# සි ද ත් ස ඟ රා වේ

අනෙත්‍යපාත්‍යාඨීය

නොහොත්

## ඉෂ්ටානිෂ්ටාලඞ්කාරාධිකාරවය.

වි ද්‍යෝ ද ය ප රි වෙ ණා ධි ප ති

ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය

**ශ්‍රී සුමඞ්ගලාභිධාන ප්‍රධාන සඞ්ඝනායකස්ථවිර**

ස්වාමිපාදයන්වහන්සේගෙන් ශාස්ත්‍රාගම උගත්

යටගල විහාරාධිපති

**කලෙගේ ගුණරතනාභිධාන ස්ථවිරයන්වහන්සේගේද**

සඞ්ඝරාජ පරිවෙණාධිපති

**මඩුගල්ලේ සිද්ධාර්ථාභිධාන ස්ථවිරයන්වහන්සේගේද**

ශිෂ්‍ය වූ

මිහිරිපැන්නේ බෞද්ධපාඨශාලාවේ ප්‍රධානාචාර්ය

**ජේ. පී අමරසිංහ මහත්මයා විසින්**

කරණලද සහෝදාහරණ

## විස්තරාර්ථව්‍යාඛ්‍යානයෙන්

ස ම න්වි ත යි.

ශා ස්ත්‍රා න්ත ර ප්‍ර වී ණ

**වී. පෙ. රණසිංහ**

ජ්‍යෙෂ්ඨාධිකරණශාලාවේ පෙරකදෝරු තුමා ආදී

පණ්ඩිත මහතුන් විසින් පසස්නාලදී.

**ජේ. ඩී. ප්‍රනාන්දු විසින්**

ශ්‍රී ලං ප්‍ර කා ශ ය න්ත්‍රා ල යෙ හි

(දෙවැනිවර) මුද්‍රණය කරවන ලදී.

**ශ්‍රී. බු. ව. 2450.**

# PARAPHRASE

WITH COMMENTS ON THE TWO LAST CHAPTERS

OF THE

# SIDATSANGARA

CONSISTING OF PROSODY AND RHETORIC,

COMPOSED BY THE

VEN. PRINCIPAL OF PRATIRAJAPARIVENA,

WRITTEN BY

**J. P. AMARASINHA,**

*Head Master of the Mihiripenne Buddhist School.*

PUPIL OF

REV. KALAHE GUNARATANE ISTHAVIRA

AND

REV. MADUGALLE SIDDHATTHA ISTHAVIRA

*Principal of Sangaraja Pirivena.*

PUPILS OF

**THE VEN. H. SRI SUMANGALA**

*Principal of the Vidyodaya College, High Priest.*

---

COMMENDED BY THE LEARNED

**W. P. RANASINGHE Esq.**

*Proctor of the Hon. the Supreme Court,*

AND OTHER PANDITS.

---

PRINTED AND PUBLISHED BY

J. D. FERNANDO.

AT THE GRANTHAPRAKASA PRESS, COLOMBO.

1906.

(Second Edition.)

# සිදත් සඟරාවේ

අනෙන්‍යපානන්‍යාර්ථය

නොහොත්

## ඉෂ්ටානිෂ්ටාලඞ්කාරාධිකාරවය.

විද්‍යෝදය පරිවෙණාධිපති

ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය

**ශ්‍රී සුමඞ්ගලාභිධාන ප්‍රධාන සඞ්ඝනායකස්ථවිර**

ස්වාමිපාදයන්වහන්සේගෙන් ශාස්ත්‍රාගම උගත්

යටගල විහාරාධිපති

**කලෙගේ ගුණරතනාභිධාන ස්ථවිරයන්වහන්සේගේද**

සඞ්ඝරාජ පරිවෙණාධිපති

**මඩුගල්ලේ සිද්ධාර්ථාභිධාන ස්ථවිරයන්වහන්සේගේද**

ශිෂ්‍ය වූ

මීරිපැන්නේ බෞද්ධපාඨශාලාවේ ප්‍රධානාචාර්ය

**ජේ. පී. අමරසිංහ මහත්මයා විසින්**

**කරණලද සොදාහරණ**

විස්තරාර්ථව්‍යාඛ්‍යානයෙන්

**සමන්විතයි.**

---

ශාස්ත්‍රාන්තරප්‍රවීණ

**වී. පෙ. රණසිංහ**

ශ්‍රේෂ්ඨාධිකරණශාලාවේ පෙරකදෝරුතුමා ආදී

පණ්ඩිත මහතුන් විසින් පසස්නාලදී.

---

**ජේ. ඩී. ප්‍රනාන්දු විසින්**

ග්‍රන්ථප්‍රකාශයන්ත්‍රාලයෙහි

(දෙවැනිවර) මුද්‍රණය කරවන ලදී.

ශ්‍රී. බු. ව. 2450.

DEDICATED

BY KIND PERMISION TO

# The Honorable Tikiri Bandara Panabokke

SAMASTA WIKRAMA KARUNATILAKA

ABHAYAWARDHANA BHUWANASEKHARA JAYASUNDARA.

Member of the Legislative Council, Ceylon.

M. R. A. S., C. B.

Rate Mahatmaya of Uda Palata.

President of the Provincial Committee of Buddhist Temporalities, C. P.

&c., &c., &c.,

As a small token of the

Lively interest taken by him in the promotion of

Sinhalese Literature.

By his Humble Servant.

THE EDITOR.

Colombo, May 27, 1892.

---

ලඞ්කාණ්ඩුවේ

නීතිදශකමන්ත්‍රිසභාවේ සභ

රාජකීය ආසියාතික සභාවේ ද සාමාජික ධුරන්ධර

මධ්‍යමදිශාවේ බුද්ධාගම සම්බන්ධ ප්‍රොවින්සියල් කොමිටියේ

සභාපතිධුරය ආදී ගෞරවනීය ස්ථානාන්තරප්‍රාප්ත

ප්‍රාචීනප්‍රතීචීනභාෂාශාස්ත්‍රප්‍රවීණ

ශ්‍රී ම ත්

වංශාධිපති පාණබොක්කේ

සමස්තවික්‍රම කරුණාතිලක අභයවර්ධන

භුවනශේඛර ජයසුන්දර මුදලිනාමොපලක්ෂිත

ටි කි රි බ ණ්ඩා ර

උඩරට සිංහල මන්ත්‍රීශ්වරයානන් විසින්

මෙය අත්‍යන්තසමාදරයෙන්

ස්වීකෘතයි.

---

# PREFACE.

In the year of Buddha 1791 or abont six hundred and fifty nine years ago "*Sidat Sangara*" was written by Vedeha the learned principal of a famous College known as "*Pratiraja-parivena*" at the request of Pratiraja Deva the prime minister of King Kali Kàla Sangita Sahitya Sarvagna Pandita Parâkramabahu, the Great, who reigned at Dambadeniya. The late *Batuwantudawe Pandit* revised and published about 30 years ago an old paraphrase to this work long in use in the country; but this not being explanatory enough, an explanatory paraphrase was written by the distinguished principal of the Vidyodaya College, the principal Nayake Thero of the Western Province *Sri Sumangala*, to the first ten chapters and was published by parts in the Magazine "Samaya-Sangarâ." At the instance of the learned who saw the valuable parapharse and who were desirous of promoting knowledge of our literature, Cornelis Cure Appuhami (at whose request it was written) published it in book from in 1884.

A great many who appreciated the work feeling the want of a similar praphrase to the two remaining chapters, wrote numerous letters desiring the supplying of that want.

Under the circumstances Suwetan Cure Appuhami, considering that the remaining part of the paraphrase should be done by the renowned principal himself who wrote the part already published or by some one of his pupils, requested my teacher *Kalehe Gunaratana* Isthavira of Yatagala Vihare to undertake the work; but the latter directed me his pupil to undertake it. Being thus directed I have been able on the instructions received from the learned *Madugalle Siddhattha* Isthavira Principal Sangaraja Pirivena Kandy to place the work before the public.

On the subject matter of these two chapters on Propriety and Rhetoric, opinions of the learned differ. As it is difficult to quote these opinions in detail we have after giving the literal translation and sense of the respective passages, enlarged on them with explanations and examples drawn from "Kavyadarsa" "Siyabaslakara" and several other works. New examples have been added where in the original no examples are found, and on

the whole the subject has been cleared of mistakes that have crept in, in the course of time, and of doubts about the significa-tion of some parts of the text This was Printed and Published in 1892 with a full meaning. In this edition many ommissions in the first edition have been filled up Unnecessary places have been left off. The use of "එ ළි ස ම" "Elisama" in poetry have been closely explained with various poetical examples. The explanation with a diagram of the last verse in *Sidat Sangarawe* has been fully dealt with.

As it is human to err, there may be errors in our work which we hope the learned would correct. May they at the same time consider the great benefit students would reap from our efforts. The revision of this should be performed at the permission of the above mentioned Isthaviras.

J. P. Amarasinha,
*Head Teacher of*
*The Miripenna Budhist School.*

# වි ඥා ප න ය.

ශ්‍රී බුද්ධ වර්ෂ 1791 වන්නෙහි හෙවත් මීට වර්ෂ 659 කට පමණ පෙර ලඞ්කාරාජ්‍යශ්‍රීපදප්‍රාප්තව දඹදෙණිනුවර අග්‍රරාජධානිය කොට විසූ ශ්‍රීමත්කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිතපරාක්‍රමබාහු මහරජාණන්ගේ අගැමැතිවූ ප්‍රතිරාජදෙවයන්ගේ ආරාධනාවෙන් සකල ශාස්ත්‍රසාගරපාරප්‍රාප්ත පූජ්‍යාචාර්ය ප්‍රතිරාජපරිවෙණාධිපති වෛදේහ මහාස්වාමිපාදයන්වහන්සේ විසින් කරණලද මේ "සිද්ධාන්තසඞ්ග්‍රහ"යට පුරාතනාචාර්යවරයෙකු විසින් මුල පටන් අවසානය දක්වා සංක්ෂේපයෙන් කරණලද අර්ථව්‍යාඛ්‍යානය (මීට වර්ෂ 30 කට පමණ පූර්වයෙහි) ශ්‍රී දේවරක්ෂිතාචාර්ය බටුවන්තුඩාවේ පණ්ඩිතුමන් විසින් ශුද්ධකොට මුද්‍රණය කරවන ලද්දේ වීනමුත් එයින්ද විස්තරාවබෝධයක් නොමැතිහෙයින් කොර්ණේලිස්කුරේ අප්පුහාමිගේ ආරාධනාව පිළිගත් විබුධජන චූඩාමාණික්‍යවූ විද්‍යෝදය පරිවෙණාධිපති ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය ශ්‍රීසුමඞ්ගලාභිධාන කොළඹ නවකෝරළේ ප්‍රධාන සංඝනායකස්ථවිරපාදයන්වහන්සේ විසින් ආධුනික ජනයන්ගේ ප්‍රයෝජනය පිණිස සංඥාධිකාරය පටන් ක්‍රියාකාරක පදසම්බන්ධාධිකාරය අවසන්කොට ඇති ව්‍යාකරණ අධිකාර දශයට විස්තරාර්ථ ව්‍යාඛ්‍යානයක් කරණ ලදින් එය "සමසසඟරාවෙකි" ප්‍රසිද්ධ කරණලදී.

ඒ මනෝහර ව්‍යාඛ්‍යානය දුටු පණ්ඩිතජනයන් විසින් එය ශාස්ත්‍රාභිලාෂීන්ට සුලභ කරවනු සඳහා "පොත් වශයෙන් අච්චුගස්වා ප්‍රසිද්ධ කළහොත් යෙහෙකැ"යි කොර්ණේලිස් කුරේ අප්පුහාමි වෙතට ලියුම් රාශියක් එවන ලදහෙයින් අධිකාර දශයකින් යුත් එම ව්‍යාකරණ විස්තරාර්ථ ව්‍යාඛ්‍යානය මුද්‍රණය කරවා (1884 වැනි වර්ෂයේදී) ප්‍රසිද්ධ කරණලදී.

එහි රසාස්වාදනය කළ නැණවත්හු අතිරික්තාධිකාරමය සම්බන්ධ තද්ධිතභාවයෙන් තමතමන්ගේ මනෝරථය සම්පූර්ණ නොවූ හෙයින් ඒ ඉතිරිවූ මේ ඉෂ්ටානිෂ්ටාලඞ්කාරාධිකාරද්වයටද එසේම විස්තරාර්ථ ව්‍යාඛ්‍යානයක් ඉල්ලා බෙහෙවින් ලියුම් එවූහ.

එසේ ඇතිකල "පූර්වෝක්තවූ ව්‍යාකරණ දශාධිකාරයට විස්තරාර්ථ ව්‍යාඛ්‍යානය කළ යථෝක්ත නායකස්ථවිරපාදයන්වහන්සේ විසින්ම හෝ තච්ඡිෂ්‍යයන් විසින් හෝ මීටද විස්තරාර්ථව්‍යාඛ්‍යානයක් කළයුත්තේය"යි සලකා කොර්ණේලිස්කුරේ අප්පුහාමිගේ භ්‍රාතෘවූ සුවේසන්කුරේ අප්පුහාමි විසින් දැනට යටගල විහාරාධිපතිවූ අපේ ආචාර්ය කලෙහේ ගුණරත්නාභිධාන ස්ථවිරපාදයන්වහන්සේට කතිපය වාරයක්ම ආරාධනා කරණලදින් එය එසේකර

දෙනලෙස මෙහි පහත නම් පෙණෙන මට පවරා ගුරූපදෙශාදිය දුන් හෙයින් මාවිසින් දැනට මහනුවර **සඞ්ඝරාජපරිවෙණාධිපති ආචාර්ය මඩුගල්ලේ සිද්ධාර්ථාභිධාන** ස්ථවිරපාදයන්වහන්සේගේ සහායොපකාරත්වයත් ඇතිව මේ විස්තරාර්ථව්‍යාඛ්‍යානය කරණලදී.

මේ "ඉෂ්ටාර්ත්ථ, අලඞ්කාර" යන අධිකාරදෙක සඳහා නොයෙක් ආචාර්යවරයන්ගේ මත එකිනෙකට විරුද්ධව ආකූලව නොයෙක් ලෙස පවති-එය මෙසේ මෙසේ යයි වෙන් වෙන් කොට ගෙණ හැර දක්වා විස්තර කිරීම දුෂ්කර හෙයින් ඒ ඒ තන්හි පද, ච්ඡෙද භාවාර්ථ දක්වා තදනන්තරව 'කාව්‍යාදර්ශ' සියබස්ලකර, ආදි අන්‍ය බොහෝ ග්‍රන්ථවලින් විශෙෂොදාහරණ විස්තර කොට දක්වීමෙන් හා පෙලෙහි උදාහරණ නොදක්වන ලද පද්‍යයාගේ විභාග සඞ්ගත දෙෂාදියට අමුතු උදාහරණ පෙන්වීමාදියෙන්ද බොහෝ කලක පටන් වරදින් ආකූලව සැක සහිතව තිබුනු අද්භූතොපමාව ආදි සමහරතැන් දෙෂ නිරාකරණය කිරීමාදියෙන්ද හොබවා මේ විස්තරාර්ථව්‍යාඛ්‍යානය මින්පෙර වර්ෂ 1892 දී මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කොළෙමු.

මේ දෙවැනිවර මුද්‍රණයකරවීමෙහිදී පළමුවරශෙෂව තිබූදෙෂ නිරාකරණය කිරීමෙන් හා අඩුතැන් පුරවා විස්තරකිරීමෙන්ද, වැඩිතැන් බැහැර ලීමෙන්ද, සිංහල භාෂාවේ "ණ න ල ළ" අක්ෂරවින්‍යාසය කව්එලිසමයෙන්ම අවබොධ කටයුතුයයි මුලාවී මාතෘභාෂාවටත් පවහැණිව "ණනලළ" කුරු තමන් රුචිපරිද්දෙන් පෙරළිකරන්නන් මෙකල ඇති බැවින් එයින් දුහුනන් මුදාලනු පිණිස පූර්වාචාර්ය මතභෙදානතරයන් සංග්‍රහ කොට හෙතු දෘෂ්ටාන්තයන් සහිතව එලිසමය පිළිබඳ විනිශ්චයක් දීඝ්ලෙස විස්තර කිරීමෙන්ද, කතිකාශාස්ත්‍රනාමගභිකොටඇති සිද්ධාන්තසංග්‍රහ ෂඩ්රචතුවින්‍යාසයවිස්තරවශයෙන් දැක්වීමෙන්ද, සකසා විසිතුරුකරතිබෙන බැව් විශෙෂවශයෙන් සැලකියයුතුයි.

අසර්වඥවූ සියලු දෙනාටම වැරදීම ලොකධර්මයක්ව තිබෙන හෙයින් අපේ මේ ව්‍යාඛ්‍යානයෙහිද ප්‍රමාදභ්‍රමාදියෙන් ඇතිවූ යම් ස්ඛලිතස්ථාන විද්‍යමාන විනම් පරීක්ෂාකාරී පණ්ඩිතයන් විසින් සමාධිය භජනය කිරීමෙන් එබඳුතැන් ශුද්ධකරණු ලැබෙත්වා.

එසේම අපේ මේ ව්‍යාඛ්‍යානයෙන් ආධුනික ජනයන්ට ලැබිය හැකි අනන්ත ප්‍රයොජනය ඊර්ෂ්‍යාපරවශ නොවූ ග්‍රන්ථනිර්මාණ ගෞරවය දන්නා සුධිජනයෝ සලකත්වා.

මෙය නැවත නැවත ප්‍රතිසංස්කරණය කොට මුද්‍රණය කරවීම යථොක්ත ආචාර්යයන්වහන්සේලාගේ අවසරයවූ පරිද්දෙන් කට යුතුබව දතයුතු.

මේවගට-ජේ. පි. අමරසිංහ.
මිහිරිපැන්නේ බෞද්ධ පාඨශාලාවේ
ප්‍රධාන ගුරුතැන.

# සිද්ධාන්ත සංග්‍රහය.

ශ්‍රී ලඞ්කාවීපවාසීන්ගේ ස්වකීය භාෂා නැමැති නභොමණ්ඩලයට එකාම සූර්‍ය්‍යප්‍රතිබිම්බයක් සමානවූ මේ "සිද්ධාන්තසඞ්ග්‍රහ" නම් ශබ්දාර්ථ ලක්‍ෂණය කවර කාලෙක විසූ කවරෙකුගේ ආරාධනාවෙන් කවර නම් පඬිතුමෙකු විසින් කරණ ලද්දේද යත්?

ශ්‍රී බුද්ධවර්ෂයෙන් 1791 වන්නෙහි හෙවත් මීට අවුරුදු සයසිය එකුන්සැටකින් මත්තෙහි මහා සම්මතවංශානුයාත ශුද්ධසූර්‍ය්‍ය වංශොද්භූත **කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත පරාක්‍රම** බාහු නම් භූපතීශ්වරයානෝ කෝරළ ශත්‍රූ මර්දනයකොට ත්‍රිසිංහලාධීශ්වරව ජම්බුද්‍රෝණි නම් පුරප්‍රවරය අග්‍රරාජධානිය කොට රාජ්‍යකරණසේක් එක්වාදහස් අවසිය එක්වන්නෙහි පමණ ලොකශාසනාභිවෘද්ධිය සිත්වූ පරිද්දෙන් මස්තකප්‍රාප්තකොට ශත නොනී මාගේ කවර නම් ඇමැතියාන කෙණෙක් ඊට සමර්ථයෝ හෝයි පරීක්‍ෂාකොට බලා රත්නත්‍රයාභිප්‍රසන්න දෙවප්‍රතිරාජ නම් අනැමැතියානෝ "ස්වකීය පුත්‍රදාරාවන් හා සකල සම්පත් එක්දිළින්දෙකුට පරිත්‍යාග කොට බුදුබව ප්‍රාර්ථනා කළහ"යි යනාදීන් ඔහුගේ අපමණ ගුණ සලකා ශාසනවර්ධනය මුල්කොට ඔහු කුශලකරණයෙහි යෙදූහ, පූර්ණාභිලාෂීවූ ඒ අගැමැතියානන් එතැන් පටන් විහාරාරාම ප්‍රතිමා චෛත්‍ය පිරිවෙන් ගේදඹු පාලම් කරවීමාදී නොයෙක් සුචරිත ක්‍රියා නැමැති චන්ද්‍රරශ්මීන් කරණකොට ගෙණ තමගිම් පරාක්‍රමබාහු මනුජේන්ද්‍රයන්ගේ චිත්තකුමුදවන ප්‍රබොධය කොට ලොකශාසනාභිවෘද්ධිය කළබව මහාවංශයෙන් පෙණේ.

අප ධර්මස්වාමීන්වහන්සේගේ සම්‍යක්සම්බොධිය පටන් එක්වාදහස් අටසිය සූවිසි (1824) වර්ෂයක් ඉක්මුනු කල්හි ලඞ්කාරාජ්‍යශ්‍රී පදප්‍රාප්ත පරාක්‍රම බාහුනම් පෘථිවීශ්වරතෙම් දූත්‍රකේවතු වංශයෙහි උපන් සැදැහැති ප්‍රතිරාජදෙව නම් ඇමතියන් කුශල කරණයෙහි යෙදූයේයයි **අත්තනගලුවංශයෙන්** පෙණේ.

එක්දහස් සත්සිය අනූඑක් (1791) වන්නෙහි රාජ්‍යශ්‍රීපදප්‍රාප්තව 1826 වන්නෙහි ස්වර්ගගතවූ පණ්ඩිතපරාක්‍රමබාහු මහරජානන්ගේ අග්‍රාමාත්‍යවූ "දෙවප්‍රතිරාජ" යන් විසින් 1801 වැනි වර්ෂය ඉක්මුනු කල්හි ආචාර්‍ය්‍ය "අනවමදර්ශී" තෙරණුවන්ට අත්තනගලුවිහාරයෙහි තෙමහල් පහයක් කරවා පිදූබව හා පරාක්‍රමබාහු මහරජානන්ට බුද්ධකාරකධර්මයන් ප්‍රාර්ථනාකරණලෙස ආරාධනා කළකලත් එහි දූෂ්කරතාව සිහිකළ රජහට බොධිසම්භාර හරණය

සඳහා බෝධිසත්ත්වචරිතය ප්‍රකාශකිරීමෙන් ග්‍රන්ථයක් සම්පාදනය කොට බැහැදැක්වීම පිණිස මයූරපාදපරිවෙණාධිපතීන්ට ආරාධනා කොට ඒ දෙදප්‍රතිරාජ අග්‍රාමාත්‍යතුමන්ගේම නමින් කළ ආරාම යෙහිදී පූජාවලිය කරවූ බවද එහි කියන ලදී.

ප්‍රතිරාජ දෙවාමාත්‍යයන්ගේ ආරාධනාව සඳහා ප්‍රතිරාජපරිවෙණාධිපති ස්වාමීන්ද්‍රයන් විසින් සිදත්සඟරාව කළබැව් මෙහි කියන ලදී. එසෙම අනන්දභිධානවනරතන මහා ස්වාමිපාදයන්වහන්සේගේ ශිෂ්‍යවූ "වෛදෙහ" ස්ථවිරොත්තමයානන්වහන්සේ විසින් "සිංහලශබ්දලක්ෂණය" නමින් කළබව "රසවාහිනී, සමන්තකූටවණ්ණනා" ප්‍රකරණ දෙක්හිම දක්වන ලදී.

"කාලිඞ්ගවෙහා මහාථෙරෙ යසෙසාපජ්ඣායතං ගතො,
මඞ්ගලවෙහා මහාථෙරෙ බණ්ඩසීමාපති යති,

යස්ස ආචරියො ආසි සබ්බසත්ථවිසාරදො,
අරඤ්ඤායතනානන්ද මහාථෙරො මහාගණී,
ගරුත්තමාගතො යස්ස සත්ථසාගරපාරගූ.

යො විප්පගාමවංසෙකකෙතුභූතො තිසීහලෙ,
යො'කා සීහලභාසාය සීහලං සද්දලක්ඛණං.

යො ච සමන්තකූටස්ස වණ්ණනං වණ්ණයී සුභං,
තෙන වෙදෙහථෙරෙන කතා'යං රසවාහිනී"-යි.

මෙකී කාලයන් සසඳා බලනකල ඉතා ස්වල්පවූ ඌනාතිරෙකතාවයක් පෙණෙයි.

ප්‍රතිරාජදෙව නමැති අනික් ඇමැතියකු කෙණෙක් කොයිකාලකාවත් නොසිටිය හෙයින් මේ සිද්ධාන්තසඞ්ග්‍රහයෙහි දක්වන ලද උභයභාෂාලඞ්කාරයෙහි "පතිරජදිසඉසුර"යි කියනලද්දේත් අවසානයෙහි "පතිරජදෙව්"යිකියන ලද්දේත් මේ එකම අගැමැතියාණෝම යයි සිතිය යුතුයි.

මෙහිම විභක්ත්‍යර්ථකාර 'වසානයෙහි "පතිරජපිරුවණ" යත් නෙත් ප්‍රතිරාජපරිවෙණ ස්වාමීන් විසින් යයි කීහෙයින් ඒ අග්‍රාමාත්‍යයන්ගේ නාමයෙන් පිහිටුවනලද පිරිවෙණක් තිබුනුබව හා ඒ පරිවෙණාධිපතිවූ මෙකී සිද්ධාන්තසඞ්ග්‍රහ කර්තෘන්වහන්සේට "පතිරජපිරුවණ" යන අනික් නාමව්‍යවහාරයක්වූ බවද ප්‍රකාශ වේ, ඒ එසේමැයි. ස්ථානාන්තරප්‍රාප්තයන්ගේ ඒ ඒ ස්වකීය නම් ත්බියදීත් පදවීසඥිනාය මුල්කොට ඒම නාම වශයෙන් ව්‍යවහාර කිරීම ශිෂ්ටලොකයාගේ ධර්මතාවකි, ෂඩ්භාෂාපරමෙශ්වර තොටගමුවේ සංඝරාජමහාස්වාමිපාදයන්වහන්සේ පෙර මහාවිජයබාහු මහරජානන් විසින් තමන්ගේ නාමයෙන් පිහිටුවන ලද

"විජයබාපිරිවෙණට" පැසුලු අධිපති වූ හෙයින් ඒ ඇසුය සලකා "විජයබා පිරිවෙණ" යන නාමයෙන්ද ආචාර්‍යෝපාධ්‍යායයන් විසින් තබනලද නාම වශයෙන් "ශ්‍රීරාහුල" යන නාමයෙන්ද ව්‍යවහාරකරණු ලැබේ-ගිරාසන්දෙශයෙහි "නවකර පවර විජයබ පිරිවන් තෙරිඳු" යනාදියෙන් පිරිවෙන් නාමයද වෘත්තරත්නාකර පඤ්චිකාවෙහි "රාහුලනාමා මුනිරතිවිමාන් සද්ගුණභාරී ත්‍රිපිටකධාරී මෞලීකුලාබ්ධිප්‍රභවශුබාංශු ජිනවනී ජනවත්‍යපි මම මිත්‍රම්" යනාදියෙන් ප්‍රව්‍රජිතනාමයද කියනලදී. පචපරිවෙණසාමි, මයූරපාදපරිවෙණසාමි යනාදියත් එසේම සැලකිය යුතුයි.

එසේම මේ සිද්ධාන්තසඞ්ග්‍රහ කර්තෘන්වහන්සේද පිරිවෙන් නාමයෙන් "පතිරජපිරිවෙණ" යීද ආචාර්‍යෝපාධ්‍යායයන් විසින් තබනලද ප්‍රව්‍රජිතනාම වශයෙන් "වෛදෙහ" යීද චිරප්‍රසිද්ධයි.

නොයෙක් සූත්‍රදෙශනාවලදී "වෙදෙහිපුත්තො" යීද අට්ඨශාලිනී අට්ඨකථාප්‍රාරම්භයෙහි "සඞ්ගීතකාලෙ සඞ්ගීතො වෙදෙහ මුනිනා පුන" යනාදියෙන් "වෙදෙහමුනි" යීද ව්‍යවහෘතවූයේ සම්බුද්ධභූත අග්‍රශ්‍රාවක ආනන්ද ස්ථවිරයන්වහන්සේයි, උන්වහන්සේගේ මව් විදෙහරට උපන් බිසවක් බැවින් (ශාරිගේ පුත්‍රයා ශාරිපුත්‍ර වූවාක්මෙන්) ආනන්ද ස්ථවිරයන්වහන්සේ "වෙදෙහපුත්‍ර, වෙදෙහමුනි" යයි කියනලදී. මේ සිද්ධාන්ත සඞ්ග්‍රහ කර්තෘ ස්වාමිපාදයන්ගේ ආචාර්‍යයන්වහන්සේද ආනන්ද නම්වූ බැවින් උන්වහන්සේගේ පරනාමධෙයවූ "වෛදෙහ" යන නාමය තමන්වහන්සේගේ ශිෂ්‍යවූ මේ උත්තමයානන්වහන්සේට තබන ලද්දේයයි සිතිය යුතුයි.

"එකශ්‍රැතින් නෛකසහස්‍ර ග්‍රන්ථධාරණයට සමර්ථවූ වජ්‍රඥාන ඇති ශාරීපුත්‍ර මහාස්වාමිපාදයන් පටන් සඞ්ඝරක්ෂිතය, සුමඞ්ගලය, වාගීශ්වරය, ධම්මකිත්තිය, නාගසෙනය, ආනන්දය, වෛදෙහය, බුද්ධප්පියය, අනවමදර්ශිය, යනාදි මහාස්ථවිරවරයෝ නොයෙක් ටීකාට්ඨකථා හා තත් ප්‍රවෙශොපායවූ අනෙකප්‍රකාරවූ ධර්මප්‍රබන්ධහා සන්න ගැටපද පිටපත් ආදිය උපදවා බුදුන්ගේ පර්‍යාප්ති ශාසනය බැබලවූහ" යනාදී නිකායසංග්‍රහ වාක්‍යය සැලකීමෙන් කාලයෙන් හා පාණ්ඩිත්‍යයෙන්ද මේ වෛදෙහ ස්වාමීන්ද්‍රයානන්වහන්සේට සමාන වූවන් තේරී තිබෙන රහ පෙණේ.

මේ වෛදෙහ ස්වාමීන්ද්‍රයන්වහන්සේද පද්‍යමධුව හා මහාරූපසිද්ධිය කළ බුද්ධප්පිය මහාස්වාමිපාදයෝද සම්බන්ධචින්තා සන්නකර්තෘවූ ගොතම ස්වාමිපාදයෝද ආනන්දාභිධාන වනරතන මහාස්වාමිපාදයන්වහන්සේගේ ශිෂ්‍යයෝයයි තත් තත් ප්‍රකරණාවසානයන්හි සන්දර්ශිතයි, එසේ හෙයින් වෛදෙහ බුද්ධප්පිය ගොතම

යන මහා ස්ථවිරයන්වහන්සේලා අභිධම්මමූලටීකාකාර ආනන්ද වනරතනාභිධාන මහා ස්ථවිරපාදයන් වහන්සේගේ ශිෂ්‍යබවද වෙදෙහ බුද්ධප්පිය නොහොත් අනවමදර්ශී පඤ්චපරිවෙණස්වාමි මයූරපාද පරිවෙණ ස්වාමී යනාදී ආචාර්‍ය්‍යවරයන්වහන්සේලා සමාන කාලයෙහි වැඩසිටි බවද සිතිය යුතුයි.

ප්‍රතිරාජදේවමහාමාත්‍යයන් විසින් අත්තනගල්ලවිහාරය ප්‍රකෘතිමත් කරවා අනවමදර්ශී මහාස්වාමිපාදයන්වහන්සේට භාරකොට පිදූයේ මතු නොවෙයි තමන් නමින් පලාබද්දල ආදි අනිකුදු බොහෝ විහාරාරාම කරවා අපමණ මහසඟනට පිදූබවත් තමන් අයැදීමෙන් උන්වහන්සේලාලවා නොයෙක් ලෝසපුන්වැඩකර වූ බවත් පැරණි පොතපතින් මොනවට ප්‍රකටහෙයින්ද "මහාවිහාර,පරිවෙණ" යන වචන කිසිසේත් සාමාන්‍යවී නොවනහෙයින්ද–

"ප්‍රතිනෘපති මහාවිහාරනෙතා ක්ෂිතිපුරවංශජ නිර්මුනීන්ද්‍රසූනුඃ,
භූතිරනවමදර්ශිනාමධෙයඃ පරමකරොත්කාරණං පරෝපකාරම්"

යන මේශ්ලෝකයෙන් හා අන්කිසිලෙසිනුත් ප්‍රතිරාජපරිවෙණාධිපතිවූයේත් සිදත්සඟරාකර්තෘවූයේත් අනවමදර්ශීමහාස්වාමිපාදයන්වහන්සේයයි ප්‍රකාශනොවන හෙයින්ද "ප්‍රතිනෘපති වීරප්‍රතිරාජ, දේවප්‍රතිරාජ, සතතරත්නප්‍රතිරාජ, මහාවිහාර, පරිවෙණ" නාමයන් සම්බන්ධ විශේෂයුවූ පූරාතනාචාර්‍ය්‍යවර්‍ය්‍යයන්විසින් අනභිමතවූ තදභිනවග්‍රහණය හේතු දෘෂ්ටාන්ත රහිතයි.

වෛදෙහමහාස්වාමීන්ද්‍රයන්වහන්සේවිසින් "සිංහලශබ්දලක්ෂණ,සමන්තකූටවර්ණනාව, රසවාහිනිය" යන ප්‍රකරණත්‍රය යථාක්‍රමයෙන් කළබැව් සිතිය යුතුයි, "ශබ්දලක්ෂණය, ශබ්දශාස්ත්‍රය, ශබ්දානුශාසනාව" යන මේ නම් ව්‍යාකරණශාස්ත්‍රයට පර්‍ය්‍යාය වශයෙන් ව්‍යවහෘතයි. චාන්ද්‍රව්‍යාකරණත්‍රගත මෞද්ගල්‍යායනව්‍යාකරණයේ ප්‍රාරම්භගාථාවෙහිදී "මාගධංසද්දලක්ඛණං" යීද කාණ්ඩාවසානයන්හි "ඉති මොග්ගල්ලානෙ ව්‍යාකරණෙ" යීද අවසාන ගාථාවන්හි "සද්දසත්ථං" යීද එකම ව්‍යාකරණය සඳහා මුගලන්මාහිමියානන්වහන්සේවිසින් ත්‍රෛවිධ්‍යයකින්ම විවිධසාමාන්‍යවිශේෂ නාමව්‍යවහාරය කළබැව් පෙණේ. ඉතින් මාගධශබ්දලක්ෂණය අනිකෙක මොග්ගල්ලායනව්‍යාකරණය අනිකෙක මාගධශබ්දශාස්ත්‍රය අනිකෙකැයි යමෙක් කියා නම් හෙද පිළිගතහැකිද? මාගධශබ්දලක්ෂණය යන්නෙන් මෞද්ගල්‍යායනව්‍යාකරණය ගැණෙන්නාක්මෙන් සිංහලශබ්දලක්ෂණය යන සාමාන්‍යසංඥායෙනුත් යුගොවෘතතින් චාන්ද්‍රමෞද්ගල්‍යායනව්‍යාකරණත්‍රගතසිංහලව්‍යාකරණයවූ විශේෂසංඥාවූ මේ සිද්ධාන්තසංග්‍රහවම ගැණෙන් නං, ඒ එසේමැයි. විජයබාහුපරිවෙණාධිපති ෂඩ්භාෂාපරමේශ්වර තොටගමුවේ ශ්‍රීරාහුලසඞ්ඝරාජ මහාස්වාමිපාදයන්වහන්සේ විසින් කාව්‍යශේඛරයෙහි–:

| | | |
|---|---|---|
| **2, 39.** | හත් වරද ලොප් | වණ |
| | **කිරිය අදියර යත්** | ව න |
| | අදෙස් හැදහිලි | ව න |
| | එසද ගුණයෙන් **සදලකුණු** | ව න |

යන මේ ශෛලෂකාව්‍යයෙන් දක්වනලද **"හත්, වරද, හැදහිලි"** යන නිදසුන් හා ක්‍රියාධිකාරය සත්වැනිකොටඇති, ශබ්දලක්‍ෂණයවූ ව්‍යාකරණශාස්ත්‍රය මේ සිද්ධාන්තසඞ්ග්‍රහව බවත් එසේම එයින් ප්‍රතිරාජපරිවෙණාධිපතිවූයේ වෛදෙහමහාස්වාමීන්ද්‍රයන්වහන්සේ බවත් එය එසේම එද, පටන් මෙද, දක්වා ලක්දිවඇතිවූ සියලු පැණැති පඬිඇදුරන්විසින් එකහෙලා පිළිගත් සිදත් කරුණක් බවත් සැකහැර දතයුතු.

යථෝක්ත ප්‍රතිරාජදෙව නම් අනැමැතියන් හැර ස්වකීය භාෂා විභක්ත්‍යාදි නිර්ණය පිණිස ආරබ්ධභාවක් කල අතීත් "ප්‍රතිරාජ දෙව" නමැති ඇමැති කෙණෙක් නැත්මය. වෛදෙහ ස්වාමීන්ද්‍රයන්වහන්සේ හැර සිංහල විභක්ත්‍යාදි නිර්ණය පිණිය ග්‍රන්ථ රචනාවක් කල අතීත් ආචාර්‍ය්‍යවරයෙක්ද නැත්මය, එසේම මේකී සිද්ධාන්ත සඞ්ග්‍රහය හැර වෛදෙහ ස්වාමීන්ද්‍රයන්වහන්සේ විසින් කරණලද අන්‍ය සිංහල ශබ්දලක්‍ෂණය කුදු නැත්තේමය,

එබැවින් **විශුද්ධිමාර්ග සන්න, වනවිනිස සන්න, කව් සිළුමිණ,** ආදී ප්‍රශස්ත මහා ග්‍රන්ථ නිර්මාණය කල කලිකාල සඞ්ගීත සාහිත්‍ය සර්වඥපණ්ඩිත පරාක්‍රමබාහු මහරජානන්ගේ අග්‍රාමාත්‍යවූ **ප්‍රතිරාජ දෙවයන්** විසින් ආරබනා කරණලදින් එම අගැමැතිතුමන්ගේ නාමයෙන් ශ්‍රීපාදඅඩවියබද පලාබද්නල පිහිටුවනලද ප්‍රතිරාජ නම් පිරිවෙන්හි අධිපතිවූ **වෛදෙහ** නම් මාහිමියානන්වහන්සේ විසින් මේ **සිදත්සගරාව** කරණ ලද්දේ යයි නිශ්චිතයි.

තවද "සිදත්සගරාව අදියර දසයෙකැ" යිද "එකොළොස්වන දොළොස්වන අදියරදෙක ප්‍රතිරාජ පරිවෙණාධිපතීන්වහන්සේගේ කෘති නොවෙති" යිද නොඇදහියයුතු විප්‍රලාපයකුදු මෙකල පහළවිය, ඒ පිළිබඳව සිදත්සඟරාපෙළෙන්වත් පුරාතනව්‍යාඛ්‍යානයෙන්වත් ඉන්පසු මෙදාතුරඇතිවූ අන් කිසිපොතපතකින්වත් යම්කිසිනිදසුනක් දක්විය නොහැකිහෙයින් හෙද තමන් මතිමාත්‍රයෙක්මය, ඒ එසේවීනමුත් පසුගියදවස යම්කිසි අදහසකින් පහළකල චැකියෙන් මුළාවන්නන් දැනුදු ඇතිබැව්හැඟුනෙන් මතු එසේ නොරැවැටෙනසේ ප්‍රකටිකරණය ආවශ්‍යකමැයි.

ලෝකයෙහි ඇතිවූ ඒ ඒ ශබ්දශාස්ත්‍ර තත්තද්භාෂාවිෂයෙහි ජේතෘප්‍රයෝගයයි සම්මත පණ්ඩිතවාක්‍යයන්ම මූලාධාරකොට ඇතිවූහ, එහෙයින් තවජබද්ශාස්ත්‍ර තද්මූලිකජේතෘප්‍රයොගයන් ස්වභාවබොධයට ඉවහල්වූහ, ඒ එසේමැයි. පාලිව්‍යාකරණය බුද්ධ

විච්ඡන්‍ය මුල්කොට ඇතිවිය, සංස්කෘතව්‍යාකරණය වේදවේදාඞ්ගා
දිය මුල්කොට ඇතිවිය, සිංහලව්‍යාකරණයවූ කලි එබන්දක් මුල්
කොට නොමැතිහෙයින් පෞරාණික සිංහලශාබ්දිකයන්ගේ යහ
පත් වාග්ව්‍යවහාරයම මූලාධාරකොටගෙණ සිංහලව්‍යාකරණශබ්ද
ශාස්ත්‍රය කට්ටැරි ආචාය්‍යී ප්‍රතිරාජපරිවෙණාධිපතිවෛදෙහමහාසාං
මිපාදයෝ, "**සඳරුත්විදිසිසල් අනුරු සේපිණෝතන්—ඉති සත්
සඳසමස්ඇ වහරනුසෙරෙන් සපයා-මෙ සබඳ සිදත්පිරියත්ගිම්**"යි
සූත්‍ර වෘත්ති සහිතව තදනුවර්ණනාවකුද දක්වූහ, එහි සිදත්පිරි
යත්ගිම් පිරික්සන දුනුනන් තුමූලාවනු පිණිස අදියරනම්විසින්
වෙන්වෙන්කර ගොසින් තිදෙස්ලෙස වෙසෙස්වූ දෙළොස්වන
අදියරඅවසන්හි "**මැපෙළපමණසිඹි**" යන මෙ ඇ ගී සතරකින්
යථාක්‍රමයෙන් උපවාද ආශංසන ආයාචනා ප්‍රකාශකොට තදන
න්තරව "**මෙහි පදනුවග දනෑ**" යනාදින් එහි ප්‍රධානප්‍රයොජන
ප්‍රකාශිත ෂඩරචක්‍රචිත්‍රකාව්‍යබන්ධනයාගේ නාභියෙහි අත්කිසි
සොරසතුරෙකු විසින් ලොප් කොට පැහැරැ ගත නොහැකිසේ
"**පතිරජපිරුවනඟෙ සිදත**" යන දෙළොසකුරු සතිරව පිහිටු
වීමෙන් තමන්වහන්සේගේ හා ශාස්ත්‍රයාගේ විශෙෂනාම ප්‍රකා
ශක ශ්‍රිනසතමුද්‍රාලිපිය තබාලූසේක.

තවද සකුමගදව්යරණයන්හි මෙබඳු අදියරදෙකක් වෙන්වෙන්
වශයෙන් නොමැත්තෙන් එපමණකින් මෙහි පැරණි සිහලවිය
රණනත්වෙසෙස් උවදෙස්වදන් නොදැනැ මූලාවී මානිගන්නා
එබඳු දුනුනන් මතු ඇතිවියහැකිබැවින් ඊට අවසර නොදෙනු
පිණිස විනිසකුත් තබාලනු කැමති දිගුදිසි මාහිමියානන්ගේම
හෝ තත්කාලිකවූ තදනුයායී අන්‍යප්‍රාඥවරයෙකුගේ හෝ කෘති
යකැයි සිතිය හැකි **පුරාතනව්‍යාඛ්‍යානයෙක** පැණෙන "මෙසබඳ
**සිදත්පිරියත්ගිම-යී හදලහෙයින් අනතිමපරිච්ඡෙදමයෙකි දක්
වූ පදලක්ෂණත් ශිෂ්ටප්‍රයොගමැකැයි මෙහිම අනාගීනයී**"යන
මෙවදන් බුනුමන්කොටන් පිළිගෙණ සිදත්පෙළ විබත්අදියර
අවසන්හි "**දෙනෙ දනෑ මෙසිදන පතිරජපිරුවන**" යනුත් ඉවුනිවූ
අදියර පවින්ගැන්මෙහි "**ඉහි වියරණ දකෑ**" යනුත් ලකරඅදිය
රෙහි උබබස්නිදසුන්විසින් තමන් සිදත්කරුණුසදහා අයැදි ඇ
මැතිනුමන් ගුණකිත්වැණුම්කොට දක්වූ කවහි "**පතිරජදිය
ඉසුරා**" යනුත් දෙළොස්වන අදියර අවසන්හි "**මැපෙළපමණ
සිඹි**"-"**මෙකුදුසිදතින් විශතිනි**"-"**පතිරජදෙව්සැරැදෙනේ**"-"**අද
රෙන් සදන ඔහු විබනැනිරණ සිසබසැ පලකරණුවස් මෙනෙ
ලෙම් කුළුණෙන් සිදත්සගරා**"-"**මෙහි පදනුවග දනැ වියරණසිඳු
බජමින**"-යනාදියන් අන්‍යව්හිතනොවී සිහිනුවණින් යෙදි සසළ
බලා කවරෙකුගේ කෘතිදැයි නොහැඟෙන තවත් සැකඇත්නම්

පැරැණි ලිපි පෙළ සන්න අත්පොත් රැගෙණ විදහා බලා පිරික්සියයුතුයි, එසද සීදත්සඟරා කෙළවරනම් දෙලොස්වන අදියර කෙළවරවතතුරුයයි චිරප්‍රසිද්ධ සත්‍යයෙන්ම වූ සත්‍යයක්ම බවත් හැඟෙයි, එහෙයින් සංඥාදිපචකයන් අතුරෙන් ප්‍රමාණය විසදනාතැන්හිද **පරිච්ඡේදදෙලොසකැයි** ප්‍රකාශිතයි.

තවද සිංහලව්‍යාකරණය පමණක් දැනීමෙන් ප්‍රයොජන මදබැවින් හා අමිශ්‍රවූ ශුද්ධසිංහලභාෂාව බෙහෙවින් පවත්නේ කාව්‍යවිෂයෙහි බැවින්ද ඒ අවශ්‍යයෙන් ජෙකප්‍රයොජනයයි සම්මත සාලඞකාරපද්‍යලක්‍ෂණස්වරූපයත් දතයුතුහෙයින්ද එකොළොස්වන දෙළොස්වන ඉටුනිටු ලකර අදියරදෙකත් සීදතෙහිම සංගෘහිත බැව් දතයුතුයි, හෙද පාලිසංස්කෘතඉෂ්ටානිෂ්ටපද්‍යලක්‍ෂණජ නෙදැලඞකාරවෛචිත්‍ර්‍යයත් ආධාරකොටඇතිබැවින් අසම්පූර්ණද නොවෙති, එසිනුත් එතුමන්ගේ චාතුර්‍ය්‍යය වඩවඩාත් ප්‍රකට වේමැයි.

"අක්ඛරනියමො ඡන්දං ගරුලහුනියමො භවෙ වුත්ති,
දීඝො සංයොගාදිපුබ්බො රස්සො ච ගරුලහු තු රස්සො"යි

පාලිව්‍යාකරණයෙහිද්ද ඡන්දෝවෘත්තගුරුලඝුත් ප්‍රකාශිත හෙයින්ද මෙහි පැණෙන පද්‍යයාගේ විභාගසංගතදෙෂය කාලව්‍යවධානනාමයෙන් පාලිසංස්කෘතව්‍යාකරණවලයෙහිම ප්‍රකාශිතහෙයින්ද ඒ මේ අදියරදෙකින් ශාස්ත්‍රගෞරවය හෝ ග්‍රන්ථගෞරවය විගුණත්‍රිගුණව උසස්ලෙස ඇතිවනු මිස නැති නොවේ.

සව්සතුන්වෙත මෙත්කුළුණුසිත් පෙරදැරිව සම්දිටු මිසදිටු පින් පව් කුසල්අකුසල් යහපත් අයහපත් ඉටුනිටුද මේ මේයයි ප්‍රකාශ කිරීම ලොකයෙහි පහළවූ ඒඒ සියලු බුදුපසේබුදුඅගසව්මහසව් රහත්පුහුදුන්ගත්කරුපඬිඇදුරුතුමන්වහන්සේලාගේ ධම්තාවකි ඒ ඒ යහපත්මං පියා අයපත්මං පිළිපන් කිසියම් අදබොළද දුහුදුන් අව්දුදුහුනන් ඇතිවූවත් ඉන් උන්වහන්සේලාට පරමැණුපමණකුත් කිසිදෙසක් අයත්නැත්බැව් සියසමයදත් පැණැත්තෝ නම් දනිත්මැයි, අත්ලෙහි වණයක් නැත්නම් අතින් ගත් විසය පවා තමත් සිරුරෙහි නොපැතිරෙන්නාක්මෙන් අකුශලචෙතනා රහිත හෙයින් හිදුනුඇ එළවා දුන්නත් තිදෙරින් පව්කම් නොකරන්නන්හට සිදුවන අකුසල්කම් නැත්මැයි. වදාළෙමැනෝ-:

"පාණිම්හි චෙ වණො නාස්ස හරෙය්‍ය පාණිනා විසං,
නාබ්බණං විසමන්වෙති නත්ථි පාපං අකුබ්බතො"යි.

බුදුවදන් හෙයින් "තත්ස්වාමිපාදයන්වහන්සේ ස්වසමයට විරුද්ධකෘති ඇත්තෙකැයි" යන හාස්‍යජනක සාහසික චොදනාව නොසුදුසුමැයි.

විචනය මුල්කොට ඇතිවිය, සංස්කෘතව්‍යාකරණය වෛදවේදාඞ්ගාදිය මුල්කොට ඇතිවිය, සිංහලව්‍යාකරණයවූ කලි එබන්දක් මුල්කොට නොමැතිහෙයින් පෞරාණික සිංහලශාබ්දිකයන්ගේ යහපත් වාග්ව්‍යවහාරයම මූලාධාරකොටගෙණ සිංහලව්‍යාකරණශබ්දශාස්ත්‍රය කට්ටැරි ආචාර්‍ය්‍ය ප්‍රතිරාජපරිවෙණාධිපතිවෛදෙහමහාස්වාමිපාදයෝ "සඳරුත්විදිසියල් අනුරූ සේපියෝනන්—ඉති යන් සඳසමස්අූ වහරනුසරෙන් සපයා-මෙ සබඳ සිදත්පිරියත්හිමි"යි සූත්‍ර වෘත්ති සහිතව තදනුවර්ණනාවකුදු දක්වූහ, එහි සිදත්පිරියත්හිමි පිරික්සන දුනුනන් නූමූලාවනු පිණිස අදියරනම්විසින් වෙන්වෙන්කර ගොසින් තිදෙස්ලෙස වෙසෙස්වූ දෙලොස්වන අදියරඅවසන්හි "මැපෙලපමණසිඹි" යන මෙ අෑ ගී සතරකින් යථාක්‍රමයෙන් උපවාද ආශංසන ආයාචනා ප්‍රකාශකොට තදනන්තරව "මෙහි පදනුවග දූනෑ" යනාදින් එහි ප්‍රධානප්‍රයොජන ප්‍රකාශිත ෂඩරචතුෂ්චිත්‍රකාව්‍යබන්ධනයාගේ හඬියෙහි අත්කිසි සොරසතුරෙකු විසින් ලොප් කොට පැහැරගත නොහැකිසේ "සතිරජපිරුවනහෙ සිදත" යන දෙලොසකුරු සතිරව පිහිටුවීමෙන් තමන්වහන්සේගේ හා ශාස්ත්‍රයාගේ විශෙෂනාම ප්‍රකාශක ශ්‍රීනසනමුද්‍රාලිපිය තබාලූසේක.

තවද සකුමගදප්යරණයන්හි මෙබඳු අදියරදෙකක් වෙන්වෙන් වශයෙන් නොමැත්තෙන් එපමණකින් මෙහි පැරණි සිහලවියාරණනත්වෙසෙස් උවදෙස්වදන් නොදූනැ මූලාවී මානිගත්නා එබඳු දුහුනන් මතු ඇතිවියහැකිබැවින් ඊට අවසර නොදෙනු පිණිස විනිසකුත් තබාලනු කැමති දිගුදිසි මාහිමියානන්ගේම හෝ තත්කාලිකවූ තදනුයායී අන්‍යප්‍රාඥවරයෙකුගේ හෝ කෘතියකැයි සිතිය හැකි පුරාතනව්‍යාඛ්‍යානයෙකි පැණෙන "මෙසබඳ සිදත්පිරියත්හිමි-යී හඳලහෙයින් අනතිමපරිච්ඡෙදමයෙකි දූක් වූ පදලක්ෂණත් ශිෂ්ටප්‍රයොගමැකැයි මෙහිම අනනගිනයි"යන මෙවදන් බුහුමන්කොටත් පිළිනෙණ සිදත්පෙළ විබත්අදියර අවසන්හි "දෙණෙ දූනෑ මෙසිදන සතිරජපිරුවන" යනුත් ඉවුනිවු අදියර පටන්ගැන්මෙහි "ඉහි වියරණ දූකෑ" යනුත් ලකරඅදියරෙහි උබබස්නිදසුන්විසින් තමන් සිදත්කරුණුසඳහා අයැදි ඇමැතිතුමන් ගුණකිත්වැණුම්කොට්න් දක්වූ කවහි "සතිරජදිය ඉසුරා" යනුත් දෙලොස්වන අදියර අවසන්හි "මැපෙලපමණසිඹි"-"මෙකුඳුසිදතින් විශතිනි"-"සතිරජදෙව්සැරැදෙනේ"-"අඳරෙන් යදන ඔහු විබනැනිරණ සියබසැ ලකරණුවස් මෙකොලෙම කුළුණෙන් සිදත්සහරා"-"මෙහි පදනුවග දූනැ වියරණසිඳු බජමින"-යනාදියත් අන්‍යවිහිතනොවී සිහිනුවණින් යෙදී සසඳා බලා කවරෙකුගේ කෘතිදූයි නොහැඟෙන තවත් සැකඇත්නම්

පැරැණි ලිපි පෙළ සන්න අත්පොත් රැගෙණ විදහා බලා පිරික් සියයුතුයි, එසඳ සිදත්සඟරා කෙළවරනම් දෙළොස්වන අදියර කෙළවරවනතුරුයයි චිරප්‍රසිද්ධ සත්‍යයෙන්මවූ සත්‍යයක්ම බවත් හැඟෙයි, එහෙයින් සංඥාදීපවකයත් අතුරෙන් ප්‍රමාණය විස දනතැන්හිද **පරිච්ඡේදදෙළොසකැයි** ප්‍රකාශිතයි.

තවද සිංහලව්‍යාකරණය පමණක් දැනීමෙන් ප්‍රයොජන මඳබැවින් හා අමිශ්‍රවූ ශුද්ධසිංහලභාෂාව බෙහෙවින් පවත්නේ කාව්‍ය විෂයෙහි බැවින්ද ඒ අවශ්‍යයෙන් ඡෙකප්‍රයොජනයයි සම්මත සාලඞ්කාරපද්‍යලක්ෂණස්වරූපයත් දතයුතුහෙයින්ද එකොළොස්වන දෙළොස්වන ඉටුනිවූ ලකර අදියරදෙකත් සිදතෙහිම සංග්‍රහිත බැව් දතයුතුයි, හෙද පාලිසංස්කෘතදෘෂ්ටාන්තපද්‍යලක්ෂණජ නෙද්‍යලඞ්කාරවෛචිත්‍ර්‍යයත් ආධාරකොටඇතිබැවින් අසම්පූර්ණද නොවෙති, එසිනුත් එතුමන්ගේ චාතුර්‍ය්‍යය වඩවඩාත් ප්‍රකට වේමැයි.

"අක්ඛරනියමො ඡන්දං ගරුලහුනියමෙං භවෙ වුත්ති,
දීඝො සංයොගාදිපුබ්බො රස්සො ච ගරුලහු තු රස්සො"යි

පාලිව්‍යාකරණයෙහිදීත් ඡන්දොවෘත්තගුරුලඝුත් ප්‍රකාශිත හෙයින්ද මෙහි පැණෙන පද්‍යයාගේ විභාගසංගතදොෂය කාලව්‍යවධානනාමයෙන් පාලිසංස්කෘතව්‍යාකරණවයෙහිම ප්‍රකාශිතහෙයින්ද ඒ මේ අදියරදෙකින් ශාස්ත්‍රගෞරවය හෝ ග්‍රන්ථගෞරවය විගුණත්‍රිගුණව උසස්ලෙස ඇතිවනු මිස නැති නොවේ.

සව්සතුන්වෙත මෙත්කුළුණුසිත් පෙරදැරිව සම්දුටු මිසදිටු පින් පව් කුසල්අකුසල් යහපත් අයහපත් ඉවුනිවූද මේ මෙයයි ප්‍රකාශ කිරීම ලොකයෙහි පහළවූ ඒඒ සියලු බුදුපසේබුදුඅගසව්මහසව් රහත්පුහුදුන්ගත්කරුපඬිඇදුරුතුමන්වහන්සේලාගේ ධම්තාවකි ඒ ඒ යහපත්මං පියා අයපත්මං පිළිපන් කිසියම් අඳබොලද දුහුදුන් අව්දුදුහුනන් ඇතිවුවත් ඉන් උන්වහන්සේලාට පරමැණුපමණකුත් කිසිදෙසක් අයත්නැත්බැව් සියසමයදත් පැණැත්තෝ නම් දන්නමැයි, අත්ලෙහි වණයක් නැත්නම් අතින් ගත් විසය පවා තමන් සිරුරෙහි නොපැතිරෙන්නාක්මෙන් අකුශලචෙතනා රහිත හෙයින් හිඳුනුඇ එළවා දුන් නත් තිදෙරින් පව්කම් නොකරන් නන්නට සිදුවන අකුසල්කම් නැත්මැයි. වදාළෙම්මැනෝ-:

"පාණිම්හි චෙ වණො නාස්ස හරෙය්‍ය පාණිනා විසං,
නාබ්බණං විසමන්වෙති නත්ථි පාපං අකුබ්බතො"යි.

බුදුවදන් හෙයින්"තත්ස්වාමිපාදයන්වහන්සේ සවසමයට විරුද්ධකෘති ඇත්තෙකැයි"යන හාස්‍යජනක සාහසික චොදනාව නොසුදුසුමැයි.

වැළිදු මෙහිදී කියයුත්තක් නම්-තමන්ගත් මූලකාව්‍යයෙහි "මහද ගදකිළිකර" යී කව්පෙර මකර යෙදීමත් ඉටුනිටුවණින්දක්වූ කාව්‍යයත් "එකයමරජඅණ මලඅංඅවාකර-පෙරපසැ,නහාසුබසියල්" යී මකර යෙදීමත් එකානෙකාව නොගැළපෙයි යන්න පමණකි. මේ කාව්‍ය සම්බන්ධව පුරාතනව්‍යාඛ්‍යානයෙහි වචනමාත්‍රයකුදු නො පෙණෙන හෙයින්ද ග්‍රන්ථාන්තරයන්හි වර්ණියන්ගේ ඉෂ්ටානිෂ්ටවකථනය වීව වෙනස්ව පෙණෙන හෙයින්ද ඉටුනිටුගණල භව ඉටුනිටුවණින් දක්වීමත් යුතුයයි සිතා පුරාතන ව්‍යාඛ්‍යානයෙන් පසු කිසිවෙකුවිසින් පෙළෙහි බහාලනලදැයි හෝ එය පසු කලකදී ලිපිභ්‍රමයකින් ව්‍යාඛ්‍යානයෙන් අපගතවීයයි හෝ උදාසීන වියයුතු නමුත් "ඉටුනිටුනණඅකුරුඇ" යී හදළුහෙයින්ද ඒ ඒ පූරාණව්‍යාඛ්‍යානයන්හි ප්‍රකාශ නොවන ගාථා එක දෙක හැර්වන ගල්ලව්හාරවංස, බාලාවතාර, පදසාධන, සම්බන්ධචින්තාදිප්‍රකරණයන්හිත් විද්‍යමානහෙයින්ද එයින් පදසාධනයෙහි සන්න නොමැති අනන්තිම්නාථාවත් තොටගමුවේ මාහිමියන්වහන්සේ විසින් තට්ටිකාවෙහිබහා ව්‍යාඛ්‍යානයකළහෙයින්ද "සුඛභයමරණ කෙලශදුඃඛා පවගිහඃ"-සුඛභරණපටු විණ්ණව්නය්‍යසයොගඃ-පද්ම දෙ ගදෑවකෙත්‍ර උවසීව සකලෙ ප්‍රාකෘතාදෙ සමෙ'යම්" යී ප්‍රකාශිත නමුත් බොහෝ පාලිසංස්කෘතප්‍රකරණයන්ගේ ප්‍රථමපද්‍යාදීයෙහි හා මඞ්ගල්‍ය ඉෂ්ටදෙවතාභිධානාදීයෙහිත් මකාරය විද්‍යමානහෙයින්ද ඉෂ්ටානිෂ්ටවර්ණයන්ට වඩා ඉෂ්ටානිෂ්ටගණ බලවත් බැව් නිපුණුනුවණින් හභවත්‍රපිණ්ස එකී ජ.සින් අවා (අනිටු) නර (මැදුම්) සුර(ඉටු) වණින්යුත් "මහද" යන ඉටු (දෙව) ගණයෙන් පටන්ගෙණ තවත් ශුභමිත්‍රගණ යොදා, බොහෝ ශාස්ත්‍රයුක්තිපරිද්දෙන් බන්ධනය කළ මූලගීයේ මූලකුර නිසා යටකී කාව්‍යත් බැහැරකටයුතු නොවේ.

මෙහි අඞ්ගත්වය නම්-වාදශාධිකාරයකි * එනම්, සංඥාධිකාරය, සන්ධ්‍යධිකාරය, ලිඞ්ගාධිකාරය, විභක්ත්‍යධිකාරය, සමාසාධිකාරය, විශෙෂණවිශෙෂ්‍යාධිකාරය, ක්‍රියාධිකාරය, ප්‍රත්‍යයාධිකාරය, උක්තානුක්තාධිකාරය, ක්‍රියාකාරක පදසම්බන්ධාධිකාරය, ඉෂ්ටානිෂ්ටාධිකාරය, අලඞ්කාරාධිකාරය, යන මෙතෙක්, මෙසේ මාහිමියානන් විසින් ස්වකීය භාෂා විභක්ත්‍යාදිනිර්ණය සඳහා ව්‍යාකරණය, ඉෂ්ටානිෂ්ටය, අලඞ්කාරය, යන ත්‍රෛවිධ්‍යයකින් සමලඞ්කෘත කොට වාදශාධිකාරයකින් මේ "සිද්ධාන්ත සඞ්ග්‍රහය" සමාප්ත කරණලදී.

මෙය මනාව අවබොධ කළ සිංහල අධුනික ජනයන්ට මාගධ සංස්කෘතාදිමයවූ ගම්භීරශාස්ත්‍රාවබොධයද සුකරවේ, එහෙයින් ශාස්ත්‍රාභිලාෂී සියලු දෙනාටම මෙය අත්‍යන්තොපකාර බැව් දත යුතු.

---

* අවසානයෙහි පැමිණෙන "මැපෙළපමණයිඹි" යනාදිය හැරයි.

# සිදත් සඟරා

## ඉෂ්ටානිෂ්ටාධිකාරය.

### නමව් මුනිසරණ.

ඉති වියරණ දැනැ කිවියර පදි බඳනාං,
ඉටු නිටු ගණ අකුරු ඈ ලකුණු විමසා බඳනේ. A
සියලු පවන් මැද අවසනැ වත ගල නා
එ ම න බ ය ජ ර ස ත යන නමිනට ග ණ
දියොද සෙතං ලෙඩ දළසෝ මර වැස නා
පවනබිදන්පසැ සිටුවා කළ කෙමෙ නා. B

A ඉති, මෙසේ; වියරණ, ව්‍යාකරණය; දැනැ, පරිඥානය කොට; පදි බඳනා, පද්‍යබන්ධනය කරන්නාවූ; කිවියර, කාව්‍යකාරතෙම; ඉටුනිටු ගණ, ඉෂ්ටානිෂ්ටගණද; (ඉටු නිටු) අකුරු, ඉෂ්ටානිෂ්ට අක්ෂරද යන; ඈ ලකුණු, මේ ආදි ලක්ෂණයන්; විමසා, විමංසනය කොට, බඳනේ, (පද්‍ය) බන්ධනය කරන්නේය.

මෙසේ පූර්වෝක්තවිංශති ප්‍රකාර ව්‍යාකරණවිධි විජානනය කොට ගී කාව්‍යශ්ලෝකසඞ්ඛ්‍යාත පද්‍යයන් බන්ධනය කරන්නාවූ කාව්‍යකාරතෙමෙ ඉෂ්ටගණහා අනිෂ්ටගණද ඉෂ්ටාක්ෂරහා අනිෂ්ටාක්ෂරද ඉෂ්ටයොත්හා අනිෂ්ටයොත්ද යන මේ ආදි ලක්ෂණයන් පරීක්ෂාකොට දැනැ එබිවූ පරිද්දෙන් පද්‍යබන්ධනය කරන්නේය යනු භාවයි.

මෙසේ ලක්ෂණපරීක්ෂාවෙන් මනාකොට ප්‍රයොග කරණලද කාව්‍යරචනාව ඉෂ්ටාර්ථසාධක කරයි-එසේම නපුරු කොට ප්‍රයොග කරණලද්දේ මහත් විනාශ කරන්නේයයි පුරාතනාචාර්‍ය්‍යවරයන් විසින් කියනලදී.

B සියලු, සකලස්ථානයෙහිද; පවන්, පූර්වයෙහිද, මැද, මධ්‍යයෙහිද; අවසනැ, අවසානයෙහිද; ගලනාං වත, ගුරු ලඝුන්වූ කල්හි; එ, එය; ම, මගණය; න, නගණය; බ, බගණය; ය, යගණය; ජ, ජගණය; ර, රගණය; ස, සගණය; ත, තගණයයි; යන නමින් අටගණ, (මේ) කියනලද නාමවලින් අෂ්ටගණයෙක් වන්නේය; පවන්, පද්‍යපූර්වයෙහිද; අබිදන්පසැ, අභිධානපාර්ශ්වයෙහිද; සිටුවා, ස්ථාපනය කොට; කළ, කළ කල්හි, දිය, ජයද; ඔද, තෙජස්ද; සෙත්, ශාන්තිද; ආ, ආයුෂද; ලෙඩ, ව්‍යාධිද; දළසෝ, දුඃඛශොකද; මර, මෘත්‍යුද; වැසයාං, ව්‍යසනද; කෙමෙනා, ක්‍රමයෙන් වන්නේයි.

සකලස්ථානයෙහි හෙවත් ගණය මුලුල්ලම ගුරු වූවහොත් ඒ මගණය වේ, ගණය මුලුල්ලම ලඝු වූ:හොත් ඒ නගණය වේ, (ගණයේ) ආදියෙහි (මුල) ගුරක් වූවහොත් ඒ භගණය වේ, ආදියෙහි ලඝුවක් වූවහොත් ඒ යගණය වේ, මධ්‍යයෙහි ගුරක් වූවහොත් ඒ ජගණය වේ, මධ්‍යයෙහි ලඝුවක් වූවහොත් ඒ රගණය වේ, අවසානයෙහි හෙවත් ගණය කෙළවර ගුරක් වූවහොත් ඒ සගණය වේ, අවසානයෙහි ලඝුවක් වූවහොත් ඒ තගණය වේ,ඒ මේ මගණය ආදි අෂ්ටගණයන් පද්‍යයාගේ පූර්වයෙහි හෙවත් ආදියෙහිද, නාමයට උභයපාර්ශ්වයෙහිද, පිහිටුවා කළහොත් එයින් ජයද, ඔජස්ද, ශාන්තිද, ආයුෂද, රොගද, දුඃඛශොකද, මරණද, විපත්තිද, යන මෙකී විපාක පිළිවෙළින් වන්නේය—යත්‍ර භාවයි.

මෙහි ඒ ඒ ගණ නාම හා ගුරු ලඝු යෙදෙන පිළිවෙළද ඊට නිදසුන්ද එයින් ලැබෙන විපාකද මෙහි පහත දක්වන වින්‍යාස යෙන් සුවසේ දතහැකි වේ.

| | ගුරු | | | ලඝු | | |
|---|---|---|---|---|---|---|
| සියලු.* | ම ග ණ ය | ◡ ◡ ◡ | සෙත්වේවා — දිය—1 | නගණය | – – – | තොපට — ඔද—2 |
| පවත්— | භ ග ණ ය | ◡ – – | වේ සුබ — සෙත්—3 | යගණය | – ◡ ◡ | තිලෝනා — ආයු—4 |
| මැද— | ජ ග ණ ය | — ◡ — | ම ඩෝ ර — ලෙඩ—5 | ර ග ණ ය | ◡ – ◡ | බා රු සී — දළසෝ-6 |
| අවසනැ | ස ග ණ ය | – – ◡ | න ර සී — මරණ-7 | තගණය | ◡ ◡ – | ස ප් දූ හී — වැසන8. |

හෙළ දිව් අබි දැන වතෙහි.

1 බුමි, දේව, සිසි, ජල, මේ සිව් ... ග ණ
ම, න, භ, ය, මේ පිළිවෙළින් හැඳින ... ගෙ ණ
සුව, බල, ආයුස, යස, දෙන ඉටු ... ග ණ
දූනැඳින තෙපලනු සුබ කිමට ... ගෙ ණ
2 සූරිය, ගිනි, වා, ආකාසය, ... ග ණ
ජ, ර, ස, ත, කොමෙනා දූනගෙණ මන ... මෙ න
සෝක, මරණ, උමතුත්, දුප්පත්, ව ... න
අවැඩබ තෙපලති මෙ සිව් අනිටු ... ග ණ

* "ආදි මධ්‍යාවසානෙෂු භජසා යාන්ති ගෞරවම්, .
යරතා ලාඝවං යාන්ති මනෞ තු ගුරුලාඝවම්"ශ්‍රැතබොධයි.

බූ මි ගණේ ගුරුම තුණයි සිරිසැප දෙ යි ම ග ණේ
දේව ගණේ ලගුම තුණයි ආ යුස දෙ යි න ග ණේ
වං යු ගණේ අග ට ගු ර යි ඇවිදුම් වෙ යි ස ග ණේ
සූ ර ගණේ මැදට ගු ර යි රෝ ග වඩ යි ජ ග ණේ
මැදට ලගුයි දි වි ම ර වෙ යි වහ්නිග ණේ ර ග ණේ
මුලට ලගුයි දි ර ව ඩ යි වා රි න ණේ ය ග ණේ
අ ගට ලගුයි වි නා ස වෙ යි අහස් ග ණේ ත ග ණේ
මුලට ගුර යි සැපපැමිණෙයි ච න්‍ද ග ණේ භ ග ණේ

ම ස්ත්‍රිගුරු ස්ත්‍රිලඝුශ්ච නකාරො
භාදිගුරුඃ පුනරාදිලඝු යඃ,
ජො ගුරුමධ්‍යගතො රලමධ්‍යඃ
සො'න්තගුරුඃ කථිතො'න්තලඝුස්තඃ-ජනෙන්දුමජරී.

මඃ, මගණයතෙම; ත්‍රිගුරුඃ, ගුරුත්‍රයක් ඇත්තේය; නකාරඃ, නකාරය හෙවත් නගණයතෙම; ත්‍රිලඝුශ්ච, ලඝුතුණක් ඇත්තේම වෙයි; භාදිගුරුඃ-භ, භගණය තෙම, ආදිගුරුඃ, ආදියෙහි ගුරක් ඇත්තේය; පුනඃ, නැවත; යඃ, යගණයතෙම; ආදිලඝුඃ, ආදියෙහි ලඝුවක් ඇත්තේය; ජඃ, ජගණයතෙම; ගුරුමධ්‍යගතඃ, ගුරක් මධ්‍යයට පැමිණියේවේ; ර, රගණයතෙම, ලමධ්‍යඃ, ලඝුවක් මධ්‍යයෙහි ඇත්තේය; සඃ, සගණයතෙම; අන්තගුරුඃ, අන්තයෙහි ගුරක් ඇත්තේය; තඃ, තගණයතෙම; අන්තලඝුඃ, අන්තයෙහි ලඝුවක් ඇත්තේයයි; කථිතඃ, කියනලදී.

උර්ව්වී ම ස්ත්‍රිගුරුඃ ශ්‍රියං විතනුතෙ න ස්සව ස්ත්‍රිලෙං ජීවිතං
රො'ග්නි ර්මධ්‍යලඝු ර්මෘතිං ස පවනො දෙශභ්‍රමං ප්‍රාන්තගඃ,
යො වාංසත්‍රිං'දිලඝු ර්ධෘතිං දිනමණි ර්මධ්‍යගුරු ජෝ රුජං
දද්‍යා සොමො භූර්ලඝුඃ ක්ෂයං ගුරුමුඛො භ ස්තාරකෙශො යශඃ.

ත්‍රිගුරුඃ, ගුරුතුණක් ඇතිගණය, උර්ව්වී, භූමිගණනම්වෙයි; මඃ, මගණ නමුදු වෙයි; ශ්‍රියං විතනුතෙ, සම්පත් උපදවයි;-ත්‍රිලඃ, ලඝුතුණක් ඇතිගණය; නඃ, නගණනමුදුවෙයි; ස්වඃ, දෙවගණ නමුදුවෙයි; ජීවිතම්, දීර්ඝායුෂවේ;-මධ්‍යලඝුඃ, මැදලඝුවක් ඇති ගණයතෙම; රඃ, රගණනමුදුවෙයි; අග්නිඃ, වහ්නිගණනමුදු වෙයි; මෘතිං, මරණ උපදවන්නේය;—ප්‍රාන්තගඃ, අන්තයෙහි ගුරක් ඇති ගණයතෙම; සඃ, සගණනමුදුවෙයි; පවනඃ, වායුග ණනමුදුවෙයි; දෙශභ්‍රමං, දෙශාන්තරගීව ඇවිදීම උපදවයි;—ආදි ලඝුඃ, ආදියෙහි ලඝුවක් ඇතිගණය; යඃ, යගණනමුදුවෙයි; වාරි, ජලගණනමුදුවෙයි; ධෘතිං, ධෛර්ය්‍ය උපදවයි,—මධ්‍යගුරුඃ, මැදගුරක් ඇති ගණයතෙම; දිනමණිඃ, සූර්ය්‍යගණ නමුදුවෙයි; ජඃ, ජගණ නමුදුවෙයි; රුජම්, ව්‍යාධි උපදවයි;-මුඛලඝුඃ, මුඛයෙහි ලඝු

තියකුරු ගෙණෙක් නම්, තිමෙස්කල් මත්, උසුරු විමෙහි එක්මත් ඇතිසේ ලුහුනම්, දෙමත් ඇතිසේද-හලින් පෙරවූද ගුරු නම්, ගත් අඩමත් ඇතිසේ, ඇප් අෑ මිතසින් වැඩියෙන් මත්වැඩි නම්; b

---

එක් ඇති ගණයතෙම; දෙඃ ෟඃ, ආකාශගණ නමුදුවෙයි; තඃ, තගණ නමුදුවෙයි; ක්‍ෂයං, විනාශය උපදවයි;— ගුරුමුඛඃ, මුල ගුරක් ඇති ගණයයෙම; භඃ, භගණ නමුදුවෙයි; තාරකොශඃ, චන්‍ද්‍රගණ නමුදුවෙයි; යශඃ, කිත්ති උපදවයි.

මෙසේ වෙන් වෙන් වශයෙන් අෂ්ටගණ ලක්‍ෂණ හා එහි අධිපති දෙවතාවන්ගේ නම්ද එයින් ලැබියහැකි ඉෂ්ටානිෂ්ටවිපාකද මේ කවිකණ්ඨපාශශෛලාකයෙන් සඞ්ගෘහිතයි.

b තියකුරු, අක්‍ෂරත්‍රයක් ඇත්තේ; ගෙණෙක් නම්, ගණයක් නම් වේ; (1) තිමෙස්කල්, නිමෙෂකාලයක් ඇත්තේ; මත්, මාත්‍රාවක්නම් වේ; (2) උසුරුවිමෙහි, උච්චාරණය කිරීමෙහි, එක්මත් ඇතිසේ, මාත්‍රා එකක් ඇත්තේ; ලුහුනම්, ලඝුනම් වේ; (3) දෙමත් ඇතිසේද, මාත්‍රා දෙකක්ඇත්තේද; හලින් පෙරවූද, හල් අක්‍ෂරයකෙරෙන් පූර්වවූ හ්‍රස්වාක්‍ෂරයාද; ගුරුනම්, ගුරුනම් වේ; (4) ගත්, ගාත්‍රාක්‍ෂරය තෙම; අඩමත් ඇතිසේ, අර්ධමාත්‍රායෙක් ඇත්තේයි; (5) ඇප් අෑ, ඇප් යන මේ ආදිය; මිතසින් වැඩියෙන්, මාත්‍රාංශයෙකින් වර්ධනවූ හෙයින්; මත්වැඩිනම්, මාත්‍රාවෘද්ධි නම් වේ—(6) මාත්‍රාංශවෘද්ධියයි සේයි.

භාවය-(1) ගණයක් නම් අකුරු තුණකි, (2) මාත්‍රාවක්නම් නිමෙෂකාලයක් හෙවත් ඇසිපියක් හෙලන කාලයයි (3) ඒ ඇසිපියක් හෙලන පමණ කාලය තුළ කියවෙන්නේ ලඝුනම් වේ; (4) මෙබඳුවූ මාත්‍රා දෙකක් ඇත්තේ හෙවත් ස්වභාවයෙන් දීර්ඝාක්‍ෂරයද හල්අකුරෙන් පෙරවූවූ ලඝු අක්‍ෂරයද ගුරනම් වේ; (5) ඇසිපියක් හෙලන කාලයෙන් අර්ධයක් පවත්නේ ගතකුරනම් වේ, ගතකුර ස්වභාවෙන්ම අල්අකුරයි, ගතකුරු-ක්-ග්-යනාදියයි, ඒ හුදකලාව සිටිකල ව්‍යක්තශබ්දයක් නූපදින හෙයින් ඊට-අ-ආදිය යොදූ කී කල-ක-ග-ආදි වශයෙන් ව්‍යක්තශබ්ද උපදී-(6) මෙහි අප් කියන කාලයටවඩා ඇප් කියන කාලය වැඩි හෙයින් මාත්‍රා වැඩිවීම ලකුණෙන් නොව ශබ්දයෙන්ම වියයුතුයි, මෙහිම "නිමෙස්කල්මත්"කියා දැක්වූහෙයින් කාලයෙන්ම ගතයුතුයි-මාගධ සංස්කෘත දෙක්හිද මාත්‍රා නියම කරණ තැන ලකුණෙන් නොව කාලයෙන්ම නියමකරතිබේ. * ඒ මෙසේයි සංස්කෘතෙහි "-අ-

---

* ලඝුකා මත්තා පමාණං යෙසං තෙ ලඝුමත්තා; මත්තා ස දෙ, වෙ'ත් අච්ඡරාසංඝාත අක්ඛිනිමීලනසඞ්ඛාතං කාලං වදති, තාය මත්තාය එකමත්තා රස්සා, ද්විමත්තා දීඝා, අඩ්ඪමත්තා ව්‍යඤ්ජනා-යි, මහාරූපසිද්ධි. මාත්‍රාශබ්දනාං 'ක්‍ෂිපපක්‍ෂ්මප්‍රමාණඃ කාල

1 2 3 4
"ම"සෙත්වේවං-"න" තොංපට-"බ" වේසුබ-"ශ"තිලෝනා-
5 6 7 8
"ජ" මඩෝර— "ර"බාරුසී—"ස" හරසී— "ත"සප්දැහි,
ඉති ඉටුනිටු අටගණ පියෝ A

---

අා-අ-" යන මේ වර්ණ තුණටම "හ්‍රස්වය දීර්ඝය ප්ලුතය"යි සංඥා කොට "හ්‍රස්වය" මාත්‍රා එකක් වශයෙන්ද "දීර්ඝය" මාත්‍රා දෙකක් වශයෙන්ද "ප්ලුතය" මාත්‍රා තුණක් වශයෙන්ද ශබ්දකරණලෙස උගන්වා තිබේ-මෙහි "හ්‍රස්වය" නොහොත් මුල 'අ' යන්නත් "ප්ලුතය" නොහොත් අග 'අ' යන්නත් ලකුණෙන් කිසිවෙන සක් නැතිබව පෙණේ, එසේ නමුත් මුල'අ' යන්න ශබ්දවනකාලය වාගේ තවදෙකොටසක් පමණ කාලය තුළ අග 'අ' යන්න ශබ්ද වේ; එම නිසා මේ මාත්‍රාවෘද්ධියයි සැලකීම උගහටයි.

A ම, මගණයතෙම; සෙත්වේවං, සෙත්වෙවා යනු වේ; න, නගණයතෙම්, තොපට, තොපට යනු වේ; බ, බගණයතෙම; වේසුබ, වේසුබ යනු වේ; ය, යගණයතෙම; තිලෝනං, තිලෝනා යනු වේ; ජ, ජගණයතෙම; මඩෝර, මඩෝර යනුවේ; ර, රගණයතෙම; බාරුසී, බාරුසී යනුවේ, ස, සගණයතෙම; නරසී, නරසී යනුවේ; ත, තගණයතෙම; සප්දැහි. සප්දැහි යනුවේ;* ඉටුනිටු, ඉෂ්ටානිෂ්ටවූ; අටගණපියෝ, අෂ්ටගණප්‍රයෝගය; ඉති, මෙසේයි.

---

උච්‍යතෙ-යි. ස්ඛානනචන්ද්‍රිකා.

එකමාත්‍රො භවෙද්ධ්‍රස්වො ද්විමාත්‍රො දීර්ඝ උච්‍යතෙ,
ත්‍රිමාත්‍රස්තු ප්ලුතො ඥෙයො ව්‍යඤ්ජනං චාර්ධමාත්‍රකම්.
චාෂශ්චෛකාං වදෙන්මාත්‍රාං ද්විමාත්‍රං වායසො වදෙත්,
ත්‍රිමාත්‍රං තු ශිඛී බෲයාන්නකුලශ්චාර්ධමාත්‍රකම්-යි. සාරස්වතී.

එකමාත්‍රඃ, මාත්‍රා එකක් ඇත්තේ; හ්‍රස්වඃ භවෙත්, හ්‍රස්ව නම් වන්නේය; ද්විමාත්‍රඃ, මාත්‍රා දෙකක් ඇත්තේ; දීර්ඝඃ උච්‍යතෙ, දීර්ඝයයි කියනුලැබේ; ත්‍රිමාත්‍රඃ තු, මාත්‍රා තුණක් ඇත්තේ වනාහි; ප්ලුතඃ, ප්ලුතයයි; † ඥෙයඃ, දතයුතුයි; ව්‍යඤ්ජනංච, ව්‍යඤ්ජනාක්ෂරයද; අර්ධමාත්‍රකා, අර්ධමාත්‍රයක් ඇත්තේය.

චාෂඃ තු, තලගිරිතනායයි ව්‍යවහාරවූ පක්ෂියතෙමේ වනාහි; එකාං මාත්‍රාං, එක් මාත්‍රාවක්; වදෙත්, කියන්නේය (හඬන්නේය;) වායසඃ, කවුඩුතෙමේ; ද්විමාත්‍රං, මාත්‍රා දෙකක්; වදෙත්, කියන්නේය; ත්‍රිමාත්‍රන්තු, මාත්‍රා තුණ වනාහි; ශිඛී, මොණරතෙම; බ්‍රෑයාත්, කියන්නේය; නකුලශ්ච, මුගටිතෙමේද; අර්ධමාත්‍රකං, මාත්‍රා ඞියක් කියන්නේය.

---

* මෙය දෙවැනි පිටේ පැහැදිලිකර ඇති.

† දූරාහ්වානෙ ච ගානෙ ච රොදනෙ ච ප්ලුතො මතඃ"යි.
මුග්ධබොධටීකා.

මේ අෂ්ටගණය යොදා බන්ධනය කළකල්හි මේ මේ විපාක ලබන්නේ වෙයි කියා ලකුණුසරෙහි මෙසේ කියා තිබේ—එයින් පළමුවැනි ඉෂ්ටගණ සතර මෙසේය.

1 පවත් ගුරු තුන් බඳ මෙ මීගණ නම් වතුයේ,
ඉති බැඳුමැ ක්වි තිහුනා මහඉසුරු යසපත් වේ.

පවත්, ප්‍රථමයෙහි, ගුරුතුන්බඳ, ගුරුතුණක් ලා බන්ධනය කරණලද්දේ; මෙ මීගණ නාම් වතුයේ. මේ මහීගණයනම් වන්නේ ය; කිවි, කවීහුගේ; ඉතිබැඳුමැ, මෙසේ බන්ධනයෙහි; තිහුනා, සතුති නායකතෙමේ; මහඉසුරු, මහත්වූ ඓශ්චර්‍ය්‍යයට හා; යස, කීර්ත්‍යටව; පත් වේ, පැමිණේ.

2 ඉදිරියේ ලුහු තුණෙක් සුරගණ නම් විතුයේ,
මෙයින් බැඳුම් ලදහට ආසකර බල වඩනේ.

ඉදිරියේ ලුහු තුණෙක්, අභිමුඛයෙහි ලඝු තුණක් ඇතියේ; සුරගණනම් වතුයේ, දිව්‍යගණයනම් වන්නේයි; මෙයින්, මේ දිව්‍යගණයෙන්; බැඳුම් ලදහට, බැඳුම් ලද්දාහට; ආසකරබලවඩනේ, ආයුස්සංස්කාරය හා බලවර්ධනය කරන්නේයි.

3 පළමු ගුරු එක් ලුහු යුවලෙක් වනේ සඳගණ,
යසරුසිරු වඩා නිති මුළුලෝ සඳ බඳින්නේ.

පළමු ගුරු එක්; ප්‍රථමයෙහි ගුරුඑකක් හා; ලුහුයුවලෙක් වනේ, ලඝුදෙකක්වන්නේ; සඳගණ, චන්ද්‍රගණය (භගණය) වේ; (මෙයින් බැඳුම් ලද්දාහට) නිති, නිරන්තරයෙන්; යසරුසිරුවඩා, යශස් හා රූපශ්‍රී වර්ධනය කරන්නේය; මුළුලෝ, සකලලොකවාසීන්ගේ; සඳ, චිත්තය; බඳින්නේ, බන්ධනය කරන්නේයි.

4 නවක ලුහු එක් දෙගුරෙනි බඳ හොත් දියගණ නම්,
යසතෙදිනි ලෝ රදනේ වෙසෙසා උසස් තැන්පත්.

නවකලුහුඑක්, ප්‍රථමකොට ලඝුඑකක්හා; දෙගුරෙනි, ගුරුදෙකකින්; බඳහොත්, බඳනාලද්දේවීනම්; දියගණනම්, ජලගණය නම් වෙ; (මෙයින් බඳනාලද්දේ) යසතෙදින, යශසින් හා තෙජසින්; ලෝරදනේ, ලොකයා රංජනය කරන්නේය; වෙසෙසා, විශෙෂයෙන්; උසස්තැන් පත්, උසස්වූ ස්ථානයකට පැමිණේ.

ඉෂ්ටගණ සතර කියා නිමවන ලදී.

---

අනිෂ්ටගණසතර මෙසේයි.

5 දෙඅත්හි ලුහුදෙකින් මැදගුරු හිරුගණ නම්,
නිරතුරු ගිලන්පීඩා සෝදුක්නි නොම මුස්නේ.

දෙඅත්නි, උභයාන්තයෙහි හෙවත් දෙපස; ලුහුදෙකින්, ලඝුදෙකකින් යුක්තව, මැද, මධ්‍යයෙහි; ගුරු, ගුරක්ඇතියේ; හිරුගණ නම්, සූර්‍ය්‍යගණ (ජගණ) නම් වේ; (මෙයින් බැඳුම්ලද්දේ) නිරතුරු, නිරන්තරයෙන්; ගිලන්පීඩා, ලෙඩින්හා පීඩාවෙන්ද; සෝදුක්නි, ශොකයෙන් හා දුකින්ද; නොමමුස්නේ, නොමිදෙන්නේයි.

6 මැදලුහු එක්දෙකෙළෙහි දෙගුරුවනේ ගිනිගණ,
තිඹුනාහට ද කිවි ගිනි බිය මරණ වේ වැනසුම්,

මැදලුහුඑක්, මැදලඝුවක්හා; දෙකෙළෙහි දෙගුරුවනේ, දෙපස ගුරුදෙකක් ඇතිවන්නේ; ගිනිගණ, වහ්නිගණ (රගණ) නම් වේ;(මෙයින් බඳනාලද්දේනම්) තිඹුනාහට්ද, ස්තුතිනායකයාහටද; කිවි, කවීනටද; ගිනිබිය මරණ, ගින්භය හා මරණයද; වැනසුම් වේ, විනාශද වන්නේයි.

7 නවක ලුහු දෙක්නි යුත් ගුරෙක් පවන් ගණ නම්,
උමුතු තුමුතු හෝ වේ සියතැනිනි යේ නො සරස්.

නවකලුහු දෙක්නියුත්, ප්‍රථමකොට ලඝු දෙකකින් යුක්තව, ගුරෙක්, (අන්තයෙහි) ගුරක්ඇත්තේ; පවන්ගණනම්, වායුගණ (සගණ) නම්වේ;(මෙයින් බැඳුම්ලද්දේ) තුමුතු, නිරන්තරයෙන්; උමුතුහෝවේ, උන්මාදහෝ වන්නේයි; . නොසරස්, වහා; සියතැනිනියේ, ස්වකීය (සිටිය) ස්ථානයෙන් පහව යන්නේයි.

8 ඉදිරියේ ගුරුදෙක ලුහු අවසන් වී නම්,
ගුවන් ගණ නම් වනුයේ සව්සිරි පෙදෙන් සිස් වේ.

ඉදිරියේ, අභිමුඛයෙහි; ගුරුදෙක, ගුරුදෙකක්හා; අවසන් ලුහුවීනම්, අවසානයෙහි ලඝුවක්වූයේ නම්; ගුවන්ගණනම් වනුයේ, ආකාශ ගණ (තගණ) නම් වේ, (මෙයින් බඳනාලද්දහුගේ) සව්සිරි, සියලුම ඓශ්වර්‍ය්‍යය; පෙදෙන් සිස් වේ, උත්පත්තින් ශූන්‍ය වන්නේයි.

අනිෂ්ටගණ සතර කියා නිමවන ලදී.

---

මෙහි විපුල ප්‍රයොජනය සඳහා මිත්‍රාමිත්‍රාදි ලක්ෂණ කවිකණ්ඨපාශයෙන් ගෙණහැර දක්වනුලැබේ.

මනෞ මිත්‍රෙ භයෞ භෘත්‍යාවුදාසීනෞ ජරෞ සමෞතෞ,
තසාවරී නීචසංඥෞ ඥෙයාවෙතෞ මනීෂිභිඃ.

මනෞ, මගණ නගණදෙක; මිත්‍රෙ, මිත්‍රයි; භයෞ, භගණ යගණදෙක; භෘත්‍යෞ, දාසයෝයි; ජරෞ, ජගණ රගණදෙක; උදාසීනෞ, මධ්‍යස්ථයෝයයි; සමෞතෞ, දන්නාලදහ; එතෞ තසෞ,

මේ තගණ සගණදෙක; අරී, සතුරුයි; නීචසංඥෝ,නීචනම් ඇත් තෝයසිද, මනීෂිභිඃ, පණ්ඩිතයන් විසින්; ඥෙයෞ, දතයුතුනාහ.

මේ ගණප්‍රයොගයෙහි විපාක මෙසේ දතයුතුයි.

මිත්‍රාන්මිත්‍රාදයඃ ස්‍යු සිද්ධි ධන මුදයං ශූන්‍යකං බන්ධුපීඩා
හෘත්තනන්මිත්‍රාදයශ්චධෘතිමධිකගුණං හානිශොකෞචකුය්‍ය්‍යුඃ,
ඖදාසින්‍යාච්චමිත්‍රාදය ඉහ කුසුඛෞ ධෛය්‍ය්‍යමීෂත් ස්වල්පවෛරං
ශත්‍රොර්ම්මිත්‍රාදයශ්චභ්‍රමමථ ගෘහිණී නාශමාධිං විනාශම්.

මිත්‍රාත් මිත්‍රාදයඃ, මිත්‍රගණයෙන් පරව මිත්‍රගණාදිය; යදි ස්‍යුඃ, ඉදින්වන්නාහුද; ධනං, වස්තුවද; උදයං, අභිවෘද්ධියද; ශූන්‍යකං, විනාශයද; බන්ධුපීඩා, ඥාතිව්‍යසනද යනමොංහුවෙත්; චෙත්, ඉදින්; හෘත්තනත්, දාසගණයෙන් පරව; මිත්‍රාදයඃ, මිත්‍රාදීහු වීනම්, ධෘතිං, ධෛය්‍ය්‍යද; අධිකගුණං, ගුණාභිවෘද්ධියද; හානිශොකෞච, විනාශය ශොකය යනදෙකද; කුය්‍ය්‍යුඃ, කරන්නාහුය; ඉහ, මෙහි; ඖදාසින්‍යාත්, උදාසීනබැව් අයිකොටඇති ගණයෙන් පරව; මිත්‍රාදයඃ ච; මිත්‍රාදීහුවෙත්නම්; කුසුඛෞ, දුක්සැපදෙකද; ඊෂත් ධෛය්‍ය්‍යම්, ස්වල්පවීය්‍ය්‍යද; ස්වවෛරම්, ස්වකීයයන්හා වෛරදවේ; චෙත්, ඉදින්; ශත්‍රොඃ, සතුරුගණයෙන්පරව; මිත්‍රාදයඃ,මිත්‍රගණාදියවෙත්නම්; භ්‍රමං, පිතෙනානමාදදියද; අථ, ඥළිත්; ගෘහිණී නාශං, භාය්‍ය්‍යාව නැසීමද; ආධිං, දෞම්නස්ද, විනාශම, විනාශද කෙරෙත්;-මෙහි අදහසනම්:—

මිත්‍රගණයෙන් මිත්‍රගණය ඇතිකල්හි වස්තූන්ගේ වැඩීමද-මිත්‍රගණයෙන් දාසගණය ඇතිකල්හි ජයනැණීම් ආදී යහපතද—මිත්‍රගණයෙන් උදාසීනය ඇතිකල්හි විනාශයද—මිත්‍රගණයෙන් ශත්‍රුගණය ඇතිකල්හි බන්ධුපීඩාවද වෙයි—දාසගණයෙන් මිත්‍රගණය ඇතිකල්හි ධෛය්‍ය්‍යද-දාසගණයෙන් දාසගණය ඇතිකල්හි අධිකගුණ හෙවත් සියලු ලාභද—දාසගණයෙන් උදාසීනය ඇතිකල්හි හානිද-දාසගණයෙන් ශත්‍රුගණය ඇතිකල්හි ශොකද වෙයි—උදාසීනයෙන් මිත්‍රගණය ඇතිකල්හි දුකද-උදාසීනයෙන් දාසගණය ඇතිකල්හි සැපද—උදාසීනයෙන් උදාසීනය ඇතිකල්හි මඳක් ධෛය්‍ය්‍යද-උදාසීනයෙන් ශත්‍රුගණය ඇතිකල්හි සියදනන් හා වෛරද වෙයි-ශත්‍රුගණයෙන් මිත්‍රගණය ඇතිකල්හි පිතෙනානමාදදියද—ශත්‍රුගණයෙන් භෘත්‍යගණය ඇතිකල්හි භාය්‍ය්‍යාව නැසීමද-ශත්‍රුගණයෙන් උදාසීනය ඇතිකල්හි දෞම්නසද හෙවත් සියකුල නැසීමද-ශත්‍රුගණයෙන් ශත්‍රුගණය ඇතිකල්හි කාව්‍යනායකයාහට විනාශයද වෙයි, එමන්සා ඉෂ්ටඵල සඳහා කාව්‍යබන්ධනාදිය කරණ තැනැත්තන් විසින් ශත්‍රුමිත්‍රාදිය දැන ඉෂ්ටසූචක ගණයක් ආදියෙහි යොදා, එය රක්ෂාකරණ පිණිස අනතුරුව ඊට පැහෙන ගණ යෙදිය යුතුයි.

එ ක ය ම ර ජ අ ණ න ළ අං අවාක ර
උ ප බ ග හා නර නම් තිරි වේ අම ර
සුරකර පෙර පසැ වැඩදේ අවාක ර
නසා සුබ සියල් නරකුරු මැදුම් ස ර A

ඉති ඉටුනිටු වණ.

---

මෙසේ ගණශුඩිය දැනගත් කිවිහු විසින් අක්ෂර ශුඩිද අවශ්‍ය යෙන්ම දැනගතයුතු හෙයින් "එකයමරජ" යනාදි කව කීහු.

A එකයමරජඅණනළඅං, එ, ක, ය, ම, ර, ජ, අ, ණ, න, ළ, අං, යන මේඅක්ෂර; අවාකාර, අපායාක්ෂරනම්වේ; උපබගහා, උ, ප, බ, ග, හ, යන මේඅක්ෂර; නරනම්, මනුෂ්‍යාක්ෂරනම් වේ; ඉතිරි, අතිරික්තවූ අක්ෂර; අමර වේ, දිව්‍යාක්ෂරනම්වේ; පෙර, (පද්‍යයාගේ) පූර්වයෙහිද; පසැ, (අභිධාන) පාශ්චයෙහිද (පිහිටුවා කළහොත්;) සුරකර, දිව්‍යඅක්ෂර; වැඩදේ, අභිවෘද්ධිදායක කෙරෙයි; අවාකර, අපායාක්ෂර; සියල්සුබ, සකලශුභය; නසා, නාශ කෙරෙයි; නර කුරු, මනුෂ්‍යාක්ෂර; මැදුම්සර, මධ්‍යම සාරයි-ඉටු නිටු වණ, ඉෂ්ටා නිෂ්ට වර්ණයෝ; ඉති, මෙසේයි.

"එකයමරජඅණනළඅං" යන මේ අකුරු අපායාක්ෂරයි, "උ ප බ ග හ" යන මේ අකුරු මනුෂ්‍යාක්ෂරයි, ඉතිරි අනික් "ඉ ඔ ච ඩ ත ද ල ව ස" යන මේ අකුරු දිව්‍යාක්ෂරයි, මෙකී අකුරු පද්‍යාරම්භ යෙහිද, ස්තුතිනායක කාව්‍යකර්තෘදෙදෙනාගේ නමට දෙපැත් තෙහිද, පිහිටුවා කළහොත් එයින් සුරකුරු සියලු යහපත දීමද, අවාකුරු සියලු සුබනැසීමද, නරකුරු මධ්‍යම ඵලවිපාක දීමද සිදු කෙරෙයි.

මෙයින් පණකුරුපස ලක්ෂණවශයෙන්ම ගෙණ මෙසේ සංක්ෂිප්ත වී නමුත්-ලුහුගුරුබෙයින් දුසයක්වනබැවින් මෙකී වර්ණයන්ගේ විභාගය මෙසේ දතයුතු:—

| අපායාක්ෂර 18. | මනුෂ්‍යාක්ෂර 6. | දිව්‍යාක්ෂර 11. |
| --- | --- | --- |
| එ-ඒ, ක, ය, ම, ර, ජ, අ-ආ, ණ, න, ළ, අං, | උ-ඌ, ප, බ, ග, හ, | ඉ-ඊ, ඔ-ඕ, ච, ඩ, ත, ද, ල, ව, ස, |
| සියල්සුබනසා. | මැදුම්සර. | වැඩදේ. |

මෙසේ මෙකී අක්ෂරයන් සාමාන්‍යවශයෙන් කොටස් තුණකට බෙදා එකී විපාක ත්‍රිවිධාකාරයෙන් සඞ්ගෘහිතයි. එබැවින් අක්ෂර යන් සම්බන්ධ විශේෂ විභාග විපාක විස්තර වශයෙන් ග්‍රන්ථාන්ත රයන්හි ප්‍රකාශිත ක්‍රමයත් මෙහිදි අවබොධ කටයුතුබැව් දතයුතු.

"අක්ෂරෙ පරිශුද්ධෙ තු නායකො භූතිමාවජති" යනුයෙයින් එසේ අක්ෂර පරිශුද්ධිය ඇතිකල්හි කාව්‍යනායකතෙම සම්පතට පැමිණේයයි පූර්ව කවීන් විසින් කියනලදී.

අවර්ණාත් සම්පත්තිං ඊවර්ති,ච මුදිවර්ණාද්ධනශතා-
න්‍යුවර්ණාදබ්ධතිඃ සරභසමාවර්ණාත් විරහිතාත්,
තථා හ්‍යචඃ සෞඛ්‍යං, ඩඤණරහිතාදක්ෂරගණාත්
පදාදෞවින්‍යස්තාත් හරබහලපූර්වෛර්විරහිතාත්.

අවර්ණාත්, අවර්ණය හෙතුකොටගෙණ; සම්පත්තිඃ භවති, සම්පතක්වේ; මුද්ච, සතුටක්දවෙයි; ඉවර්ණාත්, ඉවර්ණයෙන්; ධනශතානි, සියගණින් වස්තු ඇතිවෙත්; උවර්ණාත්, උවර්ණයෙන්; අබ්ධතිඃ, අප්‍රසිද්ධයවේ; ඍවර්ණාත්විරහිතාත්, ඍවර්ණය වර්ජිතකිරීමෙන්; සරභසං, සහොත්සාහයවේ; තථාහි, ඒ එසේමැයි; එචඃ, එච්සමාහාරයෙන්ද; ඩඤණරහිතාත්, ඩඤණ යනමොවුන් වර්ජිතකොට ඇත්තාවූද; හරබහලපූර්වෛඃ, හරබහල යන අක්ෂර පූර්වකොට ඇත්තවූන් විසින්; විරහිතාත්, තොරකරණලද්දාවූද; පදාදෞ, ශ්ලොකපාදාදියෙහි; වින්‍යස්තාත්, පිහිටුවනලද්දාවූ අක්ෂර ගණාත්, අක්ෂර සමූහයෙන්; සෞඛ්‍යං, සැප බව වේ.

ව්‍යඤ්ජනාක්ෂරයන්ගේ ඉෂ්ටානිෂ්ට ඵලනම්:—

කඃ ඛෝ ගො ඝශ්ච ලක්ෂ්මීං විතරති වියශො ඞස්තථා චස්සුඛං ජඃ
ප්‍රීතිං ජෝ මිත්‍රලාභං භයමරණකරෞ ඣඤෞ ටඨෞ ඛෙදදුඃඛෙ,
ඩඃ ශොභාං ඪො විශොභාං භ්‍රමණමථච ණස්තනස්තු ඛං ථස්තු යුද්ධං
දෙ, ධඃ සෞඛ්‍යං මුදං නඃ සුඛභයමරණක්ලෙශදුඃඛං පවර්ගඃ.

කඃ, කකාරයද; ඛඃ, ඛකාරයද; ගඃ, ගකාරයද; ඝඃ, ඝකාරයද; ලක්ෂ්මීංවිතරති, ශ්‍රීපතුරුවයි; ඞඃ, ඞකාරය; වියශඃ, යශොපරිහානියවේ; තථා, එසේම; චඃ, චකාරය; සුඛඃ, සැප උපදවයි; ජඃ, ජකාරය; ප්‍රීතිං, ප්‍රීති උපදවයි; ජඃ, ජකාරය; මිත්‍රලාභං, මිත්‍රලාභය කෙරෙයි; ඣඤෞ, ඣකාරඤකාරදෙක; භය මරණකරෞ, භය මරණ කරන්නාහ; ටඨෞ, ටකාර ඨකාරදෙක; ඛෙදදුඃඛෙ, කනගාටුහා දුක් උපදවත්; ඩඃ, ඩකාරය; ශොභාං, දීප්ති උපදවයි; ඪඃ, ඪකාරය; විශොභාං, පහවූ දීප්ති උපදවයි; අථ, නැවත; ණඃච, ණකාරය වූකලි; භ්‍රමණං. උමතුකෙරෙයි; තඃතු, තකාරයවනාහි; ඛං, සැප උපදවයි; ථඃතු, ථකාරය වනාහි; යුද්ධං, සටන් උපදවයි; දඃ, දකාරයද; ධඃ, ධකාරයද; සෞඛ්‍යං, සැප උපදවයි; නඃ, නකාරය; මුදං, සතුටු උපදවයි; පවර්ගඃ, පවර්ගය; සුඛභයමරණ ක්ලෙශදුඃඛං, සැප බිය මරණ කෙලෙස් දුක් උපදවයි,

අ ඔ ත ල ඇ වග වණ සිරි පිළි වෙළි — නා
යොදා නකුල් මිහු මහවත් වග සපු — නා
තුරඟ බිලි පුටු සරහත් දුනැ කෙමෙ — නා
පෙර පසැ යොන් බදු නම යෝනව සොබ — නා B.

ඉති ඉටුනිටු යොන්.

---

යො ලක්ෂ්මීං රසතු දුඃඛං ව්‍යසනමථ ලවෞ ශඃ සුඛං ෂස්තු භේදං සඃ සෞඛ්‍යං හස්තු භේදං විලයමපිච ළඃ ක්ෂඃ සමෘද්ධිං කරෝති, සංයුක්තං චෙහ නස්‍යාත් සුඛහරණපටු වර්ණවින්‍යාසයොගඃ පද්‍යාදෞ ගද්‍යවක්ත්‍රෙ වචසිච සකලෙ ප්‍රාකෘතාදෞ සමෙං 'යම්.

යඃ, යකාරය; ලක්ෂ්මීං, ශ්‍රීපතුරුවයි; රඃතු, රකාරය විනාශී; දුඃඛං, දුක ඇතිකෙරෙයි; අථ, ඉක්බිත්තෙන්; ලවෞ, ලකාරවකාර දෙක; ව්‍යසනං, ව්‍යසනකෙරෙත්; ශඃ, ශකාරය; සුඛං, සැපකෙරෙයි; ෂඃතු, ෂකාරයවිනාශී; භේදං, දෙම්නස් උපදවයි; සඃ, සකාරය; සෞඛ්‍යං, සැප උපදවයි; හඃතු, හකාරය විනාශී; භේදං, දෙම්නස් උපදවයි; ළඃ, ළකාරය; විලයංඅපි, ක්ෂයරෝගද කෙරෙයි; ක්ෂඃ, ක්ෂකාරය; සමෘද්ධිං කරෝති, අධිකසම්පත්තියක් කෙරෙයි; ඉහ, මෙහි; සංයුක්තංච, සංයොගාක්ෂරද; නස්‍යාත්, ආදියෙහි නොයොදන්නේය; සුඛහරණපටුඃ, සැප හැරගැන්මෙහි දක්ෂවූ; අයම් වර්ණවින්‍යාසයොගඃ, මේ අක්ෂරස්ථාපනයොගයතෙම; (නොහොත්) මේ අකුරු පිහිටුවීම; පද්‍යාදෞ, පද්‍යයන්ගේ ආදියෙහිද; ගද්‍යවක්ත්‍රෙ, ගද්‍යමුඛයෙහිද; සකලෙ වචසිච, සියලු වචනයෙහිද; ප්‍රාකෘතාදෞ, ප්‍රාකෘතාදියෙහිද; සමඃ, සමයි.

B. අ ඔ ත ල ඇ වග, 'අ ඔ ත ල' යනාදි වර්ගයෙහි, වණ, වර්ණයන්; සිරිපිළිවෙළිනා, සිරියාවූ පටිපාටියෙන්; නකුල්, මුගටියා; මිහු, මහිෂයා; මහවත්, බකමූහුණුයා; වග, ව්‍යාඝ්‍රයා; සපුනා, සර්පයා යන මොවුන්ද; තුරඟ, අශ්වයා; බිලිපුටු, කාකයා; සරහත්, මෘගයා යන මොවුන්ද; කෙමෙනා, ක්‍රමයෙන්; යොදා, යොජිතකොට; දුනැ, ජානනය කොට; නමයෝනව, නාමයොනියට; සොබනා, ශොභනවූ; යොන්, යොනිය; පෙර, පද්‍යයාගේ පූර්වයෙහිද; පසැ, නාමයට උභයපාර්ශ්වයෙහිද; බඳු, බන්ධනය කරණු—ඉටුනිටු යොන්, ඉෂ්ටානිෂ්ටයොනි; ඉති, මෙසේයි.

මෙහි 'අ ඔ ත ල' 'ආ ඕ ද ව' යනාදි වර්ග අටෙහි අක්ෂර පිහිටියාවූ පිළිවෙළින් මුගටි ආදී අෂ්ටයොනිය යොදා සතුරු මිතුරු යොනි ක්‍රමයෙන් පරීක්ෂාකොට දුන නාම යොනියට ශොභනවූ යොනිය පද්‍යයාගේ මුලද නාමයාගේ දෙපැත්තෙහිද යොදා බන්ධනය කරණු.

හෙලදිව් අබිදැනවතෙගි.

1 අ ඔ ත ල අ ඹ කෙමෙනා ෙම අට ගැ ණ
අබිදන් පසෙගි යොන් සිටුවා පිළිවෙළි න
කවිනා අබිදනට පසැ සිටි යොන් ඇඳි න
කුනුනා යොනුත් දැනැඳින කිවොත් සොඳි න

2 හකුල්, මහිස, මහවත්, වග, නා, තුර ඟ
බිලිපුටු, මිග, යන යොන් අට කෙමෙන් ම ග
මිතුරු පසමිතුරු යොන් ලෙව් පෙණෙන ර ඟ
දැන පවසන් අමිතුරු යොන් බලා ස ග

3 එක, දෙක, තුණ, සතර, කෙමෙනා අවට ගැ ණ
පසට පසට ගැණ දුටු අමිතුරු යොනි න
මරණ, සෝක, ලෙඩ, වැසනය, දිලිඳු, දෙ න
අනිටු මෙ යොන් දැනැඳින කව් බඳිනු ගෙ ණ

4 එක, පස, මරණ, දෙක, සය, සෝක දෙති, ද නු
තුණ, සත, රෝග, සිව්, අට, වැදි, පමුණ නු
දැන නියවතුනී අමිතුරු යොන් නොම රැග නු
මෙසින් පිටත අමිතුරු යොන් නොම සොය නු

මෙය මේ 'අඹතල' චක්‍රයෙන් සුවසේ දතහැකි වෙයි.




මේ අෂටයොනියෙහි පලමුවැන්න පස්වැන්නහා අන්‍යොන්‍ය ප්‍රතිවිරුඬයි, එසේම දෙවැන්න සවැන්න සමගද, තුන්වැන්න සත්වැන්න සමගද, සිව්වැන්න අටවැන්න සමගද, අන්‍යොන්‍ය ප්‍රතිවිරුඬයි, මෙසේ ඒ ඒ යොනීන්ගේ පිළිවෙළින් පසින් පසට ඇති මෙකී සතුරුයොනි හැර සෙසු සියල්ල ඔවුනොවුනට සතුරු

පදි දුබා මැද සසඳ සඳ සමස් පස්
විබත් කරණු විදදෙ නො රිසිත් රුසි විසිදත්. A

---

නොවන බව දැන ඊට අයත් අකුරුගෙණ පද්‍යාරම්භයෙහිද, කාව්‍යනායක කාව්‍යකර්තෘනාමවිපාකවයෙහිද යොදා කාව්‍ය බන්ධනය කටයුතු.

මෙසේ ඉෂ්ටානිෂ්ට ගණ වර්ණ යොනි දක්වූ ඉක්බිති ඉෂ්ටානිෂ්ට ශබ්දයනුත් දක්විම් අවශ්‍යක නමුත් ග්‍රන්ථය මහත්වන බැවින් නොදක්වනලදි, එහෙයින් එය කවිකණ්ඨපාශ, ලකුණුසර, හෙලදිව්අබිදානවත ආදියෙන් දතයුතු.

A පදිදුබාමැද, පද්‍යයාගේ විභාගමධ්‍යයෙහි, සසද, සංසඳනවූ, සද, සන්ධිද, සමස්, සමාසද, පස්, ප්‍රත්‍යයද, විබත්, විභක්තිද, කරණු, කිරීම, රුසි විසිදත්, සෘෂිවචන දත්තාවූ, විදදෙ, විදග්ධයෝ, නොරිසිත්, අභිමත නොවෙත් නොහොත් රුචි නො කෙරෙත්.

පද්‍යයාගේ විභාගමධ්‍යයෙහි එකට ගළපා සන්ධිද සමාසද ප්‍රත්‍යයද විභක්තිද කිරීම සෘෂි වචන දන්නා පණ්ඩිතයන්ට අභිමත නොවේ යනු භාවයි.

මෙහි පද්‍ය නම්.

"ගද්‍යං පද්‍යං ච මිශ්‍රං ච තත් ත්‍රිධෛව ව්‍යවස්ථිතම්
පද්‍යං චතුෂ්පදී තච්ච වෘත්තං ජාති රිති ද්විධා."

තත්, ඒ කාව්‍යයතෙම, ගද්‍යං, කෙවලගද්‍යාත්මකය, පද්‍යං, කෙවලපද්‍යාත්මකය, මිශ්‍රංච, ගද්‍යපද්‍ය මිශ්‍රාත්මක යයි, ත්‍රිධෛව, තුන් පරිද්දෙකින්ම, ව්‍යවස්ථිතම්, පිහිටියේයයි දතයුත්තේය (එහි), චතුෂ්පදී, චතුෂ්පාදකෙණෙකුන්ගේ සමාහාරයම, පද්‍යං, පද්‍ය නම් වන්නේය, තච්ච, ඒ පද්‍යයද, වෘත්තං, වෘත්තය, ජාතිරිති, ජාති යයිද කියා, ද්විධා, ද්විප්‍රකාරවන්නේය:—

ඒ කාව්‍යයතෙම හුදෙක් ගද්‍යම ආත්මකොට ඇත්තේය, හුදෙක් පද්‍යම ආත්මකොට ඇත්තේය, ගද්‍ය පද්‍ය මිශ්‍රබව ආත්මකොට ඇත්තේයයි කියා තුන්පරිද්දෙකින්ම පිහිටියේය, එහි සතරපදකෙණෙකුන්ගේ එකතුකිරීම පද්‍යනම් වන්නේය, ඒ පද්‍යයද වෘත්ත පද්‍යය ජාතිපද්‍යයයි කියා දෙයාකාරයකි-මෙසේ පද්‍යය චතුෂ්පාදාත්මකවූ කල විභාගමධ්‍ය නම්—දෙවැනි පාදයාගේ අන්තයටද තුන්වැනි පාදයාගේ ආදියටද අතරයි, මෙහිලා හෙවත් දෙවැනි පාදයාගේ අන්තය හා තුන්වැනි පාදයාගේ ආදියත් එකට ගළපා සන්ධියක් හෝ සමාසයක් හෝ ප්‍රත්‍යයයක් හෝ විභක්තියක් හෝ කිරීමට පණ්ඩිතයෝ කැමැති නොවෙත් යනු නියමයි, මෙකී නියමය සිංහලට පමණක් නොව පාලි සංස්කෘත දෙකටත් මෙසේමැයි, පාලිව්‍යාකරණ උගන්වන්නන් විසින් කාලව්‍යවධානය ඇති

කල්හි හෙවත් කාලයෙන් අතරක් ඇති කල්හි සන්ධි නොවන ලෙස පෙන්වා තිබෙන්නේ මෙහි විභාගමධ්‍යවූ ස්ථානයයි, එහි වූකලී "පමාදමනුයුඤ්ජන්ති" යනාදි මේ ගාථාවෙහි "ජනා=අප්පමාදං" කියාම වනුම්ස "ජනප්පමාදං"යී සන්ධි නො වන බව දක්වයි.

"පමාදමනුයුඤ්ජන්ති බාලා දුම්මෙධිනො ජනා-
අප්පමාදඤ්ච මෙධාවී ධනං සෙට්ඨං'ව රක්ඛති."

යන මෙහි "ජනා"යන දෙවැනි පාදයාගේ අන්තයහා "අප්පමාදං"යනාදි තුන්වැනි පාදයාගේ ආදියත් එකව සන්ධි නොවේ, ජනා' යන තන්හි නකාරස්ථ ආකාරය පහව නකාරය හල්වූ විට 'අප්පමාදං'යනාදි තන්හි අකාරයක් පරව තිබෙනා බැවින් "සරා සරෙ ලොපං" යන සූත්‍රයෙන් පූර්වස්වරය ලොප් කොට "නයෙ පරං යුත්තෙ" යන සූත්‍රයෙන් හල්නකාරය අකාරයට පමුණුවා 'ජනප්පමාදං' කියා සංහිතා කටයුතුයි, නමුත් පද්‍යයාගේ විභාගමධ්‍යයෙහි කාලයෙන් අතරක් ඇති බැවින් එසේ නො වේ. *

තවද මෙහි විභාගසඞ්ගතදෝෂය ලා නිදර්ශනයක් දක්වා නැති බැවින් ආධුනික ජනයන්ගේ අවබොධය පහසු නොවේ, එහෙයින් අපවිසින් දක්වනලද මේ නිදර්ශනයන් බලා ඒ පද්‍යයාගේ විභාගසඞ්ගතදෝෂය අවබොධ කරණු ලැබේවා.

මුදලිඳුනී විස්ස ල්
යව්දිව් ලෙව් මුඳුන් "කු ල්-
ලෙව්" පත් නැණිනුඳු ල්
දිලේවා පුන්සඳසෙ සුවිඳු ල්-සන්ධි.

පබලු වන් තොල ඹු ල්
මුතු වන් දසන් "නිලුපු ල්-
ඇසිඹ" දුක මනක ල්
කෙලේ එසලෙලු නොපමණින් ලො ල්-සමාස.

---

* කුසජාතක කාව්‍යයෙහි:—

යසසින් ලොවැ පසි දු—"අත්තනායක මැති ස දු-
සුරතුර" වැළඳි මු දු—සුපුල්ලෙලරන් ලතාවක් බ දු

යන මෙහි-අත්තනායක මැතිසඳු වූයේද එම සුරතුර වූයේද= අත්තනායකමැතිසඳුසුරතුර-කියා විශෙෂණ සමාසව තිබේ.
තවද-ගුත්තිලකාව්‍යයෙහි:—

බව රැ කෙලෙස්ස ද—කිරණින් මුහුලු "බඹ ස ද-
පියුම්වන" එමස ද—දෙසුම් රිවිහෙන් පුබුදුවා සො ද

මෙහිදු "බඹසඳපියුම්වන"යනු විශෙෂණ සමාසබව පෙණේ, මේ තැන් සමාසිත යයි ඇතැම් පණ්ඩිතයන්ගේ කල්පනාවක් වූ නමුත් සමාසිත නො වූ සේද සිතිය යුතුව තිබේ.

අතීත් පෙදෙන් හොත පවසත පුන විපුවා
පුනරුත් අරුත් ඒ දනු යළු සද ද පුනරුත් සේ A.
වණනව මෙ දලද දලදෙතුයෙ දලද නම්
සොව්නොබල තුනු තුනුවක සිඟුකෙළෙ'ත' ඟ කරු නිගා B.

---

විස ලිය වැළඳි ස — රු
මිහුරු පලඇති "අඹතු — රූ-
වත්" දුදන පිරි වැ — රු
සුදන තුළ ගුණ දුවති වනතු — රු-ප්‍රත්‍යය.
බඳමින් නිල් සරල් වර — ලු
නඟිමින් සදලව නිති "කො — ල-
නා" අඟනන් දුක මනක — ල
කවුරුන් නත් නො වෙද සුඟු — ල-විභක්ති.

මෙහි රේඛාවකින් බැඳි තිබෙන තන්හි සන්ධි සමාස ප්‍රත්‍යය විභක්ති යන මෙයින් පද්‍යයාගේ විභාගසංගතදෝෂය ලා නිදර්ශන කරණ ලදී.

## පෞනරුක්තය හෙවත් එකාර්ථය.

A. අතීත් හොත, අර්ථයෙන් හෝ; පෙදෙන් (හොත,) පදයෙන් හෝ; විපුවං, කථිතදෙය; පුන, නැවත; පවසත, ප්‍රකාශකල කල්හි; ඒ, එය; පුනරුත්අරුත්, පෞනරුක්තාර්ථයයි; දනු, ජනනය කරණු; යළු, නැවත; සදද, ශබ්දයද; පුනරුත්සේ, පෞනරුක්ත පරිදී; (දනු, ජනනය කරණු;)—

අර්ථයෙන් වත් පදයෙන් වත් පළමු ප්‍රකාශ කළ ශබ්දාර්ථස්වරූපය නැවත එම ක්‍රියායොගයෙහිදී අර්ථවශයෙන් හෝ පදවශයෙන් හෝ ප්‍රකාශ කෙළේනම් ඒ පෞනරුක්තාර්ථයයි අවබෝධ කරණු. * නැවත ශබ්ද පෞනරුක්තාර්ථ පරිදිද අවබෝධ කරණු යනු භාවයි.

### උදාහරණ.

B මෙ දලද, මේ ජලදායකතෙම; වණනව, විරහිණින්ව; දල දෙතුයේ, දෑහ දෑනය කරණුයේ; දලද නම්, දලද නම්වෙයි;-අනඝ, අනඝතෙම; සොව්න්, ශොකයෙන්; ඔබල, දුව්වලවූ; තුනුවක, තන්වඞ්ගියගේ නොහොත් කෘශාඞ්ග ස්ත්‍රියගේ (හීන්දෑරි හැහැණියගේ); තුනු, ශරීරය; නිගාකරු, නිග්‍රහ කොට; සිඟු කෙළේ; කෘශ කෙළේයි.

---

* පළකළ අරුත් හෝ පෙද පැවසුවොත් ය — ලු
පුනරුත් දොස ඇත කිව් පොරණැදුරු කැ — ල
කිවහොත් එලෙස කව් කතුනාහට පුව — ල
නොයෙකුත් දොස වෙති නොකියත් මින් පහ — ලු

මෙන් පෞනරුක්තපරිදි කෙසේදයත්? ප්‍රථමාර්ථයෙහි "දලද, දල දෙනුයේ දලද" යන මෙහි "දලද" යන්නෙන් හැඟෙන අර්ථයත් "දලදෙනුයේ" යන අර්ථ ක්‍රියාපද යෙනුත් හැඟෙන හෙයින් එය අර්ථපෞනරුක්තයට නිදසුන්යයි කියති. "දලද" යන්න හා 'දල ද' යන්නත් එකම අර්ථ ඇති එකම ශබ්දබැවින් පද (ශබ්ද) පෞනරුක්තයි-අනන්‍යාර්ථයෙහි "ඔබලතුනු තුනුවහසිඟුකෙලෙ" යන මෙහි "ඔබල තුනුවහ" යන්නෙන් හඟවන දුර්වල අල්ප සූක්ෂ්ම මාර්ථයත්ම "සිඟුකෙළේ" යන ක්‍රියාපදයෙනුත් හඟවන හෙයින් (ශබ්දභින්න නමුත්) අර්ථයෙන් එකක්ම බැවින් අර්ථපෞනරුක්තයි.

මෙහි පෞනරුක්තාර්ථය—අර්ථපෞනරුක්ත පදපෞනරුක්ත ශබ්දපෞනරුක්තයයි තුන්වැදෑරුම් කොට උගන්වා තිබෙනසේ හැඟෙයි, නමුත් මාගධ සංස්කෘත දෙක්හි විවිධ පෞනරුක්තාර්ථය හැර අන්පරිද්දක් උගන්වා නො මැතියි, * එහෙයින් තුන් පරිදිවූ පෞනරුක්තාර්ථයට උදාහරණ වෙන් කොට අර්ථව්‍යක්ති ක්‍රියාව පිණිස අපි නො වෙහෙසෙමු.

---

* සුබොධාලඞ්කාරයෙහි.

සද්දතො අත්ථතො වුත්තං යත්ථ භියොපි වුච්චති,
තමෙකත්ථං යථා භාති '**වාරිදො වාරිදො**' අයං.

සද්දතො,වාචක ශබ්දහෙයින්ද; අත්ථතො, අභිධෙය(වාච්‍යාර්ථ) හෙයින්ද; වුත්තං, ප්‍රයොගකරණ (කියන)ලද පදාර්ථයෙක්; යත්ථ; යම් වාක්‍යයෙක්හි; භියොපි, නැවතත්; වුච්චති, කියනුලැබේද; තං, ඒ වාක්‍යය; එකත්ථං, එකාර්ථ නම් වාක්‍යදොෂය වන්නේයි, යථා, යේ මෙසේයි; වාරිදො, ජලදානයකරන්නාවූ; අයං වාරිදො, මේ මේඝයතෙම; භාති, දිලිහෙයි-මෙහි "සම්පත්තිසාධක ජලය දෙන්නාවූ" යනාදි විශෙෂාපෙක්ෂාවක් නැතුව ජලදනමාත්‍රයක්ම කියන හෙයින් ශබ්දවශයෙන් එකාර්ථත්වයට උදාහරණයි.

තිත්ථියඞ්කුරබීජානි ජහං දිට්ඨිගතානිහ,
'**පසාදෙති පසන්නො**' සො මහාමුනි මහාජනෙ.

සො මහාමුනි, ඒ සම්‍යක් සම්බුද්ධතෙමේ; තිත්ථියඞ්කුර බීජානි, තීර්ථකසඞ්ඛ්‍යාත අඞ්කුරයන්ට උත්පත්තිකාරණවූ; දිට්ඨිගතානි, ශාශ්වත වාදාදි භෙදයෙන් භින්නාවූ දෙසැට මිථ්‍යාදෘෂ්ටීන්; ජහං, දුරුකරණසේක්; ඉහ, මේ සත්වලොකයෙහි; පසන්නො. තමන්වහන්සේ කෙරෙහි පහන්; මහාජනෙ, මහාජනයන්; පසාදෙති, පහදවනසේකි-මෙහි 'පසන්න'ශබ්දයෙන් කීවාවූ ප්‍රසාදසඞ්ඛ්‍යාත අර්ථය 'පසාදෙති' යන ක්‍රියාපදයෙනුත් කීහෙයින් ශබ්දභින්න නමුත් අර්ථය එකක්නුයි අර්ථහෙයින් එකාර්ථත්වයට උදාහරණයි.

මෙකී දෝෂය ආචාර්‍ය්‍යදණ්ඩින් විසින් මෙසේ දක්වනලදී- කාව්‍යාදර්ශයෙහි-

3, 135. අවිශෙෂෙණ පූර්‍වෝක්තං යදි භූයො'පි කීර්‍ත්‍යතෙ
අර්‍ථතඃ ශබ්දතො වා'පි තදෙකාර්‍ථං මතං යථා

පූර්‍වෝක්තම්, පළමුකොට කියනලද ශබ්දාර්‍ථස්වරූපයතෙම; අවිශෙෂෙණ, අභෙදයෙන් හෙවත් විශෙෂාපෙක්‍ෂාවක් නැතිව; අර්‍ථතඃ, අර්‍ථහෙයින්ද; ශබ්දතොංවාපි, ශබ්දහෙයින්ද; භූයොපි, නැවතද; යදි, ඉදින්; කීර්‍ත්‍යතෙ, කියනු ලැබේද; තත්, එය; එකාර්‍ථං, එකාර්‍ථයයි; මතම්, දන්නාලදී; යථා, ගේ මෙසේයි-

පළමුකොට කියනලද්දක් අර්‍ථයෙන් හෝ (යමකලක්‍ෂණයෙහි හැර අන්තැනක)ශබ්දයෙන් හෝ පසුව කිසිවෙනසක් නැතිව එකක්‍රියායොගයෙහිම කියනලද්දේනම් ඒ එකාර්‍ථය යනුභාවයි.

3, 136. උත්කාමුන්මනයන්ත්‍යෙතෙ බාලාං තදලකත්විෂඃ
අම්භොධරාස්තඩිත්වන්තො ගම්භීරාඃ ස්තනයිත්නවඃ

තඩිත්වන්තඃ, විද්‍යුත්යුක්තවූ; ගම්භීරාඃ, ගැඹුරු නාද ඇති; ස්තනයිත්නවඃ, ගුගුරන්නාවූ; තදලකත්විෂඃ, ඇගේ කියඹු පැහැඇති; එතෙ අම්භොධරාඃ, මේ මේඝයෝ; උත්කාං, (විරහයෙන්) උකටලීවූ; බාලාම්, බාලස්ත්‍රිය; උන්මනයන්ති, උකටලී කෙරෙත්-

මෙහි උත්කණ්ඨාපෙක්‍ෂාවක් ඇති කල්හි, උත්කාං-උන්මනයන්ති, යනු එකාර්‍ථයි-ගම්භීරාඃ-ස්තනයිත්නවඃ-යන මෙහිදු එකකින්ම ස්තනයිත්නු ඝොෂාගුගේ ප්‍රතිපාදනය හෙතුකොට ගෙණ විශෙෂ විවක්‍ෂාපෙක්‍ෂාවෙහිලා දෙකම එකාර්‍ථයි, හෙවත්-උත්කාං, උන්මනයන්ති, යනුද-අම්භොධරාඃ, තඩිත්වන්තඃ, ගම්භීරාඃ, ස්තනයිත්නවඃ, යනුද එකාර්‍ථබැවින් පුනරුක්තයි.

3. 137, අනුකම්පාද්‍යතිශයො යදි කශ්චිද් විවක්‍ෂ්‍යතෙ
න දොෂඃ පුනරුක්තෙ'පි ප්‍රත්‍යුතෙයමලඞ්ක්‍රියා.

යදි, ඉදින්; කශ්චිත්අනුකම්පාද්‍යතිශයඃ, කිසිඅනුකම්පාවිස්මයාදීන්ගේ උත්කර්‍ෂයෙක්; විවක්‍ෂ්‍යතෙ, ප්‍රකාශකරන්නට කැමැතිවනු ලැබේද (එකල්හි;) පුනරුක්තෙපි, පුනරුක්ත වාක්‍යයෙහිදු; දොෂඃ න, දොෂයෙක් නැත; ප්‍රත්‍යුත, එකොක්මතු; ඉයම්, මෝතොමෝ; අලඞ්ක්‍රියා, අලංකාරමැයි—ඉදින් කිසියම් අනුකම්පාවිස්මය විචාදීන්ගේ උත්කර්‍ෂයක් ප්‍රකාශකරණු ලැබේද එකල්හි පුනරුක්තවාක්‍යයෙහිදු දොෂයක් නොමැතියි, කාව්‍යශොභාධායකබව හෙයින් හෙද අලඞ්කාරමැයි යනු භාවයි—ඊටනිදර්ශන.

පද සඟින් හොත බෙදුමෙන් හොත අතින් හෝ
හුණු'නිටු'නැමි අරුත් එ විරුදු අරුත්දොස් නම්, A

දිවිරඟ විසකුණින් තොප කිත්නිළිය නස්නට
සොමිගුණ බමව හිමි නිති දසදසතැ කොදහැතිසේ. B

---

3, 138. හන්‍යතෙ සා වරාරොහා ස්මරෙණාකාණ්ඩවෛරිණා
හන්‍යතෙ චාරු සර්වාඞ්ගී හන්‍යතෙ මඤ්ජුභාෂිණී.

අකාණ්ඩවෛරිණා, නිෂ්කාරණවෛරීවූ; ස්මරෙණ, අනඞ්ගයා විසින්; වරාරොහා, උත්කෘෂ්ටාරොහ ඇති; සා, ඒ ස්ත්‍රීතොමෝ; හන්‍යතෙ, පහරණලැබෙයි; චාරුසර්වාඞ්ගී, මනොහරවූ සියලු ශරීරාවයවඇති; සා, හෝ තොමෝ; හන්‍යතෙ, පහරණලැබෙයි; මඤ්ජුභාෂිණී, මනොඥකොට බණින්නාවූ; සා, ඒ ස්ත්‍රීතොමෝ; හන්‍යතෙ, පහරණ ලැබේ.

මෙහි අනුකම්පා විෂය හෙයින් පුනරුක්තය අලඞ්කාරවත් මුත් දොෂකර නොවෙයි යනු භාවයි-එයින් කීහු.

"විස්මයෙ ච විවාදෙ ච කොපෙ දෛන්‍යෙ ච වාරණෙ
ප්‍රසාදෙ චෛව හර්ෂෙ ච ශොකෙ ච න විරුධ්‍යතෙ''යි.

---

### විරුද්ධාර්ථදොෂය.

A. පදසඟින් හොත, පදයන්ගේ සංසර්ගයෙන් හෝ; බෙදුමෙන් හොත, පදභෙදයෙන් හෝ; අතින් හෝ, අර්ථයෙන් හෝ; හුණු, ශ්‍රූයමානවූ; අනිටුනැමිඅරුත්, අනිෂ්ටවූද ග්‍රාම්‍යවූද අර්ථයක්වේනම්; එ, එය; විරුදු අරුත්දොස් නම්, විරුද්ධාර්ථ දොෂ නම් වේ.

පදයන්ගේ එකතුවීම් වශයෙන් හෝ පදබෙදීම් වශයෙන්හෝ අර්ථවශයෙන් හෝ අනිෂ්ටවූ ග්‍රාම්‍යවූ යම් අර්ථයක් අසන්නට ලැබේ නම් ඒ විරුද්ධාර්ථදොෂය නම් වේ-යනු භාවයි.

B. විසකුණින්, විචක්ෂණයන්ගේ; දිවිරඟ, ජිහ්වාග්‍රනැමැතිනාට්‍ය භූමියෙහි; තොප කිත්නිළිය, තොපගේ කීර්තිනැමැති නාටිකාස්ත්‍රිය; නස්නට, නාට්‍යකරන්නට; හිමි, ස්වාමිය; සොමිගුණ, සෞම්‍යගුණය; කොදහැතිසේ, කුන්දස්තබකයක්සේ; දසදසතැ, දශදිගන්තරයෙහි; නිති, නිරන්තරයෙන්; බමව, භ්‍රමණය කරව.

මෙහි 'විසකුණින්' යන්න විචක්ෂණාර්ථවූවත් විෂවාචී 'විස' ශබ්දය හා පූතිවාචී "කුණු" ශබ්දයත් එකතුවූ පදයක්සේ අනිෂ්ටාර්ථයක් ශ්‍රූයමාන (ඇසෙනු ලබන) හෙයින් පදසංසර්ගයෙන් වූ විරුද්ධාර්ථ දොෂයට උදාහරණයි-'නස්නට' යන්න 'නාට' නැටීම්හි

යන ධාතුවෙන් නිපන්නැහු කෙරෙන් "නව" යන සම්ප්‍රදාන විභක්තිය යොදා දක්වූ හෙයින් නැටිම පිණිස යන අර්ථ ඇත්තේ නමුත් "නැසීම පිණිස" යන අනිෂ්ටාර්ථයකුදු ශ්‍රූයමාන හෙයින් පදභෙද (විභක්තියොජනා)යෙන් වූ විරුද්ධාර්ථදොෂයට උදාහරණයි *-"සොම්ගුණබමව" යන්නෙහි අර්ථනම් සෞම්‍යගුණය භ්‍රමණය කරව යනුයි, කුඥාතබකයේ සෞම්‍යගුණය පතුරුව හෝ විස්තුරුව යනාදින් අර්ථවත් පදයක් කියයුතුව තිබියදී අනිෂ්ටාර්ථසූචක "බමව" යන්න කීහෙයින් එය (කෙවලවූ) අර්ථයෙන්වූ විරුද්ධාර්ථ දොෂයට උදාහරණයි.

මේ විරුද්ධාර්ථදොෂසම්භවය පිණිස ග්‍රාම්‍යාර්ථ සූචනත්වයත් හෙතුවක් කොට දක්වූ නමුත් මේ උදාහරණවලින් එසේ ග්‍රාම්‍යාර්ථ සූචනයෙන් විරුද්ධාර්ථවූවක් නොපෙණේ, එය නැණවත්තු විමසත්වා, නමුත් අන්‍යග්‍රන්ථවල නම් ග්‍රාම්‍යාර්ථයම බෙහෙවින් දක්වයි.

කාව්‍යාදර්ශයෙහි—

1, 63, කන්‍යෙ කාමයමානං මාං න ත්වං කාමයසෙ කථම්
ඉති ග්‍රාම්‍යො'යමර්ථාත්මා වෛරස්‍යායෙව කල්පතෙ.

කන්‍යෙ, කන්‍යාව; කාමයමානං, කැමැතිවන්නාවූ; මාං, මා; ත්වම්, තී; කථංනකාමයසෙ, කුමකැයිනොකැමැත්තෙහිදැයි; ඉති, මෙබඳුවූ; ග්‍රාම්‍යඃ, ග්‍රාම්‍යවූ; අයං අර්ථාත්මා, මේ (අර්ථයාගේ ප්‍රතිපාද්‍ය) වස්තුරූපයතෙම; වෛරස්‍යායෙව, වෛරස්‍යය පිණිසම; (හෙවත්) අමාධුර්‍ය්‍ය පිණිසම, කල්පතෙ, සමර්ථවන්නේයි.

"කන්‍යාව තී කැමතිවන්නාවූ මා තී කුමකින් නො කැමැත් තෙහි දැයි" යන මෙහි "කන්‍යෙ" යන සම්බොධනය දුහිත්‍රුස්ථාන යාගේම සිඬිය කෙරෙයි, නායිකාසම්බොධනයෙහි වනාහි "ප්‍රියෙ-සුන්දරි" යනාදි ප්‍රයෝගයම යහපති, එහෙයින් මෙහි අර්ථයාගේ ග්‍රාම්‍ය බවම වේ. ශබ්දයාගේ නොවෙයි.-යනු භාවයි.

---

* කව්සිළුමිණෙහි-ඉති කියා සහසොම් තසින් ඒ උතුමා මා,
කැඳු දූවහරණෙන් සරණ 'විසකුණු' බමුණන්.

ලකුණුසරෙහි-එබැවිනි දහැ දෙස් සුලකුණු කර බඳු පද
කර සුදු "විසකුණන්" හා පිරි මැද මැද නිතිසිතින්.

තිසරසන්දෙශයෙහි-නොහැර සතන් සිත තිසරණ ති ලකුණුය
දෙසැර ඔවුන් පවසන බස 'විසකුණු'ය.

කව්සිළුමිණෙහි-නටනොත මතඟනක පිළිබිඹු එපුරවෙරේ,
පිළිමිණිගෙ පිළිමල් 'නස්නා' කියලී දෙවසරන් කැන්.

මෙහිදූ අනිෂ්ටවූග්‍රාම්‍යවූ විරුද්ධාර්ථදොෂ ඇතිවියයුතුදැයි විමසත්වා.

ග්‍රාම්‍ය නොවන පක්‍ෂය දක්වන් නාහු.

1, 64, කාමං කන්‍දර්පචාණ්ඩාලො මයි වාමාක්‍ෂි නිර්‍දයඃ,
ත්වයි නිර්මත්සරො දිෂ්ට්‍යෙත්‍යග්‍රාම්‍යො'ර්ථො රසාවහඃ.

වාමාක්‍ෂි, මනොඥවූ කුටිලවූ හෝ ඇස්ඇත්තිය; කාමං, එකාන්තයෙන්ම; කන්‍දර්පචාණ්ඩාලඃ, අනඞ්ගනැමැති චාණ්ඩාලතෙම; මයි, මා කෙරෙහි; නිර්‍දයඃ, කරුණානැත්තේය; දිෂ්ට්‍යා, භාග්‍යය කාරණකොටගෙණ; ත්වයි, ති කෙරෙහි; නිර්මත්සරඃ, වෛරනැත්තේය(හෙවත්)රුචි ඇත්තේය; ඉති, මෙබඳුවූ; අග්‍රාම්‍යඃ, ග්‍රාම්‍යනුවූ; අර්ථඃ, අර්ථයතෙම; රසාවහඃ, [එකාන්ත මධුර බැවින්] රසඵල වත්තේය [ග්‍රාම්‍යනොවෙයි යනුභාවයි]—මෙහි "වාමාක්‍ෂි" යනු නායිකා සම්බොධනයි.

අර්ථයෙහි පමණක් නොව ශබ්දයෙහිදු ග්‍රාම්‍යබව දක්වන් නාහු.

1, 65, ශබ්දෙ'පිග්‍රාම්‍යතාස්ත්‍යෙව සා සභ්‍යෙතරකීර්තනාත්,
යථා යකාරාදි පදං රත්‍යුත්සවනිරූපණෙ.

ශබ්දෙපි, (හුදෙක් අර්ථයෙහි පමණක්නොව) ශබ්දයෙහිදු; ග්‍රාම්‍යතා, ග්‍රාම්‍යබව; අස්ත්‍යෙව, ඇත්තේමය; සා, ඒ ග්‍රාම්‍යතා තොමෝ; සභ්‍යෙතරකීර්තනාත්, අසභ්‍ය[ග්‍රාම්‍ය]වූ වචනකීමෙන් වේ; රත්‍යුත්සවනිරූපණෙ, සුරතියෙහි සන්තොෂ ප්‍රකාශකිරීමෙහි ලා; යකාරාදිපදං යථා, යකාරය ආදිකොටඇති පදය මෙනි.

උදාහරණ මෙසේයි.

1, 66, පදසන්‍ධානවෘත්ත්‍යා වා වාක්‍යාර්ථත්වෙන වා පුනඃ,
දුෂ්ප්‍රතීතිකරං ග්‍රාම්‍යං යථා යා භවතඃ ප්‍රියා.

පදසන්‍ධානවෘත්ත්‍යා වා, කිසි පදයන් දෙදෙනෙක්හුගේ ආනන්තර යහියෙන් ස්ථිතියහෙතුකොටගෙණ හෝ; පුනඃ, නැවත; වාක්‍යාර්ථත්වෙනවා, ක්‍රියාපද සහිතවූ පදසමූහයාගේ ක්‍රියාකාරකලක්‍ෂණවූ අර්ථත්වයෙන් හෝ; දුෂ්ප්‍රතිතිකරං, දුෂ්ටාර්ථාවගමය කරන් නාවූ වාක්‍යයතෙම; ග්‍රාම්‍යං, ග්‍රාම්‍යනම් වන්නේය; යථා, උදාහරණ මෙසේයි; යා භවතඃ ප්‍රියා, හෙමායා භවතඃ ප්‍රියාය–කථං යාභවතඃ ප්‍රියාය යනුයි—

මෙහි "යා" යන රූපයට ඉක්බිතිකොට ප්‍රයුක්තවූ "භවත්" ශබ්දය හෙතුකොටගෙණ මෛථුනවෘත්තලක්‍ෂණවූ දුෂ්ප්‍රතිතිය පදසන්‍ධාන ග්‍රාම්‍යනමැයි දතයුතු-පදසන්‍ධාන ග්‍රාම්‍යනම්-වෙන වෙනවූ පදයන් දෙදෙනෙකුන්ගේ සන්‍ධි එක්වූතැන දෙකින් මුසුව අනිෂ්ටවචනයක්සේ යහපත් අර්ථයක් ප්‍රකාශකරන් නාවූ වචනයක් ඇතිවීමයි-හෙම යාභවතඃ–කථං යාභවතඃ කියා–යාභ වත් ශබ්දයක් මෙන් ඇසෙනකල 'යභ මෛථුනෙ' යන ධාතුවෙන් සිඬවූභයි ඇසූවන්ට වැටහෙන හෙයින් අනිෂ්ටයි.

පෙර පිළිවෙළ සෙදී පසුපෙළෙද ඉකුත් වී නම්,
ඒ උපිළිවෙළ නම් දොස් පැවසූ පදිපඬුවෝ. a
සියහ පියතමවූ ගිරිඳූ සිරී විසිනට,
කසුන් කළදෙ මේවන් දෙවියෝ සෙතෙළවත්වා. b

---

වාක්‍යග්‍රාම්‍යපරිදි දක්වන් නාහු.

1, 67, පරං ප්‍රහෘත්‍ය විශ්‍රාන්තඃ පුරුෂො වීර්‍ය්‍යවානිති,
එවමාදි න ශංසන්ති මාර්ගයො රුභයොරපි.

වීර්‍ය්‍යවාන්, ශෞර්‍ය්‍යසම්පන්නවූ; පුරුෂඃ, පුරුෂතෙම; පරං, සතුරු; ප්‍රහෘත්‍ය, පැහැර; විශ්‍රාන්තඃ ඉති, වැළැක්කැ යනු කවිනු විසින් විවක්‍ෂිතවූ අර්‍ථය—වීර්‍ය්‍යවාන්, ශුක්‍ර අධිකකොට ඇති; පුරුෂඃ, පුරුෂතෙම; පරං, අන්‍යාර්‍ථයෙන්; ප්‍රහෘත්‍ය, මෛථුනධර්‍මය කොට; විශ්‍රාන්තඃ ඉති, වැළැක්කැ යනු මෙබඳුවූ අනික්අර්‍ථයකුදු පහළ වන හෙයින් මේ "වාක්‍යාර්‍ථග්‍රාම්‍ය" නමැයි දතයුතු—එවමාදි, මේ ආදිවූ ශබ්දග්‍රාම්‍යවූද අර්‍ථග්‍රාම්‍යවූද කාව්‍යය; උභයොරපි මාර්ගයොඃ, වෛදර්භ ගෞඩීය මාර්ගදෙක්හිම; න ශංසන්ති; ප්‍රශංසා නොකෙරෙත්.

මෙහි කිසියම් ශෞර්‍ය්‍යසම්පන්න පුරුෂයෙක්තෙම සතුරු පැහැර වැළැක්කැ යනු කවිහුගේ අර්‍ථයවේ—ශුක්‍ර අධිකකොට ඇති පුරුෂතෙම අන්‍යාර්‍ථයෙන් මෛථුනධර්‍මයකොට විඩාවට පැමිණියේයයි යන අනික් අර්‍ථයකුදු පහළවන හෙයින් මේ වාක්‍යාර්‍ථග්‍රාම්‍ය නමැයි දන්නේය–මේ ආදිවූ ශබ්දග්‍රාම්‍යවූද අර්‍ථග්‍රාම්‍යවූද කාව්‍යයට වෛදර්භ ගෞඩීය මාර්ගදෙක්හිම පණ්ඩිතයෝ ප්‍රශංසා නොකෙරෙත් යනු භාවයි.

උත්පරිපාටික දොෂය.

a පෙර, පූර්‍වයෙහි; සෙදී, යොජිතවූ; පිළිවෙළ, පරිපාටිය; පසුපෙළෙද, අපරපදයෙහි; ඉකුත්වීනම්, අතික්‍රාන්තවීනම්; ඒ උපිළිවෙළනම්දොස්, ඒ උත්පරිපාටික දොෂ නමැයි කියා; පදිපඬුවෝ, පද්‍යපණ්ඩිත වරහු, පැවසූ, ප්‍රකාශකළෝයි.

පූර්‍වයෙහි යොදනලද පරිපාටිය අපරපදයෙහි ඉක්මවූයේ නම් ඒ උත්පරිපාටික (අපක්‍රම) දොෂ නමැයි කියා පද්‍යපණ්ඩිතවරයෝ කීවාහුයි යනුභාවයි.

ඊට උදාහරණ මෙසේයි.

b ගිරිඳූ, පාර්‍වතියටද; සිරී, ශ්‍රීකාන්තාවටද; විසිනට, වාග්වනිතාවටද; සියහ, සතතයෙන්; පියතමවූ, වල්ලභවූ—කසුන්, කාඤ්චනයෙහිද; කළදෙ, කලධෞතයෙහිද; මේ, මෙඝයෙහිද;

වත්, වර්ණ ඇති, දෙවියෝ, දෙවතාවෝ, සෙතෙළුවත්වා, ශාන්ති දානය කෙරෙත්වා.

පාර්වතියටද; ශ්‍රීකාන්තාවටද; වාග්වනිතාවටද; (යනමේ දිව්‍ය ස්ත්‍රීන් තුන්දෙනාට) නිරන්තරයෙන් වල්ලභ(ස්වාමි)වූ-කාඤ්චන යෙන්ද; කලබෞතයෙනිද; මෙඝයෙහිද; වර්ණ ඇත්තාවූ දෙවතාවෝ නොහොත් බ්‍රහ්ම—ඊශ්වර—විෂ්ණු—යනමොහු (තොපට) ශාන්තිදානය කෙරෙත්වා යනුභාවයි.

උත්තපරිපාටිකනම් පිළිවෙළවරදවාකීමයි ඒ මෙසේයි.

| | | | | | |
|---|---|---|---|---|---|
| ගිරිඳු / හිම් / කඤුන්වන් | කියාද | සිරි–හිම් / කලදෞ / වන් | කියාද | විසි / හිම් / මේවන් | කියාද / යොදා / තිබේ. |
| ගිරිඳු / හිම් / කලදෞවන් | කියාද | සිරි / හිම් / මේවන් | කියාද | විසි / හිම් / කඤුන්වන් | කියාද / යෙදී / යුතු. |

උමාවගේ ස්වාමියා ඊශ්වරයායි; ශ්‍රීකාන්තාවගේ ස්වාමියා විෂ්ණුයි; සරස්වතියගේ ස්වාමියා මහාබ්‍රහ්මයායි—මෙසේ යෙදිම නොකොට පිළිවෙළවරදවා—උමාවට මහාබ්‍රහ්මයාද; ශ්‍රීකාන්තාවට ඊශ්වරයාද; සරස්වතිට විෂ්ණුද යොදා, බන්ධනය කළ බැවින් මේ උත්තපරිපාටිකදෝෂයයි.

ශ්‍රීදණ්ඩාචාරීන් විසිනුදු.

3, 144; උද්දෙශානුගුණො'ර්ථානාමනුද්දෙශො න චෙත් කෘතඃ,
අපක්‍රමාභිධානං තං දොෂමාචක්ෂතෙ බුධාඃ.

උද්දෙශානුගුණඃ, ප්‍රථමොපක්ෂෙපයාගේ ක්‍රමය අනුව වන්නාවූ; අර්ථානාම්, අර්ථයන්ගේ; අනුද්දෙශඃ, අනුකථනයතෙම; නචෙත් කෘතඃ, ඉදින් නොකරණලද්දේවී නම්; තං දොෂම්, ඒ දොෂය; බුධාඃ, පණ්ඩිතයෝ; අපක්‍රමාභිධානං, ක්‍රමලඞ්ඝනරූපත්වයෙන් අපක්‍රමනම්වෙයි; ආචක්ෂතෙ, කියත්.

ප්‍රථමපක්ෂයෙහි යොදනලද පරිපාටිය අනුවවන්නාවූ අර්ථයන්ගේ අනුකථනය දෙවැනි පක්ෂයෙහිදී නොකෙළේවී නම් ඒක්‍රමොල්ලඞ්ඝනය පණ්ඩිතයෝ අපක්‍රමදොෂයයි කියත් යනු භාවයි.

ඊට උදාහරණ මෙසේයි.

3, 145, ස්ථිති නිර්මාණ සංහාර හෙතවො ජගතාමමී,
ශම්භු නාරායණාම්භොජයොනයඃ පාලයන්තු වඃ.

ජගතාම්, ලෝවැස්සන්ගේ; ස්ථිති, ප්‍රබන්ධයෙන් වෘත්තිය; නිර්මාණ, උත්පාදනය; සංහාර, විනාශය; (යන මීට) හෙතවඃ,

ලේවන් සමුදුරෙන් උලැඟියෙ වරහ දෙරණත,
වියයුතු බැවින් මුලුසුන් සප්ලේ මෙ වේ නේදෙස්, e

කාරණයහයි; අපි, මේ කියනලදෑවූ; * ශම්භු, ඊශ්වරය; නාරායණ, විෂ්ණුය; අම්භොජයොනයඃ,බ්‍රහ්මය යන මොහු; වඃ, තොපඃ; පාලයන්තු, රක්ෂාකෙරෙත්වා;-මෙහි පළමුකොට දක්වනලද සෘෂ්ටියට කාරණවූයේ නාරායණය නිර්මාණයට කාරණවූයේ බ්‍රහ්මය සංහාරයට කාරණවූයේ ඊශ්වරය යනු ආගමය-එහෙයින් ප්‍රථමොද්දෙශයට අනුද්දෙශය හෝ අනුද්දෙශයට ප්‍රථමොද්දෙශය හෝ අනුගුණ නොවන හෙයින් මේ අපක්‍රම නම්-

මෙහි විභාග මෙසේ දතයුතුයි.

ලෝකයාගේ—

'පැවැත්ම—මැවීම—විනාශ' යන මෙහි කර්තෘවූ "ඊශ්වර—විෂ්ණු-බ්‍රහ්ම" යන මොහු-තොප රකිත්වායි කීකල ප්‍රථමොද්දෙශක්‍රමයට පසුව දක්වනලද උපන්‍යාසක්‍රමය අනුකූල නොවේ-

මෙහි "පැවැත්ම-මැවීම-විනාශ" යන පිළිවෙළේ හැටියට "විෂ්ණු—බ්‍රහ්ම—ඊශ්වර"තොප රකිත්වායි කියා අනුකූලව පිළිවෙළ නොවරදවා යෙදුවහොත් මෙකී දොෂය නොවේ.

නෙයදොෂය.

e වරහ, වරාහතෙම; ලේවන්සමුදුරෙන්, රුධිරවර්ණ සමුද්‍රයෙන්; දෙරණත, ධරණීය; උලැඟියෙ, උල්ලඞ්ඝිතකෙළේයි; මුලුසුන්, මූලොච්ජිනනාවූ; සප්ලේ, සර්පයින්ගේ රුධිරය; වියයුතු බැවින්, කියයුතු හෙයින්; මේ නේදෙස්වේ, මේ නෙයදොෂ නම්වේ.

මෙහි"වරාහරූපීවූ විෂ්ණුතෙම රත්වූ මුහුදින් පොළොව නැඟුවේය"යි කීකල ඇසූවන්ට කෙසේ රත්වූ බවක්දැයි නොහැඟේ-කාලකාවිහු විසින්"ඔහුගේ කුරයෙන් සුන් කළ නයින්ගේ ලේයෙන් රත්වූ"යයි ප්‍රතිපාදනය කොට හැඟවියයුතුව තිබියදී එය ප්‍රකාශ නොකළ හෙයින්(එකී පදයන් අධ්‍යාහාරාදියෙන් පමුණුවා අර්ථය අවබොධකටයුතු හෙයින්) මේ නෙයදොෂය වේ-පෙරවිෂ්ණුනු වරාහක විලාසයකින් ශ්‍රීකාන්තාවතිසා පොළොව උදුලේය යනු සිඬාන්තයි.

1, 74, මහීමහාවරාහෙණ ලොහිතාදුද්ධෘතොදධෙඃ,
ඉතියත්‍යෙව නිර්දිෂ්ටෙ නෙයත්වමුරගාසෘජඃ.

මහී, පෘථිවීතොමෝ; මහාවරාහෙණ, වරාහ රූපධාරීවූ විෂ්ණුනු විසින්; ලොහිතාත්, රත්වූ; උදධෙඃ, සාගරයෙන්; උද්ධෘතා ඉති, උද්ධරණලදුයි; ඉයති එව, මෙපමණක්ම; නිර්දිෂ්ටෙ, දක්වනලද කල්හි; උරගාසෘජඃ, සර්පරුධිරයාගේ; නෙයත්වම්, නෙයබවයි;හෙවත් පදාධ්‍යාහාරකොට අර්ථ එළඹියයුතුබවයි; අන් පරිද්දෙකින් අර්ථයාගේ ස්ඵුටත්වයක් නොවන්නේයි—මේ ප්‍රකාරබන්ධනයෙහි මහාජනයාගේබහුමානයක් නැත්තේය;[ආදරයෙක් නැත්තේය.]

* මතාඃ, දන්නාලද්දෑවූ;—යී—පූර්ණනවයාඛ්‍යානයි.

වත්, වර්ණ ඇති, දෙවියෝ, දෙවතාවෝ; සෙතෙලවත්වා, ශාන්ති දානය කෙරෙත්වා.

පාර්වතියටද, ශ්‍රීකාන්තාවටද, වාග්වනිතාවටද, (යනමේ දිව්‍ය ස්ත්‍රීන් තුන්දෙනාට) නිරන්තරයෙන් වල්ලභ(ස්වාමි)වූ-කාන්තියෙන්ද; කලබෞතයෙහිද, මෙඝයෙහිද, වර්ණ ඇත්තාවූ දෙවතාවෝ නොහොත් බ්‍රහ්ම—ඊශ්වර—විෂ්ණු—යනමොහු (තොපට) ශාන්තිදානය කෙරෙත්වා යනුභාවයි.

උත්පරිපාටිකනම් පිළිවෙලවරදවාකීමයි ඒ මෙසේයි.

{ ගිරිඳු / හිම් / කපුත්වන් } කියාද { සිරි–හිම් / කලදෝ / වන් } කියාද { විසි / හිම් / මෙවන් } කියාද යොද තිබේ.

{ ගිරිඳු / හිම් / කලදෝවන් } කියාද { සිරි / හිම් / මෙවන් } කියාද { විසි / හිම් / කපුත්වන් } කියාද යෙදිය යුතු.

උමාවගේ ස්වාමියා ඊශ්වරයායි, ශ්‍රීකාන්තාවගේ ස්වාමියා විෂ්ණුයි, සරස්වතියගේ ස්වාමියා මහාබ්‍රහ්මයායි—මෙසේ යෙදීම නොකොට පිළිවෙලවරදවා—උමාවට මහාබ්‍රහ්මයාද, ශ්‍රීකාන්තාවට ඊශ්වරයාද, සරස්වතිට විෂ්ණුද යොද, බන්ධනය කළ බැවින් මේ උත්පරිපාටිකදොෂයයි.

ශ්‍රීදණ්ඩාචාරීන් විසිනුදු.

3, 144; උද්දෙශානුගුණෝ'ර්ථානාමනූද්දෙශො න චෙත් කෘතඃ,
අපක්‍රම.භිධානං තං දොෂමාචක්ෂතෙ බුධාඃ.

උද්දෙශානුගුණඃ, ප්‍රථමොපක්ෂෙපයාගේ ක්‍රමය අනුව වන්නාවූ; අර්ථානාම්, අර්ථයන්ගේ; අනූද්දෙශඃ, අනුකථනයතෙම; නචෙත් කෘතඃ, ඉදින් නොකරණලද්දේවී නම්; තං දොෂම්, ඒ දොෂය; බුධාඃ, පණ්ඩිතයෝ; අපක්‍රමාභිධානං, ක්‍රමලඬඝනරූපත්වයෙන් අපක්‍රම නම්වෙයි, ආචක්ෂතෙ, කියත්.

ප්‍රථමපක්ෂයෙහි යොදනලද පටිපාටිය අනුවවන්නාවූ අර්ථයන්ගේ අනුකථනය දෙවැනි පක්ෂයෙහිදී නොකෙළේවී නම් ඒක්‍රමොලලඬඝනය පණ්ඩිතයෝ අපක්‍රමදොෂයයි කියත් යනු භාවයි.

ඊට උදාහරණ මෙසේයි.

3, 145, ස්ථිති නිර්මාණ සංහාර හෙතවො ජගතාමමී,
ශම්භු නාරායණාම්භොජයොනයඃ පාලයන්තු වඃ.

ජගතාම්, ලෝවැස්සන්ගේ, ස්ථිති, ප්‍රබන්ධයෙන් වෘත්තිය; නිර්මාණ, උත්පාදනය; සංහාර, විනාශය; (යන මේට) හෙතවඃ,

ලේවන් සමුදුරෙන් උලැඟියෙ වරහ දෙරණත,
වියයුතු බැවින් මුලුසුන් සප්ලේ මෙ වේ නේදෙස්, e

කාරණයහයි; අම්, මේ කියනලද්දාවූ; * ශම්භූ, ඊශ්වරය; නාරායණ, විෂ්ණුය; අම්භොජයොනයඃ, බ්‍රහ්මය යන මොහු; වඃ, තොප; පාලයන්තු, රක්ෂාකෙරෙත්වා;-මෙහි පළමුකොට දක්වනලද සෘෂ්ටියට කාරණවූයේ නාරායණය නිර්මාණයට කාරණවූයේ බ්‍රහ්මය සංහාරයට කාරණවූයේ ඊශ්වරය යනු ආගමය-එහෙයින් ප්‍රථමොද්දේශයට අනුද්දේශය හෝ අනුද්දේශයට ප්‍රථමොද්දේශය හෝ අනුගුණ නොවන හෙයින් මේ අපක්‍රම නම්-

මෙහි විභාග මෙසේ දතයුතුයි.

ලෝකයාගේ—

'පැවැත්ම—මැවීම—විනාශ' යන මෙහි කර්තෘවූ "ඊශ්වර—විෂ්ණු-බ්‍රහ්ම" යන මොහු-තොප රකිත්වායි කීකල ප්‍රථමොද්දේශක්‍රමයට පසුව දක්වනලද උපන්‍යාසක්‍රමය අනුකූල නොවේ-

මෙහි "පැවැත්ම-මැවීම-විනාශ" යන පිළිවෙළේ හැටියට "විෂ්ණු—බ්‍රහ්ම—ඊශ්වර" තොප රකිත්වායි කියා අනුකූලව පිළිවෙළ නොවරදවා යෙදුවහොත් මෙකී දොෂය නොවේ.

නෙයදොෂය.

e වරහ, වරාහතෙම, ලේවන්සමුදුරෙන්, රුධිරවර්ණ සමුද්‍රයෙන්, දෙරණත, ධරණීය; උලැඟියෙ, උල්ලඞ්ඝිතකෙළේයි; මුලුසුන්, මූලොච්ඡින්නවූ; සප්ලේ, සර්පයින්ගේ රුධිරය; වියයුතු බැවින්, කියයුතු හෙයින්; මේ නේදෙස්වේ, මේ නෙයදොෂ නම්වේ.

මෙහි "වරාහරූපීවූ විෂ්ණුතෙම රත්වූ මුහුදින් පොළොව නැඟුවේය" යි කීකල ඇසූවන්ට කෙසේ රත්වූ බවක්දැයි නොහැඟේ-කාලකවිහු විසින් "ඔහුගේ කුරයෙන් සුන් කළ නයින්ගේ ලේයෙන් රත්වූ" යයි ප්‍රතිපාදනය කොට හැඟවියයුතුව තිබියදී එය ප්‍රකාශ නොකළ හෙයින් (එකී පදයන් අධ්‍යාහාරාදියෙන් පමුණුවා අර්ථය අවබොධකටයුතු හෙයින්) මේ නෙයදොෂය වේ-පෙරවිෂ්ණුනු වරාහක විලාසයකින් ශ්‍රීකාන්තාවනිසා පොළොව උදුලේය යනු සිද්ධාන්තයි.

**1, 74,** මහීමහාවරාහෙණ ලොහිතාදුද්ධෘතොදධෙඃ,
ඉතියත්‍රෙව නිර්දිෂ්ටෙ නෙයත්වමුරගාසෘජඃ.

මහී, පෘථිවිතොමෝ; මහාවරාහෙණ, වරාහ රූපධාරීවූ විෂ්ණුනු විසින්; ලොහිතාත්, රත්වූ; උදධෙඃ, සාගරයෙන්; උද්ධෘතා ඉති, උපුරණලදැයි; ඉයති එව, මෙපමණක්ම; නිර්දිෂ්ටෙ, දක්වනලද කල්හි; උරගාසෘජඃ, සර්පරුධිරයාගේ; නෙයත්වම්, නෙයබවයි; හෙවත් පදාධ්‍යාහාරකොට අර්ථ එළඹියයුතුබවයි; අන් පරිද්දෙකින් අර්ථයාගේ සමුටත්වයක් නොවන්නේයි—මේ ප්‍රකාරබන්ධනයෙහි මහාජනයාගේබහුමානයක් නැත්තේය; [ආදරයෙක් නැත්තේය.]

* මතාඃ, දන්නාලද්දාවූ;—යී—පුරාතනව්‍යාඛ්‍යානයි.

එ තව දිය දේවා රිවි රා උරා කවම්මැණි,
නො පැලැඟිකෙලෙනැසුරු එ මෙ දෙස් අසබහව්නම් d

---

1, 75, ඊදෘශං බහුමන්‍යන්තෙ මාර්ගයොරුභයොරපි,
න හි ප්‍රතීතිඃ සුභගා ශබ්දන්‍යායවිලඞ්ඝිනී.

ඊදෘශං, මේ අනන්තරොක්තප්‍රකාරවූ නෛයය; උභයොරපිමාර්ගයොඃ, වෛදර්භගෞඩීය මාර්ගදෙක්හි; න බහුමන්‍යන්තෙ, තද්ඥයෝ ආදර නොකෙරෙත්; (කුමක් හෙයින් දයත්) ශබ්දන්‍යාය විලඞ්ඝිනී, වාචක ශබ්දය හා සාමර්ථ්‍යය ඉක්මෙන්නාවූ; ප්‍රතීතිඃ අර්ථාවගතියක්; න සුභගා හි, සුභග නො වන්නීමැයි.

1, 73, අර්ථව්‍යක්තිරනෙයත්වමර්ථස්‍ය හරිණොද්ධෘතා,
භූඃ ඛුරක්ෂුණ්ණනාගාසෘග්ලොහිතාදුදධෙරිති.

අර්ථස්‍ය, කාව්‍යාභිධෙයයාගේ; අනෙයත්වම්, ශබ්දයෙන් හෝ අර්ථයෙන් හෝ ප්‍රතීතිය; අර්ථව්‍යක්තිඃ, අර්ථව්‍යක්තිනම්; (යේ මෙසේයි) හරිණා, වරාහරූපධාරිවූ විෂ්ණුහුවිසින්; භූඃ, පෘථිවිතොමෝ; ඛුරක්ෂුණ්ණ, තමාගේ කුරයෙන් සුණුකරණලද; නාගාසෘක්, උරගරුධිරයෙන්; ලොහිතාත්, රත්වූ; උදධෙඃ, සමුද්‍රයෙන්; උද්ධෘතා ඉති, උදුරණලදු (හෙවත්) නඟනලදී.

මෙහි අනෙයනම්-කර්තෘහු විසින් මේ බස මේ අභිප්‍රායෙන් කිම්දී නොකියවා ඇසූ විඥයන්ට අර්ථාවබොධවන බවයි.

### අසම්භාවනීය දොෂය.

d රාඋරා, රාහු නැමැති සර්පයාට; කවම්මැණි; කණ්ඨමාණික්‍යය බඳුවූ; එරිවි; ඒ සූර්යයාතෙම, තට; ප්‍රීමත්හට; දියදේවා; ශාන්තිදානය කෙරේවා; එ ඇසුරු, ඒ ආශ්‍රය; නො පැලැඟිකෙලෙන්; නුසුදුසු කලහෙයින්; මෙ දෙස්; මේ දොෂය; අසබහව්නම්; අසම්භාවනීය දොෂ නම්වේ.

රාහුඅසුරේන්ද්‍ර නැමැති සර්පයාට කණ්ඨ (බොටුවේ ලගනා)මාණික්‍යයක් සමානවූ (රාහු විසින් ගිලිනලදය යන අර්ථයි) ඒ සූර්යයාතෙම තොපට ජය ශාන්තිදානයකෙරේවා (යන) ආශ්‍රය ප්‍රස්තාවට සුදුසු ලෙස නොකල බැවින් අසම්භාවනීය දොෂයයි යනුභාවයි.

මෙකී සූර්යයාගේ පිහිටසොයන අවස්ථාව ඔහු රාහු විසින් ග්‍රහණයකරණලදින් ඉතා අසරණව අනුන්ගේ පිහිට සොයමින් සිටි වේලාවකි-මෙකී අවස්ථාවෙහි බුදුරජානන්වහන්සේගේ සරණගිය බව සූර්යපිරිතෙන් පෙණේ—විස්තරය එයින් බලාගණීත්වා.

දෙව් බරඩඅඩනෙත් පස්විසිවා රකන තා,
නැසුනතැ අරුත්ඇතියෙන් මේ දතු ගුළුඅරුත්දොස්. ෧

---

## ගූඪාර්ථ දොෂය.

෧ බර, ද්වාදශයක්හු සම්බන්ධවූ; අඩ, අර්ධයකින්; අඩනෙත්, අර්ධයක් නෙත්‍ර ඇති; දෙව්, දෙවතාතොම හෙවත් ත්‍රිනෙත්‍රතෙම; පස්විසිවා, පඤ්චගුණිතවූ විංශති සඞ්ඛ්‍යාඇති වර්ෂයක් හෙවත් වර්ෂශතයක්; තා රකන, තාරක්ෂාකරන්න; නැසුනතැ, අනාඃප්‍රවජනනවූ, අරුත්ඇතියෙන්, අර්ථඇති හෙයින්; මේ, මේ කියනලද්දේ; ගුළු අරුත්දොස්, ගූඪාර්ථදොෂයයි; දතු, ජානනය කරණු.

මෙහි "බරඩඅඩනෙත්" යන්නෙහි හා; "පස්විසිවා" යන්නෙහිත් ඇතුළත වැසුනාවූ අර්ථඇතිහෙයින් ගූඪාර්ථ දොෂයවේ— කෙසේද? බර, ද්වාදශයක් සම්බන්ධවූ; අඩ, අර්ධයකින්; අඩනෙත්, අර්ධයක් නෙත්‍ර ඇති කියා යෙදූතැන; ද්වාදශයෙන් කොටස හයයි-හයෙන් කොටස තුණයි-ඇස්තුණක්ඇති දෙවතාවෙකි-එනම් ඊශ්වරයයි-මෙහි තිනෙත් නොකියා "බර අඩ අඩ" කියා ශබ්දගණනක් කිරීමෙන් ඇස්දෙළහක් ඇත්තාවූද ඇස්හයක් ඇත්තාවූද ඇස්තුණක් ඇත්තාවූද දෙවතාවෝ තොප රකිත්වායි කිවහොත් මෙහි දොෂය නොවේ-එසේ නොව දෙළහක් සම්බන්ධවූ අර්ධයකින් අර්ධයක් නෙත්‍ර ඇති දෙවිතෙම කියා අර්ථ බිණිය යුතුය-ප්‍රයොජන නැති ශබ්දගණනකින් අර්ථය වැසුවාවූ අර්ථයක් ප්‍රකාශවේ.

"පස්විසිවා" කීවාම විසිපස්අවුරුද්දක්යයි හැඟේ, එසේ නොව පහෙන් ගුණකරණලද විසිඅවුරුද්දක් හෙවත් අවුරුදු සියක් යන අර්ථය කියයුතු බැවින් මෙහි දොෂයවේ—මෙහි 'පස්' යන තන්හි 'ගුණ' යන්නක් නසා 'විසිවා'යි යෙදූහෙයින් අනාඃප්‍රවජනගූඪාර්ථ දොෂයයි.

### හෙළදිව් අබිදැන වශෙනහි.

බ ර ඩ අඩ නයන තුන්නෙත් දෙව් උතු මා
වෙත ට අයදම්න් කිව් කව්ව හරු තු මා
කි හ ට ගුළු දොස ඇති කිව් තෙරිදූතු මා
එ සැ රි නො කියන්න මින් වී දූන මූනු මා

ප ස් ඕ ස් සේ ගුළුදොස් නැහැ මෙම ගණ න
ගු ළු දො ස් වේ කිවහොත් සියයට රැකෙ ණ
කා ව් ද ස් සේ කිව් ලක්දිව තෙර වර ණ
ද හ ල ස් සේ වරි මේ කාව් හට හැඟු න

**සිසි සේහසක මෙන් විමලඹරය තළුන් මෙන්,**
**රිවි එව් කදෙ‍්‍යාසොබනේ නහ එව් බෙලෙ ගිම්හෙරෙන්;**
**බුන්ලිඟු බස මෙසේ උකට නිසුවම් මහදෙස්,**
**විමසා කවිකරණුයේ සබමැද යස බජනුයේ.** 𑇡

---

## භින්නලිඞ්ගාදි දෝෂ.

𑇡 **සිසි,** චන්‍ද්‍රතෙම; **සේහසක මෙන්,** ශ්වේතහංසියක මෙන්ද; **විමල,** නිර්මලවූ; **අඹරය,** ආකාශය; **තළුන් මෙන්,** තඩාගයන් මෙන්ද; **කදෙ‍්‍යා,** ඛද්‍යෝතකෘමි (කණාමැදිරි) තෙම; **රිවිඑව්,** සූර්‍ය්‍යයා මෙන්ද; **සොබනේ,** ශෝභමාන වන්නේය; **බෙලෙ,** භටතෙම; **ගිම්හෙරෙන්,** ස්වාමීහු කෙරෙහි ගෞරවයෙන්; **නහ එව්,** ශුනකයකු මෙනි.

**මෙසේ,** මේ (උක්තප්‍රකාර) පරිද්දෙන්; **බුන්ලිඟු,** භින්නවූ ලිඞ්ගයද; **බුන්බස,** භින්නවූ වචනයද; **උකට උවම්,** උත්කෘෂ්ටොපමාද; **නිසුවම්,** නිචොපමාද යන; **මහදෙස්,** මහාදෝෂයන්; **විමසා,** පරීක්ෂාකොට; **කවිකරණුයේ,** කාව්‍යකරණීතැනැත්තෝ; **සබමැද;** සභාමධ්‍යයෙහි; **යස,** කීර්තිය; **බජනුයේ,** සෙවනාය කරන්නේයි.

මෙහි "සිසි සේහසකමෙන්" යන්නෙන් ලිඞ්ගභෙදයද; "විමලඹරය තළුන්මෙන්" යන්නෙන් වචනභෙදයද; "රිවිඑව් කදෙ‍්‍යා සොබනේ" යන්නෙන් ජාත්‍යධිකයා හා හීනයාගේ උපමාකරණයද; "නහ එව් බෙලෙ ගිම්හෙරෙන්" යන්නෙන් ජාත්‍යාදි හීනයා හා අධිකයාගේ උපමාන කරණයද දක්වනලද්—'සසි' යනු පුල්ලිඟු එකවචනයි, "සේහසක" යනු ස්ත්‍රීලිඟු එකවචනයි, "සස" යන පුල්ලිඟු එකවචනයට උපමානකොළේ "සේහසක" යන ස්ත්‍රීලිඟු එකවචනයි එසේකල ලිඞ්ගයෙන් භින්නයි—"විමලඹරය" යනු ප්‍රථමාවිභක්ති එකවචනයි—"තළුන්"යනු බහුවචනයි; "විමලඹරය" යන ප්‍රථමාවිභක්ති එකවචනයට උපමාකළ "තළුන්" යන බහුවචනය වචනයෙන් භින්නයි-"කදෙ‍්‍යා" යනු නිචවූ කණාමැදිරියායි-ඔහුට උපමාකෙළේ උත්කෘෂ්ටවූ සූර්‍ය්‍යයායි-කණාමැදිරිතෙම සූර්‍ය්‍යයාමෙන් බබලයි කී කල ඒ උත්කෘෂ්ටොපමායි—"බෙලෙ"? යනු වැඩකාරයායි "නහ" යනු හීනවූ ශුනකයයි-"බෙලෙ" යන්නට උපමාකෙළේ ඒ නිචවූ "නහ"යන්නයි; එහෙයින් භටතෙම බල්ලාමෙනැයි කී කල ඒ නිචොපමායි.

යම්කිසි කාව්‍යමාර්ගයක කවින්ට යමක් ප්‍රීතිඋපදවාද එසේවූ කාව්‍යමාර්ගයෙහි ඒ ස්ත්‍රීආදි ලිඞ්ගය එකාඩාදවචනය යන මොංහු

විවිධජාති ඇත්තේවීනමුත් උපමා දූෂණය නොකෙරේ—එයින් කියනලදී ශ්‍රීදණ්ඩ්‍යාචාරීන් විසිනුදු.

2, 52, ස්ත්‍රීව ගච්ඡති ෂණ්ඩෝ 'යං වක්ත්‍යෙෂා ස්ත්‍රී පුමානිව,
ප්‍රාණා ඉව ප්‍රියෝ'යං මෙ විද්‍යා ධනමිවාර්ජිතා.

අයං ෂණ්ඩඃ, මේ ෂණ්ඩකතෙම; ස්ත්‍රීව ගච්ඡති, ස්ත්‍රියකමෙන් යන්නේය; එෂා ස්ත්‍රී, මේ ස්ත්‍රීතොමෝ; පුමානිව, පුනලහමයොගය හෙතුකොටගෙණ පුරුෂයකු මෙන්; වක්ති, බණන්නීය; අයං, මේතෙම; මෙ, මට; ප්‍රාණා ඉව, ජීවිතයන්මෙන්; ප්‍රියඃ, ඉෂ්ටය; විද්‍යාඃ, ව්‍යාකරණාදි විද්‍යාවෝ; ධනමිව, ධනයක්මෙන්; අර්ජිතාඃ, රැස් කරණලද්දාහුයි.

මෙහි පූර්වාර්ධයෙහි උපමානොපමෙය දෙන්නාගේ ලිඞ්ගනානාත්වය දක්වනලදී-අපරාර්ධයෙහි වචනභෙදය දක්වනලදී-එහෙයින් මෙබඳු විෂයෙහි ලිඞ්ගභෙද වචනභෙද දෙන්නා රසාවහත්වය කරත්මුත් උපමාදූෂණය නොකරන්නාහුයයි දතයුතු.

2, 53, භවානිව මහීපාල දෙවරාජෝ විරාජතෙ,
අලමංශුමතඃ කක්ෂාමාරොඪුං තෙජසා නෘපඃ.

මහීපාල, රජ්ජුරුවෙනි; දෙවරාජඃ, ශක්‍රතෙම; භවානිව, තා මෙන්; විරාජතෙ, හොබනේය; නෘපඃ, රජතෙම; තෙජසා, තෙජස හෙතුකොටගෙණ; අංශුමතඃ, සූර්‍ය්‍යයාගේ; කක්ෂාං, පදවියට; ආරොඪුං, නැඟෙන්නට; අලං, පොහොසති.

මෙහි පූර්වාර්ධයෙන් හීනවූ රජු හා අධිකවූ ශක්‍රතෙම උපමාකරණලදී-අපරාර්ධයෙන් අධිකවූ සූර්‍ය්‍යයා හා හීනවූ රජතෙම උපමාකරණලදී-මෙබඳුවූයේද ධීමතුන්ට ප්‍රීතිජනනය කරණ හෙයින් අත්‍යර්ථයෙන් ශොභනයයි දතයුතු-මෙම අනන්තර ශ්ලොකයෙන් දක්වත්.

2, 54, ඉත්‍යෙවමාදි සෞභාග්‍යං න ජහාත්‍යෙව ජාතුචිත්,
අසෙත්‍යව ක්වචි ද්වෙගඃ ප්‍රයොගෙ තද්විදාං * යථා.

ඉත්‍යෙවමාදි, අනන්තරොක්තවූ මේලිඞ්ග විපර්‍ය්‍යාසාදියතෙම, ජාතුචිත්, කිසිකලෙක්හිම; සෞභාග්‍යම්, සුභගත්වය; නජහාත්‍යෙව, නොහරින්නේමය; ක්වචිත්ප්‍රයොගෙ, කිසිප්‍රයොගයෙක්හි; තද්විදාම්, ශබ්දතත්වදන්නා කවීන්ට; උද්වෙගඃ, විමුඛයතෙම; අස්ති එව, ඇත්මැයි; යථා, හේ මෙසේයි.

* වාග්විදාං-විදුෂාං-සී-ටිකා.

මේ ඈ පූණු වරා පොරණෑදුරන් දැනැ පදි,
මත් සද එළි ද යවහන් සමසේ යොදැ බඳනේ.
ඉති ඉටුනිටු අදියර එකොළොස්වනු. b

---

2, 55, හංසීව ධවලශ්චන්ද්‍රඃ සරාංසීවාමලං නභඃ,
භර්තෘභක්තො භටඃශ්වෙව ඛද්‍යොතො භාති භානුවත්;

චන්ද්‍රඃ, චන්ද්‍රතෙම; හංසීව, හංසවධූවකමෙන්; ධවලඃ, ශුද්ධය. නභඃ, අකාශයතෙම; සරාංසීව, විල්මෙන්; අමලං, නිර්මලය; භර්තෘභක්තඃ, ස්වාමීන් කෙරෙහි ආදරඇතිව; භටඃ, සෙවකතෙම; ශ්වෙව, බල්ලෙකුමෙන්ද; ඛද්‍යොතඃ, කණාමැදිරිතෙම; භානුවත්, සූය්‍ය්‍යමෙන්ද; භාති, හොබනේයි.

මෙහි "හංසීව ධවලශ්චන්ද්‍රඃ" යන්නෙන් ලිඞ්ගභෙදයද; "සරාංසීවාමලං නභඃ" යන්නෙන් වචනභෙදයද;—"භර්තෘභක්තො භටඃශ්වෙව" යන්නෙන් ජාත්‍යාදි-හීනයාගේ අධිකයා හා උප මාන විධානයද—"ඛද්‍යොතො භාති භානුවත්" යන්නෙන් හීනයා හා ජාත්‍යධිකයාගේ උපමා කරණයද දක්වනලදී,

ඉක්බිති ශ්ලොකාර්ධයෙන් මෙබඳුවූයේ ග්‍රාහ්‍ය නොවන්නේ යයි දක්වත්.

2, 56, ඊදෘශං වර්ජ්‍යතෙ සද්භිඃ කාරණං තත්‍ර චින්ත්‍යතාම්,
ගුණදොෂවිචාරාය ස්වයමෙව මනීෂිභිඃ.

සද්භිඃ, බුද්ධිමත් කවීන් විසින්; ඊදෘශං, මෙබඳුවූයේ; වර්ජ්‍යතෙ, හරණලැබෙයි; මනීෂිභිඃ, පණ්ඩිතයන්විසින්; ස්වයමෙව, තෙමේම; තත්‍ර, එහි; ගුණදොෂවිචාරාය, ගුණදොෂ පරීක්ෂාව පිණිස; කාරණං, හෙතු; චින්ත්‍යතාම්, සිතනුලැබේවා.

b මේඈ, මේආදිවූ; අපූණු, දොෂයන්; වරා, වර්ජිතකොට; පොර ණෑදුරන්, පූරාණාචාය්‍ය්‍යයන්ගේ; පදි, පද්‍යයන්; දැනැ, ජානනය කොට; මත්, මාත්‍රාද; සද, ඡන්දස්ද; එළිද, එළිසමකිරීමද; යව හන්, යවහන් යන චතුරක්ෂරයන් සම්බන්ධයොගයද; සමසේ, සමවූ පරිද්දෙන්; යොදැ,යොජනයකොට; බඳනේ, පද්‍යබන්ධනය කරන්නේයි-
එකොළොස්වනු, එකාදශමවූ; ඉටුනිටුඅදියර, ඉෂ්ටානිෂ්ටාධිකාරය; ඉති, මෙසේයි.

මේ ආදිවූ සියලු දොෂයන් පහකොට පූරාණාචාය්‍ය්‍යවරයන්ගේ පද්‍යබන්ධනයන් දැනගෙණ මාත්‍රාද ඡන්දස්ද එළිසමකිරීමද

යවහන් යන සතරකරෙන් එකක් පාදන්තයෙහි වීනම් ඊව මුලින් අත්එකකුරක්ම යෙදීමද යනමොවුන් සමවු පරිද්දෙන් යුක්තකොට නිවීතෙම පද්‍යබන්ධනයකරන්නේ යයි යනු භාවයි.

මෙහි "මේ ඇඹුණු වරා"යන්නෙහි ඇශබ්දයෙන් පහතට යුතුවූ අනිකුද දෝෂයෝ ඇත්තාහුයයි යනු හැඟෙතත් ඒ කවරහු දැයි කියා සමහර කවීහු නොදනිති ඒ නොදනීම හේතුකොට නොණබවුන් විසින් යොදනලද මුතනක කුලකාදි පද්‍යබන්ධනයෝ සදෙස්වී කවිකාව්‍ය නායක දෙපක්ෂයට අනර්ථ උපදවති ඒ කවර දෝෂයෝදයත්?රාමශර්මාදි පූර්වාචාර්යවරයන්ගේ කාව්‍යලක්ෂණ අගුයකලාවූ ශ්‍රීදණ්ඩ්‍යාචාරීන් විසින් දක්වනලදදශමහා දෝෂයෝයි– ඒ මෙසේයි.

3, 125.–අපාර්ථං ව්‍යර්ථමේකාර්ථං සසංශයමපක්‍රමම්,
ශබ්දහීනං යතිභ්‍රෂ්ටං භින්නවෘත්තං විසන්ධිකම්.

3, 126–දෙශ කාල කලා ලොක න්‍යායා'ගම විරෝධිච,
ඉති දෝෂා දශෛවෛතෙ වර්ජ්‍යාඃ කාව්‍යෙෂු සූරිභිඃ.

අපාර්ථං, පරස්පරසම්බන්ධාර්ථහීනය; ව්‍යර්ථං, පූර්වයෙන් අපරයද අපරයෙන් පූර්වයද භින්නවන්නාවූ පූර්වාපරවිරොධය; එකාර්ථං, එකාර්ථය නොහොත් පෞනරුක්තය; සසංශයම්, ශඞ්කාසහිත බවය; අපක්‍රමම්. උත්පරිපාටිකය; ශබ්දහීනං, වෛයාකරණයන්ගේ අනුශාසනායෙන් භ්‍රෂ්ටය; යතිභ්‍රෂ්ටං, යතිස්ථානයෙහි කණ්ණීකාවෙන උපදනාපරිද්දෙන් ශබ්දයාගේ නූසුදුසු තන්හි බිඳීමය; භින්නවෘත්තං, ජන්දස්ශාස්ත්‍රශාසනා ඉක්ම වෘත්තභේදය; විසන්ධිකම්,සංහිතා සුදුසුතන්හි එය නොකිරීමය;දෙශකාලකලා ලොකන්‍යා'යාගමවිරෝධිච–දෙශ, පර්වතවනාදි දෙශවිරුඬය; කාල, රාත්‍රිදිවාදි කාලවිරුඬය, කලා, කාව්‍ය රූපාදි කලාශාස්ත්‍ර විරුඬය; ලොක, චඤ්චල නිශ්චලාදිලොක විරුඬය; න්‍යාය, හෙතුවිද්‍යා විරුඬය; ආගමවිරෝධිච, ස්මෘතිශ්‍රැති ආදි ආගමවිරුඬයයි; ඉති, මෙසේ; එතෙ දශෛව දෝෂාඃ, මේ දෝෂයන් දශදෙනම; සූරිභිඃ, පණ්ඩිතයන් විසින්; කාව්‍යෙෂු, කාව්‍යවිෂයෙහිලා; වර්ජ්‍යාඃ, බැහැරකටයුත්තාහ—මෙහි දශය ගණිතකල දෙශාදි ෂට්කයම එකෙකි—

### 1. අපාර්ථදෝෂය.

8, 129.–සමුද්‍රඃ පීයතෙ සොයමහමද්‍ය ජරාතුරඃ,
අමී ගර්ජන්ති ජීමූතා හරෙරෛරාවණඃ ප්‍රියඃ.

සොයං සමුද්‍රඃ, ඒ මේ සාගරයතෙම; පීයතෙ, බොනලැබෙයි අහං, මම; අද්‍ය, අද; ජරාතුරඃ, ජරාතුරයෙමි; අමී ජීමූතාඃ, මේ

මෙඝයෝ, ගජ්ජන්ති, ගුගුරුවත්; හරෙඃ, ශත්‍රුයාහට; ඓරාවණඃ, ඓරාවණතෙම; ප්‍රියඃ, ප්‍රියයි—මෙහි පදසමුදායයාගේ පරස්පර සම්බන්ධවූ අර්ථයෙක් නැත්තුයි මේතෙම අපාර්ථ නම්.

3, 130. ඉදමසමර්ථිතානාං මභිධානමනින්දිතම්,
ඉතරත්‍ර කවිඃ කො වා ප්‍රයුඤ්ජීතෙවමාදිකම්.

ඉදං, මේ අනන්තරෝක්තවූ; අභිධානං, අපාර්ථවූ අභිධානය තෙම; අසමර්ථිතානාං, මතෙතානමතතාදී අසමර්ථයන් සම්බන්ධවූ; අනින්දිතම්, දුෂ්ට නොවන්නේයි; ඉතරත්‍ර, සමර්ථයන් විෂයෙහි වනාහි; නින්දිතම්, දුෂ්ට වන්නේය; එවමාදිකං, මේ ආදි අපාර්ථවාදිය; කො වා කවිඃ, කවරනම් කවිහු කෙණෙක්; ප්‍රයුඤ්ජීත, ප්‍රයොග කරන්නේද.

## 2 ව්‍යර්ථදෝෂය.

3, 131. එකවාක්‍යෙ ප්‍රබන්ධෙ වා පූර්වාපරපරාහතම්,
විරුද්ධාර්ථතයා ව්‍යර්ථ මිතිදෝෂෙෂු පඨ්‍යතෙ.

එකවාක්‍යෙ, හුදෙක්පද්‍යයෙහි හෝ; ප්‍රබන්ධෙවා, සර්ගබන්ධාදියෙහි හෝ; පූර්වාපරපරාහතම්, පූර්වාපරදෙකින් පරස්පරව්‍යාඝාතවූ හෙවත් පූර්වාපරවිරුද්ධවූ වචනයතෙම; විරුද්ධාර්ථතයා, විරුද්ධවූ අර්ථ ඇති බැවින්; ව්‍යර්ථමිති, ව්‍යර්ථනමැයි; දෝෂෙෂු, කාව්‍යදෝෂයන් කෙරෙහිලා; පඨ්‍යතෙ, කියනුලැබේ-

3, 132. ජහි ශත්‍රුකුලං * කෘත්ස්නං ජය විශ්වම්භරාමිමාම්,
නච තෙ කො'පි † විද්වෙෂ්ටා සර්වභූතානුකම්පිනඃ.

කෘත්ස්නං ශත්‍රුකුලං, සියලු සතුරුකුලය; ජහි, හැර; ඉමාම් විශ්වම්භරාම්, මේ පෘථිවිය; ජය, ජයගණු; සර්වභූතානුකම්පිනඃ, සියලු සත්වයන්කෙරෙහි කරුණාඇත්තාවූ; තෙ, තට; කොපි විද්වෙෂ්ටා, කිසිසතුරෙකුදු; නච, නැති-

මෙහි පළමුකොට ශත්‍රූන්ගේ විද්‍යමානත්වය කියා නැවත ශත්‍රූන්ගේ නිෂෙධය කරණලදනුයි පූර්වාපර විරුද්ධහෙයින් මේතෙම ව්‍යර්ථ නම් වන්නේයි.

## 3 ඒකාර්ථදෝෂය.

ඒකාර්ථයාගේ නොහොත් පෞනරුක්තයාගේ විස්තරය මෙයින් පූර්වයෙහි ප්‍රකාශ කළබැවින් මෙහිදී ඒ නොදක්වමු.

* බලං- † නච හෙ කො'පි-සී. කලිකාතා.

### 4 සංශය දොෂය.

3, 139 නිර්ණයාර්ථං ප්‍රයුක්තානි සංශයං ජනයන්ති චෙත්,
වචාංසි දොෂ එවා'සෞ සසංශය ඉතිස්මෘතඃ.

නිර්ණයාර්ථං, නිශ්චය පිණිස; ප්‍රයුක්තානි, ප්‍රයොගකරණලද; වචාංසි, ශබ්දයෝ; සංශයං ජනයන්තිචෙත්. සැකඋපදවත්නම්; අසෞ එව දොෂඃ, මෙම දොෂයතෙම; සසංශයඉති, සසංශයනම් දොෂයයි; ස්මෘතඃ, දන්නාලදී.

3, 140, මනොරථප්‍රියාලොක රසලොලෙක්ෂණෙ සඛි,
ආරාද්වෘත්තිරසෞ මාතා න ක්ෂමා ද්‍රෂ්ටුමීදෘශම්.

මනොරථ, හෘදයාභිලාසයට; ප්‍රිය, ප්‍රිය ජාරපුරුෂයාගේ; ආලොක, දක්මෙහිලා; රස, අනුරාගරසයෙන්; ලොලෙක්ෂණෙ, ලොල්වූ නෙත්‍රඇති; සඛි, යෙහෙලිය යනු එක් අර්ථයෙක-නො හොත්-මනොරථ, මනොරථයට; ප්‍රිය, ඉෂ්ටවූ; ආලොක, බාහ්‍යවූ ප්‍රකාශයෙහි; රස, ඇල්මෙන්; ලොලෙක්ෂණෙ. ලොල්වූ ඇස් ඇත්තියයි හෝ යනු එක් අර්ථයෙක-

මෙහි අභිප්‍රාය නම්-ති මූවාකොට ගෘහොදරයෙහි වසන්නා නො කැමැත්තෙහි සිතසේ පිවතම ඇච්දිනා කැමැත්තෙහිය යනු අර්ථයි-මෙකී අර්ථයෙහි පූර්වාර්ථයද්‍යෙහෝ විතිශාර්ථයද්‍යෙ හෝ ග්‍රාහ්‍යයයි ශඞ්කාවන හෙයින් මේ සංශය නම්-ඉදින් හේ එසේවී නමුදු ඉන්කිම්ද යන වචනයෙහි උත්තරාර්ථය කියනලදී.

ඊදෘශං, මෙබඳුවූ තිගේ ස්වාතන්ත්‍ර්‍යය; අසෞමාතා; තිගේ මේ මවු තොමෝ; "ආරාද්වෘත්තිඃ, ආරාද්වෘත්ති වී" ද්‍රෂ්ටුම්, දක්නට; නක්ෂමං, යොග්‍යනොවේ; බැල්ය නොහෙයි සේයි-මෙහි "ආරාද්වෘත්ති රසාව ඉත්‍යාරාද්වෘත්තිඃ"යි ගත්කල "ආරාත්" ශබ්දයා දූර සමීප දෙඅර්ථයෙහිම වැටෙන හෙයින් දූරවෘත්තිවිය යනු අර්ථයද්‍යෙ හෝ සමීපවෘත්තිවිය යනු අර්ථයද්‍යෙහෝයි මෙහිදු සංශය වන හෙයින්ද-"අසෞ" යනු පරොක්ෂ අපරොක්ෂ දෙක්හි වැටෙනහෙයින් එහි ද සංශය හෙයින් මේ සංශය නම්.

### 5. අපක්‍රමදොෂය.

අපක්‍රමදොෂය හෙවත් උත්පරිපාටිකාදොෂය මෙයින් පූර්වයෙහි "පෙරපිළිවෙළ යෙදී" යනාදනත්හි විස්තරකරණලද් එය ඊ නයින් අවබොධකරණු.

### 6, ශබ්දහීනය කෙසේද?

3, 148, ශබ්දහීනමනාලක්ෂ්‍ය ලක්ෂ්‍යලක්ෂණපද්ධතිම්,
පදප්‍රයොගො'ශිෂ්ටෙෂ්ටො න ශිෂ්ටෙෂ්ටස්තු දුෂ්‍යති.

ලක්ෂ්‍යලක්ෂණ පද්ධතිම්, උදාහරණ හා ශබ්දශාසනමාර්ගය; අනාලක්ෂ්‍ය, නොබලා; පදප්‍රයොගඃ, සුබන්තතිඞන්තයන්ගේ ප්‍රයොගය; අශිෂ්ටෙෂ්ටඃ, අනාප්තයන්ට අභිමතවූයේ; නශිෂ්ටෙෂ්ටඃ, ශිෂ්ටයන්ට අභිමත නුවූයේ; ශබ්දහීනං, ශබ්දහීන නම් වන්නේය (එහෙයින්ම) දූෂ්‍යති, දුෂ්ටවන්නේයි.

3, 149, අවතෙ භවතෙ බාහුර්මහීමර්ණවශක්වරීම්,
මහාරාජන්නජිඥසා නාසතීත්‍යාසාං ගිරාං රසඃ.

මහාරාජන්, මහරජ; අර්ණවශක්වරීම්, සතරසාගරයම මෙඛලාකොටඇති; මහීම්, පෘථිවිය; භවතෙ බාහුඃ, තොපගේ හස්තය තෙම; අවතෙ, රක්ෂාකරන්නේයයි යන; ආසාංගිරාං, මේ වචනුන්ගේ; රසො නාසතිති, රසයෙක් නැත් නුයි; ජිඥසා න, තව රිසෙක්නැති.

මෙහි 'අවතෙ'යි ආත්මනෙපදය අසාධුය—බාහුසම්බන්ධයෙහි "භවතඃ"යි ෂෂ්ඨීකටයුතුහෙයින් "භවතෙ"යි චතුර්ථීඅසාධුය—"අර්ණවශක්වරිකම්" කියා කප්‍රත්‍යය කටයුතුහෙයින් අර්ණවශක්වරීම්" යනුදු අසාධුය—"මහාරාජ"යි කියා ප්‍රයොග කටයුතුහෙයින් "මහාරාජන්" යන ඒ ප්‍රයොගයද අසාධුය—එහෙයින් මෙබඳුවූයේ ශබ්දහීන යයි දතයුතු.

**7, යතිභ්‍රෂ්ටය කෙසේද?**

3, 152, ශ්ලොකෙෂු නියතස්ථානං පදච්ඡෙදං යතිං විදුඃ,
තදපෙතං යතිභ්‍රෂ්ටං ශ්‍රවණොද්වෙජනං යථා.

ශ්ලොකෙෂු, ශ්ලොකයෙහිලා; නියතස්ථානම්, ඡන්දශාස්ත්‍රයෙහි ව්‍යවස්ථාවූ චතුර්වර්ණාදි ලක්ෂණවූ ස්ථානඇති; පදච්ඡෙදං, සුප්තිඞන්තපදයන්ගේ විච්ඡෙදය; යතිංවිදුඃ, යති යයි දනිති; තදපෙතම්, ඒ යතියෙන් රහිතවූයේ; යතිභ්‍රෂ්ටම්, යතිභ්‍රෂ්ට නම් වන්නේය; ශ්‍රවණොද්වෙජනං, කර්ණකටුකවූ ඒ යතිභ්‍රෂ්ටයතෙම; යථා, මෙසේයි.

3, 153, ස්ත්‍රීණාං සඞ්ගී-තවිධිමයමා-දිත්‍යවංශ්‍යො නරෙන්ද්‍රඃ
පශ්‍යත්‍යක්ලිෂ්-ටරසමිහ ශිෂ්-ටෛරමාත්‍යෛදි දුෂ්ටම්,
කාර්‍ය්‍යාකාර්‍ය්‍යාණ්‍යයමවිකලාන්‍යාගමෙනෛව පශ්‍යන්
වංශ්‍යාමුර්වීං වහති නෘපඉත්‍යස්ති චෛවං ප්‍රයොගඃ.

ආදිත්‍යවංශ්‍යඃ, සූර්‍ය්‍යවංශයෙහිවූ; අයං නරෙන්ද්‍රඃ, මේ රජතෙම; ශිෂ්ටෛඃ අමාං, ශිෂ්ටයන් හා එක්ව, අක්ලිෂ්ටරසම, අක්ලිෂ්ටවූ ශෘඞ්ගාරාදි රසඇති, ස්ත්‍රීණාම්, ස්ත්‍රීන්සම්බන්ධිවූ, සඞ්ගීතවිධිම,

ප්‍රෙක්ෂණීයවූ නෘත්‍යවාද්‍යය; පශ්‍යති, බලන්නේයයි; ඉත්‍යාදී, මේ ආදි දෙය; දුෂ්ටම්, (යතිභ්‍රෂ්ටය හෙතුකොටගෙණ) දුෂ්ටයි-මේ මන්දාක්‍රාන්තායෙහි සතරවණ්ණයකින්ද තදනන්තරව සයකින්ද යති උවමනාතැන * 'සඞ්ගීත' යන ස්ථානය ඉක්ම ගිය හෙයින් යතිභඞ්ග නම්වෙයි; සෙසුතැනද මෙසේම දතයුතු.

මෙහිදු දොෂරහිත පද්‍යයද, දක්වන පිණිස කාය්‍යාකාය්‍යමිත්‍යාදිය කීහු- අයං නෘපඃ, මේරජතෙම; අවිකලං තී, සියල්ල; කාය්‍යාකාය්‍යාණි, කටයුතු නොකටයුතු; ආගමෙනෛව, ආගමයෙන්ම; පශ්‍යති, බලන්නේ; වංශ්‍යාම්, වංශනතවූ; උර්වීම්, පෘථිවිය; වහති, උසුලායයි; එවම්, මෙසේ; ප්‍රයොගයාව, ප්‍රයොගය කුඩු; අස්ති, ඇති; මෙහි 'කාය්‍යාකාය්‍යාණ්‍යයම්' යන තැනද ස්වරසන්ධියෙන්වූ යතිභඞ්ගය ශාස්ත්‍රාකතහෙයින් දුෂ්ට නොවන්නේයි.

**8 භින්නවෘත්තය කෙසේද?**

**3, 156,** වණ්ණානාං න්‍යූනතාධික්‍යෙ ගුරුලඝුවයථාස්ථිතිඃ,
යත්‍ර තද්භින්නවෘත්තං ස්‍යාද්දෙෂ දොෂඃ ශ්‍රුතිඤ්ඤිතඃ,

වණ්ණානාම්, (ශාස්ත්‍රහෙයින් ප්‍රතිනියත ශ්ලොකභාවීවූ) වණ්ණයන්ගේ; න්‍යූනතාධික්‍යෙ, හීනත්ව අධිකත්ව දෙකද; ගුරු, සංයොගපරදිඝලක්ෂණවූ ගුරුහුගේද; ලඝු, හ්‍රස්වාක්ෂරයාගේද; අයථාස්ථිතිඃ, ශාස්ත්‍රාතික්‍රමයෙන් ප්‍රවෘත්තිය; යත්‍ර, යම්පදයෙක්හි ඇද්ද, තද්භින්නවෘත්තං ස්‍යාත්, ඒ භින්නවෘත්ත නම් වන්නේයි; එෂ දොෂඃ, මේ භින්නලක්ෂණවූ දොෂයතෙම; ශ්‍රුතිඤ්ඤිතඃ, අත්‍යන්තයෙන් ගර්හිතයි.

**3, 157,** ඉන්දුපාදාඃ ශිශිරාඃ ස්පෘශන්තීත්‍යූනවණ්ණතා,
සහකාරස්‍ය කිසලයාන්‍යාද්‍රාණීත්‍යධිකාක්ෂරම්.

"ඉන්දුපාදාඃ ශිශිරාඃස්පෘශන්තීති, ඉන්දුපාදාඃ ශිශිරාඃස්පෘශන්ති" යත්‍ර, ඌනවණ්ණතා, ඌනවණ්ණවත් වෘත්තයය; සහකාරස්‍ය කිසල

---

⏑⏑⏑ | ⏑, – – | – – – | ⏑, ⏑ – | ⏑ ⏑ – ⏑

*"මන්දාක්‍රාන්තාජල ධිෂඩගෛමෝභ්‍ නෞ තෞ තෞ ගුරු චෙත්" වෙත්, ඉදින්; මෞභෞ, මගණ භගණ දෙකවන්නාහුද; නතෞ, නගණ තගණ දෙකවන්නාහුද; (නැවත)තඃ, තගණය කුත් වේද; ගුරු, ගුරුදෙකකුත් වන්නාහුද; ජලධිෂඩගෛඃ; සතරකින් හා සයකින් සතකින්; (නැවැත්ම වේද මෝතොමෝ;) මන්දාක්‍රාන්තා, එනම් වන්නීය.

[illegible]ණීති, සහකාරස්‍ය කිසලයානකර්ද්‍රාණී; යත්‍ර, අධිකාක්‍ෂරම්, අධිකාක්‍ෂරත්වවෘත්තයයි–අනුෂ්ටුප්වෘත්තයෙහි පාදය අෂ්ටාක්‍ෂරයයි ශාස්ත්‍රාගතය, මෙහි 'ඉක්‍ෂුපාදෘඃශිශිරඃ' යත්‍ර සප්තාක්‍ෂර හෙයින් න්‍යූනවර්ණත්වයයි—මේ පද්‍යයෙහි තෘතියපාදයෙහි අක්‍ෂරයක් වැඩිහෙයින් අධිකාක්‍ෂරත්වයයි.

3, 158, කාමෙන බාණා නිශිතා විමුක්තාං
මෘගෙක්‍ෂණාසවිත්‍යසථාගුරුත්වම්,
මදනස්‍ය * බාණා නිශිතාඃ පතන්ති
මෘගෙක්‍ෂණා † සවිත්‍යයථාලඝුත්වම්.

මේ ශ්ලෝකය උපෙන්ද්‍රවජ්‍රාබව විතීයචතුර්ථපාදයෙන් නියතය, "උපෙන්ද්‍රවජ්‍රා ජතජාස්තතො ගෞ" යත්‍ර එයට ලක්‍ෂණය හෙයින් පාදාදියෙහි සිටිනා ජගණයාගේ ප්‍රථමාක්‍ෂරය ලඝුවෙයි මෙහි 'කාමෙන' යයි ගුරුකළහෙයින් අයථාගුරුත්වයයි, තෘතීයපාදයෙහිද විතීයාක්‍ෂරයා ගුරුකළමනාතැන 'මදන' යී කීහෙයින් අයථා ලඝුත්වයයි.

9, විසන්ධිදෝෂය සිංහලට නිදෙස්වේ; ඒ බොහෝකව්හි විද්‍යමානබැවින්ද—සියබස්ලකරෙහි.

නොසබඳ විරුදත්—එකත් සැකි නොපිළිවෙළ,
නොසුසඳ සිඳුම්හුන්—බුන්සඳ දෙසැවිරුදුදු.
කිවින් මෙ නවදෙස්—කිවිකමපියන්නටයුත්,
මතුමත්බල්නටමුත්—නොසබඳ මෙහනුනටදෙස් ‡

"නොසබඳ, අසම්බන්ධද; විරුදත්, විරුධාර්ථද; එකත්, එකාර්ථද; සැකි, ශඞ්කාද; නොපිළිවෙළ, අපක්‍රමයද; නොසුසඳ, අපශබ්දද; සිඳුම්හුන්, පදච්ඡෙදශූන්‍යයද හෙවත් යතිභ්‍රෂ්ටයද; බුන්සඳ, භින්නඡන්දස්ද; දෙසැවිරුදුදු, දේශාදිවිරුඬද; (හෙවත් දේශකාලකලාලොකන්‍යායාගමවිරොධයද;) මෙ නවදෙස්, මේ යථොක්තවූ නවදොෂ; කිවින්, කවීන් විසින්; කිවිකමපියන්නටයුත්, කාව්‍යක්‍රියාවෙහි හරණට යුක්තයි; මෙහි, මේ නවදොෂයෙහි; නොසබඳ, අසම්බන්ධයද; මතුමත්බල්නටමුත්, මත්තොන්මත්තබාලයන්ට මුත්; අනුනට දෙස්, අන්‍යජනයාට දොෂයි" මෙසේ මෙහි අසම්බන්ධාදි නවදොෂයක් පෙන්වා විසන්ධිදොෂය නො දක්වන හෙයින්ද මිට එය ඇතුළත් නොකෙළෙමු.

* සමරස්‍ය—යී-කාලිකතා. † වාමෙක්‍ෂණා—යී-කාලිකෘතා.
‡ මේ පරිච්ඡෙදයෙහි ගීඅභාවයට ගොස් තිබුනුබැවින් මේ ගී දෙක සන්නයෙන් පදඋපුටාගෙණ කාව්‍යයට හාකා මෙහි යෙදිමු.

## 10, දෙශාදිවිරොධය.

දෙශො'ද්‍රිවනරාෂ්ට්‍රාදිඃ කාලොරාත්‍රින්දිවර්ත්තවඃ,
නෘත්‍යගීතප්‍රභෘතයඃ කලා කාමාර්ත්ථසංශ්‍රයාඃ.
චරාචරාණාං භූතානාං ප්‍රවෘත්තිර්ලෝකසංඥිතා,
හෙතුවිද්‍යාත්මකො න්‍යායඃ සස්මෘතිඃ ශ්‍රැතිරාගමඃ.
තෙෂු තෙෂ්වයථාරූඪං යදි කිඤ්චිත්ප්‍රවර්ත්තතෙ,
කවෙඃ ප්‍රමාදාද්දෙශාදි විරොධීත්‍යෙතදුච්‍යතෙ.

දෙශඃ, දෙශනම්; අද්‍රිවනරාෂ්ට්‍රාදිඃ, පර්වතවනරටවල් ආදියයි; කාලඃ, කාලනම්; රාත්‍රින්දිවර්ත්තවඃ, රෑදවල් ඍතුආදියයි; කලා, කලානම්; කාමාර්ත්ථසංශ්‍රයාඃ, කාමය අර්ත්ථය යනමේ උත්පාද හෙතුවූ; නෘත්‍යගීතප්‍රභෘතයඃ, නැටුම් ගීආදිහුය; චරාචරාණාං, ජඞ්ගමස්ථාවරවූ; භූතානාං, ද්‍රව්‍යාදීන්ගේ; ප්‍රවෘත්තිඃ, වෘත්තාන්තකථානය; ලොකසංඥිතා, ලොකය (ලොකසම්මතයයි) කියනලද්දිය; න්‍යායඃ, න්‍යායනම්; හෙතුවිද්‍යාත්මකඃ, හෙතුශාස්ත්‍ර ආත්මකොට ඇත්තේයි; ආගමඃ, ආගමනම්; සස්මෘතිඃශ්‍රැතිඃ, මනුස්මෘත්‍යාදි ශාස්ත්‍රසහිත වෙදයයි—තෙෂුතෙෂු, දෙශාදි ඒ ඒ තැන; අයථාරූඪං, ප්‍රසිද්ධි ඉක්මවා; කිඤ්චිත්, කිසිවක්; කවෙඃ ප්‍රමාදාත්, කවීනුගේ පමාවෙන්; යදිප්‍රවර්ත්තතෙ, ඉදින් පැවැත්තහොත්; (වර්ණනාකරණලදනම්) එතත්, මේතමේ; දෙශාදි විරොධීඉති, දෙශකාලාදි විරුද්ධයයි; උච්‍යතෙ, කියනුලැබේ.

### 1, දෙශවිරොධය.

කර්පූරපාදපාමර්ශසුරභි මලයානිලඃ,
කලිඞ්ගවනසම්භූතා මෘගප්‍රායා මතඞ්ගජාඃ.

මලයානිලඃ, දක්ෂිණමාරුතය; කර්පූරපාදප, කර්පූරද්‍රැමයන්ගේ, ආමර්ශ, ස්පර්ශයෙන්; සුරභිඃ, සුගන්ධිවෙයි; කලිඞ්ගවනසම්භූතාඃ, කලිඞ්ගවනයෙහි උපන්නාවූ; මතඞ්ගජාඃ, මත්තහස්තීනු; මෘගප්‍රායාඃ, මුවන්සමානයෝයි; (ඉතාක්ෂුද්‍රය යන අර්ත්ථයි) මෙහි මලයදෙශයෙහි චන්දන මුත් කර්පූරපාදපයන්ගේ උත්පත්තියක් නැති—චීනදෙශයෙහිම ඔවුන්ගේ උත්පත්තිය වේ—එසේම අරණ්‍යෙහි මුත් කලිඞ්ගුවෙනෙහි මත්තහස්තීන්ගේ සම්භවයක් නැතිනුයි මේ දෙතැන්හිම දෙශවිරොධයයි. *

---

* කල්‍යාණීපුරප්‍රවෙශයෙහි මාගීලක්ෂණ දක්වන සැලලිහිණිසන්දෙශයෙහි සාරිකාපක්ෂියාර් ආමන්ත්‍රණයකොට මෙසේ කියාතිබේ.

## කාල විරොධය.

පද්මිනී නක්තමුන්නිද්‍රා සද්‍යොත්‍යහනි කුමුද්වතී,
මධුරුත්ඵුල්ලනිචූලො නිදාඝො මෙඝදුර්දිනඃ.

පද්මිනී, පියුම්වනය; නක්තං, රාත්‍රියෙහි; උන්නිද්‍රා, ප්‍රබුද්ධවෙයි; කුමුද්වතී, කෛරවවනය, අහනි, දහවල්කාලයෙහි; සද්‍යොති, පිපෙයි; මධුඃ, වසන්තකාලයතෙම; උත්ඵුල්ලනිචූලඃ, ප්‍රබුද්ධවූ නිචුලද්‍රැම (මිදෙල්ලවෘක්ෂ) ඇත්තේය; නිදාඝඃ, ග්‍රීෂ්මකාලයතෙම; මෙඝදුර්දිනඃ, මෙඝයෙන් වැලලිදවස වූයේය—

---

29, අ ග පිපිමල් මලිගියලිය කැ ලේ යං
ව ග බැද හෙන රජහසපුල් වී ලේ යා
ල ඟ සිරි තුරු ගිලිහුනු රෙණු වූ ලේ යං
ම ග බැසැ යව පළහෙළවැලි තෙ ලේ යා

මස්තකයෙහි පිපියාවූ මල්ඇත්තාවූ මාලතී ලතා ප්‍රතාන යෙන් ප්‍රකතවූ වෙණීබන්ධනයකොට පෙලසැදී පතනය වන්නාවූ (රාජහංසාස්තු තෙ චංචුචරණෛර්ලෝහිතෛස්සිතාඃ-යනු හෙයින් රත්වූ තුඩුහා පාදඇති සව්‍යාභාවලවූ) රාජහංසයන් ඇති ප්‍රබුද්ධ පද්මාකරයන් ඇත්තාවූ මාගීසමීපයෙහි ස්ථාපනය කරන්නාවූ වෘක්ෂයෙන් ගලිත රේණුවෙන් ආකුලවූ ව්‍යාපතවූ ධවලවූ පුලිනතල ඇත්තාවූ මාගීයව් අවතීණීව ගමනයකර—යනු මෙහි භාවයි—

මෙහි දක්වනලද ලක්ෂණයන් අතුරෙන් "රතුවූ තුඩු හා පාද යන්ඇති සව්‍යාභවලවූ රාජහංසයන්ගේ මෙහි අවිද්‍යමානත්වය කාරණකොටගෙණ මේ දෙශ විරොධයවේ—මෙසේම කාලඥාණී තීරයාගේ ලක්ෂණ දක්වාතිබෙන—

42, ස ල් සඳු සීණ දෙඹ රැරඟ නං මිදෙ ලී
පු ල් එරහැඳි හෝපලු මීඅඹ පළො ලී
පොල් පුවකිඟු රඹ මලබුලතී සලි ම ලී
නී ල් ගනසා සෙවනලු දෙතොර මනකා ලී

මෙහිදු රැව චන්ද්‍රකාන්තියපරිද්දෙන් බබලන්නාවූ "රැරඟ" නම් ඖෂධි වෘක්ෂයන් හිමාලයවනයෙහිමුත් මෙහිනැතිබැවින් ඒ දෙශවිරොධය වේ—ඇසළමාසයෙහි මල්පිපෙන්නාවූ "එරහැඳි" නම් චතුරඟුල (ඇසළ) වෘක්ෂයන්ගේ මල්පිපීමත් දුරුතුමාස යෙහි නැතිබැවින් නොහොත් ශාරිකාපක්ෂියාගේ ගමනාරම්භ යට දක්වනලද නක්ෂත්‍රයොගය මෙහි (දුරුතු) මාසයෙහි යෙදෙන බැවින් මේ කාලවිරොධයයි හැඟේ.

මෙහි දෑවල් පිපෙන පද්මයන් රෑට කීහෙයින්ද—රෑට පිපෙන් කුමුදු දෑවලට කීහෙයින්ද—වර්ෂාකාලයට පිපෙන නිවුලදෑම් වසන්තකාලයට කීහෙයින්ද—වර්ෂාකාලයෙහි පැමිණෙන දුර්දින ය ග්‍රීෂ්මකාලයට කීහෙයින්ද, මේ කාලවිරෝධයි.

ශ්‍රව්‍යහංසගිරො වර්ෂාඃ ශරදෙ, මත්තබර්හිණඃ,
හෙමන්තො නිර්මලාදිත්‍යඃ ශිශිරඃ ශ්ලාඝ්‍යචන්දනඃ.

වර්ෂාඃ, වර්ෂාකාල; ශ්‍රව්‍යහංසගිරඃ, ශ්‍රවණයකටයුතු හංසනාද ඇතිවෙත්; ශරදඃ, ශරත්කල්; මත්තබර්හිණඃ, මත්මොණරු ඇතිවෙත්; හෙමන්තඃ, හෙමන්තකාලය, නිර්මලාදිත්‍යඃ, නිර්මලසූර්‍ය්‍යයා ඇතිවේ; ශිශිරඃ, ශිශිරකාලය; ශ්ලාඝ්‍යචන්දනඃ, යහපත් සඳුන් ඇතිවෙයි.

ශරත්කාලයෙහිම ඇත්තාවූ හංසනාදය වර්ෂාකාලයට කීහෙයින්ද, වර්ෂාකාලයෙහිම ඇත්තාවූ මයූරනාදය ශරත්කාලයට කීහෙයින්ද, සූර්‍ය්‍යයා හිමපටලවලින් ආවෘතවීමෙන් නිර්මල නොවන්නාවූ හිමකාලයෙහි සූර්‍ය්‍යයාගේ නිර්මලත්වය කීහෙයින්ද, ශීතවූ ශිශිරකාලයෙහි ශීතගුණවූ සඳුන් යහපත්බව කීහෙයින්දයි මෙකී නයින් කාලවිරෝධය දතයුතුය.

## කලාවිරෝධය.

වීරශෘඞ්ගාරයොර්භාවෞ ස්ථායිනෞ ක්‍රොධවිස්මයෞ,
පූර්ණසප්තස්වරඃ සො'යං භින්නමාර්ගඃ ප්‍රවර්තිතෙ.

වීරශෘඞ්ගාරයොඃ, වීරරසය ශෘඞ්ගාරරසය යනදෙකට; ක්‍රොධවිස්මයෞ, ක්‍රොධය විස්මය යන්දෙක; ස්ථායිනෞ භාවෞ, ස්ථායීභාවවූවෝ [විරුද්ධෞ, විරුද්ධවෙති] පූර්ණසප්තස්වරඃ, සම්පූර්ණවූ [මනාකොට යොදනලද නිෂාදාදි] සප්තස්වරඇති; සඃ අයං, ඒ මේ සඞ්ගීතවිධිය; භින්නමාර්ගඃ, [ඒ ඒ කාලයන්හි වලකනලද ස්වරයන්හා එකතුනොවීමෙන්] වෙන්වූ මාර්ගය හෙවත් ප්‍රයොග නියමඇත්තේ; ප්‍රවර්තිතෙ, පවතියි [උක්තප්‍රකාර ප්‍රවෘත්තියෙන් විපරීතවූයේ දොෂවෙයි යනුයි.

මෙහි වීරරසයෙහි උත්සාහය ස්ථායීභාවයි; ශෘඞ්ගාරරසයෙහි රතිය ස්ථායීභාවයි; ඒ නියමය එසේතිබියදී රෞද්‍රරසයාගේ ස්ථායීභාවවූ ක්‍රොධයත් අද්භුත රසයාගේ ස්ථායීභාවවූ විස්මයත් යනදෙක යටකී වීරශෘඞ්ගාරරස දෙකට බෙදීම විරුද්ධහෙයින් නාට්‍ය රූපකලා විරෝධනම් දොෂය වෙයි—

මනාකොට යොදනලද නිෂාද ඍෂභාදි සප්තස්වරය ඇති සඞ්ගීතවිධිය නම්, ඒ ඒ කාලවලදී නොලැබෙන ස්වරහා එකතු කොට නොකියා වෙන්වූ ප්‍රයොග නියමයඇතිව පවතියි ඒ

ප්‍රවෘත්තා ස්වභාවෙන් විපරීතකොට යෙදීම ගීතරූපකලං විරො-ධනම් දොෂයවෙයි.

### ලොකවිරොධය.

අධූතකෙශරො හසති තීක්ෂ්ණශෘඞ්ගස්තුරඞ්ගමඃ,
ගුරුසාරො ‘යමෙරණ්ඩො නිඃසාරඃ ඛදිරද්‍රුමඃ.

හසති, වාරණතෙම; අධූතකෙශරඃ, සලනලද ජටා [කෙශර] ඇත්තේය;—තුරඞ්ගමඃ, අශ්වතෙම; තීක්ෂ්ණශෘඞ්ගඃ, තියුණු අං ඇත්තේය—අයං එරණ්ඩඃ, මේ එරඬුවෘක්ෂයතෙම; ගුරුසාරඃ, බරවූ හරඇත්තේය—ඛදිරද්‍රුමඃ, කිහිරිවෘක්ෂයතෙම; නිඃසාරඃ හරනැත්තේය, යනු ලොකවිරොධයි, කෙසුරු (රහිත ඇත්තු) කෙශරසහිතයයිද, අංනැති අශ්වයන් අංසහිතයයිද, හරනැති එරබුනස් හරසහිතයයිද, සාරවත් (හරඇති) කිහිරිරුක නිඃසාර (හරනැති) යයිද, ලොකස්වභාව ඉක්මවා කිහෙයින් මේ ලොකවිරොධ නම්.

මෙහි පූර්වාර්ධයෙන් ජඞ්ගමයෝද අපරාර්ධයෙන් ස්ථාවරයෝද කියනලද්දැහුය.

ඉති ලෞකික එවායං විරොධඃ සර්වගර්හිතඃ,
විරොධො හෙතුවිද්‍යාසු න්‍යායාඛ්‍යාසු නිදර්ශ්‍යතෙ.

ඉති, මෙසේ; ලෞකිකඃ, ලෞකික හෙවත් ලොකප්‍රසිද්ධවූ; අයං එව විරොධඃ, මේ විරොධයම; සර්වගර්හිතඃ, සියලු පණ්ඩිතයන් විසින් නින්දාකරණලදී, න්‍යායාඛ්‍යාසු, න්‍යාය නම්වූ; හෙතුවිද්‍යාසු, හෙතුවිද්‍යාවන් විෂයෙහිවූ; විරොධඃ, විරොධය; (හෙවත් න්‍යාය විරොධය) නිදර්ශ්‍යතෙ, දක්වනු ලැබේ.

### න්‍යාය විරොධය.

සත්‍යමෙවාහ සුගතඃ සංස්කාරානවිනශ්වරාන්,
තථාහි සා චකොරාක්ෂී ස්ථිතෛවාද්‍යාපි මෙ හෘදි.

සුගතඃ, සර්වඥයන්වහන්සේ; සංස්කාරාන්, ඥානවිශෙෂ [සංස්කාර] යන්; අවිනශ්වරාන්, අවිනශ්වරයයි (නොහොත් චිරස්ථායීයයි) සත්‍යංඑව, සැබෑවක්ම; ආහ, කීයේය; සා චකොරාක්ෂී, පූර්වානුභූතවූ ඒ චකොරාක්ෂී තොමෝ; අද්‍යාපි; අදදක්වාත්; මෙ හෘදි, මාගේ ළෙහි; ස්ථිතාඑව, පිහිටියාමය.

මෙහි මලප්‍රියාව තමාසිතින් නොයනනියාවක් කීනියාවය; සර්වඥයන්වහන්සේ සර්වසංස්කාරයන් නිත්‍යයයි නොකීවක් කීයයි කී නියාය යනමෙය හෙතුවිද්‍යානම න්‍යායශාස්ත්‍රයට විරුද්ධනුයි මේ න්‍යායවිරොධය නම් වේ.

## ආගම විරෝධය.

අනාහිතාග්නයෝ'ප්‍යෙතෙ ජාතපුත්‍රා විතන්වතෙ,
විප්‍රා වෛශ්වානරී මිෂ්ටි මක්ලිෂ්ටාචාරභූෂණාඃ.

අක්ලිෂ්ටාචාරභූෂණාඃ, සදාචාරයෙන් යුක්තවූ; ජාතපුත්‍රාඃ, උපන් පුත්‍රයන් ඇති; එතෙවිප්‍රාඃ, මේ බ්‍රාහ්මණයෝ, අනාහිතාග්නයඃ අපි, ගිනි රැස්නොකළෝද, වෛශ්වානරීං ඉෂ්ටිං, අග්නි යාගය; විතන්වතෙ, කෙරෙත්.

අග්න්‍යාධානය කිරීමෙන්ම විනා අන්පරිද්දෙකින් වඟ්නීනානය සම්පාදනය නොවනබව ශ්‍රැති ශාස්ත්‍ර (ශ්‍රීනම්) යෙහි දක්වා තිබෙනහෙයින් අග්න්‍යාධානය නොකළ අය ගිනියාගකරත්ය යන මේ ආගමවිරෝධයයි දතයුතු.

අසාවනුපනීතො'පි වෙදානධීජගෙ ගුරොඃ,
ස්වභාවශුද්ධඃ ස්ඵටිකො න සංස්කාරමපෙක්ෂතෙ.

ගුරොඃ, ආචාර්‍ය්‍යයාකෙරෙන්; අසෞ, මේ (ජන) තෙම; අනුපනීතඃ අපි, නොකරණලද උදග්‍රහණ සංස්ක්‍රියා ඇත්තේද (ඉගෙණීම් පිරිසිදුනොකළේනමුත්) වෙදාන්අධිජගෙ, වේදහැදෑරීය; (ඒ එසේමය) ස්වභාවශුද්ධඃ, ස්වභාවයෙන් පිරිසිදුවූ; ස්ඵටිකඃ, පළිඟුව; සංස්කාරං, (විශෙෂ) ශුද්ධියක්; න අපෙක්ෂතෙ, අපෙක්ෂ නොකෙරෙයි.

මෙහි උපනයනය නොකළ බ්‍රාහ්මණ කුමාරයන්ට වෙදාධ්‍යයනය නොකළහැකිබව වේදශාස්ත්‍රයෙහි පැණෙනහෙයින් මේ වචනය ඒශාස්ත්‍රයට විරෝධහෙයින් මේ ආගම විරෝධයි.

මෙසේ මේ දශමහාදෝෂය මෙහි සංක්ෂෙපයෙන් ගෙණහැර දක්වීමු.

මාත්‍රා ඡන්දස් සමසේ යොදා බන්ධනය කිරීම ඡන්දශාස්ත්‍රය ඉගැණීමෙන් වියයුතුයි * වෘත්තරත්නාකරය, වුත්තෝදය,

---

* මාත්‍රා ඡන්දස් එකී යවහත් යන ඡන්දෝලක්ෂණයන් සම්පරිද්දෙන් යෙදන්නේයයි කීහෙයින්-මෙහි මාත්‍රාසම්කිරීම "මාත්‍රා වර්ණවිභෙදෙන ඡන්දස්ත්‍රිධා කථ්‍යතෙ"යූ බැවින් භාෂා තුණවම සමානයි—ඡන්දස් යනු—පාලිසංස්කෘතයන උභය ඡන්දෝලක්ෂණයට සමානවූ-1-උක්තාය-2-අත්‍යුක්තාය-3-මධ්‍යය-4-ප්‍රතිෂ්ඨාය-5 සුප්‍රතිෂ්ඨිතාය-6 ගායත්‍රිය-7 උෂ්ණික්ය-8 අනුෂ්ටුප්ය--9 බෘහතිය-10 පඞ්ක්තිය-11 ත්‍රිෂ්ටුප්ය-12 ජගතිය-13 අතිජගතිය-14 ශක්වරිය-15 අතිශක්වරිය-16 අෂ්ටිය-17 අත්‍යෂ්ටිය-18—ධෘතිය-19 අතිධෘතිය-20 කෘතිය-21 ප්‍රකෘතිය-22 ආකෘතිය-23

'එළිජඳස' යන මේ පොත්තුණ භාෂාතුණට කරණලද *—සිංහල කවීන් විසින් උගතමනාවූ ඒ මේ එළිජඳසෙහි—මාත්‍රාවෘත්තය වර්ණවෘත්තය යනභෙදහෙයින්—ගීතිකා වෘත්තලක්ෂණය ස්වාද වෘත්තලක්ෂණයයි කියා භෙදදෙකක් වෙත්—එහි ප්‍රස්තාරයෙහිලා—දෙසාළිස් මාත්‍රාවක්ඇති ගීතිනම් වෘත්තය—එක්සාළිස් මාත්‍රාවක්ඇති පිඳුම්ගීනම් වෘත්තය—සත්තිස්මාත්‍රාවක්ඇති මත්වලගීනම් වෘත්තය-අටතිස් මාත්‍රාවක්ඇති උමතුගීනම් වෘත්තය—සමසතළිස් මාත්‍රාවක්ඇති කව්ගීනම් වෘත්තය-දෙසාළිස් මාත්‍රාවක්ඇති බමරගීනම් වෘත්තය—දෙසාළිස් මාත්‍රාවක් ඇති යාගීනම් වෘත්තය-සූසාළිස් මාත්‍රාවක් ඇති දුවහගීනම් වෘත්තය—සමසතළිස් මාත්‍රාවක්ඇති යොන්ගීනම් වෘත්තය—එක්සාළිස් මාත්‍රාවක්ඇති කාරිකාගීනම් වෘත්තය—එක්සාළිස් මාත්‍රාවක්ඇති දකුණුතොහල්ගීනම් වෘත්තය—එක්සාළිස් මාත්‍රාවක්ඇති වම්තොහල්ගීනම් වෘත්තය-දෙසාළිස්මාත්‍රාවක්ඇති සානුෂ්ටක ගීනම් වෘත්තය-සමතිස්මාත්‍රාවක්ඇති නළගීනම් වෘත්තය—සමසතළිස් මාත්‍රාවක් ඇති සස දුළුතුගීනම් වෘත්තය—ගොමූත්‍රිකාදී චක්‍රලක්ෂණය යන මොහු ගීතිකාවෘත්තලක්ෂණයයිද.

සයක් වෘත්තඇති සඳනම් ජඳසය—දෙලොස් වෘත්තයක් ඇති සිරිනම් ජඳසය—සූවිසිවෘත්තයක්ඇති මැදුම්නම් ජඳසය-අටසාළිස් වෘත්තයක්ඇති පිහිටිනම් ජඳසය—සයානූවෘත්තයක් ඇති සුපිහිටිනම් ජඳසය—එක්සිය දෙයානූවෘත්තයක්ඇති උතුනම් ජඳසය—තුන්සිය සුවාසූවෘත්තයක් ඇති සෙල්නම් ජඳසය-සත්සිය අටසැත්තෑවෘත්තයක්ඇති ගජනම් ජඳසය-එක්දහස් පන්සිය සතිස්වෘත්තයක්ඇති රුදිනම් ජඳසය-තුන්දහස් විස

---

විකෘතිය-24 සංකෘතිය-25-අභිකෘතිය-26 උත්කෘතියයි මෙසේ සවිසි ජඳස් කෙණෙකි.

එළිජඳසෙහි-1 සඳය-2 සිරිය-3 මැදුම්ය-4 පිහිටිය-5 සුපිහිටිය-6 උතුය-7 සෙල්ය-8 ගජය-9 රුදිය-10 රවුළුය-11 තෙම්තෙත්ය-12 නිරුය-13 මීය-14 මදුය—යි මෙසේ තුදුසෙකි-මෙහි ලක්ෂ්‍ය ලක්ෂණ සහිත විස්තරය එයින් බලා ගතයුතුයි-'එළි යවහන්, ලකුණු පාලිසංස්කෘතච්භාෂාවට අසමානයි, එබැවින් එය 'එළි ජඳස' 'ලකුණුසර' ආදී සිංහලකාව්‍යලක්ෂණයෙන්ම දතයුතු.

* පෙර අබාගිරිවෙහෙර (පියන්ගල්හි) කලාගුරුසුලුපා වැසි වියතුන් විසින් සියබසින් ගෙතූ මහත් ගැඹුරු විසිතුරු කාව්‍යාලඞ්කාරජඳශාස්ත්‍රය සහ 'කෝවාසන්හය'ත් මෙකල අවිෂය විය.

න්‍යාවෘත්තයක්ඇති රවුළුනම් ජඥසය—හදෘස්එකසිය පුසාළිස්වෘත්තයක්ඇති තෙනෙත්නම් ජඥසය—දෙළොස්දෘස්දෙසිය අට අසූවෘත්තයක්ඇති ගිරුනම් ජඥසය-සූවිසිදහස් පන්සියහැත්තෑ හයක් වෘත්තඇති මීනම් ජඥසය-සතළිස්නවදෘස් එකසිය දෙපණස්වෘත්තයක්ඇති මදුනම් ජඥසය-යනමෙංනු හං දූතිස් මාත්‍රාවක්ඇති දණ්ඩකනම් ජඥසය—යනමෙංනු සිව්පද ලක්ෂණයයිද-මෙසේ හෙදදෙකෙකි, සිව්පදයක් විභාගකළකල්හි එක්භාගයක් දෙපාද කව් ලක්ෂණවේ—ගිප්‍රථමපාදය හා දෙපාදකවියක් එක්වූ කල සිතිලිගීවේ—සිතිලිගීදෙකක් එකතුවූ කල කඩවක්නම් වේ—කඩවක්නම් වෘත්තයාගේ කෙළවර කිසියම් සිව්පදයක් ලා බන්ධනය කරණලද්දේ උපජාතිසැහැලි වේ—සිතිලිගී තුණකින් මත්තෙහි කැමැති සිව්පදයක්ලං බඳින ලද්දේ ලියහැලිනම් වේ—සිතිලිගී සතරකින් මත්තෙහි සිව්පදයක්ලා බඳිනං ලද්දේ බැහැලිනම් වේ—සිතිලිගීපසකින් මත්තෙහි දෙපදකවියක්ලා බඳිනාලද්දේ සදහැලිනම් වේ—සිතිලිගී සයකින් මත්තෙහි එලිඇත්තාවූ සිව්පද තුණකින්ද එම එලිඇත්තාවූ දෙපද කවියක්දලං බඳිනාලද්දේ ඇහැලිනම් වේ—සිතිලිගී හතේපවන් වැඩිවැඩිකොංට එකොංළහ දක්වා කැමති සිව්පදවෘත්තයක්ලං බන්ධනය කරණලද්දේ රසහැලි විරිලි රාහැලි මිහිඳු සුරිඳුයයි යන නාමයෝ වෙත්—සිතිලිගී දෙළොසෙක්ඇත්තේ සරඟ හැලිනම් වෘත්තය වේ—සිව්පදයන්ගේ බන්ධනය කවීහුගේ කැමැත්තමෙනි.

## එලිසමකිරීම.

මෙසේ සියබස පදුබැඳුම් අතුරෙන් කව්සිව්පදයන්ගේ අන්ත්‍යාක්ෂර සතර සමානවූ එකාක්ෂරයකින් එලිඇතිකිරීම කව් සිව්පදයන්ගේ ස්වාභාවිකලක්ෂණයකි, එය එසේම සිව්පදයන්ගේ ආදිභාගයෙහි හා පාදමධ්‍යයෙහි එකපළක හෝ කිහිප පළකම හෝ සමකුරුසතරක් පිහිටුවා විසිතුරු කාව්‍යශරීරය ඇතිවන පරිද්දෙන් රචනා කිරීම කවීහුගේ විචක්ෂාවූ පරිද්දෙන් කටහැකිධි, හෙද එලිසමකිරීමයයි සලකති, එබඳු කව්සිව්පදයන් සියබස බෙහෙවින් විද්‍යමානබැවින් එය බහුතරාචාර්‍ය්‍යසම්මත සම්භාවනීය භූෂණවෘත්තියක්සේ සිතියයුතුධි, නමුත් පාදාන්තයෙහි නියමිත එකාක්ෂරසාම්‍යයෙන් කව්සිව්පදයන්ගේ ස්වාභාවික ලක්ෂණය ලැබෙනබැවින් එසේ පාදමූලොංපමධ්‍යයෙහි එලිසම නොකිරීමද දෝෂකරනොවේ, එබැවින් අර්ථාලඞ්කාරකාව්‍යරසය නොසලකා සකලස්ථානයෙහිම අක්ෂරයෙන් පමණක් එසේ සමකොට විසිතුරු කිරීම නොමැනවි.

සිදත්සඟරාවෙහි මේ "එලි" යන නාමමාත්‍රය විනා එහි විස්ත
රය ප්‍රකාශනොවූයෙන්දෝ තමන් ආවෙණිකවූ අන්කිසි අදහස
කීත්දෝ මෙකල සමහරු ඒ සම්බන්ධව පූර්වකාව්‍යසමයට සහ
භාෂාරීතියටත් අනීයටත් නොගැළපෙනසේ නොඇදහියයුතු
අවිනිශ්චිතනවීනතරමතප්‍රකාශ කරති, එනම්—: "ණන" කුරු
මිශ්‍රවූ තැන්හිත් "ලළ" කුරු මිශ්‍රවූ තැන්හිත් එලිසම නොවේලු,
ඒත් පාදාන්තයෙහි පමණක්ලු, පාදමූලෝපමධ්‍යයෙහි එකී අකුරු
මිශ්‍රව යෙදුනුවිට එලිසමය වේලු, එතැනදී ඒ වෛෂම්‍යය නො
වේලු, මෙකී අක්ෂරයන්ගේ කිසිලෙසිනුත් සමත්වයෙක් නොලැ
බේලු, එසේම මාතෘභාෂාවටත් ශබ්දධර්මයටත් පයින් ගසා
"ණනලළ" අක්ෂරවින්‍යාසයත් කව්වලින්ම අවබොධකටයුතුලු,
එලිසේදිපමණක් දෙතුන්කුරක්යෙදුනත් විෂමවේලු, යවහනේදී
දෙකුරක්සමවූවහොත් "යවහන්දෝස්" හඬගවෙයිලු, මේ ආදි අ
නෙකන්‍ය ප්‍රතිවිරුද්ධනවීනතරමතප්‍රකාශ කරමින් ඊට දෘෂ්ටාන්ත
යයි පැරැණි යෙදුම්හි පැණෙන "ණනලළ"කුරු තමන්රුචි පරිද්
දෙන් පෙරළිකරමින් පෙන්වා එසේ අසත්‍යයකින් ලෝ
කයාමුළාකරවීම කොයිතරම් සාපරාධක්‍රියාවක්දැයි පශ්චිම ජනතා
වකෙරෙහි දයානුකම්පාඇති සුධීන් විසින් කල්පනා කටයුතුයි,
"ණනලළ" කුරු එසේවීනම්-ස්ථානොච්චාරණශ්‍රැතිලිපිභෙද
යෙන් හා තදාශ්‍රිතශබ්දාර්ථයෙන් අතිශයින් භින්නවූ "ඟග" කුරු
දෙකත්" "ඬඩ" කුරුදෙකත් "ඳද" කුරුදෙකත් "ඹබ" කුරුදෙ
කත් මිශ්‍රව යෙදී කෙසේ එලිසමය වේදැයි පිළිවිසියයුතු.

කණ්ඨෝත්පත්තිස්ථානකරණප්‍රයත්නවිශෙෂඇති ඝොෂාක්ෂරය
වූ "ග" කාරයා හා නාසිකාව උත්පත්තිස්ථානකරණකොටඇති
උග්‍රහත්වයෙන් හා ඝොෂාඝොෂත්වයෙන් විනිර්මුක්තවූ බින්දුව
ර්ණයාගේ අර්ධයක් බැඳිපවත්නා සංයොග "ඟ" යන්නත් එසේම
"ඩදබ" කුරුහා එහි පිළිවෙළින් "ණනම" අක්ෂරයන්ගේ අර්ධයක්
බැඳිපවත්නා "ඬඳඹ" කුරුත් කෙසේ සමවන්නාහුද? එසේ
ඔවුන්ගේ අංශයක් සමවන්නේනම් අනික්අංශය විෂමවීමට
හෙතු කිම? එසේ නැතහොත් ඒ අංශයත් බැහැර කටයුතුයි,
එවිට කදිම සියබස පරපුරකුත් ඇතිකරගත හැකිවෙයි, "සඟ,
සග-අඬ, අඩ-සඳ, සද-අඹ, අබ" යන මේ ශබ්දයන්හි පමණ
උච්චාරණශ්‍රැති භෙදයෙක් "වණ,වන-දළ, දල" යන ශබ්දයන්හි
ප්‍රකටව ව්‍යවහාර නොවේ, කල්‍යකානනා කාලාර්ථවාචකවූ "කල"
යන්නට වඩා රකාරට අදෙස්ලකාරෙන් යුත් "කළ" යන ක්‍රියාවාච
කපදයාගේ කකාරොච්චාරණප්‍රයත්නවිශෙෂයක් ඇතැම් තැනක
ප්‍රකටවූ නමුත් එම රූපයෙන් යුත් භාවවාචී "කළ" ශබ්දයේදී එප
මණ ප්‍රකටව උච්චාරණශ්‍රැති භෙදයක් ව්‍යවහාරයෙහි අවිද්‍යමාන
විය, "මල, මළ" යන මෙ ආදියද එසේමැයි.

පාලිව්‍යාකරණයෙහිදී අගම්වී පැණෙන "ජලංඝ, ජලඩා"දී ශබ්දයන් සම්බන්ධවූ ලකාරළකාරයන්ගේ හා රකාරට අදෙස් වී පැණෙන "පලාසති, පළාසති, පලලඩක, විපල්ලාසා" දිපදයන් සම්බන්ධවූ ලකාරළකාරයන්ගේ උච්චාරණශ්‍රැතිභෙදයෙක් ප්‍රකට නොවූයෙන් ත්‍රිපිටකධාරී මහාවෛයාකරණික බුද්ධප්‍රියාචාර්යයන්වහන්සේ විසින් මහාරූපසිද්ධියෙහිදී "ලළානමවිසෙසො" යන්නෙන් ලළයන්ගේ උච්චාරණශ්‍රැතිවිශෙෂයෙක් නැතැයි කියනලදී, එසේ ඔවුන්ගේ අන්‍යොන්‍ය සමානත්වයෙක් කිසිලෙසිනුත් නැතහොත් මෙසේ අවිශෙෂයෙන් යෙදියනැකිදැයි එසේ කියහැකිදැයි සුධීන් විසින් කල්පනා කටයුතුයි.

සංස්කෘත භාෂායෙහි සව්‍යාකරණ ශබ්දාලඞ්කාර දත් ප්‍රාඥයෝ අතිශයින් භින්නස්ථානඇති රකාරලකාරදෙදෙනාගේද—ඩකාරලකාරදෙදෙනාගේද-ශකාරසකාර දෙදෙනාගේද-බකාරවකාර දෙදෙනාගේද සමානවර්ණත්වය පවා කියති. ඒ එසේ මැයි.

රලයොර්ඩලයො ශ්චෛව ශසයො ර්බවයො ස්තථා,
වදන්ත්‍යෙෂාංඤ්ච සාවර්ණ්‍ය මලඞ්කාරවිදො ජනාඃ-ඊ.

ළකාරය වෙදයෙහි මුත් සංස්කෘතව්‍යාකරණශාස්ත්‍රයෙහි නො දක්වනලදී, එහි ඒ සම්බන්ධ විශෙෂවිභාගයකුත් නොපැණේ, එසේම පාලිභාෂාවේ පෞරාණිකශබ්දලක්ෂණයක්වූ බොධිසත්වව්‍යාකරණයෙහි හා චූලනිරුත්තියෙහිදී ලකාරළකාරදෙදෙනාගේ අවිශෙෂත්වග්‍රහණයෙන් ළකාරය වර්ජිතකොට බුද්ධවචනොපකාර අක්ෂරසම්සතළිසකැයි කියන ලදී, * ළකාරයාතමා ලකාරස්ථානීයත්වයෙන් ඔහුගේ ඝොෂාඝොෂවිචාරණත්වය ලකාරයාට කියන ලද විචාරණානුසාරයෙන්ම දැනගන්නට හැකිබවත් ළකාරයා ඩකාර විකෘතියක්කොට සම්හරු හඳුරතත් එය පූර්වාචාර්යවරුන් නොපිළිගත් බැවින් ලකාරස්ථානයෙහිම දක්වනුපිණිස අක්ෂරපරිපාටියෙහිදී ළකාරයා පසුකොට කියනලදබවත් මුඛමත්තදීපනීරූපසිද්ධිටීකාව්‍යාඛ්‍යාදියෙන් ප්‍රකාශිතයි, මෙය මෞදල්‍යායනව්‍යාකරණයෙහිද එසේම පිළිගෙණ තිබෙන බැව් තොටගමුවේ මාහිමියන්වහන්සේ විසින් විරචිත පදසාධනටීකාවෙහි

* වර්ණමාලාවෙහි අකුරුපණසක් නමුත් එහි විශෙෂවිභාග ප්‍රකාශකප්‍රස්තාවෙහි අක්ෂරභෙදමතාන්තරයක් ප්‍රකාශකරණු පිණිස "තත්‍ර චතුර්දශාදෞ ස්වරාඃ" යන කාතන්ත්‍රසූත්‍රාදි ක්‍රමයෙන් ස්වර 14 තුදුසක්වශයෙන් ගෙණ "ණන"දෙක එකකුරක් වශයෙනුත් "ලළ"දෙක එකකුරක්වශයෙනුත් "ශෂස" තුණ එකකුරක්වශයෙනුත් ගෙණ ගිණුකල ව්‍යඤ්ජනාක්ෂර සම 30 තිසක්වන බැවින් ස්වරව්‍යඤ්ජනාක්ෂර පිඩුකොට "අකුරෙන් සතළිස් සතරක් බෙදී" යනු අතරගමරාජගුරු බණ්ඩාරපඬිතුමන් විසින් දක්වන

**"ළකාරං පන කෙචි ඩකාරට්ඨානෙ පඨන්ති† ඉධ ළකාරඨානෙති දස්සනත්ථං සො පච්ඡා වුත්තො"** යන මේ පාඨයෙන් මොනවට හැඟෙන්නා.

මෙකී තාක් මදනම්–අක්ෂරයන්ගේ සාම්‍යසාම්‍යය ස්ථානකරණප්‍රයත්නවිශේෂාදිවශයෙන් දතයුතු හෙයින් ඒත් මතු දක්වනනයින් "ණන" කුරු දෙදෙනාගේත් "ලළ" කුරු දෙදෙනාගේත් සමානත්වය වැඩිදුරටත් තේරුම් ගතයුතුයි, එනම්—සාමාන්‍යවශයෙන්, මෙහි අක්ෂරයෝ උපදිත්තුයි උත්පත්තිස්ථානනාම් වෙති, මෙයින් උච්චාරණය කරණු ලැබෙත්තුයි කරණනම් වෙති, සංවෘතත්ව විවෘතත්ව ස්පෘෂ්ටත්වාදීන්ගේ ප්‍රකෘෂ්ටොත්සාහවිශේෂය ප්‍රයත්න නම්, අක්ෂරෝත්පත්තිස්ථානය කණ්ඨාවක් වැන්න, කරණය එහි දිවතවැන්න, ප්‍රයත්නය දිවතෙත් කණ්ඨායෙහි ප්‍රහාරොත්සාහවිශේෂයක්වැන්නැයි මෙසේ විමසූසඳ "ණ" කාරයා මුදුනින්හා නාසිකාවෙන් උපදී දිවගලගකරණයවේ, "න" කාරයාදත්මුලින් හා නාසිකාවෙන් උපදී, දිවගකරණයවේ, දෙදෙනාගේම ස්ථානකරණ ප්‍රයත්නයන් ස්පර්ශකිරීමයයි කියනලද සමවූ ස්පෘෂ්ටත්වය ඇතිවේ, දෙදෙනාම ඝොෂාක්ෂරද වෙති, එබැවින් ඔවුන්ගේ සමානත්වය **"තුල්‍යාස්‍ය ප්‍රයත්නං සවර්ණම්"** I, I, 9, යන **පාණිනීය සූත්‍රයෙන්**හා **"ඤපො'ක් සමොණ් ඍක්ච"** 6, යන මුග්ධබොධ **සූත්‍රාදියෙන්** සම්මතයි, ආභ්‍යන්තරබාහ්‍යප්‍රයත්නයන් අතුරෙන් "ණකාරනකාර" දෙදෙනාගේ ආභ්‍යන්තර ප්‍රයත්නත්වයෙන් අතිශයින් සමානවර්ණත්වය පාණිනීයසූත්‍රයේ "ප්‍ර"ශබ්දයෙන් ප්‍රකාශිතබැවි **සිද්ධාන්තකෞමුදීයෙන්** හා එහි ටීකාවෙන් මොනවට හැඟේ, ඒ සමානවර්ණසංඥවත් **"පරසමඤ්ඤා පයොගෙ"** යන සූත්‍රයෙන් මාගධව්‍යාකරණයෙහිද සංගෘහීතයි, ඒ අතිශයශිෂ්ටප්‍රයොගබැවින් ඔවුන්ගේ අන්‍යොන්‍යසමානත්වය සිංහලව්‍යාකරණයෙහිද **"සදරුත විදිසිසල් අනුරූ සේපියෝනක්"** යන අඩගසූත්‍ර සාමර්ථ්‍යයෙන් සංගෘහිතයයි සැකහැර දතයුතු.

---

දූයි කියති, එකී කාව්‍යයේ සිව්වැනිපෙදෙහි තිබෙන "පත්සිය" යනු මෙතැනවත් තෙණ "පත්සිය සතළිස් සතරකැ"යි ඇතැම් මතයි, ශේ මතිභ්‍රමයෙකැයි ද කියති.

† මෙතැනදී "කෙචි, සද්දසත්ථවිදූ"යන වචනවලින් ගතවතු ලබන්නෝ චොලදෙශීයාදීහු වෙති, කාත්‍යායන මොග්ගල්ලානයනාචාර්‍යවරු නොවෙති, අදහස තේරුම්නොගෙණ බහාලූ අඩොලි පියස් ව්‍යාඛ්‍යානයක තිබෙන්නා.

තවද "අනුනාසිකා ඞඤණනමාඃ" යන කාතන්ත්‍රසූත්‍රාදියෙන් අනුනාසිකසංඥා ලබනලද මේ "ණන" කුරුදෙක කෙවල මූර්ධන්‍යදන්ත්‍යාක්‍ෂරයෝ නොවෙති, වර්ගපඤ්චමාක්‍ෂරවූ මේ "ඞඤණනම" කුරුපසම ස්වකීය ස්වකීය වර්ගාක්‍ෂරස්ථානයන්හිත් නාසිකාස්ථානයෙහිත් උපදනෙන් මිශ්‍රාක්‍ෂරයයි සම්මත වෙසිති, එසේ ඔවුන් මිශ්‍රාක්‍ෂර වන බැවින් නාසිකාස්ථානයෙහි උපදනා අනුස්වාරය(නිග්‍රහීතය)යි නම්ලද බින්දුවර්ණයාත් ස්වකීය ස්වකීය වර්ගාක්‍ෂරයන්හුත් නිතර ආශ්‍රයකරමින් සඬගනවනබව මාතෘභාෂාදීශාබ්දිකයෝ දනිත්මැයි, සාමාන්‍යවශයෙන් මෙකී පඤ්චමාක්‍ෂරයන්ගේත් විශෙෂවශයෙන් "ඤණන" යන ත්‍ර්‍යක්‍ෂරයන්ගේත් එයිනුදු "ණන" යන ද්‍ව්‍යක්‍ෂරයන්ගේත් අන්‍යොන්‍ය සම්බන්ධයක් ඇති බැව් ශබ්දධර්මයදෙස නුවණ මෙහෙයා බැලිය යුතුයි, "අඞ්ග, අඤ්ඤ, අන්-අරඞ්ග, අරණ්‍ය, රණ්‍ය, අරණ, රන්" මේ ඈගී.

තවද සංස්කෘතභාෂාවෙහිදී "ණ"කාරයා පදාන්තයෙහි අල්වී නොසිටින්නාක් මෙන් සිංහලභාෂාවෙහිද "ණළ"කුරු අල්වී නොසිටිත්, "ණ"යන්න අල්වෙනතැන්හි "න්"යන්නත් "ළ" යන්න අල්වෙනතැන්හි "ල්"යන්නත්වී රුවින් යම් වෙනසක් තිබුනිනම් ඒ පිකත් හඬගවී මුදුනින් දතමුලටම වැටුනි, ඒ "ණළ"කුරු අල්වනතැන්හි "න්ල්"දෙක මිස ඒ වෙනුවට අන්අල් කුරක් නොයෙදේ, එසේ වෙනකුරක් අල්වූවිට නමත්නැති නොහරි, බොහෝකොට කීමෙන් කම්කිම, එබැවින් "ඔවුන්ගේ කිසි ලෙසිනුත් සමත්වයෙක් නොලැබේ" යනාදින් මෙදා පනළවූ නව් නතර දුර්මතය මෙයින් බැහැරැ ලිමු. ළලදෙදෙනාගේ ස්ථාන කරණප්‍රයත්නඝොෂාවිචාරණය යටකී පරිද්දෙන් දතයුතු.

මේ එලිසමකිරීම නම්-ශබ්දාලඞ්කාරවිශෙෂාන්තර්ගතඅනුප්‍රාස ලක්‍ෂණයෙකි, හෙද සාමාන්‍යයෙන් පඤ්චවිධ නමුත් නානාවිධවේ, එයින් ස්වරයාගේ වෛෂම්‍යය ඇතිකල්හිත් ශබ්දාක්‍ෂරයන්ගේ සාම්‍යය අනුප්‍රාසය වෙයි, එයින් අන්ත්‍යානුප්‍රාසයනම් ආදියෙහිවූ ස්වරය හා සමග ව්‍යඤ්ජනාක්‍ෂරය යථාවස්ථාවට පැමිණ පටනිද එයම අන්ත්‍යයෙහි යෙදිය යුතුබැවින් අන්ත්‍යානුප්‍රාසනම් වෙ. එයින් කීහ.

"ව්‍යඤ්ජනංචෙද්‍යථාවස්ථං සහාද්‍යෙන ස්වරෙණ තු,
ආවර්ත්‍යතෙ'න්ත්‍යයොජ්‍යත්වාදන්ත්‍යානුප්‍රාසඃ ස එව තත්" යනුයි,

ඊට උදාහරණ-:

"කෙශරප්‍රචුර්ලොකස්‍ය පශ්චාත්කාරි විකාසිතං,
ශෙඛරෙණෙව පූර්ණස්‍ය ශිරඃ කුසුමලක්‍ෂ්මණා,"

"කෙශඃ කාංශසතවකවිකාංශඃ
කාංශඃ ප්‍රකටිතකරභවිලාසඃ
චක්‍ෂුර්දග්ධවරාවකකලාපං
ත්‍යජති න චෙතඃ කාමමනලපං"

මේ ශ්ලෝකපාදාන්තයන්හි පැණෙන "ණණ" දෙකත් "ශශ" දෙකත් ඇහ රචවනු පිණිස එකකුරකින්ම තදවිපශ්‍යාසබුඩිමත් ප්‍රාඥවයෂ්‍යෝ නොයෙද්දුහ. අහෝ සිංහලයන් අතරව පැමිණි "ණනලළ" කුරු බොහෝකලක් ශාස්ත්‍රයුක්ති පරිද්දෙන් සුදුසු තැන්හිම යෙදි පැවති නමුත් මෙද පහලවූ නවීනතරදුර්මතික යෝ ගුරුතුමාගේ අඩොලිපියේ එල්බී එතැන්පටන් පටහැණිව කිඅතකට පෙරළි කළෝද, එව්වත් කණේන්ද්‍රිය උදාසීනව සිටි හ බලය කරණකොටගෙණ පහලවූ මෙද මතයෙන් දුහුනන් ඇසුත් රැඳවීමෙන් මහත්විපතක් සිදුවියහැකි බැවින් ඔවුන් එයින් මුදලනු පිණිස කරුණාධ්‍යශයෙන් මේතාක් කරුණු කීමු, එහෙයින් මේ මතු දක්වන රචන දෘෂ්ටාන්ත කොට පිළිගෙණ උදාසීනව සලකණු ලැබෙත්වා.

| ණනමුසු එලිසම. | | ලලමුසුඑලිසම. | |
|---|---|---|---|
| කාව්‍යශෙඛරයෙහි 13, 12. | | කාව්‍යශෙඛරයෙහි 1, 52. | |
| සැප ඇති කල සර | ණ | දැවාන පහ පෙ | ළ |
| ඉදිති අහනෝ නොපම | ණ | සරණ දුහුදුන් සහවැ | ල |
| නහස්නා පහණි | න | වඩිනා ගුවන්න | ල |
| පෙණේ හිමි දුක් ඔවුන්ගේ ගු | ණ | උතුම්රහතුන්වෙනසනැතිකළ | |
| ගුත්තිලකාව්‍යයෙහි 140. | | එහිම 2, 26. | |
| සැරයව ලං නො ව | න | රුදුනු පැහැ සිලි | ලේ |
| ලිහිණියෙකු අත්පහුරෙ | න | නැබතෝතැන්න නිම | ලේ |
| හණ්මිසි තැත් කර | ණ | වසාරෙද ප්‍රති | ලේ |
| එකෙකුමෙත්නායකාකෙලෙ වෙණ | | තමලුලියසිරිරුපැසි ලක | ළේ |
| එහිම 828. | | එහිම 4, 4. | |
| සතුටුව වෙණ නදි | න | විළිකුත් දෙළම් ප | ල |
| දුම්වෙන් පලන් අඹර | ණ | පලමින් තුඩින් පැහදු | ල |
| කඳුලෙන් තුවනද | න | කෙළිනෙන් ගිරපෙ | ළ |
| ගියෙන් වන සිරිසිලු පුරහ | න | දුගුම්දෙව්දුනුසිරින් සුලක | ළ |

සිරි ලක විසු පොර ණ
හැණහැවිහ නැරු සතර ණ
කිපු කව් කිව්වර ණ
රුකෙණ එළි බලනු "ණනලළ"ව ණ

තිහිප පලගම එළිසමකිරීම සිංහලකවිහි බොහෝසේ පෙණේ-සැලලිහිණිසන්දෙශයෙහි—

85 "රි වි තැ වූ ලේ පිපිකම් ලේ විල් හැව සි<br>
මතකො වූ ලේ තුරුවද ලේ හඬන නී සි<br>
ව ත සැ වූ ලේ මගඅස ලේ පොරසැල සි<br>
ගු රු බැ වූ ලේ යව අවූ ලේ නොවී කි සි"

"රිවිතැවූලේ, සූර්‍ය්‍යසන්තාපයෙන්; පිපිකමලේ, සුප්‍රඵිතපද්ම යන් ඇත්තාවූ; විල්, තඩාගයෙන්; හැවසී, සඤ්ජනිතාවූ; නීසි, සඤ්චාරණයට යොග්‍යවූ; තුරු (අඹාදි) වෘක්ෂයන්ගේ; වදලේ, මුවාංවෙහි; හඬන, නාද කරන්නාවූ; හෙවත් රුව් පිළිරුව් පවත්වන්නාවූ; මතකොවූලේ, මත්තකොකිලයන් ඇත්තාවූ; මගඅසලේ, මාර්ගාසන්නයෙහි, පොරසැලසී, ධූමප්‍රවෘත්තවූ; වතසැවූලේ, වලිකුකුළන් ඇත්තාවූ; ගුරුබැවූලේ, ගුරුබැවූලනම්වූ උන්නතප්‍රදෙශයෙහි; කිසිඅවූලේනොවී, ස්වල්පමාත්‍රවූද අකුලයක් (බාධාවක්) නැතිව; යව, ප්‍රයාණය කරව."

මෙහි-'රිවිතැවූලේ' යන්නෙහි කරණාර්ථයෙහි "ඒ" විබතද 'පිපි කමලේ' යන්නෙහි "ඒ" විබතද එළිසම කිරීම සඳහා විභක්තිරූප වෙනස්කොට යොදනලදි.

යවහන්යෙනු, ය-කාර, ව-කාර, හ-කාර, න්-කාර,-යන මොහුයි, මෙකී සතරකුරෙන් යම් කිසිකුරක් පාදයන්ගේ කෙළවර වැටුනිනම් ඊට පූර්වයෙහි එකඅක්ෂරයකින්ම සිව්පදය සමකළ යුතුයි—අනිකක් යෙදුවහොත් මහාදෙෂයයි ප්‍රාඥයෝ කියති—දක්වනලදමැයි.

ලකුණුසරෙහි.

යවහන් සතරකුරෙන් පදතැ එක කුරෙක්වත්,<br>
එයට ඉදිරි කර කිසි එකකුරු නො පැව මහදෙස්.

යවහන් සතරකුරෙන්,-ය-ව-හ-න්-යන සතරඅක්ෂරයෙන්; පදතැ එකකුරෙක්වත්, පාදාන්තයෙහි එක්අක්ෂරයක් වතුදු; එයට ඉදිරි කර, ඒ අක්ෂරයන්ට අභිමුඛකොට; කිසි, කවරවූ; එකකුරු නොපැව, එකාක්ෂරයකුදු නොපැව හොත්, මහදෙස්, මහ දෙෂයයි-

මේ නියමය මෙසේම පෙරපවත් සිගල්ලන් විසින්ම එකහෙලා පිළිගෙණ තිබෙන බැව් දහස්ගණන් කව්වලින් ප්‍රකාශවෙයි, එබැවින් යවහන් දෙසින් යුත් නිදසුනක් ලබාගැණීම පවා ඉතා දුෂ්කරවිය, ලකුණුසරෙහි නිදසුන්කර තිබෙන්නේත් යවහන්

"කෙශඃ කාශස්තවකවිකාශඃ
කායඃ ප්‍රකටිතකරභවිලාසඃ
චක්‍ෂුර්දග්ධවරාටකකල්පං
ත්‍යජති න චෙතඃ කාමමනල්පං"

මේ ශ්ලොකපාදාන්තයන්හි පැණෙන "කණ" දෙකත් "ශශ" දෙකත් ඇඟ රචටනු පිණිස එකකුරකින්ම තද්විපර්‍ය්‍යාසබුද්ධිමත් ප්‍රාඥවර්‍ය්‍යයෝ නොයෙදූහ. අහෝ සිංහලයන් අතරට පැමිණි "ණනලළ" කුරු බොහෝකලක් ශාස්ත්‍රයුක්ති පරිද්දෙන් සුදුසු තැන්හිම යෙදී පැවති නමුත් මෙදා පහළවූ නවීනතරදුර්මතික යෝ ගුරුතුමාගේ අඩොලිපියේ එල්බී එතැන්පටන් පටහැණිව කීඅතකට පෙරළී කලෝද, එව්වත් කණේන්ද්‍රිය උදාසීනව සිටි හ බලය කරණකොටගෙණ පහළවූ මෙදා මතයෙන් දුහුනත් ඇසූත් රුචිවීමෙන් මහත්විපතක් සිදුවියහැකි බැවින් ඔවුන් එයින් මුදලනු පිණිස කරුණාධ්‍යාශයෙන් මේතාක් කරුණු කීමු, එහෙයින් මේ මතු දක්වන රචන දෘෂ්ටාන්ත කොට පිළිගෙණ උදාසීනව සලකණු ලැබෙත්වා.

ණකමුසු එළිසම.
කාව්‍යශෙඛරයෙහි 13, 12.

සැප ඇති කල සර ණ
ඉඳිති අඟනෝ නොපම ණ
තහස්නං පහණී න
පෙණේ හිමි දුක් ඔවුන්ගේ ගු ණ

ලළමුසුඑළිසම.
කාව්‍යශෙඛරයෙහි 1, 52.

දෑවාන පහ පෙ ළ
සරණ පුහුදුන් සඟවැ ල
වඩිනං ගුවන්ත ල
උතුම්රඟතුන්වෙනසකැතිකළ

ගුත්තිලකාව්‍යයෙහි 140.

සැරයව ලං නොං ව න
ලිහිණියෙකු අත්පසුරෙ න
ගණ්මිධි තැත් කර ණ
එකෙකුමෙත්ගායනාකෙලෙ වෙණ

එහිම 2, 26.

රුදුනු පැහැ සිලි ළේ
නැබතෝතැන්න තිම ළේ
වසාරෙද සුතී ළේ
තමලුලියසිරිරුපැසි ලක ළේ

එහිම 828.

සතුටුව වෙණ නදී න
දුම්වෙත් පලත් අඹර ණ
කඳුළෙත් තුවනද න
සිලෙයත් වන සිරිසිලු පුරඟ න

එහිම 4, 4.

විළිකුත් දෙළුම් ප ල
පලමින් තුඩින් පැහදු ල
කෙළිනෙත් ගිරපෙ ළ
දුගුම්දෙව්දුනුසිරින් සුලක ළ

සිරි ලක විසූ පොර ණ
හැණහැවිහ තැරු සකර ණ
කිවූ කවි ණිව්වර ණ
රුකෙණ එළි බලනු "ණකලළ"ට ණ

තිහිප පලහම එළිසමකිරීම සිංහලකවහි බොහෝසේ පෙණේ-සැලලිහිණිසන්දෙශයෙහි—

85 “රි වි තැ වූ ලේ පිපිකම් ලේ වීල් නැව සී
මතකො වූ ලේ තුරුවද ලේ හඬන නී සී
ව න සැ වූ ලේ මගඅස ලේ පොරසැළ සී
ගු රු බැ වූ ලේ යව අවූ ලේ නොවී කි සී”

“රිවිතැවූලේ, සූර්‍ය්‍යසන්තාපයෙන්; පිපිකමලේ, සුදුපිනපදම් යන් ඇත්තාවූ; වීල්, තඩාගයෙන්; නැවසී, සඤ්ජාතවූ; නීසී, සඤ්චාරණයට යෝග්‍යවූ; තුරු (අම්‍රාදි) වෘක්ෂයන්ගේ, වදලේ, මුවාවෙහි; හඬන, නාද කරන්නාවූ; හෙවත් රැව් පිළිරැව් පවත් වන්නාවූ; මතකොවූලේ, මත්තකොකිලයන් ඇත්තාවූ; මගඅසලේ, මාර්ගාසන්නයෙහි; පොරසැළසී, පුඩප්‍රවෘත්තවූ; වනසැවූලේ, වලිකුකුළන් ඇත්තාවූ; ගුරුබැවූලේ, ගුරුබැවූලනම්වූ උන්නතප්‍රදෙශයෙහි; කිසිඅවූලේනොවී, ස්වල්පමාත්‍රවූද අකුලයක් (බාධාවක්) නැතිව; යව, ප්‍රයාණය කරව.”

මෙහි-‘රිවිතැවූලේ’ යන්නෙහි කරණාර්ථයෙහි “ඒ” විබතද ‘පිපිකමලේ’ යන්නෙහි “ඒ” විබතද එලිසම කිරීම සඳහා විභක්තිරූප වෙනස්කොට යොදනලදී.

යවහන්යෙනු, ය-කාර, ව-කාර, හ-කාර, න්-කාර,-යන මොහුයි, මෙකී සතරකුරෙන් යම් කිසිකුරක් පාදයන්ගේ කෙලවර වැටුනීනම් ඊට පූර්වයෙහි එකඅක්ෂරයකින්ම සිව්පදය සමකල යුතුයි—අතිකක් යෙදුවහොත් මහාදෙෂයයි ප්‍රාඥයෝ කියති—දක්වනලදමැයි.

ලකුණුසරෙහි.

යවහන් සතරකුරෙන් පදතැ එක කුරෙක්වත්,
එයට ඉදිරි කරැ කිසි එකකුරු නො පැව මහදෙස්.

යවහන් සතරකුරෙන්,-ය-ව-හ-න්-යන සතරඅක්ෂරයෙන්; පදතැ එකකුරෙක්වත්; පාදාන්තයෙහි එක්අක්ෂරයක් වතුදු, එය ට ඉදිරි කරැ, ඒ අක්ෂරයන්ට අභිමුඛකොට, කිසි, කවරවූ, එකකුරු නො පැව, එකාක්ෂරයකුදු නොපැව හොත්, මහදෙස්, මහදෙෂයයි-

මේ නියමය මෙසේම පෙරපවත් සියල්ලන් විසින්ම එකහෙලා පිළිගෙණ තිබෙන බැව් දහස්ගණන් කව්වලින් ප්‍රකාශවෙයි, එබැවින් යවහන් දෙසින් යුත් නිදසුනක් ලබාගැණීම පවා ඉතා දුෂ්කරව්ය, ලකුණුසරෙහි නිදසුන්කර තිබෙන්නේත් යවහන්

"ගොශඃ කාංශසනවකවිකාංශඃ
කාඃ ප්‍රකම්පිතකරහවිලාංසඃ
චක්‍ෂුද්‍රිගබවරවකකලපං
තෘජති න චෙතඃ කාමමනලපං"

මේ ශ්ලෝකපාදාන්තයන්හි පැණෙන "නණ "දෙකත් "ශෂ" දෙකත් ඇහ රචවනු පිණිස එකකුරකින්ම තදවිපශාභාසබුධිමත් ප්‍රාඥවයෂියෝ නොයෙදූහ. අහෝ සිංහලයන් අතරව පැමිණි "ණනලළ" කුරු බොහෝකලක් ශාස්ත්‍රයුක්ති පරිද්දෙන් සුදුසු තැන්හිම යෙදී පැවති නමුත් මෙදා පහළවූ නවීනතරදුර්මතික යෝ ගුරුතුමාගේ අබොලිපියේ එල්බී එතැන්පටන් පටහැණිව කිඅතකට පෙරළි කලෝද, එවිටත් කණෙණ්ඤිය උදාසීනව සිටි හ බලය කරණකොටගෙණ පහළවූ මෙදා මතයෙන් දුහුනත් ඇසූත් රැඳිටිමෙන් මහත්විපතක් සිදුවියහැකි බැවින් ඔවුන් එයින් මුදලනු පිණිස කරුණාඩ්‍යශයෙන් මේතාක් කරුණු කීමු, එහෙයින් මේ මතු දක්වන රචන දෘෂ්ටාන්ත කොට පිළිගෙණ උදාසීනව සලකණු ලැබෙත්වා.

**ණනමුසු එළිසම.**
කාව්‍යශෙඛරයෙහි 13, 12.

සැප ඇති කල සර ණ
ඉදිනි අහනෝ නොපම ණ
නාහස්නා පහණි න
පෙණේ හිමි දුක් ඔවුන්ගේ ගු ණ

ගුත්තිලකාව්‍යයෙහි 140.

සැරයව ලං නො ව න
ලිහිණියෙකු අත්පසුරෙ න
හණ්මිධි තැත් කර ණ
එගෙකකුමෙත්ගායනාගෙගෙළ වෙණ

එහිම 823.

සතුටුව වෙණ නදි න
දුඹුවෙත් පලන් අබර ණ
කඳුලෙන් තුවනද න
ගියෙන් වන සිරිසිලු පුරහ න
සිරි ලන විහු පොර ණ
හැණහැවිහ තැරැ සතර ණ
කිඳු කව කිවිවර ණ
රැගෙණ එළි බලනු "ණලළ"ව ණ

**ලළමුසුඑළිසම.**
කාව්‍යශෙඛරයෙහි 1, 52.

දෑවාන පහ පෙ ළ
සරණ පුහුදුන් සහවැ ල
වඩිනා ගුවන්න ල
උතුම්රකතුන්වෙනසතැතිකළ

එහිම 2, 26.

රැදුනු පැහැ සිලි ලේ
නැබතෝතැන්න නිම ලේ
වසාරෙද සුනී ලේ
තමලුලියසිරිරැපැසි ලත ළේ

එහිම 4, 4.

විළිකුත් දෙළම් ප ල
පලම්න් තුඩින් පැහදු ල
කෙළිනෙන් ගිරාපෙ ළ
දෑගුම්දෙව්දුනුසිරින් සුලක ළ

තිහිප පළඟම එළිසමකිරීම සිංහලකව්හි බොහෝසේ පෙණේ-සැළලිහිණිසන්දේශයෙහි—

85 "රි වි තැ වූ ලේ පිපිකම් ලේ විල් ගැව    සි
මතකො වූ ලේ තුරුවද ලේ හඬන නී    සි
ව න සැ වූ ලේ මගඅස ලේ පොරසැළ    සි
ගු රු බැ වූ ලේ යව අවු ලේ නොවී කි    සි"

"රිවිතැවුලේ, සූර්‍ය්‍යසන්තාපයෙන්; පිපිකමලේ, සුප්‍රඵුල්ලිතපද්මයන් ඇත්තාවූ; විල්, තඩාගයෙන්; ගැවසී, සඤ්ජනිතාවූ; නීසි, සඤ්චාරණයට යොග්‍යවූ; තුරු (අඹාදි) වෘක්ෂයන්ගේ; වදලේ, මුවාවෙහි; හඬන, නාද කරන්නාවූ; හෙවත් රැව් පිළිරැව් පවත්වන්නාවූ; මතකොවුලේ, මත්තකොකිලයන් ඇත්තාවූ; මගඅසලේ, මාර්ගාසන්නයෙහි; පොරසැළසී, පුඩප්‍රවෘත්තවූ; වනසැවුලේ, වලිකුකුලන් ඇත්තාවූ; ගුරුබැවුලේ, ගුරුබැවුලනම්වූ උන්නතප්‍රදෙශයෙහි; කිසිඅවුලේනොවී, ස්වල්පමාත්‍රවූද අකුලයක් (බාධාවක්) නැතිව; යව, ප්‍රයාණය කරව."

මෙහි-'රිවිතැවුලේ' යන්නෙහි කරණාර්ථයෙහි "ඒ" විබත්ද 'පිපිකමලේ' යන්නෙහි "ඒ" විබත්ද එළිසම කිරීම සඳහා විභක්තිරූප වෙනස්කොට යොදනලදී.

යවහන්යෙනු, ය-කාර, ව-කාර, හ-කාර, න්-කාර,-යන මොහුයි, මෙකී සතරකුරෙන් යම් කිසිකුරක් පාදයන්ගේ කෙළවර වැටුනිනම් ඊට පූර්වයෙහි එකඅක්ෂරයකින්ම සිව්පදය සමකල යුතුයි—අනිකක් යෙදුවහොත් මහාදෙෂයයි ප්‍රාඥයෝ කියති—දක්වනලදමැයි.

ලකුණුසරෙහි.

යවහන් සතරකුරෙන් පදතැ එක කුරෙක්වත්,
එයට ඉදිරි කරැ කිසි එකකුරු නො පැව මහදොස්.

යවහන් සතරකුරෙන්,-ය-ව-හ-න්-යන සතරඅක්ෂරයෙන්; පදතැ එකකුරෙක්වත්; පාදාන්තයෙහි එක්අක්ෂරයක් වතුදු, එය ව ඉදිරි කරැ, ඒ අක්ෂරයන්ට අභිමුඛකොට, කිසි, කවරවූ, එකකුරු නො පැව, එකාක්ෂරයකුදු නොපැව හොත්, මහදොස්, මහ දෙෂයයි—

මේ නියමය මෙසේම පෙරපවත් සියල්ලන් විසින්ම එකහෙලා පිළිගෙණ තිබෙන බැව් දහස්ගණන් කව්වලින් ප්‍රකාශවෙයි, එබැවින් යවහන් දෙසින් යුත් නිදසුනක් ලබාගැණීම පවා ඉතා දුෂ්කරවිය, ලකුණුසරෙහි නිදසුන්කර තිබෙන්නේත් යවහන්

දෙසින් චිත්‍රකාව්‍යයෙකි, එබැවින් නිදසුනකින් පලමුකොට යම හත් දෙස ස්ථිරා සැපි දුහුනත් හඳුන්වනු යෙහෙකැයි සිතා ෂඩ්භාෂා පරමේශ්වර තොටගමුවේ ශ්‍රීරාහුල සංඝරාජ මහා ස්වාමිපාදයන්වහන්සේ විසින් විරචිත 'කාව්‍යශේඛර නම් ප්‍රශස්ත මහාකාව්‍යයෙන් හා 'සූරාබිදූත' නම් කාව්‍යයෙන්ද ඊට නිදර්ශන වශයෙන් කාව්‍ය කීපයක් ගෙණ කාව්‍යබන්ධනය කිරීමෙහි නියැලි සාධුජනයන්ගේ විජානනය පිණිස මෙහි බහාලන් නෙමු.

කාව්‍යශේඛරයෙහි–අහිරික අනොත ප ය
පවට විළිනැති නොබ නුය
නො සත් ගුන් සිත නුය
දනුව උදහස් නමැයි සැබ ව ය

පිළිවෙළ්නුපද තෙ න්
නො වේ ඉසුරු කරු ණෙ න්
සසරදෙස් විස දි න්
නිරෙදනම් ඒ නිවනි සැපව න්

මෙහි ප්‍රථම පාදාවසානයෙහි සිටි-ය--යන්නාට මුලින් යෙදූ-ප-යන්න සෙසුපාදයන්හිත් යෙදිය යුතුබැවි පූර්වාචාර්යසම්මත යයි* සෙසු අක්ෂරත්‍රයද මෙම නයින් දන්නේයි.

සූරාබිදූතයෙහි:—

එ ව න ගි රා පරපුටු සැලලිහි ණී ය
ර ව න තුරා නද කොවුලන් පුර වි ය
ස ව ණ පු රා හිමවනදෙව් තොස ලි ය
එ ව න ස රා සිරි කෙලෙස වණා ලි ය

---

* පදවිපර්යාස පදපූරණාදියෙන් වෘත්තය නොපිරිහෙලා පද්‍ය බන්ධනය කිරීම විනා ධර්මකොට්ඨාසප්‍රකාශකිරීමෙහිදී එයම ප්‍රමාණවන බැවින් මෙබඳු දොෂනැණ ඒ මහාකවිවරයෝ නො සැලකූවෝ දොයි හඟිමු. රත්නත්‍රයාදි ඉෂ්ටදෙවතා ප්‍රණාමානු ස්මරණාදියෙන් සකලකාව්‍යදොෂභඞ්ගත්වය පූර්වාචාර්ය සම්ම තයයි, ඒ විනා ව්‍යක්ෂරවිධානත්වයකින් එබඳු භඞ්ගත්වයක් නො ලැබෙන බැවින් පශ්චිමජනතාවන්ගේ භඞ්ගත්වය නොපතන සියල්ලන් විසින්ම මෙද පහලවූ ඒ නවීනතරදූෂිතය නො පිළිගතයුතු.

ප ත් යසසිරිසැපතින් දිසි සුර ලොව
සු ත් දසදහසක්යොදුනෙක දඹ දිව
වි ත් දෙරණෙහි පිහිටූ මෙන් බඹ ලොව
ප ත් හිමවනගිරි පෙදෙසෙකි මෙලෙ ස ව

එ න් නා දැක දුරින් බි සව සුවදැති සිහිල් පැන්
උ න් නා ඉසි දූනැ රජ දුව පෙරු දී තම සිය ති න්
ඉ න් නා රවතොව පුරු දුව වලදවා සතො සි න්
ද න් නා රුසිවරන් ඇ සුව ඇමදපන්සල්අවවවෙසෙ සි න්

ඉක්බිති 'යවහන්' මහාදෝෂය වර්ජිතකොට කාව්‍යබන්ධනය කරණවිදිය දක්වීමපිණිස පරවිසන්දේශයෙන්-

ය-යන්නට උදාහරණ.

ම හ ත සැපත මොහු ගුණතෙද පවස ත ය
ස ත ත සහස නෙත්දෙව්මැති පවස ත ය
ව ත ත සවත දිනගුරුසොම් බඹක ත ය
ස ම ත මෙසුර සැකහැරනත නොසම ත ය

මෙසේ පාදාවසානයෙහි සිටි-ය-යන්නට මුලින් එකාක්ෂරයක් (ත-යන්නක්)ම යොදා මෙකී "යවහන්" මහාදෝෂය වර්ජිත කිරීම බහුතරාචාර්‍ය්‍යසම්ප්‍රසාධනයයි.-ශේෂොදාහරණයන්ද මෙම නයින් අවබොධ කරණු.

ව-යන්නට උදාහරණ.

දු තු කම්රම් රජුමෙන් ලොව පුවත ර ව
දු තු පරසුම් ගණරන් දුතු සරද ර ව
දු තු පුල්වන් දෙව්රජකුලැ ගරුත ර ව
දු තු දෙව්රදු හවද මෙතෙපුල් සැලක ර ව

ගුත්තිලකාව්‍යයෙන්, හ-යන්නට උදාහරණ.

නොහල විරු සිරි ය හ
රිපදුරව රිවි උද ය හ
පබල මෙර දිරි ය හ
නැඟී රිය රියැදුරෝ සිටි ය හ

න්-යන්නට උදාහරණ.

සපැමිණ නන් දෙ සෙ න්
හිය වුරු දරු එක සෙ න්
විලසින් අසුර සෙ න්
එවෙත සිටියෝ නොයෙක් දුතු සෙ න්

මෙසේ යට කියනලද සියලු දොෂයන් දුරුකොට පූර්වාචාර්‍ය්‍යවර යන්ගේ යෙදුම් දුනගෙණ මාත්‍රා ඡන්දස් එලි යවහන් යනාදි ජනෙදලක්‍ෂණයන් සමකොට යොදා දක්‍ෂ කවිවරයෝ පද්‍යබන්ධනය කරති.

අෂ්ටගණයන් හා ඡන්දස් [ශාස්ත්‍රාදිය] නොදත් කවීන් විසින් බන්ධනය කරණලදකාව්‍යනැමැති කර්ණාභරණයතෙම පණ්ඩිත කවිජනයන්ගේ කර්ණයෙහි පිළන්ධනය නොකරණුලැබේ. තෙමේම බන්ධනය කළ කාව්‍යනැමැති වනම්බ්‍යයට ප්‍රවිෂ්ටව ගණ ඡන්දසුන්ගේ කිසිම හසරක් නොදූන ශඩ්කාවෙන් ජනිතවූ හිතියෙන් ඇවිදිනබව කියනලදී—හෙළදිව් අබිදනවනෙහි.

ගණසද නොදත් කිවිබැඳි කවිකන්බර ණ
පඩුකිවිදනන් කණ්‍ෑ නොම පළඳි කිසිදි න
තුඹු බැඳි කවිවෙනෙහි මැද වැද සැකබියෙ න
ඇවිදි කිසිම ගණසද හසරක් නො දූ න

## ඉෂ්ටානිෂ්ටාධිකාරය

නිමි.

———o———

## අලඞ්කාරාධිකාරය.

### උපමා උපමෙය.

සමහැවියව තැකූ කිසි වත් උවම් නම් වේ,
ලබනුයෙ උවම් ඒ හා උවමේ නමින් පල වේ. A.
ඉති උවම් උවමේ.

---

A සමහැවියව තැකූ; සමභාවයට තර්කණය කළාවූ; කිසිවත්, කිසිවස්තුවෙක්; උවම් නම් වේ, උපමා නම් වන්නේයි, ඒහා, ඒ උපමාව හා; උවම් ලබනුයේ, උපමා ලබන්නේ; උවමේ නමින් පලවේ, උපමෙය යන නාමයෙන් ප්‍රකාශ වේ-උවම් උවමේ, උපමා උපමෙය, ඉති, මෙසේයි.

සමානභාවයට කල්පනාකරණලද කිසිවස්තුවෙක් උපමා නම්වේ, ඒ උපමාවස්තුව හා උපමා ලබන,|(සමානබැව් ඇසුරු කරණ) වස්තුව උපමෙය යන නාමයෙන් ප්‍රකාශවෙයි යනු භාවයි.

මෙහි උපමා උපමෙය දෙදෙනාගේ හැඳිනගැණීම මෙසේයි- යම් කිසි කෙණෙකුන්ගේ ඇස්දෙක නිල්මහනෙල්පෙතිදෙකක් සමානයයි කියා ඇස්දෙකට නිල්මහනෙල් උපමා කෙලේ නම්- ඇස්දෙක උපමෙය වස්තුව වේ-නිල්මහනෙල් උපමාන වස්තුව වේ. " සඳවැනි මුහුණ" යයි කීකල්හි " සඳ " යනු උපමාන නම් වේ; "මුහුණ"යනු උපමෙය නම්වේ.

කුසජාතකයෙහි-

197 නි ල් ගෙලෙ පිල්කලඹෙව් නිති බබල න
ම ල් දම් දුල ඇඟෙ මුහුලස හැම දි න
දු ල් විදු කිඳු තොරතොවමින් වොරැඳ න
නි ල් ගන කුළු සිරිපැයි දනමන ගෙ න

මෙහි 'පිල්කලඹ' යනු උපමාන වස්තුව වේ-'මුහුලස' යනු උපමෙය වස්තුව වේ.

ගුත්තිල කාව්‍යයෙහි-

400 පෙ ර ඳු ර පුරව පවුරෙව් මෙර වටා සි ටි
ස මු දු ර තරඟ සෙමරව ලූ කිරණ මි ටි
ඳු ග ඳු ර පටන් අඩකින් එකිනෙකට මි ටි
ම න හ ර රුවන් සත්කුලපව් වලලූ දි ටි

මෙහි 'පවුරෙව්' යන තන්හි "පවුර" යනු උපමා වස්තුව වේ- "සත්කුලපව් වලලු" යනු උපමෙය වස්තුව වේ.

## . වස්තු පමාව.

 නුවන් ඉඳුවර වන් ඉඳු වන් උවන් සවැණියා,
සමදම් ඉති යෙදුයෙන් මෙ විශ්‍රු වත් උවම් නම්. A

---

සැළලිහිණි සන්දේශයෙහි-

63 දිගුනෙ ත් නිලුපුලෙව් රතදර පබල ර ග
සි රි ම ත් පුපුන්සඳවැනි උවන ම න ර ග
පැහැප ත් ලකල් රන්වන් විලසින් ලෙංව ග
වැ ද බ ත් පිළිම ගිම් වඳු පංයැ පැල දි ග

මෙහි 'දිගුනෙත්' යනු උපමෙය වස්තුව වේ—"නිලිපුල්" යනු උපමාන වස්තුව වේ—"සඳ" යනු උපමාන වස්තුවයි-'උවන' යනු උපමෙය වස්තුවයි.

පරවිසන්දේශයෙහි-

174 කෙ ල වන දිගුනෙත නිලිපු ල සේ යා
ලෙ ල පවතිත් රත්ලිය වි · ල සේ යා
න ල ගන රඟනා දැකැ නොල සේ යා
න ල ලතැ නුවනතැ රඟ සැල සේ යා

මෙහිදු 'නිලිපුල' යනු උපමාන වස්තුවයි—'දිගුනෙත' යනු උපමෙය වස්තුවයි.

මුවදෙව් දාවතෙහි-

58 නැගී බැසැ බමණ-බමරකැලනවල විමල්,
පුපුල්පිපුම්ලු බැබළි-සහ දුම් දුම්කොහෙල්ලෙව්.

මෙහි 'පුපුල් පිපුම්ලු' යනු උපමෙය වස්තුවයි-"දුම්කොහෙල්" යනු උපමාන වස්තුවයි.

මෙසේ නොයෙක්තන්හි නොයෙක් පරිද්දෙන් උපමා උපමෙය ඇත්තේද ආධුනිකයන්ගේ අවබෝධයට මේ ප්‍රමාණ හෙයින් නොදක්වූ තන්හිදු මේ නයින් අවබෝධ කටයුතුයි.

A සවැණිය, සර්වඥයන්වහන්සේගේ; නුවන්, නයනය(නෙත්‍රවය) තෙම; ඉඳුවරවන්, ඉන්දීවරවැන්න; උවන්, වක්ත්‍රයතෙම; ඉඳු වන්, චන්ද්‍රයාවැන්න; ඉති, මෙසේ; සමදම් යෙදුයෙන්, සමවූ ධර්මය යොජනා කළහෙයින්; මෙ වත්උවම්නම් විශ්‍රු, මේ වස්තු උපමා නම්යැයි කිවූ.

මෙහි නෙත්‍ර නීලෝත්පල වැන්නයි කීමෙන් නෙත්‍ර නීලොත්පල දෙදෙනා දීර්ඝත්වයෙන් හා වර්ණයෙන්ද සමානයයි හැඟේ, වක්ත්‍රය චන්ද්‍රයා වැන්නයි කීමෙන් වක්ත්‍ර චන්ද්‍ර දෙදෙනා සෞම්‍යශ්‍රීයෙන්හා කාන්තගුණයෙන් සමානයයි හැඟේ, මෙසේ සමාන වස්තු උපමාකළබැවින් මේ වස්තූපමා නම් අලඞ්කාරය වේ. එයින්කිහ-

කාව්‍යාදර්ශයෙහි-

2, 16 රාජීවමිව තෙ වක්ත්‍රං නෙත්‍රෙ නීලොත්පලෙ ඉව,
ඉති ප්‍රතීයමානෛක ධර්මා වස්තූපමෛව සා.

තෙ වක්ත්‍රං, තිගේ මුඛය, රාජීවම්ව, පද්මයක්වැන්න; නෙත්‍රෙ, ලොචනවය, නීලොත්පලෙ ඉව, ඉන්දීවර යුගමය වැන්නාහුයි; ඉති, මෙබඳුවූ; ප්‍රතීයමානෛකධර්මා, (අව්‍යක්තවාරය හෙතුකොටගෙණ අර්ථහෙයින්) ගම්‍යමානවූ උභය සමාන කාන්තාදි ගුණ ඇති; සා, ඒ උපමාතොමෝ; වස්තූපමාඑව, වස්තූපමාවම වේ.

මෙහි වක්ත්‍රය පද්මයක් වැන්නයි කීමෙන් වක්ත්‍රපද්මදෙදෙනා සෞම්‍යශ්‍රීයෙන් හා කාන්ත භාවයෙනුත් සමානයයි හැඟේ, නෙත්‍රවය නීලොත්පලවැන්නයි කීමෙන් නෙත්‍ර නීලොත්පල දෙදෙනා දීර්ඝත්වයෙන් හා වර්ණයෙන්ද සමානයයි හැඟේ, මෙසේ සමාන වස්තුවකට උපමාකළ බැවින් මේ වස්තූපමා නම් වන්නේය යනු භාවයි.

කාව්‍යශෙඛරයෙහි-

2, 34. දෙබැම දෙව් දුනු වැන්
පටු නළල අඩසඳ වැන්
ඇගෙ දිගු නුහ ස වැන්
කොලෙන රුසිරි රනෝවිලි වැන්

මෙහි භ්‍රෑයුගමය ඉන්ද්‍රචාපයන් වැන්නයි කීමෙන් භ්‍රෑයුගම ඉන්ද්‍රචාප දෙදෙනා වක්වූ ගුණයෙන් සමානයයිද, පටුවූ ලලාටය අර්ධචන්ද්‍රයා වැන්නයි කීමෙන් අවිශාල ලලාට අර්ධචන්ද්‍රදෙදෙනා ලක්ෂණයෙන් හා කාන්තියෙනුත් සමානයයිද-කර්ණයුගමය රන් උන්සිලප්‍රා වැන්නයි කීමෙන් දීර්ඝගුණයෙන් හා ලක්ෂණයෙනුත් සමානයයිද හැඟේ-මෙසේ උභය සමානකාන්තාදි ගුණප්‍රකාශවූ මේ අලඞ්කාරය වස්තූපමා නම් වේ-මෙසේම සෙසු කාව්‍යයන්හිද ලක්ෂණ බලා හැඳිනිය යුතුයි.

මෙහි පළමුකොට දක්වනලද්දේ උපමාලඞ්කාරයට අනන්‍යගත වස්තූපමාවයි-ඒ මේ උපමාඅලඞ්කාරය දක්වන ආචාර්‍ය්‍යදණ්ඩීන් විසින් කාව්‍යාදර්ශයෙහිද මෙසේ දක්වනලදී.

**2-14** යථා කථඤ්චිත් සාදෘශ්‍යං යත්‍රෝද්භූතං ප්‍රතීයතෙ,
උපමා නාම සා තස්‍යාඃ ප්‍රපඤ්චෝ'යං ප්‍රදර්ශ්‍යතෙ.

යත්‍ර, යම් විෂයෙක්හි, සාදෘශ්‍යං. කිසි පදාර්ථයන් දෙදෙනෙකුන්ගේ සාම්‍යය; යථා කථඤ්චිත්, ගුණාදිවූ කිසියම් ප්‍රකාරයකින්; උද්භූතං, ව්‍යක්තවූයේ; ප්‍රතීයතෙ, දන්නාලැබේද; සා, ඒ සාදෘශ්‍යත කතිතොමෝ; උපමා නාම, උපමා නම් අලඞ්කාරයයි දතයුතුයි; තස්‍යාඃ, එබඳුවූ ඒ උපමාලඞ්කාරයාගේ; අයං ප්‍රපඤ්චඃ, මේ විත්‍ර ප්‍රභෙදය තෙම; ප්‍රදර්ශ්‍යතෙ, දක්වනුලැබේ-

මෙසේ දක්වනලද උපමාලඞ්කාරය — ධර්මෝපමා-වස්තූපමා-විපර්‍යාසොපමා-අන්‍යොන්‍යොපමා- නියමොපමා-අනියමොපමා-සමුච්චයොපමා-අතිශයොපමා—උත්‍ප්‍රෙක්ෂිතොපමා- අද්භූතොපමා-මොහොපමා-සංශයොපමා-නිර්ණයොපමා-ශ්ලෙෂොපමා-සමානොපමා-නින්දොපමා-ප්‍රශංසොපමා-ආචිඛ්‍යාසොපමා-විරොධොපමා-ප්‍රතිෂෙධොපමා-චටූපමා- තත්ත්වාඛ්‍යානොපමා-අසාධාරණොපමා-අභූතොපමා--අසම්භාවිතොපමා--බහූපමා--වික්‍රියොපමා-මාලොපමා-වාක්‍යාර්ථොපමා-ප්‍රතිවස්තූපමා-තුල්‍යයොගොපමා— හෙතූපමා; යයි දෙතිසක් ප්‍රභෙද ඇත්තේය.

මේ සිද්ධාන්තසඞ්ග්‍රහයෙහි දක්වන ලද්දේ-වස්තූපමා-අද්භූතොපමා-ශ්ලෙෂොපමා-නින්දොපමා-විරුධොපමා-යන මෙතෙකි-මෙකී උපමාලඞ්කාරයාගේ විස්තරය කාව්‍යාදර්ශයෙන් බලාගතයුතුයි.

මේ වස්තූපමාව ලා බඳිනලද කාව්‍ය බෙහෙවින් දක්වීම අප්‍රයොජන බැවින් කිහිපයක් ගෙණහැර දක්වමු-හේ මෙසේයි,

කාව්‍යශෙඛරයෙහි-

10-8 වතින් සොමි ස  ද වූ
රත්ලිය සිරින් බ  ද වූ
තෙනෙත් රත් පෙ  ද වූ
දුවතියන් තම ලහව කැ  ද වූ

| කුසජාතකයෙහි—85 | | ගුත්තිලකාව්‍යයෙහි—348 | |
|---|---|---|---|
| වතිනි සරි ඉ | න් දූ | පුල් නිලුපුලැ | සියෝ |
| රුසිරෙන් දලනිඳු | න් දූ | මිණුරු පිල් වරලැ | සියෝ |
| සඳසි පුර ල | න් දූ | වැද පුර විල | සියෝ |
| සඳලුතලවල කෙළිනි ප | න් දූ | සුරිඳු ගිය කරුණුපිළිවිසියෝ | |

ගිරාසන්දෙශයෙහි-

24 ක ලා  සපිරි සිසි වත මහ ක  ලා ව න්
නි ලා  නිබෙන බැම ඉඳු දුනු පි  ලා ව න්
දූ ලා  තනහ තන රණහස පි  ලා ව න්
බ ලා  පියැද යනු බැරි පුර ක  ලා ව න්

## අ ද් භු තො ප මා ව.

ඉඳුසැව් පිරිවැටූ මහමෙර ලොවැ දුගුම් වන,
සුගතිඳු බඳ එබඳු වී හඟනේ අබුතුවම් නම්. A

A ඉඳුසැව්, ඉන්‍ද්‍රවංපයෙ (දෙව්දුනුවලි)න්; පිරිවැටූ, පරිවෘතවූ; (හාත්පසින්පිරිවරණ ලදැවූ;) මහමෙර, මහමෙරුපර්වතය; ලොවැ, ලොකයෙහි; දුගුම්වන, ජඩගමවූයේ(ඇවිදිනේ)නම්; සුගතිඳු බඳ, සුගතෙන්‍ද්‍රයාගේ දෙහය; එබඳු වී, එබඳු (එයාකාර)යයි කියා; හඟනේ, චින්තනය කිරීම, අබුතුවම් නම්; අද්භුතොපමා නම් වේ–

දෙව්දුනුවලින් හාත්පසින් පිරිවරා වටකරණලද මහමෙරුපර්වතරාජයෙක් ලොකයෙහි ඇවිදිනොත් සවණක්රැසින් පරිවෘතව වොරජනා සර්ඥයන්වහන්සේගේ ශ්‍රීදෙහය එබඳුයයි කියා අද්භුතවස්තුවක් (පුදුම ආශ්චය්‍ය්‍යජඞගමස්වරූපිමහාමෙරුවක්)උපමා කොට සිතීම අද්භුතොපමා නම් වේ.

මීට "අභූතොපමා" යන නාමය බොහෝ කලක පටන් ව්‍යවහාර කරනෙණ එන නමුත් එයකිසිසේත් නොගැලපෙන නිසා මෙයින් හඟවන්නේ අභූතොපමා නොව අද්භුතොපමා බව අප මතයි. "අද්භුතොපමා, අභූතොපමා"යි ප්‍රභෙද දෙකකි, එයින් අද්භුතය නම් ආශ්චය්‍ය (පුදුම) යෙකි, එබඳුවූ යම්කිසි වස්තුවක් ලෙව්හි ඇතහොත්–ඇත්නම්, යනාදිවූ අනියම වචනයෙන් කියා එය යමක් හා සමානාකාරයෙන් ආරොපණය කොට කීම අද්භුතොපමා නම්.

අභූතය නම් නූවූ (බොරු)වකි, කිසිසේත් නොවිය හැකිවූ එබඳු යමක් කියා එමෙන් චක්‍රාදි කිසිවක් බැබළිම් ආදින් යුක්තයයි නිශ්චය වශයෙන් කිසියම් වස්තුවකට යමක් උපමාකර කීම අභූතොපමා නම්. ඒ දෙක පිළිවෙළින් මෙසේ දතයුතුයි.

කාව්‍යාදශීයෙහි–

2, 24. යදි කිඤ්චිද් භවෙත් පද්මමුද්භ්‍රූ විභ්‍රාන්තලොචනම්,
තත් තෙ මුඛශ්‍රියං ධත්තාං මිත්‍යසාවද්භුතොපමා.

උද්භ්‍රූ, උද්ගතවූ බැමඇති; විභ්‍රාන්තලොචනම්, විභ්‍රමත්වූ ඇස්ඇති; කිඤ්චිත්පද්මම්, කිසිපද්මයෙක්; යදි භවෙත්, ඉදින් වේ නම්; තත්, ඒ පද්මයතෙම; තෙ, තිගේ; මුඛශ්‍රියං, වදනකාන්තිය; ධත්තාම්, උසුලාමායි; ඉත්‍යසෞ, මෙබඳුවූ මෝතොමෝ; අද්භුතොපමා, අද්භුතොප්‍රමායයි දතයුතු.

මෙහි උක්තප්‍රකාරවූ පද්මයක්හුගේ අභාවය හෙතුකොටගෙණ අද්භුතොද්භාවනායෙන් මුඛපද්මයන්දෙදෙනාගේ සාදෘශ්‍යකාරකයෙන් මෝතොමෝ අද්භුතොපමා නමැයි යේසි.

සියබස්ලකරෙහිද-

91 නැඟිබැම සසලනෙත්-යම්කමලක් වත්හොත්,
මෙහ් වත්සිරි දෙරේ නි-වියත් අසිරිඋවම් නම්.

නැඟිබැම, උද්ගතවූ භ්‍රූඇති; සසලනෙත්, චපලවූ නෙත්‍ර ඇති; යම්කමලක්වත්හොත්. යම් පද්මයක් විද්‍යමානවත්හොත්; මෙහ්, එසේවූ පද්මයතෙම; නි වත්සිරි දෙරේ, තීගේ මුඛශ්‍රීය දරන්නේයයි; වියත,කියත්හොත්; අසිරිඋවම්නම්,ආශ්චර්‍ය්‍යෝපමා නම් වේ; (අද්භුතෝපමා නම්.)

ජිවනිදසුන් කව්සිළුමිණෙහි-

178 ඇත රුසිරු විසිත්—රුවන්ගන එනි මුමූ,
තෝරුවන්දහර වන්—සුවහස්වැම් වැජඹෙනා.

රුසිරු, සිත්කලුවූ; විසිත්, විචිත්‍රවූ; රුවන්ගන, රත්නමෙඝයක්; ඇත, විද්‍යමානවූවහොත්; එනි, ඒ රත්නමෙඝයෙන්; මුමූ, වහනය කරන්නාවූ; තෝරුවන් දහරවන්, තොයරත්නධාරාවන් වැනිවූ; සුවහස්, ලක්ෂගණන්; වැම්, ස්තම්භයන්; වැජඹෙනා, විරාජමාන වූ—යනුයි-

මෙහි අවිද්‍යමාන තොයරත්නධාරාවන් හා ස්තම්භයන්ගේ සාදෘශ්‍යාභිධානය හෙතුකොටගෙණ මෙය අද්භුතෝපමායයි කියා හැඳින ගතයුතුයි—

සැලලිහිණිසන්දෙශයෙහි-

83 සි රි ස ර ගිඟුල්විලැ සේහස වැලෙව් ග න
සු ර ව ර සලෙල රත ලවනත දළ දුල න
මන හ ර සද වලාපෙළ කොළවර පෙණෙ න
පැහැසර ල සද පුවලෙක් ඇත්නම් එමෙ න

මෙහි අවිද්‍යමාන බාලචන්ද්‍රයන් දෙදෙනා හා සාදෘශ්‍යාභිධානය හෙතුකොටගෙණ අද්භුතොපමානම් වේ-

සැවුල්සන්දෙශයෙහි-

190 සි රි ස ර සව් කෙළිත රණොවිලිපුරැ සොබ න
සු ර ව ර සවණ්පුනැ මිණ්තෝවූ බබල න
තු ගු ත ර අදුන්ගිරිකුළු පුගපසැ දිලෙ න
පැහැ ස ර ලකිරු පුවලෙක් ඇතහොත් එ මෙ න

මෙහිදු—අසම්ප්‍රජනපච්චිතකුවයාගේ උභයපාර්ශ්වයෙහි බබලන්නාවූ ප්‍රභාසාරබාලසූර්‍ය්‍යුගමයක්හුගේ අභාවය හෙතුකොටගෙණ මිණිතෝවූ බාලසූර්‍ය්‍යුගමදෙදෙනාගේ සාදෘශ්‍යකථනයෙන් මේද අද්භුතෝපමා නම්.

එහිම-

61 හි ම ග   කෙලෙස මෙරගිර වූ පුවතර   ම
ව ල ග   කර රහස පදඇත ඇතොත්තු   ම
සි ත ග   නැඟී බම වසි පා තම මනි   ම
මත ග   නැඟුම් ඉත් මෙරජුගෙ කියනු කි   ම

මෙහි—හිමාලයපර්වතය-කෛලාශපර්වතය-මහාමේරු පර්වතය, යන මේසා මහත් විශාලවූ අවිද්‍යමාන හස්තිරාජයෙකුගේ සාදෘශ්‍යාභිධානය හෙතුකොටගෙණ මෝතොමෝ අද්භූතොපමා නම් වන්නීය.-සෙසුතැන්හිද මෙම නයින් දත්නේයි.

අද්භූතොපමාවවූකලී-කාව්‍යාදර්ශයෙහි-

2-38 සර්වපද්මප්‍රභාසාරඃ සමාහෘත ඉව ක්වචිත්,
ත්වදානනං විභාතීති තාමද්භූතොපමාං විදුඃ.

ත්වදානනම්, තිගේමුඛය; ක්වචිත්, කිසිතැනෙක්හි; සමාහෘතඃ, රැස්කරණලද; සර්වපද්ම ප්‍රභාසාරඃ ඉව, සියලුපද්මයන්ගේ ප්‍රභාසාරයක් මෙන්; විභාතීති, හොබනේයයි; ඉති, මෙබඳුවූ යම් උපමාවක් ඇද්ද; තාම්, ඒ උපමාව; අද්භූතොපමාම්, (අවිද්‍යමානවූ පද්මප්‍රභාසාරය හා සාදෘශ්‍යාභිධානය හෙතුකොටගෙණ) අද්භූතොපමායයි; විදුඃ, දනිති.

සියබස් ලකරෙහිද-

105 තැනෙක්හි වූ හැම-පියුම්පැහැසරරැස් මෙන්,
වොරජනෙ ති වත් යත්-නොඋවම් නම් වියත් මේ.

තැනෙක්හිවූ, එකස්ථානයෙක්හි ජනිතවූ; හැමපියුම් පැහැසර රැස්මෙන්, සර්වපද්මයන්ගේ ප්‍රභාසාරරාශියක් මෙන් (හෙවත්) ලොකයෙහි විද්‍යමානවූ පද්මයන්ගේ ප්‍රභාසාරය එකතැනෙක ඉපද රාශිව සිටියාක් මෙන්; ති වත්, තිගේ වක්ත්‍රය; වොරජනේ, විරාජමානවන්නේයයි; යත්, කියත්හොත්; මේ, මේඋපමාව; නොඋවම් නාම් වියත්, අද්භූතොපමා නැමැයි කියත්.

ඊට උදාහරණ-කව්සේකරෙහි-

1,30 දඹදිවැ ඉසුරු බ   ර
රැස්කොට තුබූ තැන්පු   ර
කොසොල්රට මනහ   ර
සැවැත් නම් වි පුරෙක් පුවත   ර

බුදුගුණලකරෙහි-

21 ඇමතැනැ ඇති සැප   ත්
එකතැන් කලෙව් සිරිත   ත්
දුක දුක රිසි තුමු   ත්
නැතැයි යන සම්පතෙක් එහි නැත්-යනුයි.

## ශ්ලේ ෂෝ ප මා ව.

පෙදන් අතින් හෝත-දෙ වතට සම ගුණ යොදා,
පවසත සබඳ අරුතෙන්-එ විසූ සෙලෙසුවම් නම්. A

පිණවි රා වඩා-කොස් දඹු පත් ගුණ සියෝ,
දල පල් දුහ ද සිරියේ-පැරදී පිදුමැය සරණින්. B

සුවට කෙමිනුලැඟි-අඹරතැ රැඳි කොකුම් වත්,
තරුපුත් ඇල් යපනුයේ-වම් තෙනෙ නොම ලතික් රැස්. C

---

අපේ මේ මතයේ ස්ථිරත්වය මේ දැක්වූ නිදසුන් හා සිදත්සඟරා ගීය සසඳා බැලීමෙන් ඔප්පුවේ, "ශඛඛ භූත පිසාච" යනාදින් බිඳී ආ "සක් බූ පිසස්" ආදිය සලකා බැලීමෙන් "භූත,, ශබ්දයෙන් "බුතු,,යි නොව "බූ,,යි බිදෙන බව ඥානවිෂයයි, එහෙයින් "අභූත,, ශබ්දයෙන් බිඳීම "අබූ,,යි වියයුතුයි.

සිදත්සඟරා ගියෙහි දක්වන "අබුතු,, යන්න "අභූත,, යන්නෙන් නොව "අද්භූත,, යන්නෙන් බිඳුනු බව මෙයින් ප්‍රසිද්ධව බැවින්ද ඒ "අභූතොපමා,, නොව "අද්භූතොපමා,,යි සැලකීම යුක්තතරයි, එහෙයින් පූර්වාචාර්යවචනානුසාරීව විමසා බලා පණ්ඩිතජනයෝ අපේ මේ ව්‍යාපාරයෙහි සන්තොෂ වෙත්වා.

A පෙදෙන් (හෝත,)පදයෙන් හෝ; අතින්හෝත, අර්ථයෙන් හෝ; දෙවතට, උභය වස්තුවට; සමගුණයොදා, තුල්‍ය(සමාන)වූ ගුණ යොජනය කොට; අරුතෙන්, අර්ථයෙන්; සබඳ පවසත, සම්බන්ධයක් ප්‍රකාශකරණ කල්හි; එ සෙලෙසුවම් නම් විසූ, ඒ ශ්ලෙෂොපමා නමැයි කීවූ.

පදයෙන්වත් අර්ථයෙන්වත් වස්තුදෙකකට සමානගුණ යොදා, අර්ථයෙන් (එහි) සම්බන්ධයක් ප්‍රකාශකරන්නේ වීනම් එය ශ්ලෙෂොපමාය යනු භාවයි—ඊට උදාහරණ මෙසේයි.

B පියවි රාවඩා, ප්‍රකෘති රාගය වර්ධනය කොට; (ද්‍යෝහෝ නොහොත්) ජනානුරාගයෙන්; කොස්, කොෂයෙන්; (ද්‍යෝහෝ නොහොත්) කොසඇටයෙන්; දඹු, නාලයෙන්; (ද්‍යෝහෝ නොහොත්) සෙනායෙන්; පත්, පත්‍රයෙන්; (ද්‍යෝහෝ නොහොත්) වාහනයෙන්; ගුණ, සූත්‍රයෙන්;(ද්‍යෝහෝ නොහොත්) ෂඩ්ගුණයෙන්; සියෝ,සඞ්ගතවූ (එක්වූ);පිදුම, පද්මයතෙම;දලපල් දුහද සිරියේ, ජලපඞ්ක දුර්ගයෙහිද ස්ථානයකෙළේ;ඇයසරණින්, ඇගේ පාදයෙන්; පැරදී, පරාජිත වී.

C සුවට, මනාවූ වෘන්තයක් ඇති; කෙමින්, ක්‍රමයෙන්; උ

ලැඟි, උල්ලඞ්ඝිතවූ; අඹරතැ, ආකාශාන්තරයෙහි (දෝහෝ නොහොත්) වස්ත්‍රාන්තරයෙහි, රැඳි, රඤ්ජිතවූ; කොංකුම්වන්, කුංකුම වර්ණ ඇතියෙක්; තරුපුත්, තාගේ ශත්‍රැත්; ඇල්, ශීතකාලයෙහි; යපත්නුයේ, සන්සිඳුවන්නේය (එතෙම්;) වම්තෙනෙ නොම, වනිතාවගේ පයෝධරය නොවේ; ලතික්රැස්, අභිනව සූය්‍ය්‍යාදී.

මෙහි පදශ්ලෙෂය අර්ථශ්ලෙෂ යයි කියා දෙකකි—පදශ්ලෙෂය එකස්වරූපපදයෙන් උභයවස්තුවට සමවූගුණ යොද, සම්බන්ධය ප්‍රකාශකිරීමයි-අර්ථශ්ලෙෂය එකස්වරූපඅර්ථයෙන් උභයවස්තුවට සමානගුණ යෝද, සම්බන්ධය ප්‍රකාශකිරීමයි—'පියවීරවඩං, යනාදිය පදශ්ලෙෂ නම් වේ-මෙහි ප්‍රකෘති රාගය විභීනයකොට කියාද ජනානුරාගයෙන් කියාද එකස්වරූප පදයෙන් අර්ථදෙකක් කිය යුතු හෙයින් පදශ්ලෙෂ නම් වේ-'සූවට කේමිනුලැයි' යනාදිය අර්ථශ්ලෙෂ නම් වේ-මෙහි; සූවට, මනා වටවූ කියා අර්ථකිකල පයොධරය වටවූ බැවින් පයොධරයද සූය්‍ය්‍යා වටබැවින් සූය්‍ය්‍යාද මේ එකම අර්ථයෙන් සමානකොට හැකවූහෙයිනි-මෙකී අර්ථ ශ්ලෙෂය සිංහලකවිහි අපවිසින් වැඩිකොට නොදක්නාලදී, පද ශ්ලෙෂය වූකලී ඇතම්තැන්හි පැණේ. ඒ මෙසේයි.

කව්සිළුමිණෙහි-

27 පමාදෙනෙ ඉසුරෝ-පුරෙහි කෙලෙස් නිවෙස්නෙන්,
තලා දෙළෙ සඳ බඳමෙන්-බුජඟුනුරෙහි වැලඳමෙන්.

එ පුරෙහි පමාදෙනෝ ඉසුරෝ, ඒ පුරයෙහි ප්‍රමාදජනයෝ ඊශ්වරයෝයි; කෙසේදයත්?-කෙලෙස් නිවෙස්නෙන්, කෛලාශ පර්වතය නිවාසකොට ඇති හෙයින් (දෝහෝ නොහොත් කෙල ශයන්ට නිවාසස්ථානවූ හෙයින් දෝහෝ;) තලා, තිලකද්‍රැම ඇතිහෙයින් (දෝහෝ නොහොත් තිලකාභරණ ඇතිහෙයින් දෙහෝ;) දෙළෙසදබඳමෙන්, ජටා චන්ද්‍රබන්ධනයෙන් (දෝහෝ නොහොත් ක්‍රීඩාපුරයෙහි අදහස් බැඳිමෙන් දෝහෝ;) බුජඟුනු රෙහි වැලඳමෙන්, සප්පහාර * ඇතිහෙයින් (දෝහෝ නො හොත් බුජඟුන් (ධූර්තයන්) වක්‍ෂඃස්ථලයෙහි වැලඳගැන්මෙන් දෝහෝ;(එපුරෙහි පමාදෙනෝ ඉසුරෝයි.)†

---

* සපීංහරණ-සමහර.

† මෙකී 'කව්සිළුමිණ' විනා අර්ථශ්ලෙෂාපොපමාදිය පවා ඇති පිරිසිදු ගැඹුරු පුරාණ සිංහල ප්‍රශස්තකාව්‍යයක් මෙ කාල ලකතුළ නොමැති බැව් කියම්හ.

කාව්‍යශෙඛරයෙහි-

11 පිරි සරසවිය ර          ස
සුබතරඟ නතුමින් රැ          ස
රන්වනඹර සිවෙ          ස
වදිම් මුනිරජ සුපුර සඟ තොං          ස
12 සෙව් සුවිමල් සව          ග
පලකල මහවියත් ම          ග
කෙලෙසඟ නිවූ නිස          ග
වදිම් සදහම්බාරුසි ග          ග
1,3-දිනිසුරු බස පුබු          දු
අඟතෙක් ගුණෙන් පිරි සු          දු
කෙමිදුල නලෙන් ඉ          දු
වදිම් මහසඟ තඹුරුකැල බ          දු
2,39-නත් වරද ලොප්          ව ණ
කිරිය අදියර සත්          ව න
අදෙස් හැදගිලි          ව න
එ සද ගුණයෙන් සදලකුණුව න

පරවිසන්දෙශයෙහි-

17 රැඳි රජමිතුරු මහසෙන් උවිඳු කිවි          ගු රු
සුවිමල් කමල් සරමින් දද දන ඉ          සු රු
සුතු හරිසඳු නිරිඳු විජයොත් පහනි          සු රු
මෙලෙසින් මෙ පුරවර පුරදර පුර අ          සු රු

සැවුල්සන්දෙශයෙහි-

66 තර සිව්පා ගුණ දම බැදෙමින් සිටි          න
දල දම් සොඬ පිරිසිඳු කිත් සිරි රඳ          න
සතඟ දෙරණ සුපිහිටි ගතිනි වොරද          න
මෙ නරවර කලණ වරණෙව් දිසි නිති          න

කව්සිළුමිණෙහි-

416 ලහුණිනි පුල් කඳුලු-සල පියපුරු මඬලෙන්,
කිලිටිඹරෙන් ඝනසමං-වියෝ පමං විලස් ලද.

ලහුණිනි, තරුණ කලිරඇති හෙයින් (දොහෝ නොහොත්) ශෘදයොෂණ ඇතිහෙයින්; පුල්කඳුලු, පුලලවූ කඳුලවෘක්ෂ ඇති හෙයින්(දොහෝ නොහොත්)විපුලවූ බාෂ්ප ඇතිහෙයින්;සල පිය පුරුමඬලෙන්, චඤ්චලවූ මේඝමණ්ඩලයෙන් (දොහෝ නොහොත්) චඤ්චලවූ පයොධර මණ්ඩලයෙන්; කිලිටිඹරෙන්, කලිෂ්ටවූ ආකාශයෙන් (දොහෝ නොහොත්) මලිනාඹරයෙන්; ඝනසමං, මෙඝකාලය තෙම; වියෝපමං විලස් ලද, විරහකාන්තාවගේ විලාස ලදී,(සනාකානොපමායි.)

මේ ශ්ලේෂෝපමාව දක්වන අලඞ්කාරචාරීන් විසින්

2,28, ශිශිරාංශු ප්‍රතිස්පර්ධී ශ්‍රීමත් සුරභි ගන්ධි ච,
අම්භෝජමිව තෙ වක්ත්‍රමිති ශ්ලේෂෝපමා ස්මෘතා.

තෙ වක්ත්‍රම්, තිගේ මුඛයතෙම; අම්භෝජමිව, පද්මයක් වැත්තේයි; කෙසේදයත්-ශිශිරාංශු ප්‍රතිස්පර්ධී, (සමාන කාන්තිත්වය හෙතුකොටගෙණ) චන්ද්‍රයාහට ප්‍රත්‍යනීකවූ (නොහොත් චන්ද්‍රොදයෙහි සංකොච සෙවනය හෙතුකොටගෙණ) චන්ද්‍රයාහට ප්‍රතිපක්‍ෂවූ; ශ්‍රීමත්, කාන්තිමත්වූ (නොහොත් ශ්‍රීදෙවතාවගේ වාසය හෙතුකොටගෙණ) ශ්‍රීමත්වූ; සුරභිගන්ධිච, හෙද ශොභනවූ සුවද ඇත්තාවූද; තෙවක්ත්‍රම්, තිගේ වක්ත්‍රය; අම්භෝජමිව, පද්මයක් වැත්තේයි, ඉති,මෙසේ (ශ්ලෙෂොත්පාදනයෙන් චන්ද්‍රවක්ත්‍ර දෙදෙනා කෙරෙහි උපමාප්‍රයොගය හෙතුකොටගෙණ;)ශ්ලෙෂොපමා, ශ්ලෙෂොපමා නමැයි; ස්මෘතා, දත්තාලදු.

2,29 සරූපශබ්දවාච්‍යත්වාත් සා සන්තානොපමා යථා,
බාලෙවොද්‍යානමාලෙයං සාලකානනශොභිනී.

සරූපශබ්දවාච්‍යත්වාත්, සමානවූ ශබ්දයෙන් ප්‍රකාශයෙන්; සන්තානොපමා, 'සන්තානොපමා නමැයි කියනු ලැබේ; සා, හෝතොම; යථා, මෙසේයි; ඉයම්උද්‍යානමාලා, මේඋද්‍යානපඞ්ක්තිතොමෝ; බාලෙව, බාලස්ත්‍රියකමෙන්; සාලකානන, සල්වනයෙන්; දොහෝ නොහොත්; සාලක, කියඹුසහිතවූ; ආනන, මුඛයෙන්; ශොභිනී; හොබිනියි.

සියබස්ලකරයෙහිද-

95 නි වූවන් සසක්-පිළිවස් සුවඳසිරිවත්,
සුපුල්කමලෙව් ලඟනේ-වියනෙක් මේ සෙලෙසුවම්.

සසක්පිළිවස්, ශශාඞ්කප්‍රතිපක්‍ෂවූ හෙවත් චන්ද්‍රයාහට ශත්‍රුවූ; සුවඳ, සුගන්ධවූ; සිරිවත්, ශ්‍රීවන්තවූ; නිවූවන්, තිගේ වදනයතෙම්; සුපුල්කමලෙව්, සුත්ඵුල්ලපද්මයක්මෙන්;ලඟනේ, හොබනේයයි; වියත්, කියත්හොත්; මේ, මෙතෙම; එක්සෙලෙසුවම්, එකශ්ලෙෂොපමායි හෙවත් අභින්නපදශ්ලෙෂොපමායි.

96 කළු හෝපලු මූහුලු—වරලින් යුත් රුපුනුවර,
තා ඇතොරත් හා සදිස්-වියත් පබඳසෙලෙසුවම්.

කළු, කළුගසින්හා; හෝපලු, හෝපලුගසින්හා; මූහුලු, මූහුලුගසින්හා; වරලින්යුත්, වරල්ගසින් යුක්තවූ; දොහෝ නොහොත්; හෝපලු, අශොකපල්ලවයන්; මූහුලුකළු, මුකුලිතකළාවූ හෙවත් කෙශලෙයෙහිලා ගවසන ලද්දාවූ; වරලින්යුත්, කෙශකලාපයෙන් යුක්තවූ දොහෝ; රුපුනුවර, ශත්‍රුනගරය; තා ඇ

තොරන් හා සදිස්, තාගේ අන්තඃපුරස්ත්‍රීන්හං සදෘශයයි; විෘත්, නියත්හොත්, පබඳසෙලෙසුවම්, ප්‍රබන්ධශෛලෂොපමංයි; (සන්තා නශෛලෂොපමායි.)-ශෛලෂාලඞ්කාරයවූ කලී කාව්‍යාදර්ශයෙහි-

2,310 ශලිෂ්ටමිෂ්ටමනෙකාර්ථමෙකරූපාන්විතං වචඃ,
තදභින්නපදං භින්නපදප්‍රායමිති විධං.

අනෙකාර්ථම්, නොයෙක්අර්ථඇත්තාවූ; එකරූපාන්විතම්, (එක ශබ්දස්වභාවවූ) සමානරූපයෙන් යුක්තවූ; වචඃ, වචනය, ශලිෂ්ට මිෂ්ටම්, ශලිෂ්ටයයි කැමතිවනලද; තත්, ඒ ශලිෂ්ටයතෙම; අභින්නපදං, අභින්නපදප්‍රාය යයිද; භින්නපදප්‍රායමිති, භින්නපද ප්‍රාය යයිද කියා; විධං, විප්‍රකාර වන්නේයි.

නොයෙක්අර්ථඇති එකශබ්දස්වභාවවූ සමානරූපයෙන් යුක්තවූ වචනය ශලිෂ්ටයයි කැමතිවනලදී, ඒ ශලිෂ්ටයතෙම අභින්නපදප්‍රායයි කියාද භින්නපදප්‍රායයි කියාද විප්‍රාකාරවන්නේය-ඒවනිදසුන් මෙසේයි.

2,311 අසාවුදයමාරූඪඃ කාන්තිමාන් රක්තමණ්ඩලඃ,
රාජා හරති ලොකස්‍ය හෘදයං මෘදුභිඃ කරෛඃ.

උදයම්; උදයපර්වතයට; (දොහෝ නොහොත්) රාජ්‍යරූප යෙන්වූ අභ්‍යුදයට; ආරූඪඃ, නැංගාවූ; කාන්තිමාන්, සෞම්‍යවූ; (දොහෝ නොහොත්) අභිරූපවූ; රක්තමණ්ඩලඃ, රත්වූ බිම්බ ඇත්තාවූ; (දොහෝ නොහොත්) අනුරක්තවූ අමාත්‍යමණ්ඩලඇති තාවූ; අසෞ රාජා, මේ චන්ද්‍ර (දොහෝ නොහොත්) රජතෙම; මෘදුභිඃ, මොළොක්වූ; කරෛඃ, රශ්මීන් (දොහෝ නොහොත්;) මෘදුභිඃ, අනුවෙජවූ හෙවත් මධ්‍යවූ; කරෛඃ, අතින්; ලොකස්‍ය, සියලු ලොකයාගේ; හෘදයම්, සිත; හරති, ගන්නේයි.

මෙහි පදභඞ්ගයක්නැතිව තුබූතුබූ පරිද්දෙන්ම චන්ද්‍රනෘපති දෙන්නාහට පදයොජනාව හෙතුකොටගෙණ මේතෙම අභින්නපදශෛලෂයයි දතයුතු.

සියබස් ලකරෙහිද.

296 දියඹුදුනවෙක ලකර-කෙසුරුසරසිරි සියෝ,
ලද පලතෙදිනි පුබුදු-පිළිදූන් මෙ රජකම්ලුදු.

දියඹුදුනව, ජගත්මස්තකයට (නොහොත්) ජලමස්තකයට; එක ලකර, එකාලඞ්කාරවූ; කෙසුරුසරසිරි, සිංහසමාන සාරශ්‍රීන්; (නොහොත්) කෙශරසාරශෙභී ශ්‍රීන්, සියෝ; යුක්තවූ, මෙරජකම් ලුදු, මේ රාජොත්තමද; (නොහොත්) මේ නායකපද්මයද; පිළිදූන්; දූන්වනාභි; ලද, ලද්දාවූ; පලතෙදිනි, ප්‍රසිද්ධවූ තෙජස් කරණකොටගෙණ; (නොහොත්) ව්‍යක්තවූ සූර්‍ය්‍යාතාපය කරණකොට ගෙණ; පුබුදු, ප්‍රබොධ වී,

මෙහි 'අයමුදුනට' යනපදයද, 'කෙසුරුසරසිරි' යනපදයද, 'මෙරජකමල්' යනපදයද, 'පලතෙදිනී' යනපදයද, ඔබිනොබ අක්ෂරයන් පදයන් නොබිඳ මේ දෙපක්ෂයටම අර්ථගතවූතු හෙයින් මේ අභින්නපදශ්ලෙෂ නමි.

2,312, දොෂාකරෙණ සම්බධනක්ෂත්‍රපථවර්ත්තිනා,
රාඥ ප්‍රදොෂො මාමිත්ථමප්‍රියං කිං න බාධතෙ.

දොෂාකරෙණ, රාත්‍රියට ආශ්‍රයවූ (දොහෝ නොහොත්) ශොකයාදි දොෂයට ආකරවූ; නක්ෂත්‍රපථවර්ත්තිනා, ආකාශයෙහි පවත්නාවූ; (දොහෝ නොහොත්) දුෂ්ටනිග්‍රහ ශිෂ්ටපරිපාලන ලක්ෂණවූ රාජමාර්ගයෙහි නොපවත්නාවූ; රාඥ; චන්ද්‍රයා හා; (දොහෝ නොහොත්) රජුහා; සම්බධනා, එක්වන්නාවූ; ප්‍රදොෂඃ, රාත්‍රිමුඛය, (දොහෝ නොහොත්) ප්‍රකෘෂ්ටවූ දොෂඇතිතැනැත්තේ; ඉත්ථම්, මෙසේ; අප්‍රියම්, ප්‍රියාරහිතවූ; (දොහෝ නොහොත්) අප්‍රියවූ; මාම්, මා; කිං න බාධතෙ, කුමකැයි නො පෙළන්නේද.

මෙහි උක්තප්‍රකාරයෙන් 'ප්‍රදොෂඃ' යන මේ ආදීන්ගේ භඞ්ගය හෙතුකොටගෙණද, 'රාඥ' යන මේ පදයාගේ අභෙදය හෙතුකොටගෙණද; මෙතැන්හි භින්නපදප්‍රායවූ ශ්ලෙෂයයි දතයුතු.

සියබස් ලකරයෙහිද.

297 සිට දසරදදූමින්-එරජ නා වොරජනා,
අනුබද දන් සිරින් බද-සියසපුව ලොලුනදහස්.

දසරද දූමින් සිට, දශරාජධර්මයෙන් පැවැත; වොරජනා, විරාජමානවූ; එරජනා, ඒරාජොත්තමතෙම; අනුබද දන්සිරින්, නිරන්තරවූ දානශ්‍රීන්; සියසපුවලොලුන්, ස්වසම්පත්තිලුබ්ධයන්ගේ; අදහස්බද, අධ්‍යාශය බද; හෙවත් තමාගේ සම්පත්තිය කැමැත්තවුන් දානශ්‍රියෙන් සිත්ගති; (නොහොත්;) සරද, සාරදවූ; දූමින්, දූමයෙන් හෙවත් යහැකිල්ලෙන්; සිටද, ස්ථිතවද; වොරජනා, හොබනාවූ; එනාරජ, ඒ හස්තිරාජතෙම; දන්සිරින්; මද ශොභාවෙන්; අනුබද, අනුබද්ධවූ; සියසපුවලොලුන්, ශතගණින් භෘඞ්ගලොලයන්ගේ; අදහස් බද, අධ්‍යාශ ගති.

මෙහි 'දසරද' යනාදිවූ පදයන් භින්නව ඔබිනොබ කොස් දෙපක්ෂයටම අර්ථය යෙදෙන හෙයින් භින්නපදශ්ලෙෂ නමි.

මීට අනතුරුව අභින්නක්‍රියාදි සප්තශ්ලෙෂකෙණෙකුත් දක්වති—ගේ මෙසේයි.

2,314 අසත්‍යභින්නක්‍රියඃ කශ්චිදවිරුද්ධක්‍රියො 'පරඃ,
විරුද්ධකර්මා චාසත්‍යන්‍යඃ ශ්ලෙෂො නියමවානපි.
නියමාක්ෂෙපරූපොක්තිරවිරොධී විරොධ්‍යපි,
තෙෂාං නිදර්ශනෙෂ්වෙව රූපව්‍යක්ති භවිෂ්‍යති.

කශ්චිත්අභින්නක්‍රියඃ, කිඃඅභින්නක්‍රියාය යන ශ්ලෙෂයෙක්;
අසති, ඇති; අපරඃ අවිරුද්ධක්‍රියඃ, අනික්අවිරුද්ධක්‍රියයයි යන ශ්ලෙ
ෂයකුදුඇති; විරුද්ධකර්මාච, විරුද්ධකර්මනම්වූද; අන්‍යඃශ්ලෙෂො
පති, අනික්ශ්ලෙෂයෙක්ඇත; නියමවානපි, නියමවත්වූද ශ්ලෙ
ෂයෙක්ඇත—නියමාක්ෂෙපරූපොක්තිඃ, නියමාක්ෂෙපරූපොක්ති
නම් ශ්ලෙෂයකුදුඇත; අවිරොධී, අවිරොධීනම් ශ්ලෙෂයකුදුඇ
ත, විරොධ්‍යපි, විරොධීනම් ශ්ලෙෂයකුදුඇත; තෙෂාම්, අභින්න
ක්‍රියාදී ඒ ශ්ලෙෂයන්ගේ; රූපව්‍යක්තිඃ, රූපව්‍යක්ති තොමෝ; නිද
ර්ශනෙෂු එව, නිදර්ශනාලඞ්කාරයෙහිම; භවිෂ්‍යති, පහළවන්නේයි.

1 ස්වභාවමධුරාඃ ස්නිග්ධාඃ ශංසන්ත්‍යො රාගමුල්වණම්,
දෘශො දූත්‍යශ්ච කර්ෂන්ති කාන්තාභිඃ ප්‍රෙෂිතාඃ ප්‍රියාන්.

ස්වභාවමධුරාඃ, ස්වභාවයෙන් සුභගවූ; ස්නිග්ධාඃ, ප්‍රෙම රසභාවිත
බැවින් සිනිදුවූ; උල්වණම්, උදීර්ණ නම්වූ; රාගම්, අනුරාගය;
ශංසන්ත්‍යඃ, ප්‍රකාශකරන්නාවූ; කාන්තාභිඃ, කාන්තාවන් විසින්;
ප්‍රෙෂිතාඃ, මෙහෙයන ලද්දාවූ; දෘශඃ, දෘෂ්ටිහුද; දූත්‍යශ්ච, දූතීහුද;
ප්‍රියාන්, වල්ලභයන්; කර්ෂන්ති, අදිත්; හෙවත් වසඟකෙරෙත්.

මෙහි කර්ෂණලක්ෂණ එක ක්‍රියාවෙන් දෘෂ්ටින්ගේද දූතීන්ගේද
සම්බන්ධය හෙතුකොටගෙණ නොහොත් සිනිඳුබවද ස්වභාව
මධුර බවද සිතඇති රාගය ප්‍රකාශකරණබවද සමවූ දෘෂ්ටිය හා
දූතීන් තමන් මෙහෙයත් වල්ලභයන් ඒ කාන්තාවන්කරා අඳනා
ක්‍රියාව එකම්තුයි මේතෙම අභින්නක්‍රියා ශ්ලෙෂ නම් වන්නේ
යයි දතයුතු.

2 මධුරා රාගවර්ධින්‍යඃ කොමලාඃ කොකිලාගිරඃ,
ආකර්ණ්‍යන්තෙ මදකලාඃ ශ්ලිෂ්‍යන්තෙ චාසිතෙක්ෂණාඃ.

මධුරාඃ, සුභගවූ; රාගවර්ධින්‍යඃ, රතිභාවය වඩන්නාවූ; කොම
ලාඃ, ශ්‍රවණසුභගබැවින් (ද්‍යොහෝ නොහොත්) සුඛස්පර්ශබැවින්.
සුකුමාරවූ; මදකලාඃ, කලාකෘතවූ හර්ෂයෙන් (ද්‍යොහෝ නො
හොත්)මධුපාන ජනිතමදයෙන් මනොඥවූ; නොහොත් විහ්වල
වූ; කොකිලාගිරඃ, කොකිලාවන්ගේ ශබ්දයෝ; ආකර්ණ්‍යන්තෙ,
අසනු ලැබෙති; අසිතෙක්ෂණාශ්ච, අසිත ලොචනාවෝ ද; ශ්ලිෂ්‍ය
න්තෙ, වළඳනා ලැබෙත්.

මෙහි ආකර්ණනාලිඞ්ගන දෙන්නාගේ සහභාවය හෙතුකො
ටගෙණ මේතෙම අවිරුද්ධක්‍රියා ශ්ලෙෂයයි දතයුතු.

මෙහි ශ්ලෙෂයෙන් කී කොකිලා ගීතිකා ඇසෙනබව හා
ස්ත්‍රීන්ගේ ආලිඞ්ගනක්‍රියාවහා දෙක විරුද්ධක්‍රියා නොවන හෙයින්
අවිරුද්ධකර්මනම්.

3 රාගමාදශියනෙනාෂ වාරුණීයොගවඩ්ඪිතම්,
තිරොභවති සම්මාංශුරන්ධගජසත්‍රු විජෘම්භතෙ.

වාරුණීයොගවඩ්ඪිතම්, වාරුණී නම් දිශාවන්ගේ සම්බන්ධයෙන් (දෙහෝ නොහොත්) සුරාවන්ගේ පානලක්‍ෂණවූ යොගයෙන් වඩනලද; රාගං, රත්පැහැය (දෙහෝ නොහොත්) රතිභාවය; ආදශියන්, දක්වන්නාවූ; එෂඃ සම්මාංශුඃ, මේ සූර්‍ය්‍යතෙම; තිරො භවති, අස්තයට යන්නේය; එෂඃ අන්ධගජසත්‍රු, අන්ධගතෙම වනාහි; විජෘම්භතෙ, පැලඹෙන්නේයි.

මෙහි සූර්‍ය්‍යකාමදෙදෙනාගේ අස්තබ්ගම උදයස්වරූපවූ පරාභව විජෘම්භණයන්ගේ පරස්පර විරොධයහෙතුකොට නෙණ නො හොත් සූර්‍ය්‍යකාම දෙන්නා කෙරෙන් එකකු සැඟවෙන හෙයි නුත් එකකු පැලඹෙන හෙයිනුත් මේ තෙම විරුධකර්‍මම ශ්ලෙෂ යයි දතයුතු.

4 නිසත්‍රිංශත්වමසාංවෙච ධනුෂ්‍යෙව්‍යාසය වක්‍රතා,
ශරෙෂෙවච නරෙන්ද්‍රස්‍ය මාර්ගණත්වඤ්ච වර්‍ත්තතෙ.

අස්‍ය නරෙන්ද්‍රස්‍ය, මේ රජහුගේ; නිසත්‍රිංසත්වම්, ත්‍රිංශද්ඞගුල්‍යා ධික පරිමාණත්වය, (දෙහෝ නොහොත්) ක්‍රෑරත්වය; අසාවෙව, ඛඩ්ගයෙහිම; වර්‍ත්තතෙ, පවත්නේය; වක්‍රතා, වක්‍රබව; (දෙහෝ නොහොත්) ශඨත්වය; ධනුෂ්‍යෙව, දුන්නෙහිම; (වර්‍ත්තතෙ) පවත්නේය; මාර්ගණත්වඤ්ච, බාණත්වය; (දෙහෝ නොහොත්) යාචකබව; ශරෙෂෙවච, ශරයෙහිම, වර්‍ත්තතෙ, පවත්නේයි.

මෙහි 'ඛඩ්ගයෙහිමය' චාපයෙහිමය; ශරයෙහිමයයි මෙසේ අව ධාරණ ප්‍රයොගය හෙතුකොටගෙණ මේතෙම නියමවත් ශ්ලෙෂ යයි දතයුතු.

5 පද්මානාමෙව දණ්ඩෙෂු කණ්ටකස්ත්වයි රක්‍ෂති,
අථවා දෘශ්‍යතෙ රාගිමිථුනාලිඞ්ගනෙෂ්වපි.

ත්වයි රක්‍ෂති, තා (පෘථිවිය) රක්‍ෂාකරණකල්හි; කණ්ටකඃ, කටු (දෙහෝ නොහොත්) විපක්‍ෂතෙම, පද්මානාම්, පද්මයන්ගේ; දණ්ඩෙෂු එව, දණ්ඩයෙහිමැයි; අථවා, නොහොත් එසේ නුමය— රාගි මිථුනාලිඞ්ගනෙෂ්වපි, රාගීන් සම්බන්ධවූ ස්ත්‍රී පුරුෂදෙන්නා ගේ ආශ්ලෙෂයෙහිදු පුලකස්වරූපවූ කණ්ටකයතෙම; දෘශ්‍යතෙ, දක්නා ලැබේ.

මෙහි 'පද්මානාමෙව; යන නියමය මිථුනාලිඞ්ගනෙෂ්වපි දෘශ්‍ය තෙ, යන්නෙන් ප්‍රතිෂෙධ හෙයින් මේ නියමාක්‍ෂෙප රූපොක්ති යයි දතයුතු.

6 මහීභෘද්භූරිකටකස්තෙජස්වී නියතොදයඃ,
දක්ෂඃ ප්‍රජාපතිශ්චාසීත් ස්වාමී ශක්තිධරශ්ච සඃ.

සඃ, හෙතෙම; මහීභෘත්, රජවූයේ (දොහෝ නොහොත්) පර්වත වූයේ; භූරි, මහත්වූ; කටකඃ, ස්කන්ධාවාර (දොහෝ නොහොත්) නිතඹ ඇත්තේ; තෙජස්වී, තෙජස් (දොහෝ නොහොත්) මයූඛ මාල ඇත්තේය; නියතොදයඃ, සතතොන්නති; )දොහෝ නොහොත්) නියතොද්ගම ඇත්තේය; දක්ෂඃ, සූරවූයේ; (දොහෝ නොහොත්) දක්ෂ නම් සෘෂිවූයේ; ප්‍රජාපතිඃ, ලෝවැස්සන්හට අධිපති වූයේ (දොහෝ නොහොත්) නිර්මාණකර්තෘවූයේය; ස්වාමී, ප්‍රභූ වූයේ (දොහෝ නොහොත්) ස්කන්ධවූයේ; ශක්තිධරශ්ච, ආනම ශක්ත්‍යාදිවූ ශක්තිදරන්නේ (දොහෝ නොහොත්) ශක්තිධරඃ, ශක්ති නම් ආයුධවිශෙෂය දරන්නේද; ආසීත්, වී.

මෙහි, 'මහීභෘත්, ය'භූරිකටකත්වය, යන මේ ආදීන්ගේ උභය පක්ෂයෙහිම අර්ථව්‍යක්තිය හෙතුකොටගෙණ මේතෙම අවිරොධී ශ්ලෙෂයයි දතයුතු.

7 අච්‍යුතො'ප්‍ය වෘෂච්ඡෙදී රාජාප්‍යවිදිතක්ෂයඃ,
දෙවො'ප්‍යවිබුධො ජඥෙ ශඞ්කරො'ප්‍ය භුජඞ්ගවාන්.

7 අච්‍යුතොපි, විෂ්ණුවූයේද; නොහොත් ස්ථිරබැවින් ස්ථාන භ්‍රෂ්ටනූවූයේද; අවෘෂච්ඡෙදී, වෘෂනම් වෘෂභයාගේ, (දොහෝ නොහොත්) ධර්මයාගේ ඡෙදනය නොකළේ; ජඥෙ, දන්නාලදී; රාජාපි, චන්ද්‍රවූයේද නොහොත් නෘපතිවූයේ; අවිදිතක්ෂයඃ, නොදන්නාලද (දක්ෂශාපය හෙතුකොටගෙණ කෘෂ්ණපක්ෂයෙහි වන) ක්ෂීයමාණත්වය ඇත්තේ (දොහෝ නොහොත්) රාජ්‍යාපචයක් නැති බැවින් කිසි ව්‍යසනයක් නැත්තේ; ජඥෙ, දන්නාලද; දෙවොපි, දෙවතාවූයේද නොහොත් රජවූයේද; අවිබුධඃ, සූර යන් නැත්තේ (දොහෝනොහොත්) ව්‍යක්ත පණ්ඩිතවරුන් නැත්තේ හෙවත් පාණ්ඩිත්‍ය යුක්තවූයේ; ජඥෙ, දන්නාලද; ශඞ්කරොපි, ඊශ්වරවූයේ (දොහෝ නොහොත්) ශුභකරවූයේද; අභුජඞ්ගවාන්, සර්පයන් නැත්තේ (දොහෝ නොහොත්) ධූර්තයන් නැත්තේ; ජඥෙ, දන්නාලදී.

මෙහි අච්‍යුතත්වාදීන්ට අවෘෂච්ඡෙදිත්වාදිය විරුද්ධ හෙයින් මේතෙම විරොධී ශ්ලෙෂයයි දතයුතු.

ශ්ලෙෂාලඞ්කාර නිමි.

## නි ශෙද ප මා ව.

සොම් කිසවනසුලු රිවි සැඩ සපුරු තනතුයේ,
කහි තව ලොවැ උවම් වේ මෙ විපු නිදි උවම් නම්. A

A සොම්, චන්ද්‍රතෙම; කිසවනසුලු, කෘශවන ශීලිය (පක්ෂක්ෂයභාවීය;) රිවි, ආදිත්‍ය(සූර්‍ය්‍ය)තෙම; සැඩ, චණ්ඩය; සපුරු, සාගරය තෙම; තනතුයේ, කම්පිතවන්නේය; ලොවැ, ලෝකයෙහි; කහි, කවරෙක්; තව, ප්‍රමත්තව; උවම් වේ; උපමා වන්නේද; මෙ, මෙය; නිදිඋවම්නම්, නින්දෝපමා නමැයි; විපු, කිවු.

මෙහි චන්ද්‍රයා කලාවෙන් කලාවට පිරිහෙයි-තෝ කිසිකලකත් නොපිරිහෙයි-සූර්‍ය්‍යයා තෙජස් කරණකොට ගෙණ කෲරයි-තෝ සෞම්‍යගුණය කරණකොටගෙණ(එසේ කෲරනොවෙයි)සාගරය හුලඟින් (චඤ්චල වෙයි) කම්පාකෙරෙයි-තෝ අෂ්ටලෝකධර්මයෙන් කිසිසේත් කම්පා නොවෙයි කියා ලොකප්‍රසිද්ධ වස්තූන්ගේ දෝෂ දක්වා උපමාවන්ට නින්දා කළ බැවින් මෙය නින්දෝපමාය යනුහාවයි.

දණ්ඩ්‍යලඞ්කාරයෙහි-*

2,30 පද්මං බහුරජශ්චන්ද්‍රඃ ක්ෂයී තාභ්‍යාං තවානනම්,
සමානමපි සොත්සෙක මිති නින්දෝපමා ස්මෘතා.

පද්මං, පද්මයතෙම; බහුරජඃ, බොහෝ රේණු ඇත්තේ (දෝෂ හෝ නොහොත්) රජස් නම්වූ බොහෝ දෝෂ ඇත්තේය; චන්ද්‍රඃ, චන්ද්‍රතෙම; ක්ෂයී, අපචය ඇත්තේය; තවානනම්, තිගේ මුඛය; තාභ්‍යාම්, ඒ පද්ම චන්ද්‍ර දෙදෙනා හා; සමානං අපි, සදෘශවූයේද; සොත්සෙකම්, උත්කර්ෂසහිතයි; ඉති, මෙබඳුවූයේ; නින්දෝපමං ස්මෘතා, නින්දෝපමායයි දන්නාලද්දී.

නින්දාකරණලද පද්මාදි වස්තු හා විවක්ෂිතවූ උත්කර්ෂඇති මුඛයව උපමා විධානය හෙතුකොටගෙණ මෝතොමෝ නින්දෝපමා නමැයි සේයි.

---

* මීට 'කාව්‍යාදර්ශය' යන නාමය කලිකතාදි රටවල ව්‍යවහාර නමුත් ලඞ්කාවේ පුරාතන පඬුවන් 'දණ්ඩ්‍යලඞ්කාර' යන නාමය ව්‍යවහාරයි.

කුසජාතකයෙහි-

96 සැබකර වෙයි දිනි ඳු
ම සි න් මස අඩුවෙයි ඉ ඳු
පවතින් සැලෙයි සි ඳු
එ සි න් උවමෙක් කොද මෙරජ බ ඳු

මෙහි නින්දාකරණලද සූර්‍ය්‍යාදි වස්තු හා විවක්ෂිතවූ උත්කර්ෂ ඇති රජහට උපමාවිධානය හෙතුකොටගෙණ මෝතොමෝ නින්දෝපමා නමැයි සේයි.

කාව්‍යශෙඛරයෙහි-

1,11 ස මු දු ර ගැඹුරු ගු ණ
මදුරුගිර තර සර ගු ණ
සිසිරකර සොම් ගු ණ
පවති මොහු කෙරෙහි මේ තුන් ගු ණ

2, 11 සුරතුර නම් ගසෙ කි
සිතු රුවන නම් පහණෙ කි
සුරබිය යනු දෙනෙ කි
මොහුට තිළිණෙන් කවර උවමෙ කි

සැලලිහිණි අස්නෙහි-

18 සො දු රු සිය නදන් අනතුරු දෙසැ සිටි න
කි න රු තිසසරන් කදගස වෙත නොව න
ඉ සු රු දනද සියනිකෙලෙස් තැන රද න
උ තු රු දිගිදු පුර දිනි මෙපුර වැජඹෙ න *

සැවුල් සන්දෙශයෙහි-

28 ස ත ර දිගතැ හිමි හිමි වසන හැම දි න
ගැ ඹ ර නැණින් යුතු නෙක මැතිගණ රද න
වි ත ර නොවන මහවේ ගජසෙන් සර න
අ ම ර පුර දිනි නිති මෙපුර වැජඹෙ න

ගිරාසන්දෙශයෙහි-34-35-

36, ල දු න් සිනිඳු කොමලත වැලඳි සිසිල සේ
න දු න් මෙහිමි සොඳබඳ රඳන ගුණරැ සේ
තු දු න් අතුර උරගුන් දරණ කළ තො සේ
ස දු න් තුරෙක සරියයි කියමෝද නෙ සේ

* මෙය 'ව්‍යතිරෙක'යයිද ඇතම් ආචාර්‍ය්‍ය මතයි.

## විරුද්ධොපමාව.

ඇති නැති කරහොත නැතිගුණ කරද ඇතිසේ
පවසත වෙසෙස් අරුතක් එවිසූ විරුදුවම් නම්. A

කණුදු නැතිවතක් නො දෙනු දනුමෝ පුවතින්,
මහබා තෝ බිය නැත්තෙහි පරනට කෙසේ බිය දෙහි. B

පරවිසන්දේශයෙහි-

180, ඉඳුමිණි යටග බඳ මත සිකිතිඳු දූව ල
යුගපත් රඹපැලක වැඩියොවුන වන ග ළ
කිව මෙ උවම් බැම ගහණතව පැහැ දූ ල
අදෝ කදෝ වැනිදෝ හිමිට සරි ක ළ

මේ පරවිසන්දේශකාව්‍යයෙහි පැණෙන-181-183-184-185-186 187-කවි සහ පැරකුම්බාසිරිතෙහි පැණෙන—109—110 කවිත් මෙමරහය, ඒවා එයින් බලාගන්ත්වා.

A ඇතිගුණ, විද්‍යමාන(ඇත්තා)වූ ගුණයක්; නැතිකරහොත, අවිද්‍යමානකොට හෝ; නැතිගුණ, අවිද්‍යමාන (නැත්තා)වූ ගුණයක්; ඇතිසේකරද, විද්‍යමානවූ පරිද්දෙන්කොටහෝ; අරුතක්, අර්ථයක්; වෙසෙස්, විශෙෂයෙන් (නොහොත්) විශෙස් අරුතක්, විශෙෂාර්ථයක්; පවසත, ප්‍රකාශකරතහොත්; එ, එය; විරුදුවම් නම් විසූ, විරුද්ධොපමානමැයි කිවූ.

භාවය-ඇත්තාවූ ගුණයක් නැතිකොටද නැත්තාවූ ගුණයක් ඇතිකොටද විශෙෂාර්ථයෙන් නොහොත් විශෙෂාර්ථයක් ප්‍රකාශකෙළේවීනම් ඒ විරුද්ධොපමානම්වේ, ඊට නිදසුන් මෙසේයි.

B කණුදු, කණ්ණියද; නැතිවතක්, අවිද්‍යමාන (නැත්තා) වූ වස්තුවෙකි නොහොත් කණ්යෙහිද වස්තුවක් අවිද්‍යමානය; පුවතින්, ප්‍රවෘත්තින් හෝ පැවැත්මෙන්; නොදෙනු, ඥානයනොකිරීම; දනුමෝ, ඥාතය කරමහ (නොමදෙතියි දනුමහ) මහබා, මහාභාග්‍ය හෝ මහාබාහුඇති තැනැත්තව; තො, තොපමත්තෙම; බියනැත්තෙහි; භයනැත්තෙහිය; (එසේ හෙයින්) පරනට, අන්‍යයන්ට; කෙසේ, කවරාකාරයෙකින්; බියදෙහි, භයදෙන්නෙහිද?

භාවය-කණද අවිද්‍යමාන වස්තුවෙක නොහොත් කණ්යෙහිද වස්තුවක් නැත්තේය, යත්හෙත් කණෙනි ආභරණයන් ඇති බැවින් ඇත්තාවූ ගුණනැතැයි කියා ඇති ගුණය නැතිකළා

නම්වේ; පැවැත්මෙන් කිසිවක් නොදිම දනිමු යන්නෙන් ඇති ගුණය නැතිකළා නම්වෙයි, බියනැත්තාවූ තෝ අනුන්ට කෙසේ බිය දෙන්නෙහි දැයි කියා ඇති ගුණයක් නැතිසේ කොට කීය. "කණ අවිද්‍යමාන වස්තුවෙක" යන්නෙන් "වත්නැතියේ යමෙක්හිද ගේ නැතිවත්" යනු වාක්‍යහෙයින් කණේ කුණ්ඩලාභරණාදි කිසියම් වස්තුවක් නැත්තේය යනු අර්ථයි-ඒ ස්වකීයාර්ථය තිබියදී කණ අවිද්‍යමාන වස්තුවකැයි කීකල්හි කණ්ණයාගේ වස්තුභාවය හැඟවීමෙන් ඇති ගුණය (කණ) නැතිකොට කීයේ නම්. "ප්‍රවෘත්තියෙන්ම දානය නොකිරීම දනගතිමු" යන්නෙන් දානය කිරීම දානය නොකිරීම සේ හැඟවූහෙයින් ඇති ගුණය නැතිකළා නම්. "තෝ බියනැත්තෙහි අනුන්ට කෙසේ බිය දෙන්නෙහිද" යන්නෙන් භයනැති කෙණෙක් අනුන්ට භය දෙන්නේ කෙලෙසද? තමන්ට ඇති දෙයක් නම් අනුන්ටත් දිය හැකිය එසේ තමන්වත් නැතිදෙයක් අනුන්ට නොදිය හැකිය- අනුන්ට දියහැකිනම් තමන්ටත් ඇතිවිය යුතුයයි, ඇත්තාවූ භය ඉහවත් නැති ගුණය ඇතිසේ කිමෙන් මේද විරුද්ධොපමා නම්.

මේ කියනලද විරුද්ධොපමාව 'කාව්‍යාදර්ශ සියබස්ලකර' ආදියෙහි දක්වන විරොධොපමාව හා කිසිසේත් සම නොවන බව පෙණෙයි.

කාව්‍යාදර්ශයෙහි-

2, 33 ශතපත්‍රං සරච්චන්ද්‍රස්ත්වදානනමිති ත්‍රයම්,
පරස්පර විරොධීති සා විරොධොපමා මතා.

ශතපත්‍රං, පද්මය; ශරච්චන්ද්‍රඃ, සරත්කල්හි චන්ද්‍රයා; ත්වදානනම්, තීගේ මුඛයයි, ත්‍රයම්, තුණ; පරස්පරවිරොධීති, කාන්ත්‍යාදි ගුණවිශෙෂයොගයෙන් සමානගුණය හෙයින් අන්‍යොන්‍ය වෛරියයි; ඉති, මෙබඳුවූ යම් උපමාවෙක් ඇද්ද; සා, හෝ තෙමෝ; විරොධොපමා මතා. විරොධොද්භාවනායෙන් ශාදෘශ්‍ය කථනය හෙතුකොට වගෙණ විරොධොපමා නම් වන්නීය.

මිත් පියුම් හොබනා කල්හි චන්ද්‍රයා නොහොබනා බවද-චන්ද්‍රයා හොබනාකල්හි පියුම් නොහොබනා බවද ප්‍රසිද්ධයි—තීගේ මුහුන හොබනාකල්හි යථොක්ත ශතපත්‍ර ශරච්චන්ද්‍ර දෙදෙනාගේම අශොභනත්වය ප්‍රකාශවේතුයි මොවුන් අන්‍යොන්‍ය විරොධි හෙයින් විරොධොපමානමැයි දතයුතුයි

## උභයභාෂාලඞ්කාරය.

උතුරු පසතුරු දෙන දෙදෙනෙකු වදන් පිරියතැ,
වැණියටි සිරිත් වෙසෙසක් පළවතුබබස් නම් වේ. A

සඳවනසිඳු කිය කුඹුයොන නම සත රා
කිවී සෙවෙත තොද වැලිනී යළ තො ගෞ රා
අරුණු කිහෙනී වී කොරළුන් ලැබ හුරි රා
පැවීවනෙදෙසැ යුද පතිරජ දියඹුසු රා B

---

A උතුරු පසතුරුදෙන, උත්තර ප්‍රත්‍යුත්තරදෙන්නාවූ; දෙදෙනෙකු, දෙදෙනෙකුන්ගේ; වදන්පිරියතැ, වචනපර්‍ය්‍යන්තයෙහි; වැණියටි, වර්ණනීයක්හුගේ (නොහොත්) වර්ණනාකරණු කැමැතිවූ; සිරිත්වෙසෙසක්, චාරිත්‍ර විශෙෂයක්; පළවත, ප්‍රකාශවූ කල්හි; උබබස්නම් වේ, ඒ උභයභාෂානම් වන්නේයි-

උත්තර ප්‍රත්‍යුත්තරදෙන්නාවූ දෙදෙනෙකුන්ගෙ කථාවසානයෙහි (තමන් විසින් ස්තුතිවර්ණනා කටයුතු යම්කිසි උතුමෙකුගේ) වර්ණනාකරණු කැමැතිවූ ශෞර්‍ය්‍ය වීර්‍ය්‍යබල පරාක්‍රම ප්‍රතාපාදිචාරිත්‍රගුණ විශෙෂයක් ප්‍රකාශවූයේනම් ඒ උභයභාෂානම් වන්නේය-යනුභාවයි.

B වනසිඳුසඳ, වාලිකාසින්ධු චන්ද්‍රිකාව; කුඹුයොන. කුම්භයොනිය; කිය, කථනයකර; සතරා, සතුරාගේ; නම, නාමමයි(හෙවත්) සතරා, ශත්‍රුහුගේ; නම, නාමය; කිවි, කුමක් පිණිස කියෙහිද?; තොද, තෝද; සෙවෙත, සපත්නියගේ (නම්කිවී, නාමය කුමට කියෙහිද) වැලිනී, වාලුකානදිය; ගෞරතො, ගෞරවර්ණවූ නි වනාහි; යළ, නැවත; කිහෙනී, කවරහෙතුවකින්; අරුණුවී, අරුණවර්ණවීද; එදෙසැ, ඒ දිශාවෙහි; පතිරජදියඹුසුරා, ප්‍රතිරාජ ජගදීශ්වරයා; යුදපැවිවන්, යුද්ධයට ප්‍රාරම්භවූකල්හි; කොරළුන්, කොරලයන්ගේ; හුරිරා ලැබ. රුධිරප්‍රවාහය ලදින් අරුණුවන්විම්.

එම්බා වාලුකා සින්ධුචන්ද්‍රිකාව—කුම්භයොනිය කියව—නාමය සතුරුයි-නොහොත් සතුරාගේ නාමයවේ-තෝත් සැතිරිගේනාමය කියෙහිය-වාලුකාගඟාව මදක්සුදුපැහැඇති නි නැවතකුමකින් මදරතුපැහැඇතිවීද-ඒ දිශාවෙහි ප්‍රතිරාජ ජගදීශ්වරයන් යුද්ධයපටන්ගත්කල්හි කොරලයන්ගේ රුධිරය ලබා අරුණුවන්විම්-යනු භාවයි.

අගස්ති තාරකාව හා වාලුකා ගඟාවගේ කථාව.

{ අගස්තිතාරකාව කළ ආමන්ත්‍රණය. } { වාලුකාගඟාව දුන් උත්තරය. }

වතැසිඳුසද ? 1 කුඹුයොන කිය ? 2
සතරුනමකිව් ? 3 තොදසෙවෙතනමකිව් ? 4
වැළිනිගොරතෝ එදෙසපතිරජ දියඹුසුරුසුද
යළකිහෙති අරුණුවී ? 5 පැවිවත් කෙරළත් හුරිරුලැබ ? 6

1 අගස්ති තාරකාව විසින් මෙසේ ආමන්ත්‍රණයකරන්ට හෙතුව නම් මෙම තාරකාව පහළවීමෙන් සියලු නදීතඩාගයන්හි ජලය ප්‍රසන්නවන බැවිනි.

2 'කුඹුයොන' යන නාමය අගස්තිතාරකාවට හා අගස්තිඍෂියාටද වේ.

3 මෙසේ කියන්ට හෙතුනම් ගඟාශබ්දය ස්ත්‍රීලිඞ්ගවාචක හෙයින් ස්ත්‍රියක්කොට්ද-මුහුද පුල්ලිඞ්ග වාචකහෙයින් පුරුෂයෙක් කොටද කාව්‍යකාරයෝ කියති, පෙර අගස්තිඍෂියා මුහුදෙහි ජලය දෙහොතටගෙණ පුරුෂයාට කළ වෙහෙසය කරණකොටගෙණ පැවති වෛරය ස්ත්‍රියකෙරෙහිත් පවත්නා නිසා පුරුෂයාගේ සතුරා ස්ත්‍රීටද සතුරුබව හඟවා 'සතරුනමකිව්'යි අගස්තිතාරකාව කියේය-මුහුදෙහි ජල දෙහොතටගත්බැව් සැළලිහිණිසන්දෙශාදියෙහි පෙණේ.

63 දියකඳ නැඹර පිරිපුවතර මහසයු ර
මුවරද ලෙසින් වන අගතිසි කරතඹ ර-යන්නෙන්හා

කාව්‍යශෙඛරයෙහි 11-13

අගතිසිහු දියරැ ස
ඇදිලින් ගතෙව් දියරැ ස
දතයුතු තිලෝකු ස
නැණින් පිරිසිඳ දිටි මේ ලෙ ස-යන්නෙන්ද ප්‍රකාශයි.

4 තෝත් හැතිරියගේ නමකීයෙහියයි කීයේනම් තාපසයන්ට ස්වභාවෙන්ම ස්ත්‍රීහු සතුරු බැවිනි.

5 පෙරගෞර වර්ණවූ නි කවරහෙතුවකින් මද රතුවීදැයි විචාරන්ට කරුණු කිමයත්-පෙර අගස්තිතාරකාව පහළවූ කල්හි සියලු ගඞ්ගාජලය ප්‍රසන්නව ශ්වෙතවර්ණවෙයි,එදවස්වූකලී කළු මුහු මදරතුවූ බැවිනි.

6 ඒ දිශාවෙහි ප්‍රතිරාජ ජගදීශ්වරයා යුඞප්‍රාරබ්ධවූ කල්හිකෙරළයන්ගේ රුධිරය ලබාය කීමෙන් හොහොත් දේදෙනාගේ කථාව සාන කිරීමෙන් අනක් කෙණෙකුගේ හොහොත් ප්‍රතිරාජදෙව

අමාත්‍යයාගේ කීර්ති ප්‍රතාපාදිගුණවර්ණනා විශෙෂයක් ප්‍රකාශව න නිසා මේ උභයභාෂාලඞකාර නම් වේ-මේ යථොක්තාලඞකාර ය කාව්‍යාදර්ශාදියෙහි නො පෙණේ, වක්‍රොක්ති නම් අලඞකාරය මෙහිදී උභයභාෂා නමින් කියන ලදැයි ඇතම් මතයි. සිංහලකව ගිද ඉතා සවලපයි.

පැරකුම්බාසිරිතෙහි-

112 කි ය ග මගිය එතූ කොයි සිව් දද සමනල ගොසි නා
කිමෙ ක අමුතු එදිගැ බමුණු සුමන සුරිදු විසි නා
ගියකල දෙදහස්පන්සිය * රජෙක් එතෙයි දිය නා
නියම්න ගම්වැසිය එනම් පැරකුම්රජ මෙදි නා

මගිය, එම්බා මාර්ගිකය; කොයිසිව්, කොහි අවසර්තව; එතූ, එන් නෙහිද; දද, එම්බා බ්‍රාහමණය; සමනල ගොසිනා, සමන්තකූට පර්වතයට ගොසින් එන්නෙම්-එදිගැ, ඒ දිශාවෙහි; අමුතුකිමෙක, අමුතු (තොරතුරු) කවරේද; කියග, කථනයකරව; බමුණු, බ්‍රාහමණය; සුමනසුරිදු විසිනා, සුමනසුරෙන්‍ද්‍රයා විසින්; දෙදහස් පන්සිය, දෙදෑස්පන්සියයක්; ගියකල, අතික්‍රාන්තවූ කල්හි; දියනා, ලොකනායකවූ; රජෙක්, රාජයෙක්; එතෙයි, එන් (පහළ වේ) යයි කීය—ගම්වැසිය, ග්‍රාමවාසිය; නියම්න, ඒ කාන්තයෙන්; එනම්, ඒ යථොක්ත රාජයා නම්; මෙදිනා, මේ කාලයෙහි; පැරකුම් රජ, (අපගේ මේ) පරාක්‍රමබාහු මහරජාණෝමය-

188 ගේ සද කිම මුහුද කිම සැහවෙනු වෙළ න
මේ ගජ හය අතින් පැරකුම් රජ දිමූ න
දෙයි ගිජ්දුන් ඔහු මද හස කර ලව න
තදුන් කැළුම් සොම්ගුණ පුත් පඬුරු ඇ න

මෙහි සමුද්‍ර චන්‍ද්‍ර දෙදෙනාගේ කථාවසානයෙහි යථොක්ත පරා ක්‍රමබාහු නරෙන්‍ද්‍රයාගේ අධිකවූ ගුණවර්ණනා විශෙෂයක් ප්‍රකාශ වෙන හෙයින් මේද උභයභාෂාලඞකාර නම් වේ.

කාසත්වං ලොහිතලොචනාස්‍ය චරණෞ හංසඃ කුතො මානසාත්
කිං තත්‍රාසති සුවර්ණ පඞ්කජවනාන්‍යම්භඃ සුධාසන්නිභම්,
ත්‍රයඃ කිං කථයස්ව විද්‍රුමලතා පුෂ්පච සෞගන්ධිකං
ශම්බූකාඃ කිමු සන්ති නෙ'තිච බකෛරාකර්ණ්‍ය ජිජීකෘතම්.

* මිට අවුරුදු හාරසියයකට පළමු රජකළ පැරකුම්රජහුගේ ව ර්ණනා විශෙෂයක් හෙයින් "දෙදහස් පන්සිය" යනු වරදැයි කියති.

අගසත් තාරකාව හා වාලුකා ගඟාවගේ කථාව.

{ අගසතිතාරකාව කළ ආමන්ත්‍රණය. } { වාලුකාගඟාව දුන් උත්තරය. }

වතැසිඳුසඳ ? 1 කුඹුයොන කිය ? 2
සතරුනමකිවි ? 3 තොදසෙවෙතනමකිවි ? 4
වැළිතිගොරතෝ එදෙසපතිරජ දියඹුසුරයුද
යළකිහෙනි අරුණුවි ? 5 පැටිවත් කෙරළුන් හුරිරලැබ ? 6

1 අගසති තාරකාව විසින් මෙසේ ආමන්ත්‍රණයකරන්ට හෙතුව නම් මෙම තාරකාව පහළවීමෙන් සියලු නදීතඩාගයන්හි ජලය ප්‍රසන්නවන බැවිනි.

2 'කුඹුයොන' යන නාමය අගස්තිතාරකාවට හා අගස්තිඍෂියාටද වේ.

3 මෙසේ කියන්ට හෙතුනම් ගඟාශබ්දය ස්ත්‍රීලිඞ්ගවාචක හෙයින් ස්ත්‍රියක්කොට්ද-මුහුද පුල්ලිඞ්ග වාචකහෙයින් පුරුෂයෙක්කොටද කාව්‍යකාරයෝ කියති, පෙර අගස්තිඍෂියා මුහුදෙහි ජලය දෙහොතටගෙණ පුරුෂයාට කළ වෙහෙසය කාරණකොටගෙණ පැවති වෛරය ස්ත්‍රියකෙරෙහිත් පවත්නා නිසා පුරුෂයාගේ සතුරා ස්ත්‍රීටද සතුරුබව හඟවා 'සතරුනමකිවි'යි අගස්තිතාරකාව කීයේය-මුහුදෙහි ජල දෙහොතටගත්බැව් සැළලිහිණිසංදේශාදියෙහි පෙණේ.

63 දියකඳ ගැඹර පිරිපුවතර මහසයු ර
මුවරද ලෙසින් වත අගතිසි කරතඹ ර-යන්නෙන්ද

කාව්‍යශෙඛරයෙහි 11-13

අගතිසිහු දියරැ ස
ඇඳිලින් ගතෙව් දියරැ ස
දතපුතු තිලෝකු ස
නැණින් පිරිසිද දිටි මේ ලෙ ස-යන්නෙන්ද ප්‍රකාශයි.

4 තෝත් හැතිරියගේ නමකීයෙහියයි කීයේනම් තාපසයන්ට සැභාවෙන්ම ස්ත්‍රීහු සතුරු බැව්නි.

5 පෙරගෞර වර්ණවූ නි කවරහෙතුවකින් මද රතුවීදැයි එවං රත්ව කාරුණ්‍ය කිමයත-පෙර අගස්තිතාරකාව පහළවූ කල්හි සියලු ගඞ්ගාජලය ප්‍රසන්නව ශ්වෙතවර්ණවෙයි,එදවස්වූකලී කළු මුහු මදරතුවූ බැව්ත.

6 ඒ දිශාවෙහි ප්‍රතිරාජ ජගදීශ්වරයා යුඩප්‍රාරබ්ධවූ කල්හිකෙරළයන්ගේ රුධිරය ලබාය කීමෙන් නොහොත් දේදෙනාගේ කථාව සාහ කිරීමෙන් අතක් කෙණෙකුගේ නොහොත් ප්‍රතිරාජදෙව

අමාත්‍යයාගේ කීර්තිප්‍රතාපාදිගුණවර්ණනා විශෙෂයක් ප්‍රකාශව න නිසා මේ උභයභාෂාලඞ්කාර නම් වේ-මේ යථොක්තාලඞ්කාර ය කාව්‍යාදර්ශාදියෙහි නො පෙණේ, වක්‍රොක්ති නම් අලඞ්කාරය මෙහිදි උභයභාෂා නමින් කියන ලදැයි ඇතම් මතයි. සිංහලකව හිද ඉතා ස්වල්පයි.

පැරකුම්බාසිරිතෙහි-

112 කි ය ග මගිය එතූ කොයි සිව් දද සමනල ගොසි නා
කිමේ කා අමුතු එදිගැ බමුණු සුමන සුරිඳු විසී නා
ගියකල දෙදහස්පන්සිය * රජෙක් එතෙයි දිය නා
නියම්න ගම්වැසිය එනම් පැරකුම්රජ මෙදි නා

මගිය, එම්බා මාර්ගිකය, කොයිසිට, කොහි අවස්ථානව; එතූ, එන් නෙහිද; දද, එම්බා බ්‍රාහමණය; සමනල ගොසිනා, සමන්තකූට පර්වතයට ගොසින් එන්නෙම්-එදිගැ, ඒ දිශාවෙහි; අමුතුකිමෙක, අමුතු (තොරතුරු) කවරේද; කියග, කථනයකරව; බමුණු, බ්‍රාහමණය; සුමනසුරිඳුවිසිනා, සුමනසුරෙන්ද්‍රයා විසින්; දෙදහස් පන්සිය, දෙදාස්පන්සියයක්; ගියකල, අතික්‍රාන්තවූ කල්හි; දියනා, ලොකනායකවූ; රජෙක්, රාජයෙක්; එතෙයි, එත් (පහළ වේ) යයි කීය—ගම්වැසිය, ග්‍රාමවාසිය; නියම්න, ඒ කානනයෙන්; එනම්, ඒ යථොක්ත රාජයා නම්; මෙදිනා, මේ කාලයෙහි; පැරකුම් රජ, (අපගේ මේ) පරාක්‍රමබාහු මහරජානෝමය-

188 ගේ සද කිම මුහුද කිම සැහවෙතූ වෙළ ත
මේ ගජ හය අතින් පැරකුම් රජ දිමු ත
දෙයි ගිජ්දුන් ඔහු මද හස කර ලව ත
තදුන් කැළුම් සොම්ගුණ යුත් පඩුරු ඈ ත

මෙහි සමුද්‍ර චන්ද්‍ර දෙදෙනාගේ කථාවසානයෙහි යථොක්ත පරාක්‍රමබාහු නරෙන්ද්‍රයාගේ අධිකවූ ගුණවර්ණනා විශෙෂයක් ප්‍රකාශ වෙන හෙයින් මේද උභයභාෂාලඞ්කාර නම් වේ.

කාන්තං ලොහිතලොචනාස්‍ය චරණෝ හංසඃ කුතො මානසාත්
කිං තත්‍රාස්ති සුවර්ණ පඞ්කජවනාන්‍යම්භඃ සුධාසන්නිභම්,
රත්නඃ කිං කථයස්ව විද්‍රුමලතා පුෂ්පඤ්ච සෞගන්ධිකං
ශම්බූකාඃ කිමු සන්ති නෙ'ති ච බකෛරාකර්ණ්‍ය ජීහීකෘතම්.

* මිට අවුරුදු හාරසියයකට පළමු රජකළ පැරකුම්රජහුගේ ව ර්ණනා විශෙෂයක් හෙයින් "දෙදහස් පන්සිය" යනු වරදැයි කියති.

## නින්දා ප්‍ර ශං සා ව.

ගරහා කිසිලෙසින් පවසත උතුම අරුතක්,
එ වියූ නිඳිපසස්නම් ලකරමඟගතුගතුවෝ. A
ගණුතු තොපකෙරෙන් මතඟදූරිත සිලිය සැම්,
පරඟු පිරිරූ තදුරෙන් එබැවිනි හඟිම් මහබා. B

---

ලොහිත ලොචනාස්‍යචරණාඃ, රතුවූ ඇස්තුඩු පාද ඇති; ත්වං, තෝ, කඃ, කවරෙක්ද; හංසඃ, හංසයෙක්මි; කුතඃ, කොයිසිට එන්නෙහිද; මානසාත්, මානසනම් විලින් එන්නෙමි; තත්‍ර කිං අස්ති, එහි කුමක් ඇත්තේද; සුවර්ණපඞ්කජවනානි, රන්පියුම් වනයෝද; සුධාසන්නිභං, අමෘත සමානවූ; අම්භඃ, ජලයද (ඇති වේ); භූයඃ කිං කථයස්ව, නැවතත් කුමක් තිබේදැයි කියව; විද්‍රුම ලතා, පබළුවැල්ද; සෞගන්ධිකංප්‍රපච, සුවඳවත්මල්ද නො හොත් හෙල්මැලි මල්ද ඇත්තේය; ශම්බූකාඃකිමුසන්ති, කිමෙක සක්බෙල්ලෝත් ඇද්ද; නෙතිච, නැත්තේයයිද; බකෛඃ, කොකුන් විසින්; ආකර්ණ්‍ය, අසා, හීහීකාරං, හීහී යන අනුකරණ කරමින් සිනාසී පරිභවකෙළේය.

යන මෙයින් බක හංස දෙපක්‍ෂයෙහි කථාවෙන් මානසාදිය වර්ණිතවූ බැවින් මේ උභය භාෂාලඞ්කාරයයි.

“අඟුල්‍යා කඃ කවාටෙ ප්‍රහරති”-යනාදි ශ්ලෝකද මෙම නයයි.

A කිසිලෙසින්, කිසිආකාරයකින්; ගරහා, ගර්හාකොට; උතුම අරුතක්, උත්කෘෂ්ටාර්ථයක්; පවසත, ප්‍රකාශකලකල්හි; එ, එය; ලකරමඟ ගතුගතුවෝ, අලඞ්කාර මහාග්‍රන්ථ උගත්තෝ; නිඳිපසස්නම්; නින්දාප්‍රශංසානමැයි; වියූ, කිවූ.

කිසියම් ආකාරයකින් නින්දාකොට උතුම්අර්ථයක් ප්‍රකාශකරත් නේවිනම් ඒ නින්දා ප්‍රශංසා අලඞ්කාරයයි අලඞ්කාර මහාග්‍රන්ථෝද්ග්‍රහණය කළාවූ ප්‍රාඥයෝ කියති යනු භාවයි.

B මහබා, මහාබාහු හෝ මහාභාග්‍යඇත්ත; මතඟදූරිය, මාතඞ්ගයන් විදාරණය කරන්නාවූ; සැම්, ශ්‍යාමවර්ණවූ; අසිලිය, ඛඞ්ග ලතාව (දෝහෝ නොහොත්) අසිලියසැම්මතඟදූරිය, ඛඞ්ගලතා වමෙන් ශ්‍යාමවර්ණවූ මාතඞ්ගදාරිකාව; තොපකෙරෙන්, තොප ගේ හස්තයෙන්; ගණුතු, ගත්කල්හි; පරඟු, ශත්‍රූහු (දෝහෝ නොහොත්) අන්‍යයෝ; එබැවින්, ඒ භාවයෙන්; තදුරෙන්පිරිරූ, තොප දුරින් දුරුකළෝයයි; හඟිම්, සිතමි.

මෙහි–මහාබාහු ඇත්ත? මාතඞ්ග දාරිකාවක්බඳු ශ්‍යාමවර්ණවූ ඛඞ්ගය තොපගේ හස්තයෙන් ගත්කල්හි සතුරෝ ඒ භාවයෙන්

තොප දුරින් දුරුකළෝයයි සිතම් යන්නෙන් ශත්‍රුමර්දනස්වරූප
ප්‍රශංසාවක්ද—මහාබාහුඇත්ත බඩගලතාවසේ ශ්‍යාමවර්ණවූ
මාතඞ්ගදාරිකාව (චණ්ඩාලකෙල්ල) තොපගේ හස්තයෙන් ග්‍රහ
ණයකළකල්හි ඒ භාවයෙන් සුතාදි සමානජාතික අන්‍යයෝ
තොප දුරින් දුරුකළෝ යයි සිතම් යන්නෙන්-චණ්ඩාලදුහිතෘ
වකගේ විවාහස්වරූප නින්දාවක්ද-හැඟෙන නිසා මේනින්දාප්‍රශං
සානම්යයි කියති-මෙහි නින්දාවක්සේ වැටහෙනනමුත් කල්ප
නගෙණ සතුරන් දුරුකළ බැවින් ගුණම අවස්ථිතයි-මේ අල
ඞ්කාරය කාව්‍යාදර්ශයෙහි ව්‍යාජස්තුතිය දක්වන ආචාර්ය දණ්ඩින්
විසින් මෙසේ කියනලදී.

**2-343** යදි නින්දන්නිව ස්තෞති ව්‍යාජස්තුතිරසෞ ස්මෘතා,
දොෂාභාසා ගුණා එව ලභන්තෙහ්‍යත්‍ර සන්නිධිම්.

යදි, ඉදින්; නින්දන් ඉව, දොෂකියන්නාක්හුමෙන්; ස්තෞති,
ස්තුතිකෙරේද; අසෞ, මෝතොමෝ; ව්‍යාජස්තුතිඃ ස්මෘතා, ව්‍යාජ
ස්තුතියයි දන්නාලද්දී; අත්‍ර, මේ ව්‍යාජස්තුතියෙහි ලා,දොෂාභාසාඃ,
දොෂයන්ගේ ආභාසමාත්‍රයෙක්මය හෙවත් නැත්තාවූද දොෂයෝ
ඇත්තාවුන්මෙන් වැටහෙති; ගුණාඑව, ගුණයෝම; සන්නිධිම්,
අවස්ථානය; ලභන්තෙ හි, ලබත්මැයි-උදාහරණ මෙසේයි.

**2-344** තාපසෙනාපි රාමෙණ ජිතෙයං භූතධාරිණී,
ත්වයා රාඥාපි සෛවෙයං ජිතා මා භූන්මදස්තව.

ඉයං භූතධාරිණී, මේ පෘථිවිතොමෝ; තාපසෙනාපි, තපස්වී
වූද; රාමෙණ, දශරථපුත්‍රයා විසින් නොහොත් භාර්ගවයා විසින්;
ජිතා, දිනනලද; රාඥාපි, රජවූද; ත්වයා, තා විසින්; සෛවෙයං, ඒ
මේ පෘථිවිම; ජිතා, දිනනලද; (එහෙයින්) තව, තට; මදඃ (පෘථි
විය දිනීම් යන) අහඞ්කාරයතෙම; මාභූත්, නහමක් වේවා—

මෙහි උක්තප්‍රකාරයෙන් තපස් වීවූවන්ට පෘථිවිවිජය නින්දා
වක්සේ වැටහෙන නමුත් තත්වාර්ථ වශයෙන් වනාහි මහත් ප්‍රභා
ව ඇති මුලුපොළොව දිනූ සියලු නරාධිපයන්ට චූඩාමාණික්‍යයක්
බඳු රාමයා හා සමකොට කිසි රජක්හට කරණලද ස්තුතිය හෙතු
කොටගෙණ මෙහි ගුණම අවස්ථිතයයි දතයුතු.

**2-345** පුංසඃ පුරාණාදාච්ඡිද්‍ය ශ්‍රීස්ත්වයා පරිභුජ්‍යතෙ,
රාජන්නික්ෂ්වාකුවංශස්‍ය කිමිදං තව යුජ්‍යතෙ.

රාජන්, රජ; පුරාණාත්පුංසඃ, ජීර්ණපුරුෂයාකෙරෙන් (දොහෝ
නොහොත්)විෂ්ණුහුකෙරෙන්; ශ්‍රීඃ, රාජ්‍යාභ්‍යුදය ලක්ෂණවූ සම්ප
ත්(දොහෝ නොහොත්) ශ්‍රීදෙවතාතොමෝ;ආච්ඡිද්‍ය, පැහැරගෙ
ණ;ත්වයා,තාවිසින්;පරිභුජ්‍යතෙ,අනුභවකරණු ලබන්නීය; ඉදං,
මේ; ඉක්ෂ්වාකුවංශස්‍ය, ඔකාවස්කුලෙහිවූ; තව, තට; යුජ්‍යතෙ
කිං, කුමට යෙදේද.?

මෙහි අකිංචිත්කරවූ (කිසිවක්කොට ගතනුහුනුවූ) ජරපත් පුරුෂයාකෙරෙන් සම්පත පැහැරගෙණ අනුභව කරණු ලබන්නියයි නින්දාවක්සේ වැටහෙනබවමුත් භාවාර්ථයෙන් වනාහි විෂ්ණුහු කෙරෙන් පවා ශ්‍රීදෙවතාතොමෝ තා විසින් පැහැරගෙණ අනුභවකරණු ලබන්නියයි කිසි රජක්හුගේ විශේෂාතිශයභාවය විස්තාර කරණයෙන් ස්තුතිය හෙතුකොට ගෙණ මෙහි ගුණයම අවයපිතිය ලබන්නේයි.

2-316 භුජඞ්ගභොගසංසක්තා කලත්‍රං තව මෙදිනී,
අහඞ්කාරඃ පරං කොටිමාරොහති කුතස්තව.

තව, තාගේ; කලත්‍රං, අඹුවූ; මෙදිනී, පෘථිවිතොමෝ; භුජඞ්ගභොගසංසක්තා; අනන්තනම් නාගරාජයාගේ දරණයෙහි අවසප්තව් (ලොහෝනොහොත්) ධූර්තයන්ගේ ශරීරසම්භොගයෙහි ඇලුම්ඇත්තීය; තව, තාගේ; අහඞ්කාරඃ, අභිමානය තෙම; පරං කොටිම්, උත්කෘෂ්ටවූ කෙලවරට; කුතඃ ආරොහති, කවරහෙයකින් නැගෙන්නේද.?

මේ නින්දාවක්සේ වැටහෙනනමුත් සකලමහීතලාධිරාජ්‍යලක්ෂණවූ ස්තුතිම කියන ලදනුයි ව්‍යාජස්තුතිනම් වන්නේයයි දතයුතු- මෙහි උදාහරණ දෙකම අර්ථශ්ලෙෂ මූල්කොට දක්විය-මින් දෙවැනිව කී ව්‍යාජස්තුතිය පැරකුම්බා සිරිතෙහි 45 වෙනි කවියේ පෙණේ—ඒ මෙසේයි.

දී ය බ ද සිව්වත කලතුරු සෙනෙහ ස
සි රි ස ද සරසවි වෙත සමනවැ වැ ස
මන න ද පැරකුම් හිමි තුබ ගුණ රැ ස
කෙලෙසද පරදර පව් දුරුකල ලෙ ස

ගුණරැස, ගුණරාශියක්ඇති; මනනද, මනොනන්දනවූ; පැරකුම්හිමි, පරාක්‍රම (දෙව) ස්වාමීනි; තුඹ, තුඹවහන්සේ; දියබද, විෂ්ණුහුගේ හා; සිව්වත, මහාබ්‍රහ්මයාගේද; කලතුරුසෙනහස, කලත්‍රස්නෙහයෙන් යුක්තවූ; සිරිසද, ශ්‍රීකාන්තාවහා; සරසවි වෙත, සරස්වතී කෙරෙහි; සමගවැ, සඞ්ගමවැ (එකතුව) වැසැ, වාසයකොට; පරදරපව්, පරදාරපාපය; දුරුකලලෙස, දූරීභූත කල පරිදි; කෙලෙසද, කවරකාරද?.

සැවුල්සන්දෙශයෙහි-

32 ව ස ත මෙ රජුවෙත සරසවිය සිරිකා ත
සැ ප ත වියෝදුක් නොමකරම්හි දූ සී ත
ස ත ත බඹසරම රැකියෙන් මිස සත ත
ස කා ත ලෙස සොවින් කලුනොම වේදග ත

## අන්‍යාලාපය.

නැසී ලෙහි තුබූ කිසි හව් පළ කරණු වස්,
පවසත අනත් කරුණක් එ වියූ අන්අලප් නම්. A

මනා මැගී සුව විසලී ම ලී යා
තිළි දෙළි වැසැ එ සලී ම ලී යා
බොමී වී ම් ලී තුඩු විලි පී ලී යා
පිලින් නෙලෙන් උලැගි බැලි මි ලි යා B

---

සරසවිය, සරස්වතියද; සිරිකත, ශ්‍රීකාන්තාවද;(යන දෙදෙන) මෙරජුවෙත, මේ (රාජසිංහ)නරේන්ද්‍රයා සමීපයෙහි; වසත, වාසය කරණකල්හි; සතත, මහාබ්‍රහ්මතෙම; සැපතවියෝදුක්,(තමන්ට) පැමිණියාවූ විරහදුඃඛය; ඉදු, සෑජුව; සිත නොමකරමින්, මෙනෙහි නොකොටම; සතත, නිරන්තරයෙන්, බඹසරම, බ්‍රහ්මචය්‍යාවම; රැකියෙන් මිස, රක්‍ෂාකළහෙතුවෙන්මුත්; සකත ලෙස, විෂ්ණුගු පරිද්දෙන්; සොවින්, ශොකයෙන් යුක්තවීනම්; ගත, ශරීරය; කලුනොම වේද, කාලවර්ණ නොවන්නේද;(වන්නේමැයි)

මෙහි උක්තප්‍රකාරයෙන් නින්දාවක්සේ වැටහෙනබවවුත් භාවාර්ථවශයෙන් වනාහි සරස්වතිය හා ශ්‍රීකාන්තාවත් බ්‍රහ්ම විෂ්ණු දෙදෙනා කෙරෙන් පවා වෙන්ව මේ යථොක්ත නරේන්ද්‍රයා වෙත වාසය කළාය කීමෙන් ගුණයම අභිමතයි, මේ නයින් නින්දාප්‍රශංසාව අවබොධකරණු.

A ලෙහි, හෘද (චිත්තාභ්‍යන්තර)යෙහි; නැසීතුබූ, ප්‍රච්ඡන්නව=ගුප්තවතිබූ; කිසිහව්, කිසිභාවයක්; පළකරණුවස්, ප්‍රකාශකරණු පිණිස; අනත් කරුණක්; අන්‍යාර්ථ කාරණයක්; පවසත, ප්‍රකාශකළහොත්; එ, එය; අන් අලප් නම්, අන්‍යාලාප නමැයි,වියු, කිවු.
සිතතුලවැසී සැඟවී තිබුන කිසි අදහසක් ප්‍රකාශකිරීම පිණිස එයහැඟෙනසේ අනික් අර්ථ ඇති එවැනි කාරණයක් ප්‍රකාශකළේ නම් ඒ අන්‍යාලාපනම් වේ යනුභාවයි-ඊට උදාහරණ මෙසේයි.

B මැගී, මාර්ගිකවූ, සුව, ගිරාතෙම; විසලීමලියා, විශාලවූ කුසුමයෙහි සාල්මලීපුෂ්පයන්; මනා, නිරීක්‍ෂණයකොට; තිළි, සන්තුෂ්ටව; දෙළි, දෙහලින (ලොල්)ව, එ සලීමලියා, ඒ සාල්මලීවෘක්‍ෂයෙහි; වැසැ, වාසයකොට; විලිපිලියා, පක්වඵලයෙහි; මී බොමී වී, මධු පානය කෙරෙම්යි කියා; තුඩු, චඤ්චුව; ලී, ප්‍රක්‍ෂෙප කළේ; නෙලෙන් උලැගි, අනිලයෙන් උලලඩිතවූ; පිලින්, තූලයන්; මිලියා බැලි, මලානිකව නිරීක්‍ෂණය කළේයි-

## උත්ප්‍රේක්ෂාලඞ්කාරය.

පියවි අකුරකින් ඇසිරෙණ අරුත් වෙසෙසක්,
සලකණු අන් අකුරකින් ඒ දනු උපේ ලකර. A

---

මාර්ගිකවූ ගිරාතෙම විශාලවූ සාල්මලී පුෂ්පයන් බලා සතුටුව අධික ලෝභව ඒ සාල්මලී වෘක්‍ෂයෙහි වාසයකොට මධුපානය කරම්යි(සිතා)පැසුනුගෙඩියක හොටය ගැසූයේය එවිට හුලගින් නැගුනු පුළුන් මලාන්තිකව බැලූයේය යනු භාවයි.

මෙයසංස්කෘත කාව්‍යාලඞ්කාරයන්හි පෙණෙන අලඞ්කාරයන්ට වෙනස්වූසේ තර්කණයකොට යොදනලද්දක්මෙනි-එබැවින් මෙහි ප්‍රකාශනොවී කවීහුගේ සිතෙහි සැඟවී තුබූ අදහස් හා උපමා උපමෙය විශෙෂවිභාගය ගුරුවරුන් විචාරා දතයුතු.

මේ අනන්‍යාලාපය වූකලී ආචාර්‍ය්‍ය දණ්ඩින් විසින් කාව්‍යාදර්ශයෙහි දක්වනලද සමාසොක්තිය විය යුතුයි—තදුදාහරණය මෙසේයි.

2-206 පිවන්මධු යථාකාමං භ්‍රමරඃ ඵුල්ලපඞ්කජෙ,
අප්‍යසන්නද්ධසෞරභ්‍යං පශ්‍ය චුම්බති කුඞ්මලම්.

භ්‍රමරඃ, භෘඞ්ගතෙම; ඵුල්ලපඞ්කජෙ, ප්‍රබුඩවූ පද්මයෙහි; මධු, මකරන්දය; යථාකාමම් පිවන්, සිත්සේබොන්නේ; අසන්නද්ධසෞරභ්‍යං අපි, අනුපජාත සුගන්ධඇත්තාවූද; කුඞ්මලම්, පිපුම්කැකුල; චුම්බති, සුඹුනේයි; පශ්‍ය, (මේ ආශ්චර්‍ය්‍යය) බල.

මෙසේ කියනලද මේවාක්‍යයෙහි විදග්ධ ස්ත්‍රිය කෙරෙහි බඳනාලද සම්භොගවිලාස ඇති කාමියක්හුගේ බාලවූ කිසි අවිදග්ධ ස්ත්‍රිය කෙරෙහි රාගප්‍රසාරය තෙම ප්‍රතීයමාන වන්නේයි.

මේ යථොක්ත අලඞ්කාරය සිංහලකවිහි දුලබ නමුත් කාව්‍යශෙඛරයෙහි-1-36කවියේපැණෙන අලඞ්කාරයක්ද මිට ආසන්නයි.

ඒ මෙසේයි—නෙලුම් මල් ගඳ ග ත්
පවන් මිගු ලුහුබැඳ ය ත්
සුරත සර තස යු ත්
පුරඹ හල කවුළුවෙන් ගෙව ප ත්

පද්මසුගන්ධග්‍රහණය කළාවූ මාරුතය ෂට්පදීහු ලුහුබැඳ යත් හෝ සුරති ක්‍රීඩාශ්‍රමයෙන් යුක්තවූ නගර ස්ත්‍රීන් විසින් හරණ ලද කවාටයෙන් ගෘහයට පැමිණීයෝයි-යනු භාවයි-මෙහි නගරස්ත්‍රීන්ගේ වක්ත්‍රයන් නෙලුම්මල් සමානබැවිනුත් සුවඳ වැහෙන බැවිනුත් නෙළුම් විල් යයි රුවටී මීමැස්සෝ ගෙවලට වැදුනෝයයි අභවති—සැඟවී තිබෙණ අතික්අථියක් නොපැණේ.

මෙසේ ආසන්නවූ නුමුත් අනන්‍යාලාපයයි නිශ්චිත නොවේ.

A පියවි අකුරකින්, ප්‍රකෘති ආකාරයෙකින්; ඇසිරෙණ අරුත්

අපොළුහරියොර බිම තනබඳුපෙද නො සැහැමෙන්,
බියෙනෙව් ගිනි නුවන් වන් කත කන්කපල් පල්ලේ. B

වෙසෙසක්, පවත්නාවූ අභිවිශෙෂයක්; අන්අයුරකින්, අන්‍ය ආකාරයකින්; සලකණු, කල්පනාකිරීම; උපේලකර ඒ දනු; ඒ උත්ප්‍රෙක්‍ෂාලඞ්කාරයයි ජානනය කරණු.

මෙහි ස්වභාව ආකාරයකින් පවත්නාවූ කිසියම් අභිවිශෙෂයක් අන්‍ය ආකාරයකින් කල්පනාකිරීම උත්ප්‍රෙක්‍ෂාලඞ්කාර නම්—ඊට උදාහරණ–

B තනබඳුපෙද, පයොධරාකාරවූ කන්දුකය; නොසැහැමෙන්, ක්‍ෂමා නොකොට හීමෙන්; බිමැ, භූමියෙහි; අරිශොර; නැවත නැවත; අපොළුත, ප්‍රහාරදෙනකල්හි, කත, කාන්තාවගේ; නුවන් වන්, නයනාකාරවූ; කන්කපල්, කර්ණොත්පලයතෙම, බියෙන් එව්, භීතියෙන්මෙන්; පල්ලේ; පාදතලයෙහි; ගිනි, පතිතවී. *

පයොධරාකාරවූ (තනයවැනි) පන්දුව ක්‍ෂමානොකොටහීමෙන් (නොඉවසීමෙන්) භූමියෙහි නැවත නැවත ගසනකල්හි කාන්තාවගේ ඇසවැනිවූ කර්ණොත්පලය භයින්මෙන් පාදතලයෙහි වැටුණේය යනු භාවයි—මෙකී අලඞ්කාරය මෙහිදී සංක්‍ෂෙපකොට කී නමුත් ආචාර්‍ය්‍ය දණ්ඩින් විසින් සචෙතන අචෙතන වශයෙන් දෙකට බෙදනලදී—මෙහි 'අපොළුහරියොරබිම' යනාදිය අචෙතන උත්ප්‍රෙක්‍ෂාවට උදාහරණයි. සචෙතනයට නො දක්වනලදී—සචෙතන අචෙතන වශයෙන් කරණලද විභාගය මෙසේයි.

2-221 අන්‍යථෛව ස්ථිතා වෘත්තිශ්චෙතනස්‍යෙතරස්‍ය වා,
අන්‍යථොත්ප්‍රෙක්‍ෂ්‍යතෙ යත්‍ර තාමුත්ප්‍රෙක්‍ෂාං විදුර්යථා.

යත්‍ර, යම් උක්තියෙක්හි; චෙතනස්‍ය, සජීවයක්හුගේහෝ; ඉතරස්‍ය වා, නිර්ජීවයක්හුගේහෝ; අන්‍යථෛවස්ථිතා, අනික් පරිද්දෙකින්ම සිටියාවූ; වෘත්තිඃ, ප්‍රවෘත්තිතොමෝ; අන්‍යථා, අන්පරිද්දෙකින්; උත්ප්‍රෙක්‍ෂ්‍යතෙ, කල්පනාකරණුලැබේද; තාම්, ඒ උක්තිය; උත්ප්‍රෙක්‍ෂාම්, උත්ප්‍රෙක්‍ෂායයි; විදුඃ, දනිත්; යථා, ඒ (සචෙතනයට උදාහරණ) මෙසේයි—

2-222 මධ්‍යන්දිනාර්කසන්තප්තඃ සරසිං ගාහතෙ ගජඃ,
මන්‍යෙ මාර්තණ්ඩගෘහ්‍යාණි පද්මාන්‍යුද්ධර්තුමුද්‍යතඃ.

මධ්‍යන්දින, මධ්‍යාහ්නවේලෙහි; අර්කසන්තප්තඃ, සූර්‍ය්‍යයාවිසින් තවනලද; ගජඃ, හස්තිතෙමේ; සරසීම්, විලට; ගාහතෙ, බස්නේයි; මාර්තණ්ඩගෘහ්‍යාණි, තමාසන්තාපජනකවූ සූර්‍ය්‍යයාගේ පක්‍ෂ

*පයොධරාකාරධරො හි කන්දුකඃ කරෙණ රොෂාදභිහන්‍යතෙ මුහුඃ ඉතීව නෙත්‍රාකෘතිභීතමුත්පලං ස්ත්‍රියඃ ප්‍රසාදාය පපාත පාදයොඃ-සි. භොජප්‍රබන්ධයෙහිදු ප්‍රකාශිතයි.

යෙහිවූ; පද්මානි, පද්මයන්; උද්ධර්තුම්, උදුරන්නට; උත්සුකඃ, සාභිලාසියයි; මනො, සිතම්—

මධ්‍යාහ්න කාලයෙහි (ඉරමුදුන්වෙලාවෙහි) සූර්‍ය්‍යං විසින් තවන ලද හස්තිරාජතෙම විලට බස්නේයි(ඒ කුමකටයත්) තමා සන්තාපජනකවූ (තමාතැවීමෙන් විඩාපත්කළාවූ) සූර්‍ය්‍යාගේ පක්ෂයෙහි වූ (නොහොත් ඒ සූර්‍ය්‍යයාට මිත්‍රවූ) පද්මයන් උදුරන්නට සාභිලාසයෙන්යයි සිතම්—යත්‍රභාවයි.

අන්පරිද්දෙකින් පැවති ඇතුගේ විලට බැසීම අන්පරිද්දෙකින් සිටි පද්මයන්ගේ උද්ධරණයෙන් වෛරප්‍රතිකාර කරණ පිණිසයයි කවීහු කියති—

ඒ මෙසේයි—2-223

ස්නාතුං පාතුං විසාන්‍යත්තුං කරිණො ජලගාහනම්,
තවෛරනිෂ්ක්‍රියායෙති කවිනොත්ප්‍රෙක්ෂ්‍ය වර්ණ්‍යතෙ.

කරිණඃ, සූර්‍ය්‍යරශ්මිසන්තප්තහස්තිහුගේ; ජලගාහනම්, දියට බැස්ම; ස්නාතුම්. නාහනපිණිසද; පාතුම්, පැන්බොන පිණිසද, විසානි, මෘණාලයන් හෙවත් නෙළුම්දළු; අත්තුම්, කනපිණිසද පවත්නේය; තත්, ඒ ජලගාහනයතෙම; වෛරනිෂ්ක්‍රියායෙති, (සූර්‍ය්‍යාගේ පක්ෂයෙහිවූ පද්මයන්ගේ උද්ධරණයෙන්) වෛරප්‍රතිකාරකරණ පිණිසයයි; කවිනා,කවීහුවිසින්; උත්ප්‍රෙක්ෂ්‍ය, කල්පනාකොට;වර්ණ්‍යතෙ, කියනු ලැබේ—මෙසේ සචෙතනයට උදාහරණ දක්වා අචෙතනයට උදාහරණ දක්වන්නෝ මෙසේ කීහු-

2 224 කර්ණස්‍ය භූෂණමිදං මමායති විරොධිනඃ,
ඉති කර්ණොත්පලං ප්‍රායස්තව දෘෂ්ට්‍යා විලංඝ්‍යතෙ,

ඉදං, මේ කර්ණාවතංසයතෙම; මමායති විරොධිනඃ, මාගේ දික්වීම වළකන්නාවූ; කර්ණස්‍ය, ශ්‍රවණයට; භූෂණම්, ආභරණයයි; ඉති; මෙසේ; තව, තිගේ; කර්ණොත්පලං, ශ්‍රවණොත්පලයතෙම; දෘෂ්ට්‍යා, දෘෂ්ටිය විසින්; විලංඝ්‍යතෙ ප්‍රායඃ, ඉක්මෙනු ලැබෙයි සිතම්-මෙහි අචෙතනවූ නෙත්‍රාංගුලක්ෂණවූ වස්තූහුගේ අන්‍යපරිද්දෙකින් සිටි ප්‍රවෘත්තිතොමෝ අන්‍ය පරිද්දෙකින් උත්ප්‍රෙක්ෂිතයයි දතයුතුයි—

මේ උත්ප්‍රෙක්ෂාලංකාරය කාව්‍යශාස්ත්‍රයෙහි බොහෝසේ පෙණේ, අවශෙෂ අලංකාරයෝ වූකල්හි එසේ දකින්ට නොලැබෙත්-මේ අධිකාරය බොහෝ නිදසුන් ගෙණහැරදක්වා විස්තර කිරීමෙන් කම්කිම? ආධුනිකයන්ගේ අවබොධයට සෑහෙන විස්තරය මේ පමණී, එබැවින් එය ස්වල්ප නිදසුනකින් කරණලද විස්තරයෙන් අවබොධකෙරේවා—

කුසජාතක කාව්‍යයෙහි—311

මී අ ඹ රසඹ පානය කරමින් වැහෙ හ
නී ල බ පැහැති පරපුටුකැල තුටුරැවි හ
සී ය ඹ සමග තුරු හිසැ දෙන නද නද න
එ ප බ වතිගෙ තුති ගී කියනෙව් ගුව න

නීලඹපැහැති, නීලවර්ණමෙඝ සමාන පැහැය ඇත්තාවූ; පර පුටුකැල, කුරවිකසමූහයා; සීයඹසමග, සවකීයඅම්බිකාවන්සමඟ, මීඅඹ, මධුරාම්‍රයෙන්; වැහෙන, වහනය වන්නාවූ; රසඹ, රසජලය; පානයකරමින්, පානයකොට; තුටුරැවින, තුෂ්ටිරාවයෙන් යුක්තව හොහොත් සන්තොෂ නාදයෙන් යුක්තව; තුරුහිසැ, වෘක්ෂමස්තකයෙහි; දෙන, දෘනය කරන්නාවූ; නදන, නඳනීයවූ; නද, නාදය; (කෙසේද) ගුවන, ආකාශයෙහි; එ පබවතිගේ, ඒ ප්‍රභාවතිදෙවියගේ; තුතිගී, ස්තුතිගීතිකා; කියනෙව්, කථනය කරන්නාක්මෙනි-මෙහි අන්පරිද්දෙකින් පැවති කුරවික නාදය කව්හුවිසින් අන්පරිද්දෙකින් කල්පනාකොට කිමදී-හෙවත් ඒ ප්‍රභාවතියව ස්තුතිගීතිකා කියන්නාක්මෙන් කල්පනාකිරිමදී—

කාව්‍යශෙඛරයෙහි—

1,65 එහි නද දෙන නිත ර
කුරවි කෙවිලි මනහ ර
සුනතිඳු මිහුරු ස ර
උගන්නා වැනි සිතින් ලොබක ර

මෙහිදු අන්පරිද්දෙකින් නාදකරන්නාවූ කුරවි කෙවිල්ලන්ගේ නාදකිරීම අන්පරිද්දෙකින් පැවති බුදුන්ගේ ස්වරයකෙරෙහි ලොභයෙන් එය උගන්නාමෙනැයි කව්හු කල්පනාකොටකියති,

අචෙතන උත්ප්‍රෙක්ෂාලඞ්කාරයට උදාහරණ-

කුසජාතකයෙහි—

81 පිළිමිණි පවුර ල හ
බබලන දියඅගල ර හ
ගත හර බඹුරි ර හ
කොලෙසවට හුනු වැන්න සුරග හ

මෙහි අන්පරිද්දෙකින් පිහිටි දියඅගල අන්පරිද්දෙකින් පිහිටි ආකාශ ගඟාව මෙනැයි කව්හු කල්පනාකොට කියති-

ගුත්තිලකාව්‍යයෙහි-

94 පිපි සියපත් රෙණ ට
පුරෙහි වත්සුණු සුවඳ ට
හැසිරෙණ බමරු ව ට
හෙලු මිණිදූල් වැත්න අරක ට

මෙහි අන්පරිද්දෙකින් හැසිරෙණ භෘඞ්ග සමූහයා ආරක්‍ෂා පිණිස ලූ මාණික්‍යජාලාසමානයයි කවීහු කල්පනාකොට කියති-

283 දිගයනසඳ සෙදි න
රොසිනෙව් කැණිට නවත න
කොළවර රතලෙලෙ න
නුවන්පුනඈගෙ බැබලි වෙසෙසි න

මෙහි අන්පරිද්දෙකින් පවතින රක්තවර්ණය දික්වීම වලකන් නාවූකර්ණයකෙරෙහි කොපයෙන් රතුවීයයි කල්පනාකරකියති

පරවිසන්දෙශයෙහි-

131 විය ලතු සිය කරින් පුගතෙහි මහසපු ර
සියකුලැ පෙරසිරිත් කරුණෙන් සහසක ර
දීය කඳඅතර එහි මෙතෙකැයි ඇති හැඹු ර
විය ගිලුනෙව් බලනුවස් විමසා එව ර

මෙහි අන්පරිද්දෙකින් ගිලුනාවූ සූර්‍ය්‍යයා පුනානාතයෙහි සමුද්‍රජලය විංලීමටජලප්‍රමාණය දැනගන්නා පිණිස ගිලුනේයයිකියති-

කොවුල් සන්දෙශයෙහි—

පු ර වේදෙපසැ දෙර දෙර රඹතුරු රඳ න
නි ර තුරු නැමී සිටිනා ලෙස පල බරී න
කා ර පුද කුසුම් මිගි මඩලට * මුවැදිලි න
ව ර නමසුතන් රකිණුව නමකරණ මෙ න

පුර, නගරයාගේ; වේදෙපසැ, වීථි උභයපාර්ශ්වයෙහි; දෙරදෙර; බහිවාරයක්පාසා; රඳන, රජමානවූ; රඹතුරු, රම්භාවෘක්ෂයන්; පලබරින, (ඵලවලඹවෙන්නාවූ) ඵලභාරය කරණකොටනෙණ; නිරතුරු, අනවරතයෙන්; නැමී, නමතිගුතව; සිටිනාලෙස, සිටින්නාවූ විලාසය; (කොසේද?)මිහිමඩලට; මහීමණ්ඩලයට; කුසුම්, පුෂ්පයන්; පුදකර, පූජාකොට; මුවැඳිලින, මුඛාජලිබඩව; වර, යහපත්වූ; නමසුතන්, තමන්ගේ ආත්මජ (පුත්‍ර)යන්; රකිණුව, රක්‍ෂාකරණු පිණිස; නමකරණමෙන, නමස්කාර කරන්නාක් මෙනි.

* මිහිමලහට,

## හෙතුරූපාලඞ්කාරය,

ගැඹුරෙන් සයුරු වී සොම්ගුණෙනිඳු රිවි තෙදින්,
ඇඳුරු දිරි තිළිණෙන් සුරතුරු මෙ ගේරු නම්-A

---

මෙහිඳු අත්පරිද්දෙකින් නැමී තිබෙන්නාවූ රම්භාවංශ පෑපිවී මණ්ඩලයට නමස්කාර කරන්නාක් මෙනැයි කවීනු අත්අයුරකින් සලකණලදී—සචෙතන අචෙතන වශයෙන් පැවැති උත්ප්‍රෙක්ෂාලඞ්කාරයාගේ විප්‍රකාර ප්‍රභෙදයම * අවබොධකරණු ලැබේවා.

මෙකී අලඞ්කාරය සචෙතන අචෙතන වශයෙන් විප්‍රකාරබව ආචාර්‍ය්‍යාදීන් විසින් සූත්‍රොදාහරණ සහිතවම දක්වනලද නමුත් පතිරජ පිරිවෙන් මාහිමියන් විසින් සංක්ෂෙපයෙන් සඞ්ග්‍රහකරණලද මේ සිඬාන්තසඞ්ග්‍රහවෙහි සාමාන්‍යයෙන් "පියවී අයුරකින්" යනාදීන් සූත්‍ර හැදූ ඊට උදාහරණ වශයෙන්—"අපොල තරි යොර බිම" යනාදී ගීය පමණක් නිදසුන් කරණලදී-මෙය අචෙතනයටයි, සචෙතනයට නොමැත්යි, එබැවින් කාව්‍යාදර්ශ ස්වභාවාලඞ්කාරආදිය නොදත් අධුනිකයින්ගේ විඥානය සඳහා යථොක්ත විප්‍රකාරයම සොදාහරණකොට විස්තරකොළෙමු.

B ගැඹුරෙන්, ගම්භීරගුණයෙන්; සයුරු වී, සාගරය වැන්නැයි කියාද; සොම්ගුණෙන්; සෞම්‍යගුණයෙන්; ඉඳු (වී,) චන්ද්‍රයා වැන්නැයි කියාද; තෙදින්, තෙජසින්; රිවි(වී,) සූර්‍ය්‍යයා වැන්නැයි කියාද, දිරි, ධෛර්‍ය්‍යයෙන්; ඇඳුරු (වී,) පර්‍වතයවැන්නැයි කියාද; තිළිණෙන්, ත්‍යාගයෙන්; සුරතුරු(වී,) දෙවද්‍රැමය (දිව්‍ය වෘක්ෂය)වැන්නැයි කියාද; මෙ, මෙසේ කියනලද්දේ; ගේරු නම්, හෙතුරුපක නම්වේ.

ගැඹුරුගුණය කරණකොටගෙණ සාගරයවැනිවූයේය—සෞම්‍යගුණය කරණකොටගෙණ චන්ද්‍රයා සමානවූයේය-තෙජස කරණකොටගෙණ සූර්‍ය්‍යා සමානවූයේය—ධෛර්‍ය්‍ය ගුණය කරණකොට ගෙණ පර්‍වතය සමානවූයේය—ත්‍යාගය කරණකොට ගෙණ කල්පවෘක්ෂය † සමාන වූයේය—මෙසේ කියනලද්දේ හෙතුරුපාලඞ්කාරයයි යනු භාවයි.

---

* මන්‍යෙ ශඞ්කෙ ධ්‍රැවං ප්‍රායොනූනමිත්‍යෙවමාදිභිඃ,
උත්ප්‍රෙක්ෂාව්‍යජ්‍යතෙ ශබ්දෛරිවශබ්දො'පි තාදෘශඃ-ශ්‍රීදණ්ඩී,

† පඤ්චෛතෙ දෙවතරවො මන්දාරඃ පාරිජාතකඃ.
සන්තානඃ 'කල්පවෘක්ෂශ්ච' (පුංසිවා) හරිචන්දනම්-ශී.

දිව්‍යවෘක්ෂපහෙන්(කැමතිදෙය දෙන්නේයයි ලොකසම්මතවූ) සතරවනගහට කල්පවෘක්ෂයයි අභිධානයි.

කාව්‍යාදර්ශයෙහි-

2-85 ගාම්භීර්යෙණ සමුද්‍රොසි ගෞරවෙණාසි පර්වතඃ,
කාමදත්වාච්ච ලොකානාමසි ත්වං කල්පපාදපඃ-.

ත්වං, නෝ; ගාම්භීර්යෙණ, උත්තාන නොවූ (ගැඹුරු) සිත්ඇති බව හෙතුකොටගෙණ; සමුද්‍රඃ අසි, සාගරයෙහිය; ගෞරවෙණ, ගෞරවගුණයෙන්; පර්වතඃ අසි, පර්වතයෙහිය; (එසේම) ලොකානාම්, ලෝවැස්සන්ට; කාමදත්වාත්ච, ඉෂ්ටදායීබව හෙතුකොට ගෙණ; කල්පපාදපඃ අසි, කල්පවෘක්ෂයෙහිය.

2-86 ගාම්භීර්යප්‍රමුඛෛරත්‍ර හෙතුභිස්සාගරො ගිරිඃ,
කල්පද්‍රුමශ්ච ක්‍රියතෙ තදිදං හෙතුරූපකම්.

අත්‍ර, මේ ප්‍රයොගයෙහි ලං; ගාම්භීර්යප්‍රමුඛෛඃ, ගම්භීරත්වාදිවූ; හෙතුභිඃ, කාරණයෙන් (විවක්ෂිතවූ කිසිපුරුෂයෙක්;)සාගරඃ, සාගරයසිද; ගිරිඃ; පර්වතයසිද;කල්පද්‍රුමශ්ච;කල්පවෘක්ෂයසිද, ක්‍රියතෙ, (යම්හෙයකින් රූපිත)කරණලැබේද;තත්,එහෙයින්;ඉදම්,මෙබඳු වූයේ; හෙතුරූපකම්, හෙතුරූපකනම් වන්නේයි; (තදිදං, යේ මේ අනන්තරෙක්තවූයේ හෙතුරූපක නමැයි යෙදිය යුතු.)

මෙහිදූ, තෝ ගැඹුරු ගුණය හෙතුකොටගෙණ සාගරවූයෙහි ය, ස්ථිරවූ ගෞරව ගුණයෙන් පර්වතවූයෙහිය, එසේම ලෝවැස් සත්ට කැමැතිදෙයදීම හෙතුකොටගෙණ කල්පවෘක්ෂවූයෙහියයි මේ යෙදීමෙහි ගම්භීරත්වාදි කාරණයෙන් විවක්ෂිතවූ කිසි පුරුෂ යෙක් සාගරයසිද පර්වතයසිද කල්පවෘක්ෂයසිද යම්හෙයකින් දක්වනු ලැබේද එහෙයින් මෙබඳුවූයේ හෙතුරූපක නම් අලඞ්කා රයයි. මේ අනන්තරෙක්තවූයේ ඒ හෙතුරූපකයම්වේ,

කුසජාතකයෙහි-

658, තද තෙදිනි දිනක ර
තිසල බලයෙන් සරි මෙ ර
නුවණින් ගුරු අම ර
විපුල ඉසුරෙන් සදිසි පුරද ර

තදතෙදිනි, සතබ්ධවූ තෙජස කරණකොට ගෙණ; දිනකර, සූර්යයා හාද; තිසලබලයෙන්, තිශ්චලවූ බලය කාරණකොට ගෙණ, මෙර, මහාමෙරුපර්වතය හාද; නුවණින්,ඥාණයකාරණ කොට ගෙණ, අමරගුරු, බෘහස්පතියා හාද; සර, සමානවූ; විපු ලඉසුරෙන්, මහත්වූ ඓශ්වර්ය කාරණකොට ගෙණ; පුරදර, ශක්‍රයාහාද; සදිසි. සමානවූ; (මහබෝසත් යන්නට විශෙෂණයි)

මෙහි දැක්වූ තෙජස් ආදිහෙතුයෙන් විවක්ෂිතවූ බොධිසත්වානන මයා සූර්යයා යයිද, මහා මෙරු යයිද, බෘහස්පතියයිද, පුරන්දර යයිද, යම්හෙයකින් රූපිතද-එහෙයින් මෙබඳුවූයේ හෙතුරූපක නම්වේ,

ගුත්තිලකාව්‍යයෙහි—

25 තෙදින් දිනි දෑ න ත්
සකකුල සිඳු ස දෑ න ත්
සිරින් සුරි දෑ න ත්
නිසා සුදෙවුන් මහර දෑ න ත්

මෙහිදු තෙජස් ආදි හෙතුයෙන් විවක්ෂිතවූ සුඩොදන මහරජ තුමා සූර්ය යයිද, චන්ද්‍ර යයිද, සුරෙන්ද්‍ර යයිද.යම්හෙයකින් රූපිතද එහෙයින් මේ හෙතුරූපකයි.

පැරකුම්බාසිරිතෙහි-

100 නුවණ සුරගුරු බ ඳු
ගුණයෙන් සඳිසි සොම් ස ඳු
සැපතින් සරි සුරි ඳු
වැඩෙකි සිනෙන් දුවත්-මෙ නිරි ඳු

මෙහිදු ප්‍රඥදිකාරණයෙන් විවක්ෂිතවූ පරාක්‍රමබාහු මහරජතුමා බෘහස්පති යයිද, චන්ද්‍ර යයිද, සුරෙන්ද්‍රයයි, යම්හෙයකින් රූපිතද එහෙයින් මේ හෙතුරූපකාලඞ්කාරයයි දතයුතු

42 ත රි ඳු ගුණයෙ න් ගැඹරි න් කි රි ඳු
කි රි ඳු බලයෙ න් දිරියෙ න් ගි රි ඳු
ගි රි ඳු නුවණි න් විකුමෙ න් සි රි ඳු
සි රි ඳු දින පැරකු ම් බුජ නි රි ඳු

ගිරාසන්දේශයෙහි—

152. කුළුණෙන් දුප්ප තු න්
නිපුණු නුවණින් විය තු න්
විකුමෙන් බලව තු න්
නිබඳදෙන මහදනින් නිව තු න්

153, මෙතින් නරප නි ය න්
නිති තානතුරෙනී මැ නි ය න්
වැඩුමෙන් කුළැ නි ය න්
නොකඩ බැතිපෙම් සිතින් ය නි ය න්

## රූපකාලඞ්කාරය,

සමුදා එකත හෝ අන් අරුත් රූ හව්යෙකින්,
විකපා යුරෙන් පවසත එ විදූ රූ ලකර නම් A
යසපඬෙරෙහු සුපුල් කෙම්සිසි කෙසුරු ගහරැස්,
සෙවලාංදල නල කෙලෙස් දියව්ලැ බිජී, B

---

154, නෙපලෙන් සුබැ    සි ය න්
ඉ සු රෙ න් සිය කුලැ    සි ය න්
වි ල සි න් විල    සි ය න්
මෙලෙස ගත්තේය ලෝවැ    සි ය න්

මෙසේ බොහෝ තැන මේ හෙතුරූපකාලඞ්කාරය දකින්ට ඇතිබැවින් එබඳු තැන්වලදීද මේ ක්‍රමය සලකාගණිත්වා,

A සමුදාහෝ, සමුදායාර්ථ (සමූහාර්ථ) යෙහිහෝ, එකතහෝ; එකාර්ථයෙහිහෝ, රූ හව්යෙකින්, රූපස්වභාවයකින්; අයුරෙන්, ආකෘති (ආකර)යෙන්; විකපා, විකල්පනාංකොට (විශෙෂ වශයෙන් කල්පනාංකොට,)අන්අරුත්. අන්‍යාර්ථයක්; පවසත, ප්‍රකාශ කරත්හොත් (නොහොත්) ප්‍රකාශකළකල්හි, එ, එය; රූලකර නම්, රූපාලඞ්කාරනමැයි; විදූ. කිවූ=ප්‍රකාශකළෝ.

උදාහරණ මෙසේයි-

B. ඔහු, ඔහුගේ; සුපුල්, සුපුෂ්පිතවූ; යසපඬෙර, යශස්නැමැති පුණ්ඩරීකයතෙම; දියව්ලැ, ජගත් නැමැති තඩාගයෙහි; බිජී, සොභිතවී-කෙබඳු පුණ්ඩරීකයක්දයත්?

සිසිකෙම්, චන්ද්‍ර නැමැතිකණිකාවක්ඇති; ගහරැස්, ග්‍රහරශ්මි නැමැති; කෙසුරු, කෙසරඇති; සේවලං, ශුභ්‍රාබ්‍රනැමැති; දල, පත්‍රඇති; කෙලෙස්, කෛලාශපර්වත නැමැති; නල, නාලයක් (නොලුම්දණ්ඩක්) ඇති,ඔහු, ඔහුගේ, සුපුල්, සුත්ඵුල්ලවූ; යසපඬෙ ර, යශොලක්ෂණවූ පුණ්ඩරීකයතෙම, (කීර්තිනැමැති ශ්වෙත පද්මය); දියව්ලැ, ලොක නැමැති තඩාගයෙහි, බිජී, භ්‍රාජිතවී— මෙහි ප්‍රකට උපමාං වස්තුවලින් අප්‍රකටඋපමේයයක් රූපනය කිරීමරූපකනම්-සර්වප්‍රකාරයෙන් රූපකය කළහෙයින් සකලරූපකනම්-මෙම අලඞ්කාරය:

කුසජාතකයෙහි-

95 සිසිකෙම් වලාං ද    ල
උළුරිළු කෙසර පෙල දූ    ල
ඔහු යස සේ කම    ල
බිජී පුබුදුවැ මෙ මුළු දියව්    ල

මෙම අලඞ්කාරය කාව්‍යාදර්ශාදියෙහි බොහෝ විස්තරවපෙණේ, නමුත් මෙහි හෙතුරූපක සකලරූපක යනදෙක හැර අන්‍යවිශෙෂයක් නො පෙණේ-

කාව්‍යශෙඛර—ගුත්තිල—කුසජාතකාදිය කළ මහාකවිවරයන් නොයෙක් විශෙෂ රූපකයෙන් කාව්‍යබන්ධනයකොට තිබෙනා බැවින් ඒ විශෙෂය අධුනිකයන්ට දැනගතයුතුවූවත් නිදර්ශන සමග එය විස්තරකිරීමෙන් ග්‍රන්ථය මහත්වන බැවින් ඒ අලංකාර පරිපාටිය පමණක් මෙහි දක්වන්නෙමු-හේ මෙසේයි.

| | |
|---|---|
| 1 සමස්ත..........රූපකය | 11 සවිශෙෂණ ... ....රූපකය |
| 2 ව්‍යස්ත............රූපකය | 12 විරුඩ...............රූපකය |
| 3 සමස්තව්‍යස්ත...රූපකය | 13 හෙතු...............රූපකය |
| 4 සකල...... ......රූපකය | 14 ශ්ලිෂ්ට...... ......රූපකය |
| 5 අවයව.........රූපකය | 15 උපමා...............රූපකය |
| 6 අවයවි.............රූපකය | 16 ව්‍යතිරෙක.........රූපකය |
| 7 එකඟාදි...........රූපකය | 17 ආක්ෂෙප............රූපකය |
| 8 යුක්ත.............රූපකය | 18 සමාධාන...........රූපකය |
| 9 අයුක්ත...........රූපකය | 19 රූපක. ...............රූපකය |
| 10 විෂම..............රූපකය | 20 තත්වාපහ්නව රූපකයයි |

මෙසේ සම විස්සකි.

### 1 සමස්ත රූපකය.

2, 66 උපමෛව තිරොභූතභෙදා රූපකමිෂ්‍යතෙ, *
යථා බාහුලතා පාණිපද්මං චරණපල්ලවම්.

උපමෛව, යථොක්තලක්ෂණවූ උපමාවම; තිරොභූතභෙදා, අප්‍රකටවූ උපමා උපමෙයයන්ගේ නානාත්වය ඇත්තී; රූපකමිෂ්‍යතෙ, රූපකාලඞ්කාරයයි කැමතිවනු ලැබේ-යථා-හේමෙසේයි-බාහු ලතා, හස්ත නැමැති ලියය; පාණිපද්මම්, හස්තතල නැමැති පියුමය; චරණපල්ලවම්, පාද නැමැති පලුපතයි—මේ අලංකාරයතෙම උපමාන උපමෙය දෙදෙනාගේ අභෙදාරොපණය කෙරේනුයි රූපකනම-මෙහි බාහුප්‍රභෘති ශබ්දයෝ ලතාදීන් හා අභෙදය හෙතුකොට ගෙණ රූපිකය හයි දතයුතු.

### 2 ව්‍යස්ත රූපකය.

67 අඞ්ගුල්‍යඃ පල්ලවාන්‍යාසන් කුසුමානි නඛාර්චිෂඃ,
බාහුලතෙ වසන්තශ්‍රීස්ත්වං නඃ ප්‍රත්‍යක්ෂචාරිණී.

* රූපකමුච්‍යතෙ-රූපකං=උච්‍යතෙ කවිභිරිති ශෙෂඃ-කාලිකතා.

අඞ්ගුල්‍යඃ, ඇඟිලිහු, පල්ලවානි අසත්, පල්ලපත්වූහ; නඛාර්චිෂඃ, නඛශොභාචෝ, කුසුමානි (අසත්), පුෂ්පවූහ; බාහූ; බාහුවය; ලතෙ, ලතාවූහ; (එහෙයින්) ත්වම්, තෝ; නඃ, අපව; ප්‍රත්‍යක්‍ෂවංරිණී, ප්‍රත්‍යක්‍ෂව ඇවිදිනාවූ; වසන්තශ්‍රීඃ, වසන්තලක්‍ෂ්මියෙහි.

## 3 සමස්තව්‍යස්ත රුපකය.

68 ඉත්‍යෙතදසමස්තාඛ්‍යං සමස්තං පූර්ව රුපකම්,
ස්මිතං මුඛෙන්දෝර්ජ්‍යොත්ස්නෙති සමස්තව්‍යස්තරුපකම්.

ඉත්‍යෙතත්, මෙබඳුවූ රුපකය; අසමස්තාඛ්‍යම්, අසමස්තනම; පූර්වරුපකම්, පළමු(කොට දක්වනලද''බාහූ ලතෙ''යන මේආදිවූ) රුපකයතෙම; සමස්තම්, සමස්තනම-ස්මිතම්, ස්මිතයතෙම, (මොලොක්සිනාව) මුඛෙන්දෝඃ, මුඛචන්ද්‍රයාගේ; ජ්‍යොත්ස්නාති, සඳ රැසය යන මේ; සමස්තව්‍යස්තරුපකම්, (මුඛෙන්දෝඃ කියා සමස්ත කළහෙයින්ද-ස්මිතංජ්‍යොත්ස්නෙති යි ව්‍යස්තකළහෙයින්ද) සමස්ත ව්‍යස්ත රුපකනම්-*

මෙහි-'යථාබාහූ' යනාදියෙන් සමස්ත රුපකයද, 'අඞ්ගුල්‍යඃ, යනාදියෙන් ව්‍යස්ත රුපකයද. ස්මිතං මුඛෙන්දෝඃ' යනාදියෙන් සමස්ත ව්‍යස්ත රුපකයදැයි මෙසේ රුපකතුණක් දක්වනලදී.

## 4 සකල රුපකය.

69 තාම්‍රාඞ්ගුලි දලශ්‍රෙණි නඛදීධිති කෙශරම්,
ධ්‍රියතෙ මූර්ධ්නි භූපාලෛර්භවච්චරණපඞ්කජම්.

තාම්‍රාඞ්ගුලි. රත්වූ ඇඟිලි නැමැති; දලශ්‍රෙණි, පත්‍රපඞ්ක්ති ඇති; නඛදීධිති, නඛරශ්මිනැමැති; කෙශරම්, කෙසුරුඇති; භවච්චරණ පඞ්කජම්, තොපගේ පාද නැමැති පද්මය; භූපාලෛඃ, රජදරුවන් විසින්; මූර්ධ්නි, සිරස්හි ලා; ධ්‍රියතෙ, දරණුලැබේ·

70 අඞ්ගුල්‍යාදෞ දලාදිත්වං පාදෙ චාරොප්‍ය පද්මතාම්,
තද්‍යොග්‍යස්ථානවින්‍යාසාදෙතත්සකලරුපකම්.

අඞ්ගුල්‍යාදෞ, ඇඟිලිආදියෙහි; දලාදිත්වම්, පත්‍රාදිත්වයද; පාදෙ, පාදයෙහි; පද්මතාං ච, පද්මත්වයද, ආරොප්‍ය, ආරොපනයකොට; තද්‍යොග්‍ය, එබඳුවූ පද්මයට උචිතවූ; ස්ථානවින්‍යාසාත්, රජදරුවන්ගේ සිරෙලක්‍ෂණවූ ස්ථානයෙහි නිවේෂය හෙතුකොට ගෙණ, එතත්, මේ අනන්තරොක්තවූ රුපකය; සකලරුපකම්, සකලරුපක නම්-මෙහි සර්වාකාරයෙන් රුපනය කළහෙයින් සකල රුපකයි. (සිංහල කවිහිද බොහෝ ඇති).

* සමස්ත ව්‍යස්ත රුපකං උභයමිශ්‍ර රුපක මිත්‍යර්ථඃ, තථාච ස්මිතං ජ්‍යොත්ස්නාඉති ව්‍යස්තං මුඛෙන්දෝරිති සමස්තං-ටීකා.

### 5 අවයව රූපකය.

71 අකස්මාදෙව තෙ චණ්ඩි ස්ඵුරිතාධරපල්ලවම්,
මුඛං මුක්තාරුචො ධත්තෙ ඝර්මාම්භඃකණමඤ්ජරීඃ.

72 මඤ්ජරීකෘත්‍ය ඝර්මාම්භඃ පල්ලවීකෘත්‍ය චාධරම්,
නාන්‍යථාකෘතමත්‍රාස්‍ය මතො'වයවරූපකම්.

චණ්ඩි, කිපෙනසුලුතැනැත්තිය; තෙ, තිගේ; ස්ඵුරිතාධරපල්ලවම්, කොපයෙන් වෙව්ලන්නාවූ අධර නැමැති පල්ලව ඇති, මුඛම්, වක්ත්‍රය; මුක්තාරුචඃ, මුක්තාවකට බඳු ශොභාඇති; ඝර්මාම්භඃකණ, ප්‍රණයකොට කොපයෙන් උපන්නාවූ ස්වෙදබිඳු නැමැති; මඤ්ජරීඃ, කුසුමස්තබකයන්; අකස්මාදෙව, නිෂ්කාරණයෙන්ම; ධත්තෙ, උසුලා—අත්‍ර, මේ ප්‍රයොගයෙහි ලා; ඝර්මාම්භඃ ස්වෙදජලයම, මඤ්ජරීකෘත්‍ය, පුෂ්පස්තබකත්වයෙන් කල්පනා කොට; අධරංච, මුඛයාගේ එකදෙශවූ අධරයද; පල්ලවීකෘත්‍ය, පල්ලවත්වයෙන් රූපිතකොට; ආස්‍යම්, අඞ්ගීමුඛය; නාන්‍යථාකෘතම්, අන්‍යථාත්වයෙන් කරණලද්දේ නොවේ; හෙවත් පද්මාදිත්වයෙන් රූපිත නොවේ; අතඃ, මෙහෙයින්, අවයවරූපකම්, අවයවීවූ මුඛයාගේ රූපනය නොකොට අවයවවූ අධරාදීන්ගේ රූපනය කළහෙයින් අවයවරූපකනම් වේ.

### 6 අවයවීරූපකය.

73 වල්ගිතභ්‍රු ගලද්ඝර්මජලමාලොහිතෙක්ෂණම්,
විවෘණොති මදාවස්ථාමිදං වදනපඞ්කජම්.

74 අවිකෘත්‍ය මුඛාඞ්ගානි මුඛමෙවාරවින්දතාම්,
ආසීද්ගමිතමත්‍රෙදං මතො'වයවී රූපකම්'

වල්ගිතභ්‍රු, නගනලද්දාවූ බැමඇති; ගලද්ඝර්මජලම්, වැහෙන්නාවූ ස්වෙද ජල ඇති; ආලොහිතෙක්ෂණම්, මදක් රත්වූ ඇස් ඇති; ඉදංවදනපඞ්කජම්, මේ මුඛනැමැති පද්මය; මදාවස්ථාං, මධු පානයෙන් ජනිතවූ මදයාගේ අවස්ථාව, විවෘණොති, ප්‍රකාශ කෙරේ—අත්‍ර, මේ ප්‍රයොගයෙහි ලා; මුඛාඞ්ගානි, අඞ්ගීවූමුඛයාගේ නෙත්‍රාදිවූ අවයවයන්; අවිකෘත්‍ය, රූපිත නොකොට; මුඛමෙව, අඞ්ගීමුඛයම; අරවින්දතාම්, පද්මභවට, ගමිතමාසීත්, පමුණුවන ලද්දේවිය; හෙවත් පද්මත්වයෙන් රූපිතය; අතඃ, මෙහෙයින්; ඉදම්, මේ අනන්තරොක්තවූ රූපකය; අවයවී රූපකම්, අවයවී රූපක නම්—මෙහි අවයව නිරූපණය නොකොට මුඛය මතු පද්මය කළහෙයින් අවයවී රූපකනම්වේ.

## 7 එකාඞ්ගාදි රූපකය.

75 මදපාටලගණ්ඩෙන රක්තනෙත්‍රොත්පලෙන තෙ,
මුඛෙන මුග්ධෙ සොප්‍යෙෂ ජනො රාගමයඃ කෘතඃ,

76 එකාඞ්ගරූපකංචෛතදෙවං විප්‍රභෘතීන්‍යපි,
අඞ්ගානි රූපයන්ත්‍යත්‍ර යොගායොගෞ භිදාකරෞ,

මුග්ධෙ, බාලාංව, මදපාටලගණ්ඩෙන; මදයෙන් රක්තවූ කපොල ඇති; රක්ත, රත්වූ; නෙත්‍රොත්පලෙන, ලොචන නැමැති ඉඳුවරයන් ඇති; තෙ, තිගේ; මුඛෙන, මුඛයෙන්; සොප්‍යෙෂ ජනඃ, හේ මේ ජනතෙම; රාගමයඃ, රාගමයවූයේ; කෘතඃ, කරණලදී—එතත්, මේ අනන්තර කථිතරූපකය තෙම; එකාඞ්ගරූපකම්, (එකාඞ්ගවූ නෙත්‍රයාගේම උත්පලත්වයෙන් රූපණය කළහෙයින්) එකාඞ්ගරූපකනම; එවම්, එපරිද්දෙන්ම; විප්‍රභෘතීන්‍යපි, ව්‍යඞ්ගත්‍ර්‍යඞ්ගාදිවූද; අඞ්ගානි, අවයවයන්; රූපයන්ති, රූපිතකරන් නාහ; අත්‍ර, මේ අඞ්ගරූපණයෙහි; යොගායොගෞ, අඞ්ගයන්ගේ සඞ්ගති විරොධදෙදෙන; භිදාකරෞ, රූපකභෙදයන්ගේ ව්‍යවස්ථාවකරන් නාහුයි—

මෙහි අවයවිවූ වක්ත්‍රයද සෙසු අවයවයන්ද රූපණය නොකොට නෙත්‍රයන් උත්පලත්වයෙන් රූපණය කළහෙයින් එකාඞ්ගරූපක නම්වෙයි, මෙසේ දෙඅඟ, තුණහවේ—මෙ පරිද්දෙන් අවයවී හා සමහර අවයවයන් හා රූපණය නොකොට දෙඅවයවයක් රූපණය කළහොත් ව්‍යඞ්ගරූපකවෙයි–තුන්අවයවයක් රූපණය කළහොත් ත්‍ර්‍යඞ්ගරූපකවෙයි; සිඩවූ රූපකයෙන් නැවත ව්‍යක්තවූ රූපකය මේ පරිද්දෙන් වේ,

## 8 යුක්තරූපකය,

77 ස්මිතපුෂ්පොජ්ජ්වලං ලොලනෙත්‍රභෘඞ්ගමිදං මුඛම්,
ඉති පුෂ්පවිරෙඵාණාං සඞ්ගත්‍යා යුක්තරූපකම්.

ස්මිතපුෂ්පොජ්ජ්වලං, සිනානැමැතිමලින් සුභගවූ; ඉදංමුඛම්, තිගේ මේ මුඛයතෙම; ලොලනෙත්‍රභෘඞ්ගම්, චචලත්වාදියෙන් ලොල්වූ නෙත්‍රනැමැති බමරුන් ඇත්තේයි; ඉති, මෙ බඳුවූ රූපකය තෙම; පුෂ්පවිරෙඵාණං, මල්හා බමරුන්ගේ; සඞ්ගත්‍යා, පරස්පරසම්බන්ධය හෙතුකොටගෙණ; යුක්තරූපකම්, යුක්තරූපකයයි කියනුලැබේ—

මෙහි සිනා නැමැති මලින් බබලන්නාවූ චචලත්වාදියෙන්

ලෝලවූ නෙත්‍රනැමැති භෘඞ්ගයන් ඇත්තාවූ තිගේ මුඛනයයි මෙසේ මල් හා භෘඞ්ගයන්ගේ පරස්පරසම්බන්ධය හෙතුකොට ගෙණ යුක්තරූපකයයි යනුභාවයි.

## 9 අයුක්තරූපකය.

78 ඉදමාර්ද්‍රස්මිතජ්‍යොත්ස්නං ස්නිග්ධනෙත්‍රොත්පලං මුඛම්,
ඉති ජ්‍යොත්ස්නොත්පලායොගාදයුක්තං නාම රූපකම්.

ආර්ද්‍රස්මිතජ්‍යොත්ස්නං, ආර්ද්‍රසිනා නැමැති සඳරැස්ඇති; ඉදං මුඛම්, මේ මුඛයතෙම; ස්නිග්ධනෙත්‍රොත්පලම්; සිනිඳුවූ ඇස් නැමැති නිලුපුල් ඇත්තේය; ඉති, මෙබඳුවූයේ; ජ්‍යොත්ස්නොත්පලායොගාත්, සඳරැස් හා උත්පලයන්ගේ අයොගය හෙතු කොටගෙණ (හෙවත් සඳරැස්හි උත්පලයන්ගේ හැකිලිම හෙතු කොටගෙණ) දිනවිරොධයෙන්; අයුක්තංනාම රූපකම්, අයුක්ත නම් රූපකයයි දතයුතු—

කොමලවූ සිනානැමැති සඳරැස්ඇති මේ මුඛයතෙම සිනිඳුවූ ඇස්නැමැති නිලුපුල් ඇත්තේය; මෙසේ සඳරැස් හා උත්පල යන්ගේ අයොගය (නොයෙදීම) හෙතුකොට ගෙණ හෙවත් සඳ රැස් හී උත්පලයන්ගේ හැකිලීම හෙතුකොටගෙණ දිනවිරොධ යෙන් අයුක්තරූපකයයි යනුභාවයි.

## 10 විෂමරූපකය.

79 රූපණාදඞ්ගිනොඞ්ගානාං රූපණාරූපණාශ්‍රයාත්,
රූපකං විෂමං නාම ලලිතං ජායතෙ යථා.

80 මදරක්තකපොලෙන මන්මථස්ත්වන්මුඛෙන්දුනා,
නර්තිතභ්‍රූලතෙනාලං මර්දිතුං භුවනත්‍රයම්,

අඞ්ගිනඃ, අවයවිහුගේ; රූපණාත්, රූපණය හෙතුකොටගෙණ, අඞ්ගානාම්, අවයවයන්ගේ; රූපණාරූපණාශ්‍රයාත්, රූපණය හා අරූපණයන්ගේ අපෙක්ෂාවහෙතුකොටගෙණ හෙවත් අවයව යන්ගේ රූපණය හා අරූපණය හෙතුකොටගෙණ; විෂමංනාම, විෂමනම්වූ; ලලිතං, චාරුවූ; රූපකං, රූපකයතෙම; ජායතෙ, වන්නේයි; යථා, යේ මෙසේයි–මන්මථඃ, අනඞ්ගතෙම; මදරක්ත කපොලෙන, මදයෙන් රක්තවූ ගණ්ඩඇති; නර්තිතභ්‍රූල තෙන, නටවනලද බැම නැමැතිලතා ඇති; ත්වන්මුඛෙන්දුනා, තිගේ මුඛනැමැති චන්ද්‍රයා කරණකොටගෙණ; භුවනත්‍රයම්, තුන්ලොව; මර්දිතුං, දනන්නට; අලං, පොහොසති.

මෙහි සමහර අවයවයක් රූපණයකොට සමහරක් රූපණය නොකළ හෙයින් විෂමරූපක නම්.

## 11 සවිශෙෂණරූපකය.

81 හරිපාදශ්ශිරොලග්න ජහ්නුකන්‍යාජලාංශුකඃ,
ජයත්‍යසුරනිඃශඞ්ක සුරානන්දොත්සවධ්වජඃ.

82 විශෙෂණසමග්‍රස්‍ය රූපං කෙතොඃයදීදෘශම්,
පාදෙ තදර්පිණාදෙතත් සවිශෙෂණ රූපකම්.

ශිරඃ, අග්‍රපාදයෙහි හෙවත් අඞ්ගුලි දෙශයෙහි; ලග්න, පිහිටියාවූ; ජහ්නුකන්‍යා, ආකාශගඞ්ගාවගේ; ජල, දියනැමති; අංශුකඃ, පතාකස්වරූපකවූ වස්ත්‍රඇති; අසුර, අසුරයන් කෙරෙන්; නිඃශඞ්ක, සැකනැති; සුර, දෙවතාවන්ගේ; ආනන්දොත්සව, සන්තොෂොත්සවයෙහි; ධ්වජඃ, නඟනලද කෙතුවක්වූ; හරිපාදඃ, වික්‍රමවත්වූ විෂ්ණුහුගේ චරණයතෙම; ජයති, දෙනේ.

(පෙර විෂ්ණුහු ත්‍රිපද වික්‍රමය කරණකල්හි බ්‍රහ්මයා විසින් ආකාශ ගඞ්ගාජලය ඔහට අඝීකරණලද යනු කථාය, එහෙයින් "ශිරෙලග්න" යනාදි කියනලදී)

විශෙෂණසමග්‍රස්‍ය. පතාකොත්සවස්වභාවරූපවූ විශෙෂණයෙන් යුක්තවූ; කෙතොඃ, ධ්වජයාගේ; යදීදෘශං රූපම්, යම් මේ අනන්තරොක්තප්‍රකාරවූ ස්වභාවයෙක් ඇද්ද; පාදෙ, විෂ්ණුචරණයෙහි ලං; තදර්පිණාත්, (ඔහුගේම ධ්වජයයි) ආරොපණය හෙතුකොට නෙණ, එතත්, මෙබඳුවූයේ; සවිශෙෂණ රූපකම්, සවිශෙෂණ රූපකයයි කියනුලැබේ—

මෙහි විෂ්ණුහුගේ පාදයතෙම තමාකෙරෙහි හුනු ආකාශගඞ්ගාජල නැමැති වස්ත්‍රඇති දෙවියන්ගේ උත්සව ධ්වජයකැයි සවිශෙෂණවය තිහෙයින් සවිශෙෂණරූපක නම්.

## 12 විරුද්ධරූපකය.

83 න මීලයති පද්මානි න නභොප්‍යවගාහතෙ,
ත්වන්මුඛෙන්දුර්මමාසූනාං හරණායෛව කල්පතෙ *

84 අක්‍රියා චන්ද්‍රකාර්‍යාණා මන්‍යකාර්‍යස්‍ය ච ක්‍රියා,
අත්‍ර සන්දර්ශ්‍යතෙ යස්මාද් විරුද්ධං නාම රූපකම්.

ත්වන්මුඛෙන්දුඃ, තිගේ මුඛය නැමැති චන්ද්‍රතෙම; පද්මානි, පද්ම

* ව්‍යවස්‍යති-ලඞ්කාපාඨයි. යස්‍යති-කාලිකාතාඩපත්පාඨයි.

යන්; න මිලයති, නොහකුළුවන්නේය; නහොපි, අකාශයද; නාවනාහතෙ, නොබස්නේය (වැලිකුමක් කෙරේදයත්) මමාසූ නාම්, මාගේ ප්‍රාණියන්ගේ; හරණයෙව, ගැත්මවම; කළපතෙ, උත්සාහ කාරන්නේය; (මේ චන්ද්‍රයා කළමනා ක්‍රියා නොකොට අන්‍ය ක්‍රියාවක් කරණ හෙයින් විරුඩරූපක නම්—(යස්මාත්, යම්හෙයකින්; අත්‍ර, මේ ප්‍රයොගයෙහි; චන්ද්‍රකාර්‍ය්‍යාණිම්, චන්ද්‍රයා විසින් කටයුතුවූ පදමතිමිලනාදින්ගේ; අක්‍රියා, නොකිරීමද; අන්‍යකාර්‍ය්‍යස්‍යචක්‍රියා, (ආයුධාදියෙන් කටයුතුවූ ප්‍රාණහරණ ලක්ෂණවූ) අන්‍යකාර්‍ය්‍යයාගේ කිරීමද; සන්දර්ශිතෙ, දක්නාලැබේද; තස්මාත්, එහෙයින්; විරුඩං නාම රූපකම්, (මේ තෙම) විරුඩ රූපක නම් වන්නේයි.

### 13 හෙතුරූපකය.

මේ අලඞකාරය මිට පළමු හෙතුරූපකාලඞකාරයෙහිදි විස්තර කොළෙමු,

### 14 ශලිෂ්ටරූපකය.

87 රාජහංසොපභොගාහීං භ්‍රමරප්‍රාර්ථ්‍යසෞරභම්,
අලි * වක්ත්‍රාම්බුජම්දං තවෙති ශලිෂ්ටරූපකම්.

අලි, යෙහෙලිය; තව, තිගේ; ඉදං, වක්ත්‍රාම්බුජම්. මේ මුඛනැමැති පදුමය; රාජහංස, නරෝත්තමයන් විසින්; උපභොගාහිම්, අනුභවයට සුදුස්සේය; (නොහොත්) රාජහංස, රාජහංසයන් විසින්; උපභොගාර්හම්, නිෂෙවනයට සුදුස්සේය; (හෙදහෙද) භ්‍රමරප්‍රාර්ථ්‍ය සෞරභම්, කාමුකජනයන් විසින් පැතියයුතු සුවඳ ඇත්තේයි; (නොහොත්) භ්‍රමරයන් විසින් පැතියයුතු සුවඳඇත්තේයි,ඉති,මෙබඳුවූයේ(උක්තප්‍රකාරඅර්ථශ්ලෙෂාන්‍විතවූ හෙයින්;) ශලිෂ්ටරූපකම්, ශලිෂ්ටරූපකයයි දන්නාලදී.

### 15 උපමාරූපකය.

88 ඉෂ්ටං සාධර්ම්‍යවෛධර්ම්‍ය දර්ශිතාද්ගෞණමුඛ්‍යයොඃ,
උපමාව්‍යතිරෙකාඛ්‍යං රූපකද්විතයං යථා.
89 අයමාලොහිතච්ඡායො මදෙන මුඛචන්ද්‍රමාඃ,
සන්නද්ධොදයරාගස්‍ය චන්ද්‍රස්‍ය ප්‍රතිගර්ජති.

ගෞණමුඛ්‍යයොඃ, අප්‍රධාන ප්‍රධාන දෙක්නාගේ; සාධර්ම්‍යවෛධර්ම්‍යදර්ශිතාත්, සාදෘශ්‍ය අසාදෘශ්‍ය දෙක්නාගේ දැක්ම හෙතුකොට

* යබ්, ඩී. කල්කාතා.

ගෙණ; උපමාව්‍යතිරෙකාඛ්‍යම්, උපමාරූපක නම්වූද ව්‍යතිරෙක රූපකනම්වූද, රූපකත්‍රිතයං, රූපකදෙක; ඉෂ්ටම්, කැමතිවනලදී; යථා, හේමෙසේයි—මදෙන, මදයහෙතුකොටගෙණ; ආලොහිත චඡායඃ, රත්වූ ශොභාඇති; අයං මුඛචන්ද්‍රමාඃ, මේ මුඛනැමැති චන්ද්‍රතෙම, සන්නාහබොදයරාගස්‍ය, අවසිතවූ උදයකාලයෙහි රත් පැහැඇටි; චන්ද්‍රස්‍ය, චන්ද්‍රයාහට; ප්‍රතිගර්ජති, ගර්ජනාකරන් නේයි, හෙවත් චන්ද්‍රයා හා සාදෘශ්‍යයි-

මෙහි ගෞණවූ චන්ද්‍රයාද මුඛ්‍යවූ මුඛයද යන දෙදෙනාගේ රක්තත්වසාදෘශ්‍යය හෙතු කොට ගෙණ මෙබඳුවූයේ උපමා රූපකයයි දතයුතු.

### 16 ව්‍යතිරෙකරූපකය.

90 චන්ද්‍රමාඃ පීයතෙ දෙවෛර්මයං ත්වන්මුඛචන්ද්‍රමාඃ,
අසමග්‍රොප්‍යසෞ ශශ්වදයමාපූර්ණමණ්ඩලඃ.

අසෞචන්ද්‍රමාඃ, මේ චන්ද්‍රතෙම; අසමග්‍රොපි, අසම්පූර්ණවූයේ ද; දෙවෛඃ, දෙවතාවන් විසින්; ශශ්වත්, අනවරතයෙන්; පීයතෙ, බොනුලැබෙයි; අයං ත්වන්මුඛචන්ද්‍රමාඃ, මේ තීගේ මුඛ නැමැති චන්ද්‍රතෙම; ආපූර්ණමණ්ඩලඃ, සම්පූර්ණවූ මණ්ඩලය ඇත්තේ; මයං, මා විසින්; (ශශ්වත්, අනවරතයෙන්; පීයතෙ, බොනුලැබේ.)

මෙහි ගෞණමුඛ්‍ය චන්ද්‍රමුඛ දෙදෙනාගේ අසම්පූර්ණත්ව සම්පූර්ණත්වසඞ්ඛ්‍යාත අසාදෘශ්‍යය හෙතුකොට ගෙණ මෙබඳුවූයේ ව්‍යතිරෙක රූපකයයි දතයුතුයි.

### 17 ආක්ෂෙප රූපකය,

91 මුඛචන්ද්‍රස්‍ය චන්ද්‍රත්වමිත්ථමන්‍යොපතාපිනඃ,
න තෙ සුන්දරි සංවාදීත්‍යතදාක්ෂෙපරූපකම්.

සුන්දරි, සුන්දරතැනැත්තිය; ඉත්ථං, මෙසේ; අන්‍යොපතාපිනඃ, පරසන්තාපකරවූ (හෙවත් කොමල ජනයන්වහෝ විරහීජනයන්ට තැවුලි කරන්නාවූ ප්‍රකෘති) චන්ද්‍රයාගේ; චන්ද්‍රත්වං, චන්ද්‍රබව; තෙ, තීගේ; මුඛචන්ද්‍රස්‍ය, මුඛනැමැති චන්ද්‍රයාට; න සංවාදි, සමාන නොවේ; හෙවත් සැබෑනොවේ; ඉති, මෙබඳුවූ; එතත්, මේ තෙම, ආක්ෂෙපරූපකම්, (චන්ද්‍රයාගේ නිෂෙධය හෙතුකොට ගෙණ) ආක්ෂෙපරූපකයයි දතයුතු-

මෙහි චන්ද්‍රයාකෙරෙහි විද්‍යමානවූ කාමිජන සඞ්ඛ්‍යාත අන්‍යන් තවන ගුණය මුඛචන්ද්‍රයාට නැතිහෙයින් චන්ද්‍රත්වය වළක්වනලද හුයි ආක්ෂෙපරූපකනම්.

## 18 සමාධාන රූපකය,

92 මුඛෙන්දුරපි තෙ චණ්ඩි මාං නිද්දහති නිද්දයම්,
භාග්‍යදෛශො * මමෛවෙති තත් සමාධාන රූපකම්.

චණ්ඩි, දයානැතිතැනැත්තිය, තෙ, තිගේ; මුඛෙන්දුරපි, ප්‍රීති කරවූ මුඛචන්ද්‍රයාපවා, නිද්දයං, අකාරුණිකව, නොහොත් අත්‍යුෂ්ණයෙන්, මාං, මා; නිද්දහති, දවන්නේය (මේතෙම;) මමෛව, මාගේම; භාග්‍යදෛශඃ, භාග්‍යදෛශයයි; (මුඛචන්ද්‍රයාගේ දෛශය නොවෙයි යනු භාවයි) ඉති, මෙබඳුවූ යම්රූපකයෙක් ඇද්ද; තත්, ඒ රූපකයතෙම; සමාධානරූපකම්, (උක්තප්‍රකාරයෙන් සමාධානයහෙතු කොට ගෙණ) සමාධානරූපකනම් වන්නේයි-

මෙහි මුඛචන්ද්‍රයාකාරණ තාපය තමාගේ කර්මබලයමයයි ගිවිස ඉවසූ හෙයින් සමාධාන රූපකනම්.

## 19 රූපකරූපකය.

93 මුඛපඞ්කජරඞ්ගෙස්මින් භ්‍රූලතානත්තකී තව,
ලීලානෘත්‍යං කරොතීති රම්‍යං රූපක රූපකම්.

තව, තිගේ; භ්‍රූලතානත්තකී, භ්‍රූලතානැමැතිනර්තකීතොමෝ; අස්මින් මුඛපඞ්කජරඞ්ගෙ, මේ මුඛපද්මනැමති නෘත්‍යභූමියෙහි; ලීලානෘත්‍යං, ලීලානර්තනය; කරොති, කරන්නීය; ඉති, මෙබඳුවූ රූපකයතෙම; රම්‍යං, මනොඥවූ; රූපක රූපකම්, (ලතාකරණලද භ්‍රූදෙදෙනාගේ නෘත්‍යකරණය හෙතු කොටගෙණද පඞ්කජ කරණලද මුඛයාගේ රඞ්ගිකරණය හෙතුකොටගෙණද) රූපක රූපකනම් වන්නේයි-

මෙහි මුඛය පද්මය කොට ලා නැවත රඞ්ගත්වයෙන් රූපණය කළහෙයින්ද බැම ලතාවකොට ලා නැවත නර්තකීකොට රූපණය කළහෙයින්ද රූපක රූපක නම්.

## 20 තත්වාපහනව රූපකය.

94 නෛතන්මුඛමිදං පද්මං නෙනෙත්‍රෙ භ්‍රමරාවිමෞ,
එතානි කෙසරාණ්‍යෙව නෛතා දන්තාච්චිෂස්තව.

95 මුඛාදිත්වං නිවර්ත්‍යෙව පද්මාදිත්වෙන රූපණාත්,
උද්භාවිතගුණොත්කර්ෂං තත්වාපහනවරූපකම්.

තව, තිගේ; එතත්, මේතෙම; මුඛං න, මුඛය නොවෙයි; ඉදං,

* භාග්‍යදෛශාත්-මමෛව, භාග්‍යදෛශාත් තෙ මුඛමෙව ඉන්දුරපි මාං නිද්දයං නිද්දහති තාපයති-ටී කලිකාතා.

ය හ අෑ වණින් මුත් තුබුපද නො ලා සදවස්
නොම ලැහැ පෙරකිවිසමා කව් බැඳ යසබඳ දෙවා. ෲ

---

මෙතෙම; පද්මා, පද්මයක; ඉමෞ, මොහුදෙදෙන; නෙත්‍රෙ න, නෙත්‍රයෝ දෙන්නෙක් නොවෙති; භ්‍රමරෞ, භෘඞ්ගයෝදෙන්නෙක; එතෞ, මොහු; දනතාච්චිෂඃ න, දනතශොභාවෝනොවෙති; එතානි, මොහු; කෙශරාණ්‍යෙව, කෙසරයෝමැයි-මූඛාදිත්වං, මුඛාංදිභාවය; නිවර්ත්‍යෙව, සහවාම=වලකාම; පද්මාදිත්වෙන, පද්මාදිභාවයෙන්; රූපණාත්, පරිකල්පනය හෙතුකොට ගෙණ; උද්භාවිතගුණොත්කර්ෂා, ප්‍රකාශිතවූ ගුණාතිශය ඇති මේතෙම, තත්වාපහනවරූපකම්, (මුඛාදිත්වයාගේ වැලකීම හෙතුකොට ගෙණ) තත්වාපහනව රූපක නම් වන්නේයි,

මෙහි ඇති තත්වය වලකා අන්‍යවූ පදාර්ථයෙක්ම රූපණය කල හෙයින් තත්වාපහනව රූපක නම්

66 න පර්‍ය්‍යන්තො විකල්පානාං රූපකොපමයොරතඃ,
දිඞ්මාත්‍රං දර්ශිතං ධීරෛරනුක්තමනුමීයතාම්.

රූපකොපමයොඃ. රූපකඋපමා දෙන්නාගේ; විකල්පානාම්, ප්‍රභෙදයන්ගේ; පර්‍ය්‍යන්තො න, කෙලවරක් නැත, අතඃ, එහෙයින්; දිඞ්මාත්‍රම්; දෙශමාත්‍රයෙක්, දර්ශිතම්, දක්වනලද; අනුක්තම්, (මෙහිලා) නොකියනලද දෙය; ධීරෛඃ, කවීන් විසින්; අනුමීයතාම්, අනුමාන ඥානයෙන් දන්නා ලැබේවා (අනුමානයෙන් දැනගත යුතුයි)

රූපකාලඞ්කාරය නිමි.

---

ෲ ය හ අෑ වණිත් මුත්,යකාර හකාරාදිවර්ණයන් හැර, සදවස්, ජනුස් පිණිස, තුබුපද. තුච්ඡනූන (අර්ථශූන්‍යවූ නින්දිත) පදයන්, නො ලා, නො බහා, (නො හෙලා) පෙරකිවිසමා, පූර්වකවි) සමය,(පූර්වකවීන්ගේ කාව්‍යශාස්ත්‍රය)නොමලැහැ. උල්ලඞ්ඝනය නොකොට, කව්බැඳැ, කාව්‍යබන්ධනයකොට; යසබඳ, කීර්ති ශරීරය, දෙවා, ජීවත්කෙරෙත්වා (නොහොත්) ජීවත්කරව්—

යකාරය, හකාරය, වකාර, ඝුකාරය, යන මේ ආදිවර්ණයන් (අක්ෂර) මිස ජනුස් පිණිස අර්ථශූන්‍යතුච්ඡවූ පදයන් නො හෙලා පූර්වකවීන්ගේ කාව්‍යශාස්ත්‍රරීතිය නො ඉක්මවා(ඊට අනුව ඒවූ පරිච්ඡෙදත් ගී සිවු ආදි) කාව්‍යයන් බන්ධනය කොට කීර්ති ශරීරය ජීවත් කරව් (නොහොත්) ගී සිව්පදආදිය තනා එහි හා නම තමන්ගේත් කීර්තිය පවත්වා ගණිව-යනු භාවයි.

b ලකරඅදියර, අලඞ්කාරාධිකාර නම්වූ, දෙලොස්වනු, ද්වාදශම කාණ්ඩයයි.

මෙහි දක්වන යකාර හකාරාදි වර්ණ නම් ජකුදුන්ගේ අපරිහානිය පිණිස හෝ වෘත්තභෙදය පිණිස හෝ එළිසම කිරීම පිණිස හෝ මාත්‍රාසම්කිරීම් සඞ්ඛ්‍යාතපද පූරණවශයෙන් ජෙත පාඨයන්හි යොදාතිබෙන "ය, හ, ව, හු" ආදි අක්ෂරයෝයි; * ඒ එසේ මැයි.

කාව්‍යශෙඛරයෙහි-

කුළුණු නුවණ රැ   සා 'ය' සමතැ   සා 'ය'
සහ සබ මැද දෙ   සා 'ය' සිව් ස   සා 'ය'
සතන් සෙතසල   සා 'ය' නොවල   සා 'ය'
කෙලෙස් ලොවැඩතො   සා 'ය' මේ ලෙ   සා 'ය'

ගුත්තිලකාව්‍යයෙහි-

නොහල විරුසිරි ය හ—රිපුදුරව රිවිළද   ය'හ'
පබල මෙරදිරි   ය හ—නැගී රජ රියැදුරෝ සිටි ය හ.

ගිරාසන්දෙශයෙහි-

ස රි ව   තෙ දි ව   පුර සුර කුම   රු ව න්   මි ලි
සු රු ව   තු රු ව   ඉදනොවනුව   රු ව න්   මැ ලි
න ර 'ව'   ලොල'ව'   තබමින් රන්   රු ව න්   කි ලි
ගි ර ව   බ ල ව   කෙළිනා යොද   රු ව න්   කෙළි

කොවුල්සන්දෙශයෙහි-

න ම ල්   බරණ ගතැ සරසා සක   ස් කො ට
තු ඵ ල්   උතුරු පට සළුවෙන් එකැ   ස් කො ව
ක ම ල්   සඳිස් අත් ලෙළවා උස   ස් කො ව
ව් පූ ල්   'ව'වැදිතෙපලත්තුති වෙසෙ   ස් කො ව

* මෙ "යහ" ආදී වර්ණයාම යවහන් මහාදෙශයට දක්වූ යකාර, වකාර, හකාර, න්කාර, යන සතරකුරයයි සමහරුන්ගේ කල්පනාවක් පවතී, එහි-ව, න්, දෙක ගීයෙහි "ඇ" ශබ්දයෙන් ගත යුතුයැයිද කියත්. ගේ ඔවුන්ගේ මතමාත්‍රයකි, පූර්වයාවිසමයෙහි එබන්දක්අවද්‍යමාන යෙදන්ද "යවහන්" යන සතරකුර ජකුජ් පිණිස හෝ වෘත්තභ්‍රංශ නොබිඳුම පිණිස පදපූරණ වශයෙන් යොදන්නට නියම කලතැනක් නොපෙණෙන හෙයින්ද, මව පලමු දක්වූ ඉෂ්ටානිෂ්ටාර්ථකාරාවසානයෙහි "මේ ඇසුණුවරා" යනාදීගීයෙන් එය කපින හෙයින්ද, මෙහි "යවඇ"යි හොයනහා" "යහඇ"යි යෙදූ හෙයින්ද, ඒ විශෙෂඥ නොවූවන්ගේ මතිමාත්‍රය මෙහි උචිත නොවේ.

ගිරාසන්දේශයෙහි-

සිල් සෙනග 'හු' යස සෙමෙර 'හු' මෙත්සත 'හු'
ගුණ බරණ 'හු' දම්කිරුළ 'හු' නැණකත 'හු'
බුන් අරග 'හු' තදතෙදණ 'හු' සිරි පුර 'හු'
සුර ඇඳුර හු හැර කවර 'හු' වණතිඹ හු

මෙහි ' ' මේ ලකුණෙන් මැදිකර තිබෙන 'ෂ'කාර ආදි අක්ෂර උක්තප්‍රකාරයෙන් අවබොධ කටයුතුයි, එසේම 'ස' 'හ' දෙක හා ඉන් පිටත් අක්ෂරයක්හුත් කිසිතැනෙක්හි ආකාරාන්ත (දීඝී) වශයෙන්ද යොදති, එය මේ මතු දක්වන දෘෂ්ටාන්තයන්ගෙන් සත්‍ය වේ.

ගුත්තිලකාව්‍යයෙහි-

යත දසන ප බ ශා-සපුන් සේ හළ පිඹ ශා
මුවපිපුම පොං බ ශා-පුවද කර සියලු දම්සබ ශා

කාව්‍යශෙඛරයෙහි-

පැහැදුම් රඟවන් නම්තුදුලා හා
සිවුසස් නිමහන් පුතු නිමලා හා
සිතියම් වන මේ රසතෙපලා හා
එලවී සවණ සබ සියලා හා

බුදුගුණාලඞකාරෙහි-

හොලු වන් කිම්පුරස ගී ලෙස මා
බිඟිරන් දෙත අත්තල තාළම් මා
දැයදුන් ඇස දුන් රසදුන් ලෙස මා
පිළිනන් දන රඟ කැරුවූ රුව මා

කාව්‍යශෙඛරයෙහි-

පුරදර සමඟ බට දෙව්සෙන් සෙයින් සොං දා
නරනිඳු සමඟ උන් මහසෙන් මුනුඳු මැ දා
තිකුළුත රුවන්ගිරිසිරි වෙළපමින් එ දා
සැදූ සරබ පලහෙහි වැජඹි ගුණබ දා

## අලඞකාර නම්.

කාව්‍යශොභාකරාන් ධම්මානලඞකාරාන් ප්‍රචක්ෂතෙ,
තෙ චාද්‍යාපි විකල්ප්‍යන්තෙ කස්තාන් කාත්ස්න්‍යෙන වක්ෂ්‍යති.

කාව්‍යශොභාකරාන්, කාව්‍යශොභාවන් නාවූ; ධම්මාන්, ශබ්දාත්‍ථ ගතභාවයන්; අලඞකාරාන්, අලඞකාරයනැයි; ප්‍රචක්ෂතෙ, (පුරාතන පණ්ඩිතයෝ) කියත්; තෙච, ඒ ශබ්දාත්‍ථගත අලඞකාරයෝ වූකලි; අද්‍යාපි, අද දක්වාත්, විකල්ප්‍යන්තෙ, නානාප්‍රකාරස්වරූප වශයෙන් (කවීන් විසින්) කියනු ලැබෙති; (එහෙයින්) කාත්ස්න්‍යෙන, සාකල්‍යයෙන් (සර්වප්‍රකාරයෙන්;) කඃ, කවරෙක් තෙම; තාන්, ඒ අලඞකාරයන්; වක්ෂ්‍යති, කියාද? (නො කියාමැයි)

යම්සේ මුක්තාහාරකුණ්ඩලාභරණාදියෙන් ශරීරය හොබනේද එසේම කාව්‍ය නැමැති ශරීරයද අලඞ්කාරනැමැති ආබරණින් හොබනේය; එහෙයින් ඒ කාව්‍යශොභාකරවූ ගුණවිශෙෂයෝ අලඞ්කාරනම් වෙති, ඒ අලඞ්කාරයෝ අද දක්වාම අනෙකාකාරයෙන් මිශ්‍රව භින්නව උපදිති, එසේ හෙයින් එය සර්‍වාකාරයෙන් කියන්ට කවුරු නම් සමර්ථවෙත්ද? යනු භාවයි.

ඒ මේ අලඞ්කාරයෝ පන්තිස්වැදෑරුම් වෙති, දක්වන ලදමැයි ආචාර්‍ය දණ්ඩින් විසින්—

ස්වභාවාඛ්‍යානමුපමා රූපකං දීපකාවෘතී,
ආක්ෂෙපොර්ථාන්තරන්‍යාසො ව්‍යතිරෙකො විභාවනා.
සමාසාතිශයොත්ප්‍රෙක්ෂා හෙතුඃ සූක්ෂ්මො ලවඃ ක්‍රමඃ,
ප්‍රෙයො රසවදූර්ජස්වි පර්‍ය්‍යායොක්තං සමාහිතම්.
උදාත්තාපහ්නුතිශ්ලෙෂවිශෙෂාස්තුල්‍යයොගිතා,
විරොධාප්‍රස්තුතස්තොත්‍රෙ ව්‍යාජස්තුතී නිදර්ශනෙ.
සහොක්තිඃ පරිවෘත්ත්‍යාශීඃ සඞ්කීර්ණමථ භාවිකම්,
ඉති වාචාමලඞ්කාරා දර්ශිතාඃ * පූර්වසූරිභිඃ.

1 ස්වභාවොක්තිය, 2 උපමාය, 3 රූපකය, 4 දීපකය, 5 ආවෘත්තිය, 6 ආක්ෂෙපය, 7 අර්ථාන්තරන්‍යාසය, 8 ව්‍යතිරෙකය, 9 විභාවනාය, 10 සමාසොක්තිය, 11 අතිශයොක්තිය, 12 උත්ප්‍රෙක්ෂාය, 13 හෙතුය, 14 සූක්ෂ්මය, 15 ලවය, 16 ක්‍රමය, 17 ප්‍රෙයොලක්ෂණය, 18 රසවත්ය, 19 ඌර්ජස්විය, 20 පර්‍ය්‍යායොක්තිය, 21 සමාහිතය, 22 උදාත්තය. 23 අපහ්නුතිය, 24 ශ්ලෙෂය, 25 විශෙෂොක්තිය, 26 තුල්‍යයොගිතාය, 27 විරොධය, 28 අප්‍රස්තුතස්තුතිය, 29 ව්‍යාජස්තුතිය, 30 නිදර්ශනය, 31 සහොක්තිය, 32 පරිවෘත්තිය, 33 ආශීඃය, 34 සඞ්කීර්ණය, 35 භාවිකයයි, කියා මෙසේ කාව්‍ය (වාක්‍ය) යන් සම්බන්ධවූ මේ අලඞ්කාර පන්තිසක් රාමශර්මාදිවූ පුරාතනාචාර්‍යවරයන්ගේ කාව්‍යලක්ෂණ ආශ්‍රය කලාවූ ආචාර්‍ය දණ්ඩින් විසින් දක්වන ලද්දේ වී නමුත් ඒ පන්තිසෙන් මේ සිද්ධාන්ත සඞ්ග්‍රහයෙහි දක්වනලද්දේ—උපමා (ලඞ්කාර) ය, නින්දා ප්‍රශංසාය (නොහොත්) ව්‍යාජස්තුතිය, උත්ප්‍රෙක්ෂාය, රූපකය‘ යන මෙ පමණකි, එයිතුදු-උපමාලඞ්කාරය දෙතිසක් පමණ ප්‍රභෙද ඇත්තේවී නමුත් මේ සිදත්සඟරායෙහි දක්වනලද්දේ-වස්තූපමා, අද්භූතොපමා, ශ්ලෙෂොපමා, නින්දොපමා, විරුද්ධොපමා, යන මෙපමණයි, ඒ මේ උපමාලඞ්කාරයාගේ නාම පරිපාටිය මීට මුලින් (54 වැනි පිටේ) දක්වා ඇත.

* වාචාමලඞ්කාරඃ සමර්ථනෙත-ඩී-ලඞ්කා.

මෑපෙල පමණ සිඹි කිව්මන් දනන් පසසත,
ගරහත යළිදු කම්කිම් පඩුවෝම මෙහි පමණෝ a
දුහුන දනහට මුත් මෙ සුදු සිදතින් ව්යතිති,
පිරයත්නව නැතදතක් මෙහි කළ මතැතැතුස්වා. b
දකුණු ලක සියල් බුජමහාවූරෙනි රක්නා,
දෙනෙව් රදලහම් විමනාන පතිරජදෙව් සැරදෙනේ c

---

රූපකාලඞ්කාරය-විංශතිප්‍රභෙදවූ නමුත් මෙහි දක්වනලද්දේ හෙතුරූපකය, සකලරූපකය, යන දෙක පමණයි.

උභය භාෂාව-මෙහි හා සංස්කෘතාදි ඇතම් කාව්‍යවිෂයෙහිද විද්‍යමාන නමුත් දණ්ඩ්‍යලඞ්කාරාදියෙහි නො පැණේ.

මෙහි පැණෙන-අනතලාපය වූ කලී සමාසොකති, පර්‍යායොකති, යන අලඞ්කාරවයවම ඇතුලත් වූ සේ පෙණෙයි.

මෙහි සඞ්ග්‍රහ නොකරණලද අන්‍යවූ අලඞ්කාර පරිඥනයත් අවශ්‍යක නමුත් ග්‍රන්ථබාහුල්‍යය වන හෙයින් මෙහිදී සංක්ෂෙප කළ බැව් දතයුතු.

අලඞ්කාරාධිකාරය නිමි,

---

මෙසේ අධුනික ජනයාගේ ප්‍රයොජනය වාදශාධිකාරයකින් මස්තකප්‍රාප්තකොට මේ සිඞ්ධාන්තසඞ්ග්‍රහයාගේ උපවාද දක්වත් හෝ "මෑපෙල පමණ" යනාදිය කීනු.

a මෑපෙල පමණ, මාතෘකාපාලිමාත්‍රයක්; සිඹි, චුම්බනය කළාවූ; කිව්මන්, කවිමානිවූ; දනන්, ජනයන්; පසසත, ප්‍රශංසා කළද; යළිදු, නැවත, ගරහත, ගර්හාකළද; කම්කිම්, කායකිම්ද; මෙහි, මේ ශාස්ත්‍රයෙහි;(ද්‍යෙහෝ නොහොත් මේ සිඞ්ධාන්ත සඞ්ග්‍රහයෙහි;) පඩුවෝම, පණ්ඩිතවරයෝම; පමණෝ, ප්‍රමාණ-යෝය-

මූල්පෙළ පමණක් දැනගත් පණ්ඩිතමානී ජනයන් මිට පැසසුවත් ගැරහුවත් ඒ දෙකින්ම කවරනම් ප්‍රයොජනයක්ද? එසේ හෙයින් මේ ශාස්ත්‍රයෙහි (හෝ සිදත්සඟරාවෙහි) අන්ඝතාව දැන ගැණීමට පණ්ඩිතයෝම ප්‍රමාණවෙති අන්‍යයෝ නොවෙතියි සේයි.

b ව්යතිති; ව්‍යක්තයෙනි; දුහුන දනහට මුත්; අධුනිකජනයන්ට මිස, මෙ සුදුසිදතින්, මේ ක්ෂුද්‍ර (කුඩා) වූ සිඞ්ධාන්ත (සංග්‍රහ)යෙන්,පිරියත්නව, පර්‍යාප්තයන්ට(ශාස්ත්‍රයෙහි කෙළ පැමිණියන්ට;) අතක් නැතද, අර්ථ (ප්‍රයොජන)යක් නැත්තේ වී නමුත්; මෙහි, මේ ශාස්ත්‍ර විෂයෙහි; කළ; කරණලද; මතැතැ, මාගේ උත්සාහයෙහි; (නොහොත්) ම කළතැන, මා විසින් කරණලද (මෙ) උත්සාහයට; තුස්වා, සන්තොෂ වව.

අදරෙන් සදත ඔහු විබතෑ නිරණිය සියබසෑ,
පලකරණුවස් මෙ කෙළෙම් කුළුණෙන් සිදත්සඟර. ɗ

* මෙහි පදනුවහ දූනෑ. වියරණ සිදු ගිජවි    හ
නිතෑතිති මන පසිඳෑ. විදදන දප්තිපිලෙ    හ
සසරළ දිගෙළඹෙන. විතරපන සඳුරෑ මෙ    සා
නගනු මෙලකෑ නිති. දියදද නර නත මි    ත්වා ෂ.

සිදත් සඟරා නිමි.

---

මෙසේ උපවාද දක්වා ප්‍රතිරාජදෙවයන්ට ආශිර්වාද හා ඔහු අය
දුම් දක්වන්නෝ "දකුණ ලක සියල්" යනාදිය කීහු

ෆ සියල් දකුණ ලක, සකල දක්ෂිණ ලඞකාව; බුජමහවුරෙනි, භුජ (බාහු) නැමැති මහාප්‍රාකාරයෙන්; රක්නා, රක්ෂා කරන්නා වූ, රදලගම්පිමනග, රදලග්‍රාමනැමැති විමානාග්‍රයෙහි; දෙදෙවි, ජයබවජයක්වැනිවූ;පතිරජදෙව්; ප්‍රතිරාජදෙව(නම්වූ අග්‍රාමාත්‍ය) තෙම; සැරදෙනේ, චිරකාලයක් (සතුරන්මැඩ) ජයගන්නේය; (හෙවත්) බොහෝ කලක් ජීවත් වේවා.

ɗ ඔහු. ඒ ප්‍රතිරාජදෙවයන් විසින්; අදරෙන්, ආදරයෙන්;අයදන, ආරාධනා කරත්ම, සියබසෑ, ස්වකීයවූ (සිංහල) භාෂාවෙහි, විබත් ඈනිරණිය,විභක්ත්‍යාදින්ගේ නිර්ණය,(සිඬානතය=නිශ්චය,)පල කරණුවස්, ප්‍රකාශකරණු පිණිස; මෙසිදත් සඟරා, මේ සිඬාන්ත සඞග්‍රහ(නම්වූ ප්‍රකරණ)ය; කුළුණෙන්, (අධුනිකයන්කෙරෙහි) කරුණාවෙන්; කෙළෙම්, (රචනා) කෙළෙම්.

මෙසේ ආශංසනා හා ආයාචනා දක්වා තදනන්තරව මෙහි ප්‍රධාන ප්‍රයොජන දක්වන්නෝ"මෙහි පදනුවහ දූනා"යනාදි කීහු.

ඎ මෙහි, මේ සිඬාන්තසඞග්‍රහයෙහි; පදන්,ප්‍රධාන (අඞග) සූත්‍රය හා; උවහ, උපාඞගසූත්‍රද; දූනෑ, ජානනය කොට; වියරණසිදු, විංශතිප්‍රකාරව්‍යාකරණ නැමැති සිනුහුන්,බජමින,භජනය කෙරෙමින්,දපින්,(මාන) දර්පයෙන්; ඉපිලෙන,උඩත වන්නාවූ හෙවත් ඉල්පෙන්නාවූ, විද දන, විදග්ධ ජනයන්ගේ; මන, අභිමානය; නිතෑතිති, නිරන්තරයෙන්; පසිඳෑ,ප්‍රච්ඡින්න කොට; විතරපන, විස්තාරප්‍රාපනවූ; සඳුරුමෙන, සාගරයපරිද්දෙන්; දිගෙළඹෙන,

---

* මෙය "උවුරු" නම් ජන්දසෙහි "තරඟංග" නාම වෘත්තය වේ—ඒ මෙසේයි.

නොවෙන් දෙසෙත් විරම් කොට දසනව මත්තෙන්
පියදූ තරඟරඟ වෙ නිදසුන් මෙසේ දන්නේ-යී.

මාත්‍රා නවයකින් හා දසයකින් විශ්‍රාම හෙවත් යතිය තබා දස නව මාත්‍රාවකින් බඳිනලද්දේ "තරඟරඟ" නම්වෘත්තය වේ.

දශදිශාන්තරයෙහි ව්‍යාප්තව(පැතිරෙ)න්නාවූ;යසරල, යසස්නැ මැතිතරඞ්ගඇති;අනන්තම්භ; අනන්ත මත්ස්‍යයන් ඇති ද්‍යොහෝ නොහොත්; මීනනත, ප්‍රඥාවලලහවූ (ප්‍රඥාවට සමාංම්වූ;) නර, (පණ්ඩිත) මනුෂ්‍යතෙමේ; මේ ලකැ, මේ ලඞ්කාද්වීපයෙහි; නිති, නිරන්තරයෙන්;දිය දද,ජයබවජයන්;නහන්නු, ආරෝපණය කරන් නේයි.

සිදත්සඟරා, සිද්ධාන්තසඞ්ග්‍රහ (නම්වූ ප්‍රකරණ)ය;
නිමි, (මෙතෙකින්) සමාප්තයි.

මේ සිද්ධාන්තසඞ්ග්‍රහාවසාන කාව්‍යය වනාහි ශබ්දාලඞ්කාරාන්ත ගීත විචිත්‍ර බන්ධනයන් අතුරෙන් කර්තෘශාස්ත්‍රනාමාඞ්ක ගර්භ කොටඇති ෂඩරචක්‍රබන්ධනයවේ, මෙය චක්‍රයේ නාභි නෙමි දෙදෙනාගේ මධ්‍යයෙහි පිහිටි දැවිසයක් ඇති (චක්‍රවින්‍යාසයවූ) හෙයින් "ෂඩරචක්‍රය" සිදු-මෙහි කර්තෘනාමයත් ශාස්ත්‍රනාම යත් ගර්භකොට ඇති හෙයින් "කර්තෘශාස්ත්‍රනාමගර්භචක්‍ර"යසිදු- "කවිකාව්‍යනාමගර්භචක්‍ර"යයිදු කියනු ලැබේ, හෙද "ශිශුපාල බධනම් මාඝකාව්‍යයේ" කවිකාව්‍යනාමගර්භචක්‍රබන්ධනයෙන් හා "කව්සිළුමිණෙහි" පැණෙන කව්කාව්‍යනාමගර්භ චක්‍රවින්‍යාස දෙකින් ප්‍රකටවිය, මෙහි මේ චක්‍රවින්‍යාසයෙහි තුන්වන සවන වළලු දෙකෙහි පිහිටි අකුරු දොළස ප්‍රදක්ෂිණක්‍රමයෙන් එක්කොට ගත් කල්හි "පතිරජපිරුවනගෙ සිදත"යී කර්තෘශාස්ත්‍රනාමොද්ධාරය වේ, එහෙයින් මෙය "කර්තෘශාස්ත්‍රනාමගර්භචක්‍ර"යයි දත යුතු. ඒ එසේමැයි.

" පූරඃ පූරෙ ලිඛෙත් පාදාන්ත්‍රීන් ෂඩරීකෘතාන්,
තුර්‍යම්නතු භ්‍රමයෙනෛනාමෛ නාමාඞ්කශ්චිත්‍රසංවිධිඃ" යනු.

ආලඞ්කාරික සූත්‍ර හෙයින් මෙහි දැවිසයක්කොට තුන්පාදයන් එහි ඉදිරි ඉදිරියෙහි ලියන්නේය, සතරවන පාදයවනාහි (ඒ ඒ තුන්පාදයන්ගේ මුල අග අකුරු සය සමගානිම්වලල්ලෙහි පැද කුණින් සිසාරා ලියන්නේය, එය නාමාඞ්කවිචිත්‍රචක්‍රබන්ධන සංවිධානය වේ.

තදර්ථින්ගේ විපුලාර්ථය සඳහා ශ්‍රීමාඝමහාකවීන් විසින් විරචිත ශිශුපාලබධනම්වූ මාඝකාව්‍යයේ 19 සර්ගාවසානයෙහි පැණෙන කව්කාව්‍යනාම ගර්භචක්‍රබන්ධනය හා තද්ව්‍යාඛ්‍යානයෙහි ශ්‍රීමල්ලිනාථසූරීන් විසින් ප්‍රකාශිත විස්තර චක්‍රබන්ධොද්ධාරය මෙහි බහා ලනු ලැබේ.

" සත්වං මානවිශිෂ්ටමාජීරභසාදාලම්බ්‍ය භව්‍යඃ පුරෝ
ලබ්ධාඃක්ෂය ශුද්ධිරුද්ධතරශ්‍රීවත්සභූමි මුදා,
මුක්ත්වා කාමමපාස්තභීඃ පරමානවන්‍යාධඃ ස නාද්‍යං හරෙ
රෙකොඝෙඃ සමකාලමභ්‍යුදයී රොපෛස්තාද්‍යතස්තරෙ"

"චක්‍රබන්ධොද්ධාරස්තු, දශමණ්ඩලරෙඛාත්මකො නවමණ්ඩලාඃ

න්තරාලවර්ති චක්‍රෙ නාභිස්ථානෙන සහෛකොනවිංශතිකොෂ්ඨං ප්‍රත්‍යෙකං ව්‍යඤ්ජනං ඪකාන්තං සමරෙඛයා ලිඛිත්වා තත්‍රෛ කස්ථං ජඬකාන්තං චම්පාශිවප්‍රක්‍රමෙණ ආද්‍යපාදමාලිඛ්‍ය තථා ප්‍රාද ක්ෂිණ්‍යෙන ද්විතීයතෘතීයයො ද්විතීයතෘතීයෙ, ලිඛිත්වා නෙමිස්ථා නෙ බාහ්‍යවලයෙ සාක්ෂරකොෂ්ඨෂට්කෙන සහාෂ්ටාදශකො ෂ්ඨවර්ති තෘතීයපාදාන්තකොෂ්ඨවර්ති වර්ණමාරභ්‍ය ප්‍රාදක්ෂිණ්‍යෙන චතුර්ථපාදං ලිඛිත්වා තත්‍රෛව සමාපයෙත්, තත්‍ර තත්‍රාද්‍යන්ත වර්ණෛඃ සහ චතුර්ථපාදෛකාරඃ, තත්‍ර නාභිස්ථානෙ ආද්‍යපාදත්‍රය දශමාක්ෂරසංවාදඃ, තෘතීයාන්තකොෂ්ඨෙ චතුර්ථාද්‍යන්තවර්ණයොඃ සංවාදඃ, තෘතීයවලයෙ මාඝකාව්‍යමිදං ෂෂ්ඨෙ ශිශුපාලවධ ඉති කවිකාව්‍යනාමොද්ධාරඃ.”යි

## සිද්ධාන්තසංග්‍රහ ෂඩරචක්‍රවින්‍යාසය.



කර්තෘශාසන නාම ගර්භචක්‍රයයි,

## ව්‍යා ඛ්‍යා ස මා පතී ස.

1 සි රි ග න ඳු ල් සඳූනග තු ල් සසල   සි රි
සි රි ප ති තු ල් විකුමැති සි ල් පිරි රු   සි රි
සි රි ල ක ක ල් සි රි ප ද ප ල් හ ළු ඳු   සි රි
සි රි සු ම ඟු ල් හිමි ප ද ඳු ල් වඳිම්   සි රි

---

2 සත් සපුර පරතෙර–නැණ නැව්නි ඳුටු එකවර,
මුළු පඬි දනන් මුඳුනත–පැළඳි කිරුළෙව් බබළන.
3 දම් රද සඳූනඹර–සරා සඳ මඬලක් ලෙද,
මිසදිටු ගනඅඳුරු බිඳැ–හෙළිකළ මෙ මුළු සිරිලක.
4 සිරි සුමංගල නා–ඳියතුළ පතළ යසරැස්,
විදුදයපිරිවෙණඳිපති–හිමිඳු සැරදේ සැපතින්.
5 කිව්නැල කුමුදකර–උපදෙස් රැසින් පොබයන,
නැණිසුරු හිමිඳු තිසපුරු–සැරද සතරත පහද.
6 අගම්සතරත'සිරි–නැණසර නැගු කිතුඳද,
මෙහිම් සැරදේ ගුණබර–ලොසතර'ගම්වැඩුම්ගේ.
7 සකු මගද හෙළුබස–සඳරුත් ලකර සඳ ඇ,
සතර මණිබරණින් නිති–සරසන දනන් එකලෙස.
8 යටගම් වෙහෙරපතී–පොබයන දනන් මනකොඳ,
අපැඳුරු සොඳුරු කම්ලශේ–ගුණරතන නම් යතිසඳු.
9 පරසිඳු කමල්කල්–මහසෙන් සමන් විබිසන,
ලෝපල් මෙ පුරවර නිති–රකිතවා සෙත් දිදී අපමණ.
10 දිවකර විකුම් සිහ–ඇ නම් ගොතිනි පැවැතෙන,
කුළුගෙදුලම්ණි ගෙම්තුරු–පිවතුරු මෙතින් පිරිතුරු.
11 පසිඳු මඩුගල්ලේ–සිදුහත් බිඳන් යති සඳු,
සිදුසසුනඹරමැද නිත–දිලේවා සතුසනත්තම බිඳැ.
12 කොළොම්පුර සිරිබර–දෙමටගොඩ නිති වසනා,
බුලත්සිංහලගේ යන–සුවෙකණ්කුරේ මහතා.
13 අයැදියෙන් නෙකවර–අරුත්වියකැන කරණව,
ජේ. පී. අමරසිහ නම්–උනවටුනා ගම රදනා.
14 අපැඳුරු උගහ නො දහැ–රැගෙණ උපදෙස් විසිතුරු,
දුහුයන් නැණවැඩුම්වස්–මෙ කෙළෙම් ම නැණ පමණින්.

සෝද පව්හළු දසබල පිරිනිව් දෙදහස් සිව්සිය තෙතිස් ව සේ
ලෝද අලුකා දිනපත් කුඹුරැස රවිද අනුරය නවන් ම සේ
පෝද අවලක දුහුනම් වැඩවනමෙමරුතවයනැන නැණවිලසේ
සා ද නිමකළ බව දනු සුදනෙන් සත්සඳු තරණව සිලුව්ල සේ

---

# ශුද්ධිපත්‍රය.

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 14 | 15 | මෙහි විභාංග | මෛහිපදවිභාග |
| 15 | 12 | කවුරුන්නත් | කවුරුන් සිත් |
| 20 | 28 | හෙමායා | හෙ මයා |
| 30 | 22 | හැර | හරු |
| ,, | 23 | ජයගෙණි | ජයගණු |
| 36 | ,2 | කුමමවති | කුමුවති |
| 41 | 24 | පදුබැඳුම් | පදබැඳුම් |
| 45 | 33 | ව්‍යඤ්ජ | ව්‍යඤ්ජන |
| 46 | 15 | රචන | රචනං |
| 64 | ,8 | රූපව්‍යක්තිඃ | රූපව්‍යක්තිඃ |
| 72 | ,1 | ගඟාංවගේ | ගංගාවගේ |
| 87 | 29 | මෙගි | මෙහි |
| * 89 | ,1 | 90 | 89–: |
| 96 | 25 | පූර්වකවි) | පූර්වකවි |
| 102 | 27 | සමගං | සමග) |

* පිටුනොම්මර 88 ලඟට 90 වැරදී වැටී තිබෙන බැව් දතයුතු.



